දිගාලුවාගේ දායාදය

ලයා රංජන්

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

දිගාමඩුල්ලේ ආශ්චර්‍ය

මායාරංජන්

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
675, පී. ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10

Please buy books of this publisher and the author.
Make this e book to boost your reading temptation.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය විසින් පාඨමාලීය සාධනය සඳහා මූනවැයි නිර්දේශ කරණ ලදින් අධ්‍යාපන අධ්‍යක්ෂතුමන් විසින් පාසල් ප්‍රස්තකාල පොකක් වශයෙන් අනුමත කරණ ලදී.

පළමුවන මුද්‍රණය 1957
දෙවන සංස්කරණය 1963
තුන්වන මුද්‍රණය 1993
හතරවන මුද්‍රණය 1999

© බුද්ධි නිමල රාජපක්ෂ

ISBN 955 - 20 - 1094 - 2

පරිඝණක අකුරු සැකසුම
R&P ග්‍රැෆික්ස්
7-1/2E, පළමු මහල
සුපිරි වෙළඳ සංකීර්ණය,
බොරැල්ල

මුද්‍රණය :
චතුර මුද්‍රණ ශිල්පියෝ
142, අවිස්සාවේල්ල පාර
වැල්ලම්පිටිය.

Please buy books of this publisher and the author.
Make this e book to boost your reading temptation.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පෙර වදන

දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය සිංහල සාහිත්‍ය විංශයට එක් වූ අපූර්වතම කෘතියකැයි අද සිංහල භාෂා සාහිත්‍ය විශාරදයන් විසින් පිළිගැනෙයි. එය නිර්මාණය වූයේ මායාරංජන් තුළ සහජ ගතියක් වූ කරුණා ගුණය - විශේෂයෙන් අතහැර දමන ලද අය කෙරෙහි උණුවන හදවතක් හිමිවීම - නිසාය. වනයට කොටු වූ දිගාමඩුලූ වැසියන් ගෙවන දුෂ්කර ජීවිතය ඔහුගේ කරුණාබර නෙතට හසු වූ විට ඔවුන් ඒ කම්කටොළුවලින් ගලවා ගන්නට තරම් ශක්තියක් තමනට නැනත්, ඔවුන්ට වඩ වඩා සමීපව ඔවුන් අධ්‍යයනය කිරීමටත්, ඒ මගින් ඔවුන්ගේ කුළුපග මිතුරකු වීමටත් ඔහුට හැකි විය. යන්තම් සරම් කඩමල්ලක් පටලවා ගෙන තමා වෙත ආ ගැමි දරුවන්ට අකුරු කරවන්නට සිදු වූයේ තමන් උගන් අධ්‍යාපන ක්‍රම අනුව නොවේ. ඒ පරිසරයට ගැලපෙන පරිදි ඒ ක්‍රම සකස් කරගන්නට ඔහුට සිදු විය. ළමුන් බොහෝ විට වාඩිවූයේ බිමය. නැතිනම් තමන්ම කඩාගෙන ආ කොළ අතු මිටක් මතය. ගල්ලැල්ල හෝ පොත කොට බිත්තිය මත තබාගෙන ලීවේය. පෑන්, පැන්සල් නැති කැන බිම අතුරු කැටයකින් හෝ ලීවේය. මෙසේ පාසලේ, ළමුන්ගේ කෙතෙක් අඩුපාඩු තිබුණත්, හැකිතරමින් ඔවුන්ට සේවය කිරීමට ඔහු වඩ වඩා උත්සාහ ගත්තේ අසරණ කම වැඩිවන තරමට සමානුපාතිකව හදවත ද උණු වූ බැවිනි. ඔහු දෙපාර්තමේන්තුවට කරදර නොකළේ ය. දෙමව්පියන්ට ද කරදර නොකළේ ය. ඔවුන් සේ ම දුෂ්කර ජීවිතයක් ගත කරමින් තම වැටුප ද ඒ දරුවන් වෙතුවෙන් වැය කිරීම ඔහුට සතුටක් වූයේ ය. ඒ දරුවෝ ද දුෂ්කරතා මැද උනන්දුවෙන් උගත්හ. (පසු ව ඔහු ම උත්සාහයෙන් ලබා ගත් උප කැපැල් කාර්යාලයේ භාරකරු වශයෙන් පත්වීම ලැබීමට ඒ ශිෂ්‍යයෙකුට හැකි විය.) මෙසේ ඉතා සමීප ව කටයුතු කළ නිසා ම ඔහුට මොවුන්ගේ සිරින් විරිත්, යටගියාව, බස්වහර ආදී සියලු දේ අධ්‍යයනයට මග පෑදුණේ ය. ඔවුන් සමග ඒ වනයේ ඇවිදීමෙන්, ඒ රජදහනේ තොරතුරු දකීමෙන් උපතින් කලා රසිකයකු වූ මායාරංජන් වශීකෘත වූයේය. තමන් කුල්මත් කළ ඒ රඟාස්වාදනය සහෘදයනට ද බෙදා දීමට වරින්වර සිය ගම්පෙදෙසින් හිතවතුන් ගෙන්වා ගෙන වනයේ ඇවිද්දේය.

මායාරංජන් මේ වන පියසට යන කළ ඉහිනියාගල වැව ඉදිකිරීමේ මූලික කටයුතු ඇරඹී තිබුණේය. අම්පාර නගරය ද ඉදිවන්නට කටයුතු සැලසිණ. ඒ සඳහා පැමිණි නාගරික කාර්මිකයෝ බොහෝ දෙනෙක් ඒ පෙදෙස්වල කඳවුරු ලා ගත්හ. මේ සංවර්ධන කටයුතු නිසා ඉතා ළඟ දී ම මේ අසිරිමත් වන පෙදෙසත්, එය නිජබිම කොට වෙසෙන තොකිළිටි හෙළ ගැමි පිරිසත්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

අතුරුදන් වන බව ඔහු දුටුවේය. නෙල්ලි කැලේ නමින් ඇඳින්වුන ඔසු උයතේ පැරණි ඔසු කම්හලක නටබුන් - බෙහෙත් ඇඹරුම් ගල්, බෙහෙත් වංගඩි ආදිය - එදන් ඉතිරිව තිබුණේය. පල්ලම්මය අසල අම්බලමක හෝ වෙතත් ගොඩනැගිල්ලක නටබුන් විය හැකි පැරණි ගල්කණු කිපයක් ද තිබුණේය. ලංකාවේ සෞභාග්‍ය සමයේ වැදගත් සේවාවක් මේ පෙදෙසින් ඉටු වූ බවත්, ඊට උරදුන් ජනතාවට නැකම් කියන මේ අගිංසක ජනතාවන් සමග ම ඒ සියල්ල මැකී යන බවත් ඔහු දුටුවේ ය. ඔහුට කළ හැකිව තිබුණේ අනාගත ජනතාව වෙනුවෙන් ඒ අසිරිය කැටිකර රැක තැබීමයි. දෙවිය විසින් තමා මේ පෙදෙසට එවනු ලැබුයේ ඒ කාර්යය සඳහා ම යයි සිතූ ඔහු තම ජීවිත කම්කටොලු කිසිවක් දෙස නොබලා සිය යුතුකම ඉටු කළේය.

තමන් කළේ උසස් ජාතික මෙහෙවරකැයි ඔහු සිතුව ද එය කිසිවකුගේ සැලකිල්ලට පාත්‍ර නොවිය. ඔහුට අවශ්‍ය වූයේ තමාගේ වෙහෙසට සරිලන මුදලක් ලබා ගැනීම නොවේ. ජාතිය වෙනුවෙන් මෙසේ හෝ ඒ අසිරිය ඉතිරි කර තැබීමය. එද සමන් ප්‍රකාශකයන් ඉදිරිපත් නොවන්නට මේ කෘතිය පළ නොවන්නට ඉඩ තිබිණ. ඒ අසිරිමත් ජනසමාජයන්, වන පෙතත් අපට උරුමව තිබුණ බවක් අද කිසිවෙකුත් නොසිතන්නට ඉඩ තිබිණ.

වරින් වර සිංහල පාඨකයන් හා ලේඛකයන් විසින් සිහිපත් කරනු ලැබූ නියා දෝ සංස්කෘතික අමාත්‍යාංශයේ සැලකිල්ලට යොමු වීමෙන් එම දෙපාර්තමේන්තුව මගින් සංගෘහිත පුරීන ජීවිත කෘතියේ පිටිවන වෙළඳාම යාරංජන් ගැන ලිපියක් සපයන්නට මෙහෙයවනු ලැබූ පියසේන කහදගමගේ ගුරින්ගේ වැයම නිසා* සාමාන්‍ය ජනසමාජයේ අදිසිව සිටි ඔහු කවරෙක් දයි ඇදින ගැනීමට පාඨකයන්ට අවස්ථාවක් සැලසින. ඒ කාර්යය සඳහා ඒ මහතාණන්ව උනන්දු කළ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමති වී. ජ. මු. ලොකුබණ්ඩාර මැතිඳුන් වෙතුවෙන් අපගේ ප්‍රණාමය හිමිවිය යුතුය. මායාරංජන් තමින් ලේඛක ලොවට පිවිසි මහානාම රාජපක්ෂ කිසිවිටෙකත් තමන් හුවා දක්වීමේ ආශාවෙන් නොපෙළඹුණේය. ඔහුට අවශ්‍ය වූයේ සිය කෘතිය පෙන්වීම පමණකි. එස්. ගොඩගේ මහතා මේ පොත නැවත මුද්‍රණය කරවීමට භාරගත්තේ අපේ ජාතික උරුමයක් නැසිය නොදී සිංහල පාඨකයන් අතරට යැවීම උතුම් මෙහෙවරක් ය යන පවිත්‍ර හැඟීමෙනි.

මේ කාර්යය සඳහා මහත් උනන්දුවෙන් ක්‍රියා කළ පියසේන කහදගමගේ මහතාටත්, ඉතා සැලකිල්ලෙන් හා ඉක්මණින් මුද්‍රණ කටයුතු මෙහෙයවූ එස්. ගොඩගේ මහතා සහ එම කාර්ය මණ්ඩලයටත් මා සොහොයුරු මහානාම රාජපක්ෂයන් වෙතුවෙන් මගේ ගෞරවාදර ස්තුතිය පිරිනමමි.

බුද්ධි නිමල රාජපක්ෂ.

මගලෙගොඩ,
වේයන්ගොඩ.

---

* ඇදෙ ලිපිය මෙම ග්‍රන්ථයේ අගට එකතු කර ඇත.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

හැඳිනවුම

පැරැණි දිගාමඩුල්ලට අයත් පෙදෙසක් වූ වැව්ගම් පත්තුවට මා පළමු වරට පැමිණියේ වර්ෂ 1948 දී ය. එකල එය අලි - වලස් ආදී නොයෙක් වන සතුන් ගහණ මහ වනයෙකින් වැසුණු, තැන තැන පිහිටි හෙල් සහිත තැනිතලා බිමෙක් විය. එහි හෙල් මුදුන්වල සිට ගං ඉවුරු තෙක්, සතරැස් සැනපුමකට දෙක තුන බැගින් තිබුණු ආදි කර්මාන්තයන්හි නටඹුන් මට පෙනී ගියේ, දිගාමඩුල්ලේ අතීත සභ්‍යත්වය පිළිබඳ අලංකාර ස්වප්නයක් ලෙසිනි.

මේ මහ වනය මැද තැනින් තැන පිහිටි කුඩා ගම්, සාගරයක් මැද වූ පුංචි දිවයින් රැසක් බඳු විය. එහි විසූ මිනිසුන්ගේ දිවි පැවතුම් ද, ගති ගුණ, සිරිත් විරිත් සහ භාෂාව ද කොළඹ කරයෙන් පැමිණි මට ආශ්චර්යයක් මෙන් පෙනුණේ ය. ඉන් කුහුලට පත් මම ද යහළුවන් තනාගෙන, බත්මලු කර බැඳගෙන, වනය පුරා ත්, වැව්ගම පත්තු යට් පළාතේ සියලු ගම්වල ත් සැරිසැරුවෙමි. ඒ ගමන්වල දී මට අසන්නට සහ දකින්නට ලැබුණු ආශ්චර්‍ය්‍ය, මෙසේ පොතක් වශයෙන් ඔබ අතට පත් කෙරෙමි.

ජල කර්මාන්ත උදෙසා රජය මගින් 'ගල් ඔය සංවර්ධන යෝජනා ක්‍රමය' ඇරැඹුණේ ද 1948 පමණේ දී ය. (ගල් ඔය යයි ප්‍රසිද්ධව ඇතත් මෙයට පළාතේ ව්‍යවහාර නම ගල ඔය යනුයි.) ගල ඔයේ වතුර වැව්ගම් පත්තුවට ඇතුළු වන සීමාව අසල 'ඉහිනියගල' වෑ කන්ද බැඳ, 'සේනානායක සමුද්‍රය' කරවන්නට ඇමෙරිකානු 'මොරිසන් හඩ්සන් ඉන්ටර්නැෂනල්' සමාගමේ යෝධ යන්ත්‍ර පැමිණියේ ය. ඒ යන්ත්‍ර මහා සෝෂාවෙන් මහ වනය දෙදරවමින් රුස්ස ගස් වැල් ඇද හෙළද්දී දුවන්නට වූ වන සත්තු, ඈතට ගොස් නතරව මෙපිට බැලූහ. අද වැව්ගම් පත්තුවෙන් අඩක්, පැරැණි දිගාමඩුල්ලේ නවීන ඡායාවක් බඳු අලුත් ගොවි ජනපදයෙකි. අනෙක් අඩ ද අඩ වශයෙන් එළිව ඇත්තේ ය. පාරේ යන බස් රියවලට පෙනී පෙනී 'අඹාරේ' (අම්පාරෙයි) වැවේ දිය කෙළින වල් අලි අද ත් දක්ක හැකි නමුත්, මේ පොතින් විස්තර වන ආශ්චර්‍ය්‍ය සියල්ල, තවත් සීමා සහිත කාලයෙකින් අන්තර්ධාන වන්නේ ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

දිගාමඩුල්ලේ අලි-වලස් ආදි වන සතුන් පමණක් නොව මිනිසුන් ගැන ද මම ලියවෙමි. ඒ හැමට පින් ! අද ත් ජීවත් වන ඇතැම් මිනිස් පින්වතුන් පිළිබඳව මා නොයෙක් දේ ලියා ඇත්තේ ය.

මේ දෙවෙනි මුද්‍රණයෙහි දී පොත සංශෝධනය කරමින් අලුත් පරිච්ඡේදයක් ද එක් කළෙමි. එහි වැඩි වශයෙන් ලියැවී ඇත්තේ මිනිස් ජීවිත ගැන ම ය. ඒ සියල්ල සත්‍ය ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේ පිරිසිදු චේතනාවෙන් සාදර සිතින් ම මිස, කිසිවකුට හිංසාවක් හෝ නින්දාවක් හෝ කරන අදහසෙකින් නො වන බව සියලු සුටිහු සලකත්වා.

නව කතාවක් මෙන් ඔබට මිහිරි නො විය හැකි වුවත්, මෙහි එන තොරතුරු සියල්ල සත්‍ය බවට සහතිකයි.

සියලු සත්වයෝ සුවපත් වෙත් වා !

මාකාරංජන්.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පටුන

පිටු

හැඳිනවුම 07
පෙරමහ තොරතුරු..... 13
ඇතුළත විසිතුරු..... 20
මල්ලිට ලියුමක්..... 31
නෙල්ලි කැලේ..... 39
වඩිනාගල ගමන..... 50
යෝද ඇලේ කතාව..... 61
කොස්සපොල විත්ති..... 74
ඉතිහාසය..... 84
ගොවිතැන්..... 91
ජීවිත කතාව..... 98
අම්ම හාමුදුරුවන්ගෙ කාරිය..... 104
කැලේ වීරයෝ..... 116
කතා බස්..... 127
වඩිනාගල සිව්පද..... 136
අමුතු වචන..... 140
උප ග්‍රන්ථය..... 149

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner



Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner



Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

අස්නායාය පළිදෙය් වාහන පිහිටාව

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය

1

පෙරමඟ තොරතුරු

සිරිමල් සහ මම, මඩකලපුවෙන් උදේ නවයට පිටත් වූ නැපැල් බස් රියේ නැඟුණෙමු. එය අප ද ගෙන මුහුදු වෙරළ ඔස්සේ දකුණු දිගට පිහිදුණු මාවතේ ගමන් ගත්තේ ය. මුල් මයිල පසළොස තුළ දක්ක හැකි මහත් ආශ්චර්‍ය්‍යයෙක් නැති. තැනෙක මිටි පදුරින් වැසුණු නිසරු වැලි බිම් ය. අතරතුර සරු පොල් වතු සහ කජු ඉඩම් ය. මානෙන් මාන, දෙමළ-මරක්කල සිරින අනුව කටු පැළැලි, අතු පැළැලි ආදියෙන් ඇවුරුණු ගෙ මිදුල් ඇති ගම් පිහිටියේ ය.

පසළොස් වැනි මයිල-කණුව 'කලුවංචිකුඩි' නම් ගමෑ විය. එතැන් සිට බසයේ සිටියකුට වම් පසින්, තැනින් තැන මුහුදක්, අතරතුර මඩකලපුවේ සිට කල්මුණේ අසලට ම විහිදෙන කලපුවේ කොටසුත් පෙනේ. එහෙත් දකුණතින් පෙනෙනුයේ ගාස්තුවක් ගෙවා බලන්නට වටින දසුමෙකි. එය නම් ගොවි-ඇසට මිහිරක් වන මනහර වෙල් එළියෙකි. මාවතේ කාණුවෙන් පටන්-ගත්තා කුඹුරුයාය ඇත-ඉතා ඇත, උෆවේ කඳුකරය පශ්චාද්භාග කොට-ගත් අදුරු වන තීරය තෙක් ම එක එල්ලේ විහිද-ගිය මනහර සමතලයෙකි. මඩකලපුවෙන් මයිල හැටහයක් දුර පිහිටි පොතුවිල නෙක් පමණක් මා දක ඇති නමුත්, තොරතුරු අනුව දකුණු දිග වෙරළ දක්වා ම ආදියෙහි පැතිර පැවැතියෙකි. එහෙයින් මෙය ම පැරණි දිගාමඩුලු ජනපදයෙහි කීර්තියට දෙස් නොවේ ද ?

එපමණක් නොව මේ සිත් කලු දර්ශනය අවුරුද්දේ සෘතුවෙන් සෘතුව ඒ ඒ වෙස් ගෙන බැබැළෙන ඉඩමෙකි. වැසි කලට නිබඳ දියෙන් පිරී-ගත් කල කලපුවෙක සිරි ගත්තේ ය. ඊශාන මෝසම් වැස්ස අඩු වෙද්දී, පලාවන් ගොයමින් වැසී, හරිත වණ සමුද්‍රයෙක ශෝභාව

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පාන්තේ ය. ගොයම් වැඩෙද්දී දෙමළ-මරක්කල ගොවීන් ගේ පැල් පැහැ-නැහෙයි. කුඹුරු පැසෙද්දී, ඇත වත තිරයෙන් එළි බැස එන උරෙන් ගෙන්, අලින් ගෙන්, ගෝන මුවන් ගෙන් රැකෙන මුරකාවල් දවි වෙද්දී, පසුව පැමෙන වී වෙනුවට ණයට බඩු දෙන-වැඩි පුර ම බුලත් කළමනා කිඩි, සිගරට්, සුරුට්ටුන්, වියළි බනිස්, විස්කිරිස්සැ සහ කංසා-කෝපින්[1] සැපයෙන- කඩ ද පහළ වෙයි.

නැවත අස්වනු අස් කොට-ගත් පසු මේ රම්‍ය භූමිය, එළ-මී ගවයන් සිය ගණනින් සැදි රංචු සිය ගණන් නිසා සුන්දර දර්ශනයක් වෙයි. එහෙත් වියළි සෘතුවේ දීප්ත සූර්ය රශ්මියෙන් පොළොව දැ-ගිය කළ, බෙහෙතකට තණ පතක්, සතකුට වතුර උගුරක් නැති, කර්කශ වේගවත් මාරුතයෙන් උඩ නැඟී කැරකෙන දූවිල්ලෙන් වැසි-යන කාන්තාරයක් බවට පෙරළෙයි.

මඩතලපුවෙන් මයිල දෙළොසක් ගිය තැන 'කුරුක්කල් මඩම්'[2] නම් ගමෙකි. විසිපහක් ගිය තැන කල්මුණේ වෙයි. එතැනින් කාරදුව් නින්දූරය[3] පසු කොට නිස් නවයක් දුර අක්කරය පත්තුව පිහිටියේ ය. පැරණි දිගාමඩුල්ල නොහොත් වර්තමාන වැවිගම පත්තුවට යන මාවත වූයේ අක්කර පත්තුවෙනි. එහෙයින් එ තැන දී අපි බසයෙන් බැස්සෙමු.

අක්කරපත්තුවේ සිට බටහිර දිගට මයිල සතළොසක් ගිය කල ය, අපේ ගමනේ ඉලක්කය වූ ද, වැවිගම් පත්තු යටිපළාතේ ඇගනුවර වූ ද 'දමන' නම් ගම පිහිටියේ. ගණුනින් දහ-හත සුළු වුව ද ගමනින් එය දුෂ්කර ක්‍රියාවෙක් වූයේ ය.

ස්‍රීරිමලුත්, මමත් වාහන පහසුව ගැන සොයා බැලීමු. තලතුනා මරක්කල රියැදුරෙක් මුල් එකොළොස යාමට, මහු ගේ පරණ මෝටර රථයට රුපියල් විසිපහක් ඉල්ලී ය. එතැනින් එහාට මෝටර වාහන යා නොහැකි බව දන්විණි. ගමන පිටත් වී යන අතර රුපියල් විසිපහ කුළියට මිල බවයි අපට වැටහුණේ.

පළමුවැනි මයිල තුනේ, පාර යටකී කුඹුරුයාය මැදින් වැටුණු රළු කළුගල් ගෙඩියෙන් වැසුණු දඩි-බිඩි මාවතෙකි. ඉන් මඹ තැන තැන තණ පිට්ටනියෙන් ද, අතරතුර කටු පදුරින් සහ ඉළුක්කලාවෙන් ද වැසුණු බිම් ය. කුඹුරු, ඉපතැල්ලෙන් හිස්වන කලට මේ බිම් ගොදුරු

1. කංසා සහ කෝපි මිශ්‍ර පානයක්.
2. ගුරුන්ගේ වාසය - පූජකයන්ගේ නවා තැන යන අදහස දෙන නමකි.
3. නින්ද+ඌර් - නින්දගම .

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

කැරගන්නා සුන්දර මුහුණු ඇති එළ ගව රංචු තුසුරුදු මෝටර සතා අසා විස්මයෙන් මෙන් හිස් ඔසවා, කත් හරස් කොටගෙන අප දෙස බලති.

ක්‍රමයෙන් වනය ගත වෙයි. උස් වෙයි. අඳුරු වෙයි. ඒ සමඟ මාවත කබල් වන බව පෙනෙයි. මුල් මයිල එකොළොස ම රෙස්ට්වූව[1] සහිත ඒවා විය. එහෙයින් පාලම් තරණය කරන්නට පෙර මරක්කල යහළුවා රිය නතර කළ විට සිරිමල් ද, මම ද ඉන් බැස පාලමට පයින් ඇත හොල්ලා-බලා රිය එතෙර කැරවුවුමු. සමහර පාලම් අනිශ්චිත හෝ කැඩී ගොස් ම වූ හෙයින්, එ තැන්හි දී රථය පල්ලමට ගෙන වැලි තළා හෝ මඩ ගොහොරු හෝ මැදින් තල්ලු කොටගත යුතු විය.

අක්කරපත්තුවේ මිනිස් පියස පසු කළ පසු නැවත එවැන්නක් ඇත්තේ මයිල අටක් ගොස් 'ඉළුක්සේන' නම් වැව අසලට ගිය කල ය. එය වැව ඇසුරින් කුඹුරු කළ මරක්කල ගොවීන් උදෙසා පැවැත්වුණු යටකි කුඹුරු කඩයෙකි. ඉළුක්සේන පසුකොට තවත් මයිල තුනක් ගිය කැන එරගම නම් මරක්කල ගමෙකි.

එරගම සිට දමනට ඉතිරි මයිල සය මහ බැද්ද මැදින් වැටුණු රෝද පාර[2] පමණෙකි. එරගම දී කරත්තයක් ගැන විභාග කළ විට මවුනු රුපියල් පසළොසක් ඉල්ලූ හ. අක්කරපත්තුවේ විජයාරාමයෙන් පිටත්ව අපට උපකාර පිණිස වැව් වසිතාගල හාමුදුරුවන් 'මය මට්ටයන්ගේ කරත්ත අපට එපා - යමු මහත්තයෝ පයින් යි වදාළ නිසා අපි උන්වහන්සේ පෙරටු කොට ගෙන, ගමන් සැහැල්ලු ඉසින් ගෙන ඉතිරි මහට පිළිපත්නෙමු.

අක්කරපත්තුවෙන් මයිල දෙක තුනක් හා කැන් පටන් ම මේ මහ දෙපස අලි-කොටි-වලස් ආදීන් දක්වා සියලු වල් සතුන් ගෙන් ගැවැසි බව සිහි කටයුතු ය. ගමනේ නියම තත්ත්වය තේරුම් ගනු පිණිස වරක් දෙකක් එහි දී සිරිමල්ටත්, මටත් වූ අකරතැබ්බ විස්තර කරමි.

මා වැව් ගම් පන්තුවේ රස්සාවට පැමිණ සමසකට පමණ පසු එක් රෑයෙක අපි දමන සිට බර කරත්තයෙන් අක්කරපත්තු යමින් සිටියෙමු. දවල් කල මරොත්තු නො දෙන අව්ව නිසා කරත්ත ගමන රෑ කල ම සිදු විණි. මෙහි ඇත්තේ දකුණු ඉන්දියාවේ වැනි පටු තට්ටු හා උස් රෝද ඇති කරත්ත වෙසෙසෙකි.

---

1. කාණු තපා පාලම් බැඳ පැදු පාර - 'රෙස්ට්' යන්නෙන් පළාතේ ව්‍යවහාරයට ගැනී ඇති සැටියි.
2. කරත්ත රෝදවලට කැපීමෙන් පමණක් පැදුණු පාර.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

කරත්තය දක්තමින් ඉහි ඉරිප්පඩම[1] මත බුද්දම[2] සිටියේ ය. මම මහු ළඟ ම පිටි පස හිඳිමින් විදුලිපන්දම එළිය කෙරෙමින් ද, දෙ පස වන සතුන් ඇස් දෙන් ද යි කුහුලින් විමසමින් ගමනේ යෙදුණෙමි. නොටිටම ආරව්විත්, තවත් අයකුත් කරත්තය ඇතුළේ සිටිපද කී හ.

පෙර යම් දෙකට පමණ වෙද්දී අපි මඩුල දොළොයක් පමණ ගෙවා, දකුණු දෙසට වනය මැදින් තවි මහක් පිහිටි සන්දියකට එළඹෙමින් සිටියෙමු. නිදිමත කාණු-ආණු වෙත් හුන් බුද්දම විටින් විට බෑ බෑ කියමින් ද, නැවත දෙමළ කුණුසරුපයෙන් ගොනුන් දක්කමින් ද හිනි. මම එක් වර ම කරත්තයට බඹ විස්සක් පමණ ඉදිරියේ පාරට බට දැවැන්ත අලියකු දුටිමි. 'අලියා! අලියා' යි මට ඉබේට ම කියැවිණි. බුද්දම නෝන් ළඟු තද කොට ගොනුන් නවතා හුව තිබබේ ය. නොවිටම ආරව්විලත් හුව තියන්නට හවුල් වූ හ. මා ද හවුල් වන්නට වැයම් කළ නමුත් මගේ උගුරෙන් හඬෙක් නො නැහිණි. කුමක්දෝ කරුණක් නිසා මගේ උගුර වියළී හුළං මිස හඬක් ඉන් නුපදින බැවි මට හැඟිණි.

එහෙත් දෙවන මොහොතෙහි දී අලියා වෙතින් ශබ්දයෙක් ආයේ ය. එය දඩි-දිඩි- ගාන හඬෙකි. අනේ ! ඒ කරත්ත රෝද හඬකි. විමසුව විට ඒ නොවිටම සිට අක්කරපත්තු යන්නට ආ අපේ වැති ම අනෙක් කරත්තයෙකි. වැරැදීම ගැන මට ලැජ්ජාවෙක් නුවුයේ 'අලි බොටා හැටි ම තේ මටත් පෙව්ණේ මං - ලොමු දහැ ගත්තා !' යි බුද්දම පැවැසූ හෙයිනි.

ඉන් නිදිමත හළ බුද්දම එතැන වල් සතුන් ගැවැසෙන තැනක් ම බව කියා, වරක් මරක්කල කරත්ත කාරයකුට වලසකු එළවා අවුත් පැන්න පරිදිත්, තවත් දවසෙක අලියකු එළවා එන විට කරත්ත කාරයකු ඉන් පැන දිවූ සැටිත්, අලියා කරත්තය පෙරළා-දමා යන්නට ගිය සැටිත් විස්තර කළේ ය.

එහෙත් එතැන දී තම් ඉන් පසු ගමන්වල දී හෝ මට වන සතුන් මුණ නො ගැසිණ. තවත් සැන්දවෙක මා බියකරු ගමනෙක යෙදෙමින් අක්කරපත්තුවේ සිට එරගමට ළඟා වුණු පරිදි මෙහි දක්වමි.

එද සවස හතරකුත් හතළිස් පහට මම, දමනට පයින් යනු පිණිස තනිව අක්කරපත්තුවෙන් පිටත් වුණෙමි. අක්කරපත්තුවේ යහළු වෙළෙන්දන් දනහොත් ගමන වළකන හෙයින් ඒ කාටවත් නො කියා පාන් ගෙඩියක්, වතුර බෝතලයක් ආදි මහ උපකරණ එල්ලාගෙන පිටත් වීමි. කුඹුරු

1. කව්වෝරු කට්ටය - දෙමළයෙන්.
2. බුද්දම - එනම් ගමින් පැමිණියකු නිසා ඒ නමින් හැඳින්වෙන ගැමියෙක්.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යාය පසු කොට යටකී ම· සන්දියට ළහා වුනු විට වේලාව හයට නුදුරු විය. ඉළුක්සේනේ කඩය පෙනෙන විට එහි පහන් දැල්විණි. අඳුර හතර වටින් ආයේ ය.

මා, මේ ගමත් පිටත් වූයේ අදහසක් ඇතිව ය. ඒ රැයෙහි අක්කර පත්තුවෙන් පිටත් ව දමනට යන කරත්තයක් තිබුණු බැවි මම දනිමි. නවතින්නට හැකි දෙපොළක් විය ඒ ඉළුක්සේනේ කඩයත්, එරගම හන්දියේ අලුතෙන් වැටුණු කඩයකුත් ය.

ඉළුක්සේනේ කඩය පසු කරද්දි යහළු මරක්කල ජාවාරියා මා දෙස බැලුයේ විස්මය රැඳි බැල්මෙකින්, පැහිරෙන අඳුර අතරිනි. අඳුරත් සමග ගමන් කොට හත හමාරටවත් එරගම හන්දියේ කඩයට පැමිණීම මගේ අපේක්ෂාව විය.

මට එද ඒ ගමන යන්නට සිතුණු හේතුව අදවත් එක එල්ලේ කිව නො හැක. එක් අතෙකින් එරගම කඩය ඉළුක්සේනට වඩා ප්‍රිය වන කරුණු කිපයෙකි. එරගම කඩය ඉතා අලුත වැටුණෙකි. එය හිමියා වූයේ මහලු වියට යන ඇංගලෝ ඉන්දියානු ජාතික, මහතෙකි. කඩය දමා අපට අතර මහ පහසුකම් සැලසූ හෙතෙම ටික දවසකින් ම තරුණ අඹුවක ද ගෙනායේ ය. අඹුව රූමත් මරක්කල තරුණියක් වූවා ය. මහලු මහතා මරක්කල කඩ කාරයාට වඩා හොඳින්, කන-බොන දේ සපයා විඩා හරින්නට බුරු ඇදකුත් මිදුලට දෙන නිසා පමණක් නොව, පහන් එළියේ පෙනුණ තරුණ මරක්කල කම්මුල්වලට මගේ දෙ නෙත් ආසා නො කෙළේ යයි කවුරු කියත් ද ?

කුමන කාරියක් නිසා හෝ මම රෑ අඳුර යමග තරහ කෙරෙමින් ඉළුක්සේනේ කඩය වෙත නො සිට ම ඉදිරියට ගියෙමි. සරම වඩා හොඳට කැසපට කවා-ගෙන කරේ තිබුණු මෙවලම් පොදියෙන් පුංචි විදුලි හුළක් අතට ගතිමි. අහල වැටෙකින් ඉන්නක් ගලවා අවියක් වෙනුවට අනින් අතට ගතිමි. 'කෝටුවක් අතට ගත්තම කෝටියක් දේස දුරු වෙනවා' යනු වැව්ගම් පත්තුවේ පිරුළෙකි. එහෙත් ඒ කෝටුවෙන් මගේ දෝසය සම්පූර්ණයෙන් දුරු නො වී ය. කුමන දිරියෙකින් ඉළුක්සේනේ කඩය පසු කළත් වඩා දුර යන්නට-යන්නට දිරි සියල්ල දුරු වෙමින් බියෙන් හදවත පිරෙන්නට විය. අඳුර වනය ගිළ ගනිමින් සිටියේ ය. අක්කරපත්තුව පැත්තෙන් පුංචි හඳක් නැහී තිබුණ හෙයින් මගේ විදුලි හුළෙන් නිකුත් වූයේ දුබල එළියෙකි. ඈත පඳුරු ගැවිලි විටෙක ඒ ඒ සතුන් මෙන් පෙනිණි. කොළතුරෙන් කුරුල්ලකු හා පඳුරකින් සාවකු හෝ නික්මෙන සරස් ගාන හඬින් මගේ හදවත වේවිළී ය. වරක්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

බුද්දමත්, මාත් දවාලේ පයින් ගමනක යෙදෙද්දී, තවිය-දහය මයිල තණු අතර, කොටියකු විසින් අඩක් කා-දමා තිබුණ ගවි කුණක් දුටු පරිදිත් මනත් විය.

මා, බියකරු මේ ගමනෙහි යෙදෙන්නට හේතුව ගැන තවත් වචනයක් කිව යුතු ය. බිය හා සටන් කොට ගමන් තරහයෙන් ජය ගැනීමෙන් ලැබිය හැකි ප්‍රීතිය එකෙකි. මේ විස්තරය ලියන්නට අත් දකීම් ලබන අපේක්ෂණය තවෙකෙකි. ඒ පල දෙකම කෙසේ වුවත්, ඒ රෑ ගමන කෙරෙද්දි නම් මා තුළ උපන් බයෙක පමණ දන්නෙම් මම ම පමණෙකි ! විටෙක ගෝනකු - මුවකු හෝ, කොටියකු-වලසකු ම හෝ පාරේ සිට හඬක් නහා-ගෙන දුවන්නට ඉගිලෙද්දි මා ත්‍රාසයට පත් විය. 'මළා ම තමා'යි මට සිතිණි. සතා වනය බිඳගෙන ගිය පසු නැවත කැළැඹීම මදක් අඩු වෙයි. යළිත් ඇතින් විශාල පක්ෂියෙකු ගේ හෝ රථ හඬක් අසා තිගැස්සුණෙමි.

කොහොම නමුත් මෙය ලියන්නට ම නො නැසි ඉතුරුවුණු මම වේගවත් ගමනින් සුදු යහළුවා ගේ කඩය විය යුතු හදියට නො වුණෙමි. මගේ මරලෝසුවෙන් හතකුත් කාල දක්වේද දී අනුමානයේ හැටියට මට කඩේ පහන පෙනිය' යුතු ය. තවත් ටික දුරෙකින් නො වරදවා ම කඩය පෙනිය යුතු බවට සලකුණක් වූ පාලමක් ද පසු කෙළෙමි. එහෙත් පහන් එළියක් නො පෙනිණි. පසු ව හන්දියට ම පැමිණ කඩය තිබුණ තැනට ම ගියෙමි. එහෙත් මා විස්මයත් කරමින් එහි පෙනුණේ අළු ගොඩකුත්, දවී ඉතිරි වුණු දඩු කැබැලිත් පමණෙකි. සුදු යහළුවාගේ තරුණ මරක්කල අනියම් බිරිඳ, මහු අක්කරපත්තු ගිය විටෙක, එහි තිබුණු දේත් අත-පත ගා-ගෙන අනෙක් මරක්කල තරුණයකු සමග කඩය ද ගිනි දමා පලා ගිය බවෙක් පසුව සැල විය.

එහෙත් එයින් මා පත් වූයේ අලි ඇබැද්දියකට ය. අපල ගලක් උඩ මදක් ඉඳ ගෙන මම කල්පනා කෙළෙමි. ඉතිරි මයිල හය ඒ රෑ තනිව ගමන් කිරීම මටත් වැඩි පිස්සකුටත් සිතිය හැකි පවා නො වී. මහ රෑ කරන්තය එන තුරු පාලු හන්දියේ වලසුන් ගේ හොස්ස අස්සේ හුදකලාව හිඳීම නො කළ හැක්කෙකි. එහෙයින් කළ යුතු එක ම දෙය වූ පරිදි, අඩ මයිලක් පමණ දුරින් එරගම් වැව අසල පිහිටි මරක්කල ගමට රුටා ගතිමි.

එරගම දිළිඳු මුස්ලිම් පවුල් නිහ හතළිහක් එකම බිම් කඩෙක කුඩා පැල් පත්වල වෙසෙන අපිරිසිදු පිළිකුල් ගමෙකි. පටු මාවත් දෙපස කටු හෝ අතු පැළැල්ලෙන් ගෙ මිදුල් අවුරුණු එය වන වාරීන්ගේ

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

නගරයක් වැනි විය. කඩ සීපයක් සහ තැපැල් පොළෙක් ද වූ ඒ ගම සෙලවෙර, වැව අයිනේ ම ගමේ දිස්පැන්සරිය විය. එහි සිටියේ මා හඳුනන දෙමළ දෙස්නර මහතෙකි. ඔහුට කතා කොට පැදුරු කබලක් ඉල්ලාගෙන, ආලින්දයේ එය එළා රෑය ගත කරන්නට සැරසුණෙමි.

රෑය තවත් ගැඹුරට ගොස් ගම ම නිහඬව නිදද්දී, මුදුනට පැමිණි සඳේ එළියෙන් වැව් දිය බැබැළෙන්නට විය. ගමනින් කෙතෙක් වෙහෙස ව සිටිය ද, මට ඒ දර්ශනය අතරින් පැරණි දිගාමඩුල්ලේ ආශ්චර්යමත් ශ්‍රී සමෘද්ධිය චමත්කාර ජනකව පෙනී ගියේ ය.

මේ එරගම එකල එරගම නොව රජගම ය. දෙමළ ශිෂ්ඨාචාරයට යටත් වූ පසු රජගම ඉරාජ ගාමම් - ඉරක්කාමම් යි දෙමළයට හැරිණි. ඒ නැවතත් සිංහලයට බිඳෙන විට එරගම විය. එහෙත් වැව්ගම් පත්තුවේ පැරණිතෝ අදත් එයට රජගම හෝ රත්ගම යැයි කියති.

රජගම් වැව ඉස්මත්තේ නඹා වෙහෙර නොහොත් දිසවාපි චෛත්‍යස්ථානය පිහිටියේ ය. ඒ අතර වනයේ මාලිගා - ගෙවල් ආදියෙහි නටබුන් ද ඇත්තේ ය. එසේ නම් මේ වැව ම එකල දිසවාපිය වූ වා ද ? කුමක් වුවත් එදා ඒ සෞන්දර්යය මැද පැරණි සිංහල සභ්‍යත්වය පිළිබඳ සිහින දකිමින් මම නිදා ගතිමි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

2

ඇතුළත විසිතුරු

පැරණි දිගාමඩුල්ල ජනපදයට අයත් වූ වර්තමාන වැවිගම් පත්තුව සැලෙන කිරි පළාතේ මැද හරියේ - එහි බටහිර සීමායන්තයේ පිහිටි පෙදෙසකි. එහි භූමිය නැනිත් තැන පිහිටි කුඩා හෙල්වලින් යුත් නැනිතලාවෙකි. මේ නැනිතලාව සාමාන්‍යයෙන් මුහුදු මට්ටමේ සිට අඩි දෙසියය දක්වා ද, හෙල් මුදුන් අඩි දහස දක්වා ද උස් ය.

රජය ජල විදුලි කර්මාන්ත කරවා දිගාමඩුල්ලට පුනර්ජීවනය දුන් ගලඹය, වැවිගම් පත්තුව කොටස් දෙකකට බෙදමින් ගලයි. පළාතේ මෙය ගල්ඔය නොව ගලඔය යි ව්‍යවහාර වෙයි. පරණ ලංකා සිතියම් වල මෙය සඳහන් වූයේ පට්පල් ආරු නමිනි. එය සැදී ඇත්තේ පට්පි-පොලෙයි-ආරු යන්නෙනි. අදහස ගාල ළඟ ඔය යනුයි. එසේ නම් මෙහි මුල් නම ගාලේ ඔය විය යුතු සේ පෙනේ. නම කුමක් වුවත් වැවිගම් පත්තුව මෙතෙක් ජලාශ්‍රිත වූයේත්, දිගාමඩුල්ලේ පුනර්ජීවනයට ඉවහල් වූයේත් මේ ඔයයි.

වියලි කලාපයේ වනාන්තරයක් වූ මේ පෙදෙසට වැස්ස ලැබුණේ ඊශාන මෝසමේ දී පමණෙකි. ඔක්තෝබරයේ දී කළු කරමින් පිට නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි කාලයේ දී වසින්නට ගත් කල ද දවල් දෙකේ ඉස්පාසුවක් නැතිව, දවස් තුනේ හතරේ බැඳ-ගෙන වසිනු පෙනෙයි. එකල උඩරට කඳුකරයේ මෙන් ම අවට පිහිටි හෙල් මුදුන්, සිහින් වළා රොදින් වැසී යෙයි. වාතස්කන්ධය දැඩි-බර ගුණයෙකින් යුක්ත වෙයි. පොළොව ද පෙහවුණු පාන් ගෙඩියක් මෙන් මොළොක් ව එරෙන්නට වෙයි. නිරන්තර වර්ෂාවෙන් ගලඔයත්, එහි ශාඛා වූ පල්ලම් ඔය සහ එක්ගල් ආරුත් පිරී ඉතිරී යෙයි. අපමණ වන සත්තු ද, ගම් වල ගවාදී සත්තු ද වතුරේ ගොස් නැසෙති. ගොවිතැන් පාලු වී යයි. ගොයම් හැර අන් කිසිම වර්ගයෙක කුඩා පැළ මේ වැස්සට මරොත්තු නො දෙන හෙයින් හේන් ගොවිතැනට අපල වන්නේ ය. රෝද පාරවල් ඇඟිලි හැරී, රෝට්ටුවේ බෝක්කු පාලම් කැඩී බිඳී යන්නේ ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පෙබරවාරි, මාර්තු කාලයේත් අතරින් පතර වැසි ලැබෙයි. අප්‍රේල් පසු වී නිරිත මෝසම ආරම්භ වූ විට, මෙහි එන්නේ, උඩරට කඳුකරයේ දී අන්තිම දිය බින්දුව දක්වා සුරා-ගෙන ඉතිරි වන වියළි සුළඟ පමණෙකි. ජූලි, අගෝස්තු වන විට සුළඟත්, හිරු රැසත් වඩ-වඩා දැඩි වෙයි. වළාකුළින් තොර අහසෙහි දිප්තියෙන් බබළන සූර්යයා අකාරුණිකයකු මෙන් පොළොව පෙළන්නට වෙයි. එවිට ගලඹය, තැනින් තැන වළවල් පමණක් රැඳුණු දිය ඇති වැලි තලයක් වෙයි. අන් ඔය කඳුරු, පත්ලෙහි බඹයක් යට පමණක් තෙතමනය ඉතිරි කොට වියළෙයි. ගස් වැල්වල කොළ හේ යයි. ඒ අතර හමන වේගවත් මාරුතය මළානික පැලැහැටි ඒ මේ අත ගසා, දුබල මහ ගස් ද මුලිනුපුටා හෙළා දමමින් වන හිස සලිත කර ගෙන මහ කලහ කෙරෙයි.

වැස්සට කුණු නො වී රැකුණු හේත්වල බෝග මෙකල වියළී යෙයි. රට දුර්භික්ෂ වන්නාක් මෙන් හැඟෙයි. බොහෝ වන සත්තු ද, ගවයෝ ද දිය උගුරක් නැතිව නැසෙති. හමන පවන ද නැතිව ඉර අව්ව තවත් බලවත් වන කල, එළිය දෙස බලන ඇස් ද දවෙන්නට වෙයි. එකල දිගාමඩුල්ලට වැස්ස අරුමයෙකි.

මෙ බදු දේශ ගුණයක් යටතේ වැඩුණු නොයෙක් වන පතුන් ගෙන් පිරුණු වනයෙකින් මේ භූමිය වැසුණේ ය. සෙසු වූයේ වන සාගරයෙක පුංචි දිවයින් මෙන් පිහිටි ගම් පමණෙකි.

ස්වභාවයේ ප්‍රකෘති අලංකාරය වනයෙහි දක්ක හැකි ය. මානුෂික හස්තයෙන් විපර්යාස නො කරන ලද එහි, අක්ලිෂ්ට ස්වාභාවික සෞන්දර්යය ඇත්තේ ය. එහෙත් එය වර්ණනා කළ හැක්කේ වනයෙහි ම ඉපි ද එහි ම හැදී, වැඩී, උගත් කවියකුට පමණකි. එයට ආගන්තුකයකු වූ මා විසින් කළ හැක්කේ අන්ධයකු සිහිනයෙකින් දුටු දෙව් ලොවක් ගැන කරන වැණුමෙකි.

වනයේ නොයෙක් ආකාර ඇත්තේ ය. ජලාශ්‍රිත පහත් බිම් උස් මහත් වැල් පෙළින් වැසුණු මහ බැද්ද ය. එහි වැඩෙන රුස්ස රුක්, උස් මහත් කමේ පුරාජේරුව ගොළු බසින් කියන යෝදයන් වැන්න. හැමෝ ගස ඒ යෝදයන් අතර ද කුමාරයකු මෙන් ඉතා උසට, කෙළින්, ශෝභන සේ වැඩෙන වර්ගයෙකි. ඇටඹ, පතඹ ආදී වල් අඹ වර්ග ද, කුඹුක්, කොලොං සහ බකිනි ආදිය ද විශාල ව වැඩෙයි. රෑණ, වැවරණ, බුරුත, මිල්ල, හල්මිල්ල, පළු, වීර, මොර, මී, කැටකැල, දෙඹ, කීණ ආදී තවත් වැදගත් ගස් වර්ග වෙයි.

1. කෙළින් උසට වැඩෙන ගස් වර්ගයකි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

උද්භිද ලෝකයට ප්‍රභූන් වැනි මේ විශාල වෘක්ෂයන් අතර මධ්‍යස්ථ ආර්යාවන් මෙන් වැඩෙන මහ ලතා වර්ගයෝ ද වෙති. මවුනු මහ ගස් කඳන් වටේ එතෙමින්, අතු අත්වල එල්ලෙමින් ඉහළ නැඟී, ප්‍රේමාලිංගනයකින් මෙන් ඒ ගස් වැළඳගෙන සිටිති. පහළ ගස් අතළු පෙනෙන වැල් කඳන්, ශත වර්ෂ ගණන් වැඩීමෙන් ගත කොර පොතු වලින් වැසුනු ආදී කාලීන යෝධ සර්පයන් මෙන් ද පෙනෙයි. පුස් වැල්, බඹර වැල් සහ එළකිරිත්ත වැල් මෙසේ ලොකුවට වැඩෙන වර්ග වේ. කැලිය වැල්, කල වැල් සහ බොකල වැල් ද විශාල ව වැඩේ. තවු වැල් සහ වට වැල් ගොවිනට වැට බඳින්නට ප්‍රයෝජන වෙයි. තිත්ත, ගැටතිත්ත, මානිත්ත, කිරි, මෝකිරි, තට්ටු කිරි, මොට්ටැකිලි වැල් ආදිය ද කාව පලක් නැතත් වනයට අලංකාරය දෙන වර්ග වේ.

මෙ බඳු මහ බැද්දේ මහ ගස් යට ඒ කඳන්වලින් පමණක් අවහිර ඇති අවකාශ භූමියෙකි. ඉහළ සා මඩුල්ලෙන් වැසුණු නෙයින් අඳුරු ය. සිහිල් ය. මහ නිසහින් එළි මහන් බිම් දවෙන කල ද, එහි රට මැද කදු කරයේ මෙන් සුව පහස් ඇත්තේ ය. එහෙත් ඒ සුවපහසුව ලැබිය හැක්කේ වන සතුනට ම පමණෙකි.

ඔය කඳුරුවල ආශ්‍රයෙන් තොර උස් බිම් සමහරෙක් දෙමට, කුකුරුමුවන්, කටු පිල ආදී කටු පඳුරින් වැසුණේ ය. ඒ වනය කටු බැද්ද නම් වෙයි. අතු ඉනිරිවලින් විහිදුණු සිය දහස් ගණන් කටු පොකුරු ඇති මේ වනය කටු නිසා ම අලංකාර ය. යටකී දෙමට, කුකුරුමුවන් හැරුණු විට කරඹ, එරමිණිය, වේ වැල් ආදියෙන් ද යුතු වෙයි. මෙහි වැඩුණ ලොකු කුඩා ගෙඩි වර්ග පක්ෂීන්ටත්, නොයෙක් සතුන්ටත් භෝජන විය.

කටු බැද්දටත් අඩු, කොරකහ, ලීනිය ආදී පඳුරින් වැසුණු කැලෑවෝ වින්න, ඇපල ආදී නම් ලබති. ඒ අතර තවත් ලොකු කුඩා බිම් කට්ටි ඉළුකින් වැසුණේ ය. ඒ තලාව නම්. තලාව, සරුවට වැඩුණු ඉළුකින් යුතුව, හමන පවනින් ඒ මේ අතට රැළි නහමින් මහ බැදි මැද බැබැළෙන, ගොයම් කෙත් මෙන් දැකුම් කළු ඉඩමෙකි. සමහර තලාවෝ අක්කර සිය ගණන් විශාල වෙති. නියං කලට තලාව ගින්නට යස ඉඩමෙකි. එක බීඩි කොටයකින් එහි ඇවිළෙන ගින්නක්, සුළං පහරින් දුම්මල පිඹින කලෙක මෙන් වැඩි වෙමින් දවස් ගණන් තිස්සේ දවෙයි.

නානා ප්‍රකාර වූ මේ වන භූමිය ඒ ඒ රුක්ලියෙන් පැලැහැවිටෙන් වැටෙන කොළ-මල්-ගෙඩි-දඬු ආදියෙන් පොහොර වෙයි. මෙසේ තැන්පත් වන වෘක්ෂාහාර පසට මුසු කිරීම, වල් ඌරන්, ගැඩවිලුන් මුල්කොට ඇති සියලු සතුන් අතින් සිදු වෙයි. ඉන් උපදින ජීවන රසය වන මැද

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පැතිරවීම වැසි කලට දිය පහරින් කැරෙයි. මෙසේ ස්වභාවයේ හස්තය විසින් පෝෂණය කැරෙන වන රාජිණිය ඇතේ දූ දරුවන් පෝෂණය කරන්නිය.

වන රාජ්‍යයෙහි රජ දරුවෝ වනාහි අලි-ඇතුනු වෙති. අන් හැමට වැඩියෙන් උස් මහත් මහු අතුන් ගෙන් නමිනට හෝ නමින් ගෙන් අතුනට හෝ බියක් නැත්තේ, නිදහසේ සිත් සේ වෙසෙති. මවුනතර ද බල වික්‍රමයෙන් වැඩි සිටින ඇත්තෝ රජුන් මෙන් ම ඇතිනි මෙහෙසියන් හා දූ දරු පොව්වින් පිරිවරා වනය පුරා ඇවිදිති. අවි රස්නය ඇති දවල් කල මහ බැදි මැද සිහිල් සුව පහසෙහි කල් ගෙවා, සවස් වන විට නලාවට වැද බඩ පුරා කමින් ද, ඒ ඒ තැන දියට වැද දිය තෙළියෙන් පසු වෙති.

අලි කොතරම් අලි වුව ද මිනිසුනට බය බවත් ඇත්තෙකි. එ මෙන් මිනිස්සු ද අලිනට බිය වෙති. එ හෙයින් තුවක්කු අතේ ඇතත් බොහෝ විට මෙහි ගම්මු අලින් ගේ හඬක් ඇසුණු පමණින් පලා දුවන්නට ම බලති. ඇලි-ඇත්තු ද මිනිස් ඉවක් දනුණු හැටියේ මහ හරින්නට ම බලති. නමන් කොපමණ ලොකු වුවත් හිස කෙළින් ගෙන දෙපයින් ඇවිදින මිනිස් සතා වැඩි බලවතකු බව මහු දනිති. ඒ සතා නො එනොත් වන රාජ්‍යයය ඔවුන්ට පාරාදිසයෙකි.

අලි-ඇතුන් ළඟට ලොක්කෝ වල් හරක් වෙති. නමින් හරක් නමුත් ගමේ වසන්නවුන්ට වඩා කිප ගුණයෙකින් බලවත් මහු, අලි රජදරුවනට පමණක් දෙ වැනි, ඔවුන්ගේ ඇමැත්තන් වැත්නහ. මස් නො කන හෙයින් අතුනට බිය නො එළවන ඔවුහු ද, පැටවකුට, දුබලයකුට මිස කොටියාගෙන් උවදුරක් නො ලබන පමණ ප්‍රබල හෙයින් බිය සැකින් අඩු දිවියක් ගත කෙරෙති. ඔසොවාගත් බයිනේත්තු වැනි ඇ පහින හිස් කෙළින් කොට-ගෙන, සටනට සැරසුණු යෝධයන් මෙන් ඔවුන් ලන බැල්ම මිනිසකුට දරිය නො හැකි ය. අවියෙක බලය නිසා නො වේ නම් කුළකු ඉදිරියේ මිනිසා අන්ත නිවටයෙකි. එහෙත් ඒ බවක් නො දත් හෙයින් දෝ අනෙක් සියලු සතුන් මෙන් ඔවුන් ද මිනිසා ඉදිරියට එනොත් ඒ මහ හරින්නට බැරි අදිසියෙක දී පමණ ය.

මිනිසා අන් සතුනට වඩා වලසාට බිය ඇත්තේ ය. ඊට හේතු ද වෙයි. අලියා ගෙන්, කුළා ගෙන් වන අනතුරු විරල වුව ද, වලසා ගෙන් මිය ගියා වුන්, උගේ නිය පහරින් විරූප වූ මුහුණු ඇත්තාවුන් බොහෝ දෙන මෙහි ගම්වල වෙති. ඒ මුහුණක් දකිම පවා වලසා කෙරෙහි බිය දියුණු වීමට හේතුවෙකි. අනෙක් කොයි සතුනුත් මිනිසකු දනුණ කල

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මග හරින්නට බලන නමුත් වලසා ගේ එබඳු සිරිතක් ඇති බවකුත් නො පෙනේ. ඔවුන් ඡෝඩුව හෝ පවුලක් පිටින් ඇති විටෙක නම් බේරියාම ඉතා දුෂ්කර ය. එනයේ දී මිනිසකු දුටු කල එම පහර දීමට සුදුසු අවස්ථාවක් බල බලා ඔහු අනුව යන බවක් ද කියති. සිරුරු බලයෙන් මහනක් නැනත් ඒ එතරම් මිනිසාට බියකරු එහෙයිනි.

එනයේ ලොක්කන් ගෙන් කොටියා ද එකෙකි. සිතෙන විට තම කොටියා වලසාට වැඩි නපුරෙකි. නපුරු වන තරමට එම මිනිසාට මහත් බියෙකින් පසු වීම අපේ වාසියෙකි. මිනිසකු දුටු කල ඒ හයින් කොටියාට ගැනෙන උණය සත් දවසක් පවතින බව කතාවට කියති. උණ කෙසේ වෙනත් එම බොහෝ හයින් පසු වන බව නම් ඇත්ත විය යුතු ය. වන පතුන් අතරින් එම එතරම් ම දකුම දුලබ ය.

වන රාජ්‍යයේ ප්‍රභූන් මෙන් කල් යවන අලි, වල් හරක්, කොටි, වලස් යන ඇන්තෝ මිනිස් සමාජයේ පොහොසත්තු වැන්නහ. මින් සෙස්සනට කුඩාවුන් ගේ මසින් වැඩක් නැනත් කොටි රාළහාමිල්ලාගේ යැපීම ගෝන, මුව, වඳුරු, රිළා ආදීන් ගේ මසින් ම වෙයි. එහෙයින් කොටින් ද අනුන් සුරා කන පොහොසතුන් වැන්නැයි කීම වැරැදි නො වේ. වලසා කෙළින් ම මස් බුදින්නකු නො වනත් වේයත්, මීමැස්සන් ආදී ක්ෂුද්‍ර ප්‍රාණින්ට කරන විනාශය සුළු නො වේ. ගස් බෙනවල හොස්ස ලා මී නඩන, කුඹස් කටට කට නබා වේ පිළවුන් උරන වලස් අප්පුහාමිලා ද එහෙයින් දුප්පතුන්ට රජයෙන් ලැබෙන සංග්‍රහයන් කොල්ලෙන් වල්ලෙන් පැහැර ගන්නා මුලාදැනින් වැන්නැයි නො කිව යුතු ද ?

ගෝන, මුව, වඳුරු, රිළා, මීමිනි, ලෙහෙන් ආදී අනෙක් සිව්පාවෝ වන රාජ්‍යයේ පීඩිත පන්තියට අයත් දුප්පත් අහිංසකයෝ වෙති. ගෝනහාමි කුළා මෙන් ම ඇත් කුලයේ උපනෙකි. එහෙත් කොටි රාළහාමි ගේ පිම්මට අසු වුණහොත් සටනක් කළ හැකි හපනෙක් නො වේ. මුවහාමි කොටි රාළහාමිට කිරි හට්ටියක් වැන්න. එහෙත් එය එසේ වන්නේ ද පිම්මට අසු වුණ හොත් පමණෙකි. කොටි රාළහාමි බිම දිගා වී වලග නවමින් මානම ගනිද්දී අසුරු සණකට කලින් හෝඩුවාවක් ලැබුණොත්, බේරී ගන්නට තමනට ජවබලය ඇති බව ගෝන-මුවෝ දනිති. ගස් නැහුමට එ පමණ හපන් රිළා, වඳුරු නයිදෙලා කොටියාට ගොදුරු වන හැටි පුදුමයෙකි. හීන් සැරයේ බලය නො දන්නා වඳුරු හාම්ලා, රාළහාමි ගස යට කැරකෙමින් ගොරවනු අසා බය නිසා ම පනින පිම්ම වැරැදි බිම ඇද වැටි ගොදුරු වෙති. ඉත්තෑවා කුරු නිසාත්, කබල්ලෑයා කොරපොතු නිසාත් කොටියා ගෙන් ගැලැවෙති. ඉත්තෑවා

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

හිස හංගාගෙන කුරු විල්ල පුප්පා ගත් කළ, රාළහාමි තුදුවුවා වාගේ අහක බලාගෙන යයි. ගමේ චංඩින් ගේ වැඩවලට ගම්මුලාදැනින් අහක බලනු මෙනි. කබල්ලැයාගේ සිරුරෙහිත් කොරසැඩි කොරපොකුවලින් නො වැසි ඇත්තේ හිස පමණෙකි. කොටියා එනු දුටු කල ඌ හොස්ස මැදට කරගෙන දරණුවක් මෙන් හැකිළී ගුළිගැසෙයි. එහෙත් චංඩි කම් දක අහක බලන මුලාදැනින් අවිස්ථාව දුටු කල පළි ගන්නාක් මෙන් කොටි රාළහාමි ද, ඌ යළිත් හිස ඔසොවන තුරු අයිනකට වී ශබ්ද නැතිව බලා සිටින්නට දනියි. එසේ සිට යන්තම් හිස ඔසොවන විට එයින් ම ඩැහැගත් කල උගේ සියලු ආරක්ෂා සංවිධාන කෙළවර වෙයි.

වන බිම වසන සත්තු මෙ පමණ නො වෙති. කලවැදි, මුගටි, උගුඩු, උරුලෑ ආදී තවත් සස්තනයෝ ද කටුසු, හිකනැල්, කබරගොයි, තලගොයි ආදි උරගයෝ ද එහි බොහෝ වෙති. සර්ප ගණයට අයත් නා, පොළොං, පිඹුරු, හබර, කරවැල්, කුණ කටු, මාපිල් ආදින්ගෙන් හිහයක් නොවේ. තවත් පත්තෑ, ගෝනුසු ආදිහු ද ඇටිබෝ, ගෙම්බෝ, පතමැඩි, ඇටිකිති ආදි මැඩි වර්ගයෝ ද වෙති. කඩි, දිමි, කුහුඹු, මැසි, මදුරු, කෝදුරු, හෝහපුටු යන සත්තු ද වන බිම දැල් බැඳගෙන වෙසෙති.

වන මැද වළ සිට ගලන කලට මය කඳුරුවල සරන මත්ස්‍ය වර්ගයෝ ද දක්නා ලැබෙති. මෙහි වසන ලොකු ම මසා 'කුරයා' නමින් හැඳින්වේ. හෝවළයා, පෙනවළයා, වළපොත්තා ඊට කුඩා මස්සු වෙති. ලූලා, වැලිහොංඩා, ගල් පාඩුරුවා, මඟුරා, හුංගා, අංගුලුවා, තෙලියා, ඉස්සා, කටුවා, පෙටියා, කණපද්ද යනුවෙන් තවත් මස් වර්ග වෙයි.

වන රාජ්‍යයට විශිෂ්ටතම අලංකාරය ලැබෙන්නේ එහි වෙසෙන පක්ෂීන් ගෙනි. මොනරා ඉන් විශාල ම සත්ත්වයා වෙයි. බකමුහුණෝ, උකුස්සෝ, ආලාවෝ, උලමෝ ඊළඟට විශාල පක්ෂීහු වෙති. 'මානා' යයි කියනු ලබන විශාල කොක්කු ද, විල් පැස්බරුන් නමින් ද හැඳින්වෙන වල් හංස වර්ගයෙක් ද වෙති. ඇටි කුකුළු, වලි කුකුළු, මාන කුකුළු, හබන් කුකුළු යන කුකුළු වර්ගයෝ ද, ගොඩබෝ, ඇලබෝ, අළුකොබෝ, නීලකොබෝ යන කොබෝ වර්ගයෝ ද, රෑන ගිරා, අළු ගිරා, බටු ගිරා, ලීනි ගිරා ආදිහු ද වනයට සුන්දර ශෝභාවක් දෙති. තල වටු, බැදි වටු, කැස් වටු යන වටු වර්ගයෝ ඇත්තාහ. සැළලිහිණියෝ, ගොන්කවුඩෝ සහ හපුකඳයෝ ජෝඩු හෝ කුඩා රංචු ගැසී සරති. අයිත්තියා, ගිනි හොරා, වලුහොරා පෙදයෙන් අලංකාර පාති. වරකමදුළු, කහ කුරුළු,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ගොයම් කුරුල්ලා, වඩු කුරුල්ලා, ගේ කුරුල්ලා, කොන්ඩ කුරුල්ලා, ගල් කුරුල්ලා යන කුරුල්ලෝ ද වෙසෙති. පාන්කිහි, පොල්කිහි, වෙල්කිහි, උස්කිහි නමින් යුක් කිත්තෝ ඉතා කුඩා පක්ෂීහු වෙති. මේ හැර ඇති තවත් නොයෙක් පක්ෂීන් අතර බොටුවා කපන්නී නම් එකෙක් ද වෙයි.

මෙසේ නොයෙක් සත්ව සමූහයාට වාසභූමි වූ මේ වනය මැද, තැනින් තැන, මය කඳුරු ආදී ජල මාර්ග ආශ්‍රයෙන් මිනිසුන් වසන ගම් පිහිටියේ ය. එවා එකිනෙකට මයිල තුන-හතරේ සිට හත-අට දක්වා දුරින් වෙයි. ඉන් සමහරෙක ගෙවල් දෙක-තුනේ සිට දහය-දොළහ-විස්ස-තිහ දක්වා ද ඇති නමුත්, එකම ගෙයකින් යුතු ගම් ද වෙයි. ගමෙක ඇති ගෙවල් සියල්ලම එකිනෙකට ඉතා ආදුරු ව, එහෙත් මිටි වැටවලින් වෙන්ව පිහිටියේ ය.

ගෙවල් නොට ගෙපැල් යනුවෙන් හැඳින්විය යුතු ඒ සියල්ල ඉඑක් පෙවිලි කරන ලද මිටි වහලවලින් යුතු ය. අඩි දෙක-තුනේ සිට හත-අට දක්වා පමණක් උස් බිත්ති සමහරක් කටු මැට්ටෙන් වසන ලද්දේ ය. ඇතැමෙක ආවරණය වූයේ උයන් හෝ මිල්ල ගස්වල පොතු පමණෙකි. කටු මැට්ට වැසෙන සේ වැලි මැටි ගා මට්ටම් කළ බිත්ති ද, දෙර උළුවහු එකක් දෙකක් ද ඇති ගෙයක් දෙකක් සමහර ගමෙක තිබුණේ ය. ඉතිරියේ දෙර උළුවසු වෙනුවට වූයේ කපොල්ලක් සහ ඒ වසන පැළැල්ලක් පමණෙකි. සෑම ගෙපැලක කාමර තිබුණේ එකකි. වැඩි ම ගණන දෙකකි. එයට දෙර කවුළු වශයෙන් තිබුණේ ද ඉදිරියෙන් වූ එක ම කපොල්ල පමණෙකි. එහෙයින් ඒ තුළ කිසි කලෙක අලුත් හුළං රැල්ලක් හෝ එළිය රැලක් හෝ නො ලබන අඳුරෙකි.

ගෙ පැල් තුළ තිබුණු උපභෝග පරිභෝග වස්තුවෙන් ම ඔවුන් ගේ ජීවන තත්ත්වය පළ විය. හැම ගෙදරෙක ම නො වරදවා තිබුණේ ළිපත්, වළං කිපයක් සහ පැදුරු කඩමාලු දෙක තුනකුත් පමණි. තවත් එකෙක වංගෙඩිය, මෝල, කුල්ල ආදි මෙවලම් විය. හේත් කාලයෙක නම් දුම් මැස්ස උඩ වේලෙන ධාන්‍ය ටිකකුත් විය හැකි ය. ඇඳක්, පුටුවක්, මේසයක් වැනි දේ ගමකට එක් ගෙයකටවත් නො විය. එහෙයින් සැලකිය යුතු අමුත්තකු ආ කල වංගෙඩිය පැත්ත පෙරළා ඒ පිට පැදුරක් දමීම සිරිත ය. මුදල් හදල් වී නම් ඒ තැබුණේ දුම් මැස්ස උඩ වළං ඇතුළේ ය. ඇදුම් පැළඳුම්වලින් ද ඔවුන් වෙත පැවැත්තේ විස්තර කළ නො හෙන හිඟයකි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ඔවුන් ගේ ප්‍රධාන ආහාරය වූයේ හේන්වල නිපැයෙන ඉරිඟු හා කුරහන්ය. පෙබරවාරිය පමණේ දී ඉඟුරු[1] කිරි වැදෙන විට මේ රටේ එනෙක් පැවැති සාගතය නිමෙන්නේ ය. ලා ඉරිඟු කරල් කිරි ඉඟුරු කියමින් ස්‍රුඑස්සා හෝ තම්බා කති. එකල ඉරිඟු කරලක් අතේ නැති ළපැටියකු ගමක නො දක්ක හැකි ය. මෝරන ඉරිඟු කොටා පිටියෙන් තලප ද, කැලි සහල් කොට ගෙන ඉන් බත් ද පිස කති. කුරහන් පිටියෙන් ද පිට්ටු, රොටී ආදී කොයිවාන් කෑ හැකි වුවත් කවුරුත් තලපයට ම කැමැති වෙති. එහෙයින් වෙන පිටි නැති කල පාන් පිටියෙන් ද තලප හැදි ගා ගනිති.

ඔවුන්ගේ ආහාරයට ලැබෙන දේ සීමා සහිත විය. වී ගොවිතැන දුෂ්කර වූ හෙයින් හේනෙන් උපන් ධාන්‍යත්, මයියොක්කා, බතලත්, බටු මිරිස්, වට්ටක්කා, පුහුල් ආදිය ඇතුළු පළා කොළ වර්ගත් අහර උදෙසා වූයේ ය. ඒ හැර ලැබුණේ මී කිරිත්, මී පැණින්, දඩ මසුන් පමණෙකි. මේ සියල්ල රැස් වන විට පෝෂ්‍යදයක ආහාරයක් සම්පූර්ණ වනු ඇත්ත වුවත් ඒ ලැබීම සඳහා ඔවුන් කළ යුතු වූයේ බලගතු සටනෙකි.

අහරටත් වඩා මෙහි ජලය හිඟ බැව් කිව යුතු ය. නියං කලට ඔය පත්ලේ පුවළකින්[2] ලැබුණේ පොල් කටුවකින් පෙරාගත යුතු වතුරෙකි. එකල නෑම වශයෙන් කරුණේ එසේ ගන්නා දියෙන් ඇඟ තෙමා ගැනුම පමණෙකි. සමහර ගම්වල ගම් සභාව මගින් තැනවුණු ළිං වුව ද එහි ද, වතුර තිබුණේ මයේ ඇති කලට පමණෙකි.

මෙහි වැස්සන් ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ගොවිතැන ම ය. එහෙත් ලැබුණු ප්‍රමාණය අවුරුද්ද යැපීමට නො සෑහිණ. එහෙයින් සෑම අවුරුද්දෙක ම නියං සමය මේ ගම්වලට දුර්භික්ෂයෙකි. පරිසරයෙහි දුෂ්කරතා මෙන් ම නුගත් නො දන්නා කම ද ඒ තත්ත්වයට හේතු විය.

මෑත යුගයේ ලක් රජය මේ පෙදෙස දියුණුවට වැඩ කරන්නට පටන්ගෙන ඇත්තේ 1924 වර්ෂයේ සිට ය. ඉන් පෙර අක්කරපත්තුවේ වන්නියාර් ගේ පාලනයට යටත් වූ හෙයින් වැව්ගම්පත්තුව යන නම පවා නො වී ය. එහෙයින් ඇත ඉතිහාසයේ දිගාමඩුලු යුගයෙන් පසු පිරිහී ගිය මේ පෙදෙසෙහි ශිෂ්ඨාචාරය 1948 දී පැවැත්තේ ඉහත දක්වුණු පරිද්දෙනි.

විනය විසින් සැහැවුණු තවත් එක් ආශ්චර්යයෙක් මේ භූමියෙහි වෙයි. එනම් සෑම අසෙක ම මයිලයක් මයිලයක් පාසා දක්නා ලැබෙන

1. ඉරිඟුවලට පළාතේ ව්‍යවහාරය ඉඟුරු ය.
2. මයේ පත්ළ හාරා දිය ගන්නා වළ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner



කැලෑ ගම්වල ළමා ජීවිත

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

වෙඩික්කාර බොටාලා

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

පැරැණි සිංහල සභ්‍යත්වයට දෙස් කියන නටඹුන් ය. සෑම හෙල් මුදුනක් පාසා පැරැණි දගැබ්, විටමඵ ආදියෙහි නටඹුන් වෙයි. හෙල් බෑවුම්වල ඒ ඒ නැන කටාරම් කෙටූ ගල් ගෙවිල් ය. ඉන් පහත තැනි තලාවේ සෑම මෙසේනෙ ම ගල් පිළිම, කුළුණු, කොරවක් ගල්, සඳකඩ පහන් ආදියෙහි නටඹුන් දක්ක හැකි ය.

පුරාණ දිස මණ්ඩලයේ ශ්‍රී සමෘද්ධිය ඒ නටඹුන් දේ අතරින් අදත් දක්ක හැකි ය. එකල මෙහි හෙල් මුදුන්වල සිට ගං ඉවුරු තෙක් හැම බිම් අඟලක් ම මනුෂ්‍ය පරිහරණයෙහි යෙදුණු බැව් නිසැක ය. මහා පරාක්‍රම බාහු රජ තුමන් පැවැසූ පරිදි පොළොවට වැටෙන එක වැසි බිඳක් වත් අපතේ යා නො දී රකිනු පිණිස බැඳුණු වැව් මෙහි බැවුමක් බැවුමක් පාසා විය. එක් එක් වැවක් පහළ ගැමියනට සම්පත් සැදෙන කුඹුරු යායෙකි. අංශයෙක පලතුරින් ඵලවඵයෙන් පිරි, ගොඩ ඉඩම්වල සුන්දර නිරහංකාර ගෙවිල් ය. ගමේ උස ම බිම හෝ හෙල් මුදුන්හි සංඝයා වහන්සේ ගෙන් ගුද්ධ වූ විහාරාරාමයෝ වූහ. එහෙයින් සම්පත්තියෙන් ආඪ්‍ය වූ ද, ගුණධර්මයෙන් උත්කෘෂ්ට වූ ද මනුත් ජනසමූහයෙක් එකල මෙහි විසූ හ.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

3

මල්ලිට ලියුමක්

ආදර මල්ලී,

වැවිගම් පත්තුවේ කැලෑ මැද පිහිටි ගම් පිළිබඳ ව අපූරු තොරතුරු රැසක් ඔබට දක්වනු පිණිස මෙය ලියමි.

එක් සැන්දවෙක මා, තනිව අක්කර පත්තුවේ සිට එරගම නොහොත් රජගමට ගිය පිස්සු ගමනෙක විස්තර ඔබට ලියා ඇති. එ බදු විකාර ගමෙනක නොයෙ දී, කවුරුනුත් කරන පරිදි අක්කරපත්තුවෙන් රෑ කෑම කා කරත්ත බැන්ද කල, පාන්දර දෙක තුන වන විට රජගම හන්දියට ළඟාවිය හැකි. පැවැති කාලයෙක නම් සුදු මහතා ගේ කඩෙන් කැමැති පානයකුත් කොට බුලත්, සුරුට්ටු ආදිය ද ලැබගෙන පිටත් වූ කල එළිවන විට වැවිගම් පත්තුවට ළඟා විය හැකි ය. එහෙයින් අලුත් දවසකට පණිවුඩ ගෙනෙන අරුණාලෝකයෙන් ම ඔබට දිගාමඩුල්ලේ ආශ්චර්යයෙක් පෙනෙන්නේ ය.

අක්කරපත්තු සීමාවෙන් වැවිගම් පත්තුවට ඇතුළු වී මඳ දුරක් යන විට පැරැණි නටබුන් වැවක් අසල 'කරලෑව' නම් නයිකාර ගමෙක් වෙයි. පාරෙන් ඈත, වන පඳුරින් ආවරණ ව, මැනවින් නො පෙනෙන එයි නයිකාර පරපුරක් වෙසෙන පැල් කිහිපයෙකි. මේ පැල් තල අතු වලින් නොව, කණු සිටුවා, වහල සද, ඉළුක් සෙවිල්ලා තිබිණි. එහෙත් දිග මහතින් ඒවා ද තල අතු පැල් වැනි ම විය.

ගම් දෙරකඩ මිනිස් කරවටක් උසින් තැනුණු ඉණිමගක් ඇති සවිබල මැස්සෙකි. එය ගමට පැමිණෙන කුලවත් ආගන්තුකයන් උදෙසා විය. නොයෙක් ගනු දෙනු සඳහා අහල පහල සිංහලයෝ ද, මූදුකරයෙන් සංක්‍රමණය වන දෙමළ මරක්කල ජාවාරියෝ ද ඔවුන් වෙත පැමිණෙති.

නයිකාරයෝ ජීවිකා වෘත්තිය සඳහා, කොතැනත් කරන නයින් නැටවීම, සාස්තර කීම හැරුණු විට, එළුවන්, කුකුළන් ආදී සතුන් ඇති

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

කිරීමත්, දඩයමත් කළහ. ඒ දෙකම නියා කලින් කල ඒ ඒ තැන්වලට පදිංචියට ද ගියහ. දඩයමට පුරුදු බල්ලෝ ද ඔවුන් වෙත වූහ.

කෙසේ නමුත් ඔවුන් අතර ද නැති බැරි කම් සහ පොහොයත් කම් ද, නැත්තන් සහ ලොක්කන් ද ඇති බව පෙනිණි. ඇතිකරන යකුන්, නටවන නයින්-පොළඟුන්, ගැහැණුන් ගේ අතකර පිරුවෙන අබරණ සහ පිත්තල, ඇලුමිනියම් හැළි වළං ද, කැති පිහියා ආදී අවි-මෙවලම් ද ඔවුන් ගේ වස්තුව සේ ගැනිණි.

වැව්ගම් පත්තුවට පැමිණි අලුත ම මේ නයිකාර ගම පිළිබඳ කදිම පුවතෙක් මට ලැබිණ. එනම් එ ගම නායක නයිකාරයාගේ තරුණ දියණියක ඇති බවත් ඇය සරණ ගන්නා සිංහලයකුට මහු මුදලින් රුපියල් දෙදහසක් සමග සතුන් අවි-මෙවලම් ආදියෙන් දයාදයක් දෙන බවත් ය. පුවත පමණක් නොව එය අසා, ඊට කැමැත්තෙන් වැඩිදුර තොරතුරු සොයන සිංහලයකු ද මට හමුවිය. රස්සාව නැති රියැදුරකු වූ හේ කල්පනා කෙළේ, දුව නොව පුළුවන් නම් දයාදය ගෙන පලායාම ය. එහෙත් මහු ගේ අදහස හරි නො යන බවත්, පුවත ඇත්තක් නො විය හැකි බවත් ඒ ගමට පැමිණීමෙන් පසු මට පැහැදිළි විය.

නායක නයිකාරයාට දියණියෝ එකකු නොව දෙතුන් දෙනෙක් ම උන්හ. ඔවුන් ගෙන් වැඩි මහලු දුව පාවා දෙන ලද බැණා එම ගෝත්‍රයේ ම උපන් හපන් තරුණයෙකි. රස්සාව නැති සිංහල අලයකුට වඩා මහු එබඳු තරුණයකු ම ප්‍රිය කරන බව නිසැක ය.

නයිකාරයන් හා රජයේ සම්බන්ධයක් නැත. ජන ලේඛනයනට හෝ ඡන්ද දයකයන් වශයෙන් හෝ ඔවුහු නො ගැණෙති. ගම් නායකයා සියලු ගැමියන් ගේ පාලකයා විය. අයකු වරදක් කළ විට දඩ ගසා, ඉන් අරක්කු ගෙන සියල්ලන් බී ප්‍රීති වීම සිරිත ය. සමහරුන් කංඩායමෙන් නෙරපීම ද දඩුවම් වශයෙන් කරනු ලැබේ.

කරලැව ගමේ ජන ගහණය තිසක් පමණ විය. අප යද්දී ඒ සියල්ලෝ ම වැඩක් පලක් නැතිව අලස ලෙස ඒ ඒ තැන වැතිර උන්හ. සමහර ගැහැණු පමණක් ඒ ඒ වැඩවල යෙදී සිටියහ. ගම පිටිපස හෙල අයිනේ කඳුරට ගිය ගැහැණු කීප දෙනෙක් වතුර පිරවූ කළ ගෙඩි ගොඩක් බැගින් හිස් මතින් ගෙන විජ්ජාවක් කරන ආඩම්බරයෙන් ගමට ආහ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මේ කංඩායමෙහි එක්තරා නැට්ටුවෙක් ද විය. හේ මහලු ය. දුබල ය. එක් අතකුත්, එක් පයකුත් කොර හෙයින් තවත් ඔත්පොළ ය. එහෙත් හෙතෙම හැරමිටි වාරුවෙන් අසල ගම්වල ඇවිදිමින් එක්තරා රැහුමෙකින් ගැමියන් සතුටු කොට යමක් ලැබ දිවි ගෙවයි. එද අප යන විට ගම කොනෙක ගසක් මුල හේ උන්නේ ය. ලොකු මුදලක් උදෙසාවත් එද නම් උන් තැනින් සෙල්විය නො හැකි වී. ගමේ දී හෝ ගෝත්‍රයේ සෙස්සන් ඉදිරියේ දී හෝ නො නැටීම ඔහු ගේ සිරිතෙකි. හේතුව අනෙකකු එය උගනිතැ යි බිය ය.

එහෙත් මේ නැට්ටුවාත්, ඔහුගේ රැහුම හා ගීයත් අහල පහල සිංහල ගම්වලට හොඳ හැටි පුරුදු ය. ඒ එහි දී එපමණට සුලබ ය. වැඩි හරියක් සුදු වුණු තුනී කෙස් වැටිය මුදුනින් දෙකට බෙද පීරාගෙන, නිකට පුරා වැඩුණු සුදු රැවුළ ද එසේ ම පීරා බැඳගෙන, පොදියක් පිට බැඳගෙන ගාට-ගාට, හේ ගෙයක් ගානේ එයි. අවුත් "හාන්දුන්නේ, නටංඩ අවසර !" යි කියයි. අවසරය ලැබුණා හෝ නො ලැබුණා හෝ, නො නටා හෝ, යමක් නොගෙන නම් හේ අහක නො යන්නේ ය.

නැටුමට සැරසෙන හේ වට පිට බලා පොදියත්, හැරමිටියත් අයිනකින් තබා නැඟී සිටින්නේ ය. එසේ සිට කොර අතත්, කොර පයත් ඉහළට ඔසවා ගන්නේ ය. එවිට ඔබට පෙනෙන්නේ අතේ-පයේ ඇත්තේ කොරයක් නොව නාට්‍ය මුද්‍රාවකි. නිසැකයෙන් ඒ අංග දෙක පමණක් නොව ඔහුගේ මුළු සිරුර ම නාට්‍ය විලාසයෙකි. හදවත් ගිරි මුදුනින් දයා දිය දහර එක පැහැර ගැළෙන සේ අත්ත අභාග්‍ය දුගී බව නිරූපණය කිරීමෙහි යම් නළුවකු සමත් වතොත්, ඒ මේ නයිකාර නැට්ටුවා මිස අනෙකෙක් නො වේ.

ඔහු ගේ ඇඳුම දන ළඟට ඇඳගත් කිළුටු සරොම් කැබැල්ලෙකි. පටියක් වෙනුවට ඉණේ එතුණු තවෙකෙකි. උඩු කය අඩෙකින් වැසෙන මේස් බැනියම් කබෙලෙකි. පීරා සකස් වුණු කෙස් රැවුළු අතරෙන් ඇයි පෙනුණු, දත් නැති මුවෙන් දැක්වෙන ආයාචනීය ස්වරූපය දුටු කල, උණු නොවන හදවතක්, මිනිස් හදවතක් විය නො හැකි ය.

එහෙත් ඔහු ගේ නැටුමේත්, ගීයේත් ඇති අලංකාරය එපමණක් ම ය. හේ කොර අතේ මුද්‍රාව පාමින් කුමක්දෝ නො තේරෙන බසකින් ගීයක් ගය-ගයා නටයි. ගම් දරුවෝ ඒ බලා හිඳ ඔහු ගිය පසු වෙලාවකට ඒ ඒ තැන රැස්ව ඒ ගීය ම ඒ අනුව ගයමින් නටති. සිනමා වේ හෝ වේදිකා නළුවෙක හෝ මිහිර නො ලබන මේ රටට සංගීත රසය උදා වන්නේ එවිට ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ගීය මෙ වැනි ය.

බෝලෝ බෝලෝ බොංගෙයියා
බංගා රක්කා රංගෙයියා
වනගිට කොක්කුම් චම්බාටි
අඩ.... .... ල .... ප..... ඩා ... රේ!
අත්තන කලුව හඩ පඩා
බොකන කලුව හඩ පඩා
ඔක්කන වෙකුම් මා පුල්ලේ
අවරා.... ක .... ලා !

කරලෑවේ නයිකාර ගම පසුකොට මයිල දෙකහමාරක් ගිය තැන හිඟුරාන නම් ගමෙකි. ඔළි නම් කුලයකට අයත් පවුල් විස්සක් පමණ එ ගම වෙසෙති. ඒ මිනිසුනට බංජනයෝ යයි ද, ගමට බංජන ගම යයි ද මේ පළාතේ කුලීන යයි කියන ඇත්තෝ ව්‍යවහාර කරති. එහෙත් ඔවුනු ද ඒ කුලීනයන් මෙන් ම සිංහල ආරය පළ කැරෙන රූප ලක්ෂණ ඇති උත්සාහවත් හොඳ මිනිස්සු වෙති.

මෙ ගම මිනිසුන්ගේ නම්වලට දෙමළ ඌරුව තදින් වැදී ඇති බව පෙනේ. සමහර පිරිමි නම් පෙරුමා, මුරුගා, වේලා ආදිය වෙයි. සබෝනා, දදෝනා, හුදී ආදී ගැහැණු නම් හා ආඩියා, අබංචියා, බම්බා, මැද්දමා ආදී පිරිමි නම් ද වෙයි. කනවදි යි නමක් ද හිඟුරානේ දෙ තුන් දෙනකුටත්, අනෙක් ගම්වලත් ඇත්තේ ය. කනවදි ගම දෙමළ ගණපති යන්නෙහි පෙරළියෙකි. මෙසේ දෙමළ ඌරුව ගැනීමට හේතුව 1924 න් පෙර එහි පැවැති වන්නියාර් පාලනය යි. එකල ඒ ගම දෙමළ බස හදුරවන පාසලකුත් තිබුණේලු. එහෙයින් සමහරු සිංහල කථා කළ නමුත් දෙමළ පමණක් ලියන්නට, කියවන්නට දත්ත.

හිඟුරාන පසු කොට මයිල තුනක් ගිය තැන දමන නම් ගම හමු වෙයි. දමන ගමක් වුව ද වැව්ගම්පත්තුවේ යටි පළාතේ අගනුවර ද වෙයි. ගලඔයෙන් වැව්ගම් පත්තුව කොටස් දෙකකට බෙදෙන බව යට කියැවිණ. ඒ උඩ-මැද පළාත හා යටි පළාත නම්. ඉන් උඩ පළාතේ අගනුවර උහන ය. යටි පළාතේ අගනුවර දමන ය. මේවාට අගනුවර යි කියන්නේ ද කරුණු නැතිව නො වේ.

දමන පිහිටියේ අක්කරපත්තුවේ සිට එන මහ පෙරමුණ, යටි පළාතේ මධ්‍යයෙහි ය. එතැනින් දෙපසට බෙදී යන රෝද පාර එක් පසෙකින් මඩවලලන්දට සහ තොට්ටමට ද, අනෙක් පසින් පාදගොඩට ද පැමිණේ. පාදගොඩින් යළි දෙකට බෙදී එක් අතෙකින් වඩිනාගල,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යෝද ඇල, ලන්දේගම ආදී ගම්වලටත්, අනෙක් අතින් සේනානායක සමුද්‍රයේ වතුරෙන් යට ව ගිය ගමක් වූ කොස්සපොලටත් යැවිණ. මේ සියලු ගම් අයත් රජයේ ආයතන දමනේ පිහිටියේ ය. යටි පළාත කරවන කෝරාළ ගේ කාර්යාලයයත්, ගම් කාරිය සභාව, ගම්සබා උසාවිය, රජයේ බෙහෙත් සල, යටි පළාතට වූ එක ම තැපැල් පළ, හැම ගමකට බඩු සැපැයෙන සමුපකාර කඩය ආදී සියලු අංගෝපාංග එහි ම වූයේ ය. එහෙයින් මයිල දසයක් දුර තොට්ටමින් ද, පසළොසක් දුර කොස්සපොලින් ද, සතළොසක් දුර ලන්දෙගමින් ද ලුණු ගැනීමේ පටන් නඩු කීම දක්වා ඇති සියලු කටයුතු සඳහා බොහෝ දෙන එහි නිතර පැමිණියහ. නොයෙක් රාජකාරි සඳහා විවිධ කාර්යාංශයන්ගෙන් එන නිලධාරි ආගන්තුකයෝ ද එහි වූහ.

එහෙත් මේ අගනුවරට එන අමුත්තන් මතක තබාගත යුතු කරුණක් ද විය. එනම් කිසිවකුට තේ කෝප්පයක්, සුරුට්ටුවක් පමණවත් ලැබිය හැකි පොදු තැනක් එහි නුවූ බව ය. මයිල භයක් දුර එරගමින් මොබ එබදු තැන් නුවූයෙන් පැමිණෙන අමුත්තන් උවමනා සියල්ල ගෙන ආ යුතු විය.

දමන නම් වූ මේ අගනුවර එක්ගල් ආරූ නම් මයෙන් දෙ කොටසකට බෙදිණි. ඔයෙන් ඔබ ගැමියන්ගේ ගේ - දෙර විය. මොබ, එකම බිම් කැබැල්ලෙක යටකී කාර්යාල සියල්ල පිහිටි රාජකාරි නගරය විය. එන අමුත්තකු පළමුවෙන් පැමිණෙනුයේ ද මේ රාජකාරි නගරයට යි.

රාජකාරි නගරයට එන ඔබ නෙතට පළමුකොට හමු වන්නේ නවීන දිගාමඩුල්ලේ ආශ්චර්‍යයෙකි. ළඟ-ළඟ ම පිහිටි ගම්සබා උසාවියත්, බෙහෙත් හලත් එකිනෙකට නො පරදින සේ ජරාවාස වූ පුංචි ගෙවල් දෙකෙකි. වහළවලට බඳින ලද පොල්අතුවල කොළ දිරා ගොස් ඉතිරිව පෙනුණේ ඉරටු පමණෙකි. වැස්සෙන් ගරා වැටුණු බිත්තිවල මැටි බිම ගොඩ ගැසිණ. එහෙයින් සතියකට වරක් බෙහෙත් බෝතල පෙට්ටියක් ද ගෙන බර කරත්තයෙන් ආ දෙස්තර මහතා ලෙඩුන් පිළි ගත්තේ අල්ලපු ඉඩමේ පිහිටි පාසලේ දී ය. මසකට වරක් එන ගම්සබා උසාවිය පැවැත්වුණේ ජරාවාස ගොඩනැගිල්ල පසෙක දෙසි ගස් අතර වූ ලොකු කොස් ගසක් යට ය. ආදි කාලයේ අපේ මුතුන් මිත්තන් ද ගස්යට ගම්සබා පැවැත්වූ බව කියැවේ. ලොකාවසාන යුගයෙහි මිනිසුන් තුත්තිරි ගස් යට නඩු අසන කලකුත් එන බව කියනු ලැබේ. එහෙත් විසිවැනි ශත වර්ෂයේ දී කොස්ගසක් යට නඩු ඇසීම ආශ්චර්‍යයක් නො වන්නේ අලුත් දිගාමඩුල්ලට පමණෙකි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පාසල ද අතු සෙවිලි කොට ගොම-මැටි ගාන ගොඩනැගිල්ලෙකි. එහෙත් එය නපුරු නැකතෙකින් පටන්-ගෙන දෝ පැමිණෙන ගුරුවරයකු අවුරුද්දක් සිටියේ කලාතුරෙකිනි. එහෙයින් ම දෝ එයින් ඉගෙන දියුණු වූවෙක් ද පළාතේ නො වීය. එපමණක් නො ව ඊට යාව ඉඩමේ වූ සමුපකාර කඩය ද බංකොලොත්ය. ඒ ඉදිරිපිට වැව අයිනේ රමණීය භූමියෙක කලක් පැවැති පන්සල ද පාලුවට ගියේ ය. මේ සියල්ල ව්‍යසනයට හේතු විමයන මට අසන්නට ලැබුණේ, එ බිමට අරක්ගත් බහිරවයකු පිළිබඳ කතාවෙකි. තවත් රසවත් පුවතක් ද ඇදී ඇති නමුත් -මල්ලි, එය නව කථාවක් නො වන බව ඔබ තරයේ සිතට ගත යුතු ය.

ගම්සබා වත්ත දෙසි, දෙඩම් ආදී ගසින් පිරුණු අඳුරු ඉඩමෙකි. එහි දිරා ගිය බෙහෙත් හල හා උසාවිය අතරේ පිටිපසින් ගල් ගොඩැල්ලකි. එම වත්ත පිටු පස වනය අසබඩ ගෙයෙක ගම් සබා මුරකරු වූ කළුබංඩා විසී ය. හේ රාජකාරියෙන් ලබන පඩියට වඩා ගොවිතැන කෙරෙහි විශ්වාසය තැබූ පුරුෂයෙකි. කළු උස දළ-දඩු මිනිසකු වූ ඔහුගේ දියණිය මේ කතාවේ නායිකාව ය.

ඇගේ නම 'රණී' ය. දවසකට විසි විඩයක් ඕ මගේ වාඩි දෙරකඩින් වතුරට ගියා ය. පළමුවෙන් මම ඇය දෙමළ ගැහැණියකැ යි සිතීමි.

ඕ කළු ය. පාරට්ටුවෙන් කිව හැකි පමණ කළු ය. බෙහෙවින් රතු පැහැය ප්‍රිය කළ ඈ දෙමළ තාලයට ම හැන්ද ය. එහෙත් පළාතේ සිංහලයෙන් කතා කරන විට ඇගේ සිංහල බවත්, කදිම රූප ලක්ෂණයත් පළ විය. ඕ කළු වුව ද කිසි ලෙසකින් අශෝභන නුවූවා ය. රණී, සැප පතන තරුණ ගොවියකුට සුදුසු නො කම්මැලි නිරහංකාර සිංහල බිරිඳක බව මඳ කලෙකින් මට පෙනිණ.

කළුබංඩා මා හා කී පුවත අනුව, පළමුවෙන් ම රණීට ආලය කෙළේ මේ බිමට අරක්ගත් බහිරවයා ය.

බහිරවයා, දිගු රැවුළකින් යුතු මිටි මිනිසකු ගේ වේෂයෙන් පියා ඉදිරියෙහි සිහිනෙන් පෙනී සිට එම ඉඩමේ වළලා ඇති නිධානයක් මතු කැර දෙන බැව් කියා දියණිය බිලි පිණිස ඉල්ලී ය. එහෙත් කළුබංඩා ඊට එකඟ නො වී ය. මුල දී මේ ඉල්ලීම කැරුණේ රණී තුන් හැවිරිදි වියැ සිටිය දී ය. ඊට පසුත් දෙ වතාවක් ඉල්ලීම කැරිණි. ගම්සබා වත්තේ එක් තැනෙක නිධානයක් වළලා ඇති බවත්, එය මතුකොට දෙන්නට නම්, කෙසෙල් ගෙඩි සියයක්, බුලත් පුවක් සියය බැගින් ආදී කොට බොහෝ පුද පඬුරු ඇතිව යාගයක් කළ යුතු බවත්, එ සමග

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

රණී ද බිලි කොට දෙන්නට එකඟ විය යුතු බවත් බහිරවයා කළු බංඩාට කී ය. එහෙත් එය තුවූයෙන් රණී අදත් ජීවත් වන්නී ය.

එසේ වුව ද කැමැති වූ බිල්ල නො ලත් බහිරව තෙමේ තමන් බලය පවතින බිමට අයත් සෑම තැනෙකින්, සෑම අයකු ගෙන් ඊට පළි ගත්තේ ය. රණීට පසුව උපන් පිරිමි දරුවෝ පස් දෙනෙක් ම අවුරුද්දක් වයස් නො වී මිය ගියහ. ඉන් පසු ගම්සබා වත්තේ පිහිටි උසාවියත්, බෙහෙත් හලත් කඩා වැටුණේ ය. එයින් මුර කරන්නට උසාවියක් නැතිවීම නිසා කළුබංඩාට දහ හත් අවුරුද්දක් කළ රක්ෂාව ද නැති විය.

බහිරවයා එපමණකින් ද නැවතුණේ නැති. ඊට යා ඉඩමේ පිහිටි පාසලෙන් ද ඔහු පළිගන්නට සිතුවා විය යුතු ය. පාසල් වත්තට දෙ පැත්තකින් තිබුණේ කෝරාළ ගේ ඉඩම ය. තවත් පැත්තෙකින් ගම්සබා වත්ත ය. ඉතිරි පැත්තෙන් පාරත්, වෙල් යායකුත් විය. මේ තරම් ආරක්ෂා සහිතව තිබිය දීත් පාසල් වත්තේ වැවෙන බෝග හැම ද ම නැති විය. ගුරුවරයාගේ පුටුව මාස දෙක තුනෙන් තවත් ඉන්නට බැරි තැනට රත් විය. එහෙයින් හේ වෙන පාසලක් බලා ගියේ ය. මෙසේ වරින් වර ගුරුවරුන් මාරු වීම නිසා ගමට සපල සේවයක් ඉන් නො කැරිණි.

ඊළඟ ඉඩමේ වූ සමුපකාරයට ද ලැබුවේ බහිරව අපලය ම විය යුතුය. වැව්ගම් පත්තු යටි පළාතේ හැම ගමකට ම සියලු බඩු සැපයූ ඒ කඩය දිළිඳු ගම් වැසියන්ගේ මුදල් නාස්ති කොට බංකොලොත් ලැබුයේ එහෙයිනි.

සමුපකාරය ඉදිරිපිට වැව අයිනේ උස් ගොඩැල්ලක පන්සල පිහිටියේ ය. අක්කර පත්තුවේ විජයාරාමයෙන් පැමිණි ගුණවත්-සිල්වත් තෙර නමක්, කලක් එහි වැඩ වෙසෙමින් එය දියුණු කරන්නට සියලු වෑයම් දැරී ය. දයකයෝ හැකි පමණ මුදල් ද එක් කළහ. පින් කම් කරන්නට නොයෙක් වැර දැරූහ. එහෙත් අන්තිමේ දී හාමුදුරුවන්ට දනය පවා වරදින තැනට කටයුතු සිදුවීමෙන් එය අත් හැර යන්නට සිදු විය. එතැන ඉතිරි වූ සංඝාවාසය පිණිස තැනැවුණු ගෙය, පසුව, ගැමියන් ගොනුන්, මුවන් මස් කිරීමට පවා යොදන ලද්දේ ය. ඇද්ද බහිරවයාගේ වෛරයක තරම !

බහිරවයාගේ අපලවලින් බේරී ඒ භූමියෙහි රැඳුණේ කෝරාළ පමණෙකි. ඔහු බහිරවයා බැඳගෙන ඇති බව ඇතැම්මු කී හ. එහෙයින් ම දෝ අවුරුදු හත-අටකින් ඔහුට නවීන පන්නයේ ගෙයක් - යටි

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පළාතට ඇති 'ගෙයකැ' යි නිසැක ව කිව හැකි එක ම ගෙය - තනා ගෙන සැපසේ විසිය හැකි විය. කෝරාළ, බහිරවයකුට තබා ඊටත් ලොකු යකකුට හෝ නො රැවටෙන පිරිසිදු නියුණු කල්පනා ඇති, අලුත් දිගාමඩුල්ලේ උපතත්, කොළඹ හැදුනකු මෙන් ආචාර සමාචාර දන්නා, වාසනාවන්ත දරු පවුලක් ඇති නුවණැති පුද්ගලයෙකි. අදත් දමනට යන්නකුට මේ කියන දේ සැබෑ බව සියැසින් දක්ක හැකි ය.

මල්ලි, මේ කතාවෙන් මා කෙළේ මට දකින්නට ලැබුණු ඒ ඒ දේ ගමේ කියැවුණු බහිරව කතාව හා සම්බන්ධ කොට දැක්වීම පමණෙකි. එහි යථා තත්ත්වය වටහා ගැනුම උගත් ඔබට අපහසුවෙක් නො වේ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

4

නෙල්ලි කැලේ

දිමන-අගනුවරින් දකුණු දෙසට මුහුණ ලා යන පාරේ යන්නෙක්, අලහේන, වරාලන්ද, මඩාන නම් කුඩා ගම් තුනක් පසුකොට මඩවල ලන්දට පැමිණේ. ඒ ගම් එනිනෙකෙක ගෙවල් හත-අට බැගින් ද, ජනගහණය විස්ස-තිහ පමණ ද වෙයි. මඩවල ලන්ද ගෙවල් විස්සක් පමණ හා හැට-හැත්තෑවක ජනගහණයක් ද ඇති, රජයේ පාසලක් ද පිහිටි ගමෙකි. එහි ගම මැද ගම්සබාව මගින් කැප්පූ ළිදෙක් ද ඇත්තේ ය.

මඩවල ලන්දෙන් පිටත් ව මහ වනය මැදින් මයිල භයක් ගිය කල තොට්ටමට පැමිණිය හැකි ය. මෙ අතර අම්බලම් ඔය නම් ඔයෙක් වෙයි. ඒ දෙතෙර නිතර ගැවැසෙන අලි-වලසුන් ඇති මහ වනයයි. ඉන් මෑත බොහෝ දුරක් ම ඉඑකින් වැසුණු තලාව ය. දවසක් අපි තොට්ටම පන්සල් යද්දී, ඒ තලාවෙක සිට වනයට දිවෙන වලසකු දුටිමු. තණ කන මුව රංචු ද එහි දී නිතර දක්ක හැකි ය. කරත්තය දක මුවෝ නුදුවති. කරත්තය මිනිසුන්ගේ දෙයක් බව නො දන දෝ, නැතහොත් වඩා පැහැදිලිව පෙනෙන ගොනුන් හා ඇති සැක-බිය රහිත බව නිසා දෝ, මුවෝ කරත්තයේ හඬ අසා හිස් ඔසොවා, කන් කෙළින් කොටගෙන බලා සිටිති. පින්තූරවලත්, චිත්‍රපටි ආදියෙනුත් කවුරුත් මුව රංචු දකිතත්, වනයේ මුවන් දකිම අමුතු ආශ්චර්‍යයකි.

තොට්ටම, පළාතේ හැටියට දියුණු ගමෙකි. එහි පාසලෙක් ද, පන්සලෙක් ද ඇත්තේ ය. විස්සක් පමණ වූ ගෙවල, මිනිස්සු සියයකට අඩු ගණනෙක් විසූ හ. තැනිතලා වැලි බිමෙක පිහිටි ගම මැද පන්සල විය. පන්සල ද ගෙවල් මෙන් ම ඉඑක් සෙවිලි කළ පැල් වැනි ගොඩනැගිලි වලින් යුතු, වයසට මහණ වුණු එක් සහ නමක් වෙසෙන තැනෙකි. එහි පින් කම් කැරෙන දට බුරු ගැහීම ද ඒ අසල නිබඳව ම කැරෙන්නේ ය. පළාතේ කොතැනත්, ඉලව්වක්, මහුලක්, තොවිලයක්, පින්කමක් වූවොත්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

හූදුව ද නො වරදවා කැරෙන හෙයින් එය තොට්ටමට පමණක් අරුමයෙක් නො වේ.

එද අප තොට්ටම පන්සල් යන්නට කරත්තය බඳින විට, මුතුබංඩාගේ අප්පච්චි ඔහුට දුන් අවවාදය මට තවමත් මතක ය.

"පුත, තැන තැන දුව-පැන ඇවිදින්නේ නැතුං බලා-ගෙන එන්ඩ ඕනැ-එක එකා අංගම් පිඹින් !"

මේ ඔහු කී සැටියි. අංගම් පිඹීම මෙහි පන්සල්වල දී නිතර කැරෙන හාස්කමෙකි. මන්තර දන්නන් ඔවුන් ගේ බල පළ කරනු පිණිසත්, තරහ අය ගෙන් පළිගන්නා පිණිසත් කරන බැව් කියනු ලැබේ. පිඹුණු අංගම වැදෙන්නෝ නාහින් කටින් ලේ දමාගෙන සිහි නැතිව ඇද වැටෙති. සමහරු මායම් වන්නට පටන් ගනිති. එය සුව කළ හැක්කේ ද නැවත ආපසු මන්තරය ජප කිරීමෙනැ යි කියති.

එක් පින්කම් රැයෙක නබවෙහෙරැ දී ගැහැණියක අංගමක් වැදී දහලනු මම දිටිමි. කොක්නහර නම් ගමින් අපේ නඩයේ ම ගොස් සිටි ඕ, තිස් හැවිරිදි පමණ ඇති දරු මල්ලන් සහිත කතක් වූවා ය. පන්සලේ සිට යන්නට යන ගමන් දෙරටුව අසල දී වෙළෙන්දකු ගෙන් බුලත් විට ගන්නට අපි නතර වුනෙමු. ගමේ ම තවත් ගැහැණු-පිරිමින් අතර සිටි ඕ තොමෝ හදිසියෙන් ම දත් ඉහළ ඔසොවා කෑ ගසමින් දහලන්නට වූවා ය. "අංගමක්-අංගමක්" කියමින් ඇගේ ම මස්සිනා වන අයෙක් ඉදිරියට පැන පිටිපසින් දෙවුර බද ඇය අල්ලාගෙන ඉහළ එසෙවී ය. එවිට ඇ අත් පා ගසන්නට වූයෙන් තවත් අය ඒවා ද අල්ලා මිරිකාගත්හ. ඔමත් එක් පයෙකින් අල්ලාගෙන නිසල කරවන්නට වැයම් කළෙමි. අප හා අවුත් සිටි දමන යකුන්නැහේ වතුරට මතුරා ඇගේ මුහුණට ගැසී ය. ඉන් පසු ඕ සුවපත් වූවා ය. එහෙත් පරීක්ෂාවෙන් ඇගේ නෙත් දෙස මුල සිට බලා සිටි මට වියරු බැල්මක් නම් එහි නො පෙනිණි.

අංගම් ගැන තොරතුරු, අපි පසුව ද සෙවීමු. දමන පරිෂාරි[1] මට ඒ මන්තරයක් ද ලියා දුන්නේ ය. ගම්මිරිස් ඇට කීපයක් ඒ මන්තරයෙන් එකසිය අට වරක් මතුරා, කටේ ලා, සපා, උඩු සුළඟින් සිට පිඹිය යුතු බැව් හේ කියයි. එහෙත් මා සත්ත බැලූයේ නැත.

මා දන්නා මුල් කාලයේ තොට්ටම මිනිස්සු කංසා වැවීම සරුවට කළහ. ඔවුහු ගමෙන් මයිල තුන හතර ඇත ගොස් හේන් කොටා

1. වෙදරාළ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පුළුස්සා කල් බලා කංසා ඇට වපුරති. සතුන් ගෙන් වැඩි හානියක් නු වූ හෙයින් පැල් රැකීමත් අනවශ්‍ය ය. හේන් පැසුණු කල එහි ගොස් ඒවා කපා අසල ගල් තලා මත වනා, වියළීමෙන් පසු ගෝනි පුරවා ගල් ගෙවිල්වල දමති. එකල මූදුකරයෙන් දෙමළ-මුස්ලිම් ජාවාරියෝ නොයෙක් වෙළඳ බඩු ගෙන පැමිණෙති. ගම්මු ඔවුන්ගෙන් ඒ බඩු ද, සිය දහස් ගණනින් මුදල් ද ඒවා දී ලබා ගනිති.

මේ මුදලින් ම ගම පොහොසත් කාලයෙක. එක් රැයක් අපි තොට්ටම ගත කෙළෙමු. අන් කවර දකවත් නැති විසිතුරු එදින එහි විය. මුළු ගමම එකම මහුල් ගෙයක් බඳු ය. ගමේ ලොකු කුඩා සියලු දෙන අත විදුලි පන්දම් ය. හැම මුවෙක නැවිකට් දුම් වැටී ය. දෙපා නා නා මොස්තරයේ පා වහනින් වැසී පෙනෙයි. අලුත් සරොම්-බැනියම් ද, ලේන්සු ද, සුවඳ සබන්, පුයර ආදිය ද එකලට අමුතු ම සිරියෙකි. ගෙයක් ගෙයක් පාසා මසවුළු සුවඳ නික්මෙන අතර ලොකු-කුඩා සියලු පිරිමි හූදුවෙහි යෙදී කල් ගෙවති.

එහෙත් මේ අසිරිය පවත්නේ මඳ කලෙකි. එකලට පිටතින් පැමිණෙන හූදු කාරයන් ද ජාවාරියන් සමග කෙළින හූදුවෙනුත්, පමණ ඉක්මවන වියදමෙනුත් සියලු මුදල් වහ වහා වැය ව යන හෙයිනි. ඉන්පසු යළිත් ගම සංසුන් ව පුරුදු දරිද්‍රතාවයට පත්වන හෙයිනි. කලකට පමණක් ලැබුණු මේ උදරම ද, පසුකල නිලධාරීන් අත දැමීම නිසා කංසා වැවිල්ල අත් හිටියෙන්, නැති විය.

දමන-අගනුවරින් බටහිර දෙසට විහිදෙන මාවතේ මයිල පහක් පමණ ගියතැන පාදගොඩ නම් ගමෙකි. මේ ගම් දෙක අතර 'තෙල්ලි කැලේ' නමින් හැඳින්වෙන ආශ්චර්යමත් අලංකාරයෙකින් යුත් බිම් පෙදෙසක් වෙයි. ප්‍රමාණයෙන් අක්කර තුන්දහසක් පමණ වෙතැයි කියන ඒ බිමෙහි ගල්තලා සහ හෙල් අතර නා නා වර්ගීයේ ඖෂධ වර්ග වැඩී ඇත්තේ ය. එහි සෑම තැනෙක වැඩියෙන් ඇත්තේ අරළු, බුළු සහ තෙල්ලි වෙයි. එහෙත් සොයා බලතොත් එහි නැති ඖෂධයක් නැති තරම්. කපුකිණිස්ස, ගම්මාලු ආදී දුර්ලභ පැලෑටි ද එහි ඇති බව පෙනිණි.

එහෙත් මේ භූමියේ ඇති අලංකාරය අනෙකකි. ඒ පැලෑටි සියල්ල, පේළි වශයෙන් නුවුවත් කිසිවකු විසින් වැවුණු කලෙක මෙන් එක්තරා පරතරයක් ඇතිව වැවී සිටින පරිදි අපූරුවෙකි. මෙහෙයින් වැවුණු උයනෙක මෙන් ගස් අතුරින් පෙනෙන අවකාශයේ තැන තැන පිහිටි ඒ ඒ හැඩ ගත් ගල් කුළු, එම උයනට ආශ්චර්‍යයක් වන පරිදි තැනුණු අමුතු සත්ත්ව රූප රාශියක් වැන්න.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

වනගත දිගාමඩුල්ලේ ගැමියන් ලෙඩට මන්තර පිළියම් මිස බෙහෙත් නො කරන හෙයින් වනය මැද අපතේ යන මේ උයන වන සතුනට කදිම භෝජනාගාරයෙකි. එහි බිම වැසී ඇති ඉඳක් සහ තොයෙක් ගඩා ගෙඩි, මුව, ගෝන, ඉත්තෑ, රිළා, වඳුරු ආදී බොහෝ සතුන්ට ගොදුරු වෙයි. අරළු, බුළු, නෙල්ලි ආදී හැම ගඩා-ගෙඩි කන වලසා කහට ගෙඩිවලට ප්‍රිය කරන තරම උන් ඒවායේ බඩ ගෑ ලකුණුවලින් පෙනෙයි. අලි රජ දරුවෝ ද මේ කෑම ඉතා අගය කරන හෙයින් මෙහි නිතොරව හැසිරෙති. තමනට බොජුන් වන සතුන් හැසිරෙන හෙයින් කොටි රාළහාමි ද එහි ගැවැසෙයි.

මේ උයනෙන් අවට ගම් වැස්සන් ප්‍රයෝජන ලබන ගසක් නම් මඩු ගස ය. එහි හැම පෙදෙසක අතරින් පතරත් සමහර කොටසෙක රාශි වශයෙනුත් මඩු ගස් දක්නා ලැබේ. ඒවා පලගන්නා කාලය ගම්මුන් ගේ හේන් බෝග නිමා වී සාගතය එළඹෙන කාලයයි. එහෙයින් එකල ගම් වැසි ගැහැණු - පිරිමි එහි ඇවිදිමින් මඩු ගෙඩි කඩා රැස් කරගෙන යති. ඒ මද ගෙන වියළා, කොටා, පිටි හලාගෙන පිට්ටු උයාගත් කල, පවතින හිහයේ නැටියට ඔවුන්ට දිව්‍ය ආහාරයක් බදු වෙයි.

මේ උයන මැද පිහිටි එක් හෙළක් සිතියමේ කළු හෙල නමින් දක්වෙයි. ගම් වැස්සෝ එයට 'ලාකඩ ගල' යයි කියති. එහි ඇති එක් පඳුරු වර්ගයක් 'ලාකඩ ගස්' නමින් හැඳින්වෙයි. ඒව අපි හොඳින් පරීක්ෂා කෙළෙමු. එහි රිකිලි අග වූ කහ පාට මල් පොහොට්ටු ඉටි වැනි ද්‍රව්‍යයෙකින් සෑදුණේ වෙයි. අපි ඉන් ටිකක් කඩා ගෙනවුත් උණු කර බැලුවෙමු. නොමදව ඇලෙන ගුණයත්, නියම ලාකඩ (සැලැක්) වල සුවඳත් එහි ඇති බව පෙනිණි.

ලාකඩ ගල ක්‍රමයෙන් උස්වන ගල් තලා තුනෙකින් යුතු ය. ඉන් ඉතා ම උස් මුදුනට ද අපි නැඟුණුමු. එහි දී ඒ ඒ අතින් පෙනෙන දර්ශන සිත් ගන්නා සුලුය. හතර වටින් භූමිය වැසුණු වන හිස අතරින්, තැන තැන අසල ගමෙක හේන් යායවල් අමුතු වෙසෙසකින් පෙනෙයි. නැගෙනහිරි දෙසින් එරගම් විල සහ ඉඳක්සේන වැව ද, ඉන් ඔබ තැනිතලා කෙළවර මුහුදේ සේයාව ද දක්ක හැකි ය. බටහිරින් උඟවේ කඳුකරය අලංකාර චිත්‍රයක් මෙන් පෙනේ.

මේ ලාකඩ ගල හෙවත් කළු හෙල මුදුනෙහි නටබුන් පුරා වස්තු ද දක්නට ඇත්තේ ය. එහි එක් තැනෙක කුඩා ද ගැබෙක පහළ කොටස වැනි කළු ගල් ගොඩෙකි. ඒ අසල මැටියෙන් කළ උළු, ගඩොල් කැබැලි

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ද දක්ක හැකිය. හෙල මුදුනේ සිට ක්‍රමයෙන් බෑවුම් වන පැතිවල, ඒ ඒ මට්ටමට සමතලා මළු ඇති කරනු පිණිස බඳනා ලද වැනි, බැම්මවල කොටස ද පෙනේ.

ඉන් පහළ එක් ගල්තලාවෙක කණු සවි කරනු පිණිස මෙන් හාරන ලද කුඩා වළවල් සයෙක් වෙයි. එය සයැස් වූ කුඩා මැදුරක් ඉහිටි තැනක් සේ සැලකිය හැක. ඒ ළඟ ම ගල්මේම සාරන ලද වංගෙඩියකුත්, එහි කොටන දේ බා, රැස්කළ හැකි සේ ගලෙන් ම නෙළුණු වට්ටියක හැඩයෙක් ද වෙයි. තවත් පහළ බෝවිටියා පඳුරු අතරේ තවමත් කෙළින් සිටිමින් පැරැණි සිංහල නිර්මාණ ශිල්පයට දෙස් කියන ගල් කුළුණු කිපයෙක් ද, මට්ටම් කළ ආයත චතුරස්‍රාකාර ගල් ලැල්ලෙක් ද ඇත්තේ ය.

මේ සියල්ලෙන් අපට පෙණී ගියේ ආදියෙහි මෙය බෙහෙත් උයනක් වූ බව සහ ගල් තලා මත වෛද්‍යයන් ගේ රසායනාගාර ආදිය ගොඩ නංවා තිබුණු බව ය.

මේ නෙල්ලි කැලේ මැදින් පල්ලම් ඔයට ගලන මොරගහ කඳුරෙන් දිය ලබන මොරගහ පල්ලම නම් ගමෙකි. මේ ගමෙහි ඇත්තේ එක ම ගෙයෙකි. එගෙයි වසන්නෝ එක ම පියෙක් සහ මව නැති, දියණියක් පමණි. අවටින් මයිල කුනක් යන තුරු අන් මිනිස් පියසක් නැති වත්තේ වැටේ සිට සතර දිගට විහිදෙන වන සතුන් ගහණ වනයෙන් වට වුණු මේ තනි ගෙයි වසන ඒ පිය-දියණි දෙන්නා ගේ ජීවිත ප්‍රවෘත්ති කෙතරම් ආශ්චර්යමත් විය යුතු ද ?

මේ පියා - එනම් මොරගහ පල්ලමේ ලියන මහත්මයා හෙවත් හේරත් මුදියන්සෙලා ගේ තිලකරත්න, ඉංග්‍රීසි, සිංහල, දෙමළ තුන ම ලියන්නට, කියවන්නට සහ කථා කරන්නට දන්නා - තරුණ කල සිදදියේ හැසිර පුරුදු හෙයින් රටේ තොටේ තොරතුරු දන්නා - අරුම පුදුම අපූර්ව පුද්ගලයෙකි.

ඔහු ගේ රූප ලක්ෂණය ද අරුමයෙකි. වයසින් පණස ඉක්මවා සිටින නමුත් තවම වැඩපළ නො ලස්ව කරන හේ මිටි-පුංචි සිරුරක් ඇත්තෙකි. ඔහු ගේ මුහුණේ වම් ඇස යටින් විශාල කැළලෙකි. ඇස ද අංශයකට ඉරී ගොස් පමණට වඩා විශාල ය. ඉන් නිතොර ව කඳුළු ගළයි. මුහුණට විකාර ස්වභාවයක් ආරූඪ කරන මේ විපර්යාසය වී ඇත්තේ වලසකු සමග කරන ලද සටනක දී ය. වරක් නොව කිහිප වරක් ම ඔහු වනයේ දී වලසුන් හා සටන් කළ බවත්, ඉන් බොහෝ වාරවල දී උන් පලවා හැර ජයගත් බවත්, වරක් පමණක් එකකුට පැරදී

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මෙයේ කුවාල කරන ලද බවත් හේ කියයි. එහෙත් ඉත් පසුව හෝ ඔහු වනගත ගමන් හෝ දඩයම් හෝ අත් හැරියේ නො වේ.

මේ නෙල්ලි කැලේ මැදින් ගමන් කළ ගමන්වල දී මට මුණ පාන්නට සිදු වූ නපුරු අවස්ථා කීපයෙකි. දවසක් මම තව ළමයකුත් සමග දමන සමුපකාර කඩයෙන් හාල් කළමනා ද පටවාගෙන කරත්තයකින් පාදගොඩ යමින් සිටියෙමි. කරත්තය දක්කුවේ පාදගොඩ ගමේ ගුණරත්න නමැති පසළොස් හැවිරිදි කොළුවෙකි. වැසි කාලයක් වූ හෙයින් කරත්තයේ කුඩයක් ද විය. සවස හතර පමණ වන විට අපි නෙල්ලි කැලේ කෙළවර අඳුරු වන කුට්ටියකට ළඟා වෙමින් සිටියෙමු. හීන් වැසි පොදක් ආයෙන් මම කුඩය දිග හැර ගතිමි. කුඩයෙන් වැසී කතාවක ද යෙදී ආ අපට බඹ කිහිපයෙකින් ළං වන තුරු, මහ අසල ම ඉදිරියෙන් සිටි අලින් දෙන්නකු නො පෙනුණේ ය. "අලි!" යි ගුණරත්න ශ්වාසයක් කරමින් කරත්තය නැවැත්විය. කුඩය පසෙකට කර බැලූ මට කරත්තයට බඹ පහක් පමණ ඉදිරියේ, බඹ තුනක් පමණ පාරට ඇතිත් සිටින අලි යුවළ පෙනිණි. මගේ පපුව ශීඝ්‍රයෙන් ගැහෙන්නට විය. අප අත වූයේ ගුණරත්නගේ කෙවිටත්, මගේ කුඩයත් පමණි. දෙපැත්තේ ගස් නිසා කරත්තය ආ පසු හැරවීමට හෝ වෙන අතක දක්කීමට හෝ ඉඩෙකුදු නැත. අලින් දෙන්නා ගෙන් එකෙක් තවමත් අප නො දක අනෙක් දෙස හැරී අනුභවයෙහි යෙදෙයි. අනෙකා අප දක අනුභවය නවතා 'පහර දෙමි ද පලා දුවමි දැ' යි සිතන්නකු මෙන් පැත්තෙත් පැත්ත හැරෙයි. 'මක් කරංඩ දැ?' යි ගුණරත්න කෙඳිරි ය. "දක්කපන්!" මම කීමි. ඔහු මහ හඬින් හෑ ගා කරත්තය උගුළුවා ගනිත් ම අප නුදුවූ අලියා හොඬත්, වලගයත් දෙක ම ඔසොවා ගෙන හිස හැරී තිබුණු අතට වේගයෙන් දුවන්නට විය. අනෙකා ද ඒ අතට ම දිවිය. අපි ද එළවා ගත් ගමන් පාදගොඩ ගමට ම පැමිණෙන තුරු නො නැවැත්වීමු.

තවත් දවසෙක මම තනි ව කබල් බයිසිකලයෙකින් මේ මහ තරණය කරමින් සිටියෙමි. එද අලින් මුණ ගැසුණු තැන ද පසුකොට අඳුරු වන කුට්ටියට වැදුණු මට එක් වංගුවක් හැරෙන විට බඹ දහයක් පමණ දුරින් මහ හරස් කොටගෙන සිටින අලියකු පෙනිණි. තිරිංග මිරිකී බයිසිකලය නැවැතිණ. මා බැස්සුණේ කෙසේ ද යි නො දනිමි. අලියා ද වනය බිඳගෙන මඳ දුරක් දුවනු ත්, ඉන්පසු ගසක් කඩන හඬ සහ සිහින් වුව තියුණු බියකරු නාදයක් දෙනුත් ඇසිණ. මම සැනෙකින් බයිසිකලය ආපසු හරවා තබාගෙන දෙපාවල සියලු වැර යොදමින් පැදවීමි. මයිල දෙකක් පමණ එසේ යන විට හමු වූ ගැමියන් කංඩායමකට එක් ව හූ කියමින් නැවත ආපසු ගමන කෙළෙමි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

වෙනත් දිනෙක මේ නෙල්ලිකැලේ දී මට වූ ඇබැද්දියක් මේ සියල්ලට වැඩියෙන් චමත්කාර ය.

එද මම තනිව පාදගොඩට යතු පිණිස උදේ හතට පමණ දමනෙන් නික්මුණෙමි. පළාත තරමක් පුරුදු හෙයින් මෙ කල මා තුළ වැඩි බියෙක් නො වීය. වැසි කාලය නිසා වතුර බෝතලයක් ගෙන යාම අවශ්‍ය නුවූයෙන් දවාලට බත් මුලකුත්, වෙනත් අඩු වැඩියත් කරෙන් එල්ලා ගෙන මම ගමනාරම්භ කෙළෙමි. මා අත අවියකට වූයේ එක් පැත්තකට මොට තලයකිනුත්, අනෙක් පැත්තට අහල් හතරක් පමණ දිග උලකිනුත් යුතු මිලිටරි පිහියයක් පමණි.

දමන ගමෙන් ඈත් ව මහ වනයට එළඹෙන විට ද උදහැන ගතිය අඩු වී නැත. එහෙයින් වන සතුන් ගේ වේලාව තවම අවසන් නැත. මේ බව මට සිහිවන්නේ ගමෙන් ඈත් වෙද්දී ය. පිටත් වෙද්දි සිතෙහි වූ අභීත බව ටිකින් ටික ඈත් වෙවී බිය සැක කෙමෙන් වැඩෙයි. වන ගමන්වල දී කවදත් මා සිත මෙ බදු ය. එහෙයින් ඒ ගැන නොතකා ගමන ඉක්මන් කෙළෙමි.

තව දුරටත් බිය-සැක වැඩිවන විට අයිනකින් ඇද නැති දැඩි ඉන්නක් කපාගෙන ඉන් හෙල්ලයක් සාදා ගතිමි. ලිය මා සම උසට කපාගෙන එහි මුල කොණ තියුණු ව සිටින සේ උල්කොට ගතිමි. ඉන්පසු අප්‍රිකානු වනචාරියකුගේ වැනි දැඩි සිතක් ඇති කර ගැනීමට වීරිය දරමින් ඉදිරියට ගියෙමි.

වැසි කාලය වන සතුන් ගේ දින චරියාව පිළිබඳ කාල සටහන වෙනස් කරන කාලයකි. මිනිසුන් මෙන් ස්වභාවයට විරුද්ධව කුඩ ඉසුලාගෙන වැඩ කරන්නට නො සිතන ඔවුහු, කෑම සොයා යාම නතර කොට, තැන් තැන්වල ගස් යට කරබාගෙන සිටිමින් වැස්සේ සිසිල් සුවය විඳිති. නතර වූ පසු, වේලාව කුමක් වුවත් කෑම සොයා යති. එහෙයින් වෙන ද රැයෙහි පමණක් ගොදුරු සොයන සත්තු මෙකල දවල් ද කොතැනත් හැසිරෙති. මේ කරුණු මගේ සිහියට නැහෙන්නේ නෙල්ලි කැලේටත් ඇතුළු වී ඉදිරියට යද්දී ය.

සෑම අලුත් දවසෙක ම අමුතු අලංකාරයෙකින් බැබැළෙන නෙල්ලිකැලේ එදා මට පෙනුණේ වැස්සෙන් පණක් ලැබ සිටින්නාක් මෙනි. වැසි දියෙන් නා ගෙන කොළ-ඇස් ඇර සිටී, ඉළුක් ආදී මිටි පඳුරු පේළිය වලසුන් ආවරණය කොටගෙන මට ඔව වඩවන්නාක් මෙන් ද, අරළු, බුළු, නෙල්ලි ආදී ලොකු රුක් පෙළ මට වන විපත ගැන

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

සිහාසෙන්නාක් මෙන් ද මට හැඟුණි. කුමක් වුවත් පිටත් වූ ගමනක් අත් හැර ද ආපසු යාමෙන් මගේ සිරිත නොවේ. එහෙයින් බිය හා සමඟ සටනෙහි යෙදෙමින් ගමන ඉදිරියට ම කෙළෙමි.

එහෙත් මොරගහ කඳුර දෙපස මහ බැදි කුට්ටිය පසු කොට, ඊළඟ කඳුකැටිය නගිද්දී මට පෙනුණේ සිත තැති ගන්වන දේකි. මා ඉදිරියේ පාරේත්, ඒ දෙපසත් බිම හාරා බෙටි ගසා, අහල පහල තුරු ලිය තලා පොඩි කොට තිබුණේ අලි රංචුවක් විසිනි. අහල් තුනත්, ළඩියන් අතර ඒ ඒ විෂ්කම්භයන් ඇති අලි පා සටහන් එහි කෙළවරක් නැත. පසෙක බිම හාරා වළ ගැසුණු තැන් ය. තැනෙක මහ අලියකු පැන්න පෙරළී ශයනය කළ බවට සලකුණු ය. ඒ ඒ තැන ඒ ඒ පමණේ බෙටි ගොඩවල් ය. නොයෙක් තරමේ සතුන් දස දෙලොස් දෙනකු ගෙන් යුත් අලි රංචුවක් එහි දහලා ඇති බවත්, ඒ ද මඳ වේලාවකට පමණක් කලින් බවත් මට වැටැහිණ.

මෙබඳු සළකුණු මා ඊට පෙර දැක නොතිබුණා නොවේ. එහෙත් එද ස්ථානයත්, අවස්ථාවත් අනුව මා සිටියේ බිය ජනක තත්ත්වයක ය. එහෙයින් මා හදවත සැලෙන්නට ආයේ ය.

සිතට බිය වැඩි වන විට අවතාර පෙනීම ද වැඩි වෙයි. ඒ අලි රංචුව ළඟ ම ඇතැයි මට සිතුණේ ය. අලින්ගේ ගඳ ද මගේ නාසයට දැනුණි. අලින් පාරවල් අසලට පැමිණි විට මෙසේ පොළොවත්, ගසුත් කඩා තළා සුණු කරන්නේ මිනිසා සමඟ ඇති ක්‍රෝධය ඉවෙන් ඇවිස්සෙන නිසා ය. මිනිසා පිළිබඳ ඉව දැනුණු පමණින් මෙ පමණ පෙරැළි කරන උන්ට මිනිසකු ම හමු වුවොත්! මා හමු වුවොත්! - මගේ සර්වාංගය ලොමු දහැ ගැනිණි.

මම ගමන මඳකට නවතා සිත එකලස් කරගෙන ධෛර්යමත් වන්නට වෑයම් කෙළෙමි. එවේලෙහි මා සිටියේ ගමතේ මයිල පහෙන් අඩකට මඳක් වැඩියෙන් ගොස් ය. එහෙත් ඉතිරි දුර ආ දුරට ද වැඩියෙන් අභීමානකි. තවත් සිතන මට මොරගහපල්ලම නමැති ගම මයිලකට අඩු දුරින් පිහිටි බවත්, එයට යන පාර නුදුරෙහි විය යුතු බවත් මතක් විය. එහෙයින් ඒ මග සොයාගෙන මොරගහපල්ලමට ගොස් එතැනින් පාදගොඩට යන්නට සිතා හැරුණෙමි. මොරගහපල්ලම අතට හැරී නෙල්ලි කැලේ ඒ බෑවුමෙහි මා ගමන් කෙළේ බඹ පණහක්-හැටක් පමණෙකි. යලිත් හදවත බිය වද්දන දෙයක් ඉදිරියෙහි පෙනිණි. කරත්ත රෝද පාරවල් දෙකට මැදින් අඩිපාර දිගේ මා යන අතට ම ගිය මුවන් දෙන්නකු ගේ පිය සටහන් ද, ඒ සමඟ ම දවැන්තයකු වූ

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පිරිමි කවුරුත් හේනට ගිහින් - අපි විතරයි ගෙදර

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

උයන් පොතුවලින් තැනුණු මේ පැලේ
උන්නත් අපේ ආදරය සුළු පටු නොවේ.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

කොටියෙකු ගේ පා ලකුණු ද එහි විය. මේ අරිට වඩා බිය උපදවන දකුමෙකි. කොටියා මුවකුත් මරා ගත්තා නම් ළඟ ම ඉඳගෙන එය කනවා විය හැකි ය. කටේ ලේ ගෑවුණු කොටි මුහුණකුත් මට මතක් විය. කොටියකු කට අයාගෙන පනින ආකාරය පවා මා සිහියට නැඟුණේ ය.

එහෙත් කොටියාත්, වලහාත් පිළිබඳ බියට නම් මගේ හෙල්ලය සැහෙන පිළියමකි. ඌ කට අයාගෙන පනින විට හෙල්ලයේ උල් කොන ගිරිය දිගේ යැවීම මගේ බලාපොරොත්තුව වූ යේ ය. නැත්නම් උගේ ඉලක්කයෙන් ඉවත් ව හිසට ගැසීම කළ හැකි ය. හෙල්ලයෙන් තුට්ටුවක පලක් නො වන්නේ අලින් ඉදිරියෙහි ය. එහෙයින් ඒ ගැන නො තකා - එහෙත් මහත් විපරමින් යුතු ව මෙරාගහ පල්ලම දෙසට ගමන් කෙළෙමි.

තෙල්ලි කැලේ කෙළවර, පල්ලමේ කටු පඳුරු අතරින් ඉඑක් තලා මැදින් ගොස් ලියන මහතා ගේ නිවෙස දුටු පසු සැනසුම් සුසුමක් හෙළිණි. මා ඔහුට සිද්ධිය විස්තර කොට පාදගොඩට යා-ගත නො හැකිව එහි ආ බව කීවෙමි. ඔහුගේ දූ මා අසා සිනාසී,

"හෙනං නෑ ! ඔය රුකුලේ පද්දංඩ පුලුවනි යි, තනියෙං ?" කියා කීවා ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

5

වඩිනාගල ගමන

නෙල්ලි කැලේ පසු කොටගෙන දමන සිට පාදගොඩට පළමුවරට පැමිණි දවස මට අද වාගේ මතක ය. එදා අප ගියේ, පාදගොඩට පමණක් නොව වැව්ගම් පත්තුවේ නිරිත දිග කෙළවර පිහිටි වඩිනාගල නම් ගමට ම යන අදහසිනි.

ගමනට පිටත් වුණේ සිරිමල්, කරුණා සහ මම වීමු. සිරිමල් මා දකින්නට මහරටින්[1] පැමිණ සිටි මිතුරෙකි. එහෙයින් ඔහු ද මා මෙන් ම ප්‍රදේශයට අමුත්තෙකි. එහෙත් කරුණා, තොට්ටම ඉපිද එහි ම හැදුණු වැඩුණු, දහතුන් විය සිටි කොළුවෙකි.

කරුණා පාටින් කළු ය. තාරවත් ඔහුට වඩා කළු නම් ඒ හුහක් නොවේ. එහෙත් ඒ කළුව අවලක්ෂණයක් නුවූයේ ඔහු ගේ පහන් පැවැතුමත්, බුහුටි බවත් නිසා ය. දිගාමඩුලු සිංහල වචනයෙන් ගැළපි කියවෙන ඔහු ගේ කතා ව, නුපුරුදු අපට අපූරුවක් වූයේ ය.

පළමු වරට නෙල්ලි කැලේ දකුමෙන් ඇති වූ කුහුල් හැහුමෙත් යුත් මම "මේ නෙල්ලි කැලෙත් අලි වලස්සු ඉන්නවා ද ?" යි කරුණා ගෙන් ඇසීමි.

"අලිබොට්ටුත්, වලස්සුත් මේක වෙහෙක්ක[2] ම ඉඳින් !" යි හේ ඇස්මහත් කරමින් කී ය.

නෙල්ලි කැලේ කෙළවර වන්නේ පහත්, තැනිතලා, වැලි බිමක් වසා සිටි අඳුරු මහ බැදි කුට්ටියකිනි. නෙල්ලි කැලේ පැවැති ආලෝකයට සම්පූර්ණයෙන් විරුද්ධ අන්ධකාර ලෝකයක් එහි දී එයි. එකල අපේ ගමන බිම් ගෙයක කෙරෙන්නක් මෙන් හැහෙයි. රාස්සයන්[3] ගේ නාදය දෙ සවන් දෙදරවමින් හතරවටින් එයි. විටින් විට නොයෙක් කුරුල්ලන්ගේ නාදත් ඇසෙන නමුත් බියෙන් සසල වන සිතට එහි රසයක් නො

1. පාත රටින්.
2. වෙහෙක්කම - හැම තැනම, වෙහෙම - සේරම.
3. රාස්සයන් - රහැයියන්

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

ලැබෙයි. කරුණා ගේ කළු මුහුණ එහි දී කළුවර දුවයෙන් කළ රුවක මුහුණක් සේ පෙනෙයි. ගමේ දී තොර තෝංචියක් නැතිව දෙඩවන ඔහු ගේ කට ද හාවක් - හූවක් නැති ව පියැවී තිබෙයි.

කැලේ ගමන්වල දී මා කවදත් කැමැති වූයේ නඩයේ ඉදිරියෙන් ගමනට ය. පස්සෙන් ම යාමට නම් කිසි සේත් එකඟ නො වීමි. වලයකු ඉදිරියෙන් ආවොත් කිසිවක් කළ හැකියි. පස්සෙන් ඇවිත් පිටට පැන්නොත් කොහොම ද යි මට සිතුණා විය හැකි ය.

එහෙත් කරුණා ඒ විවරණය කරන්නේ,

"වලස් බොටා පහර දෙන්නෙ නෑ පස්සෙං. ඉස්සරහින් ඇවිත් දැතින් මූණට වැලි ගහ-ගෙන, හූව තබා ගෙන තමා පනින්නේ !" යි කී ය.

"එතකොට තමා මගේ හෙල්ල උගේ ගිරිය දිගේ යන්නෙ !" යි මම කීමි.

"හ්ම් !" හඬක් නහා කරුණා කර බා-ගත්තේ ය.

කොටියා හෝ වලසා පනින විට නම් හෙල්ලයෙන් හරඹයක් කළ හැකි බව මට හැඟෙයි. එහෙත් අර දවන්න කුළකු හෝ මහ ගලක් පෙරළෙන්නාක් මෙන් එන අලියකු ඉදිරියේ මගේ හෙල්ලයට කුමක් කළ හැකි ද ? ඒ සිතෙනවිට මගේ සිත ද සැලෙයි.

එසේ වුවත් මට විශ්වාසයත්, ධෛර්යයත් තිබේ. මම පස්ස හැරී සිරිමල් දෙස බලමි. මුහුණ අඳුරු වූ නමුත් ඔහු ද ධෛර්යයෙන් සිනා සෙන්නට වෑයම් කරනු පෙනෙයි. වාසනාවකට මෙන් බැදි කැටිය කෙළවර ව අප එළිමහන් බිමකට යොමු වෙයි.

මේ එළිමහන් බිම කුරුඳුවින්න මුම්මාරිය නමි. එතැන සිට පාදගොඩ ගමට ඇත්තේ බඹ ගණනෙකි. ගමේ කතා හඬ ඇසෙන මානයට පැමිණි විට කරුණා නින්දකින් පිබිදුණාක් මෙන් පහන් ව දෙඩමළු ද වෙයි. අපට උවමනා කෙළේ පළමුවෙන් ගමේ පාසලට යාම ය. කරුණා පාර අයිනේ ගෙයක උන් කීප දෙනෙකුන් දැක,

"ඉස්කෝලෙ කොහා ?[1]" යි ඇසී ය.

"ඔහොම දිගම[2] යනවා !" යන පිළිතුර ලැබුණේ ය.

1. කොහා - කොහේ ද ?
2. දිගම - දිගට.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

අපි දිගට ම ගියෙමු. තවත් බඹ තුන් හාරසියයක් ගිය තැන, ගම් කෙළවර, පල්ලම් ඔය අයිනේ පාසල පෙනේ.

පාසල අඩි හැත්තෑ දෙකක් දිග, දහ අටක් පළල ශාලාවකිනුත්, ඉඩ කඩ ඇති ගුරු නිවාසයෙකිනුත් යුතු විය. හොඳ ළිඳක් සහ කොංකිරිට් වැසිකිළි දෙකක් ද පෙනිණි. ගොඩ නැහිලි, බිමට සිමෙන්ති දමා, වල් කණු පිට පිහිටි වහළ පොල් අතු සෙවිලි කර තිබිණි. ශාලාව ලැලි ගැසීමෙන් පන්ති කාමර තුනකට බෙදන ලද්දේ ය.

කාමර තුනක් වූ නමුත් එහි උගන්වන්නට සිටියේ එකම ගුරුතුමෙකි. ගුරුතුමා උන් නමුත්, මේස, පුටු බංකු, කළු ලැලි ආදී කිසිවක් එහි නොවීය. එහෙයින් උගන්නට පැමිණි ළමයින් හත් අට දෙනා ඉදගත්තේ ගුරුතුමා ශයනය පිණිස ගෙදරකින් ඉල්ලා ගෙන තිබුණු පැදුරේ ය. ගුරුතුමා හිටගෙන ම ඉගැන්වී ය. කොට බිත්තිය මත තබා ගෙන තම් පොත ලකුණු කෙළේ ය.

මේ තාලයෙන් වත් වැඩි කලක් පාසලේ වැඩ කළ නො හැකි වන බවට ලකුණු වහළයේ පළ විය. කොන්තරාත්තු කරුවන් එහි බැන්ද පොල් අතුවල ඉතිරිව තිබුණේ ඉරටු පමණෙකි. තැනින් තැන බිත්ති සෝදගෙන වැගුරුණු මඩ ගොඩවල් ඇතුළත විය.

ශාලාවටත් වඩා ගුරු නිවාසයේ තත්ත්වය බරපතළ විය. එහි ද සමහර බිත්ති කොටස් ගරාවැටී තිබුණු නමුත් වහලයේ එක් මුල්ලක් පමණක් අලුත් පොල් අතු කීපයෙකින් වසා තිබුණේ ය.

ගෙයක ද වෙසෙමින් තෙමෙනු කොතෙකුත් ඉවසනු නො හැකි වූ ගුරුතුමා ලොකු වියදමක් කර මහන්සිත් වී අක්කර පත්තුවෙන් පොල් අතු විස්සක් ගෙන්වා ගෙන, වහළයේ එක් මුල්ලක් පමණක් ආවරණ කරගත්තේ ය. "දැන්වත් ඉතින් නො තෙමී නිදා ගන්නෙමි" යි ගුරුතුමා එදා සිතී ය. එහෙත් මහ රෑ වැස්සෙන් ගෙබිම අතෙක් තැන්වල රස් වූණු වතුර ගළා අවුත් පැදුර තෙත් කළ විට ය, ගුරු තුමන්ට නුවණ පහළ වුණේ !

කෙසේ වුවත් එදා අපට වැස්සෙන් කරදරයක් නො වී ය. එහෙත් මහත් කණගාටුවකට මෙන් අපේ ගුරුතුමා ගුරු නිවාසයේ එතුමා ගේ මුල්ලේ, එතුමන් ගේ කුඩා පැදුර එළා ගෙන සුදු රෙද්දකින් ඉස සිට දෙපතුලට ම වසා ගෙන නිදා සිටියේ ය. ගුරු නිවාසයේ පදිංචි අනෙක් තැනැත්තා වූ බාස් අයියා ලිප මුල හිඳ ගිනි තපිමින් හුනි. දෙන්නා ම උණ ගැනී සිටින බව කියන ලදී.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

අපි රෑට උයන්නට පටන් ගතිමු. පළමුකොට තේ උණු කොට ලෙඩුන්ටත් දී, අපි ද බිව්වෙමු. ඉන් පසු කරුණා හාල් ගරා ලිප තැබී ය. සිරිමල් පොල් ගාද්දී මම ලිපේ ගිනි පත්තු කෙළෙමි. පැයක දී අපි බතකුත්, එළවළුකුත් සහ සම්බලයකුත් සාදා ගෙන කාලා නින්දට ගියෙමු.

අප නින්දෙන් පිබිදුණු පරිදිත්, ඉක්බිති වඩිනාගල ගිය අයුරුත් කියන්නට කලින් පාදගොඩ ගම ගැන යමක් කිව යුතු ය.

අවුරුදු එක් සිය තිස් ගණනකට පෙර - සමහර විට වර්ෂ 1818 වෙල්ලස්සේ කැරැළි කාලයේ දී එ පෙදෙසින් සංක්‍රමණය වූ ටිකිරි අප්පු පෝඩි[1], බඩ පිස්ස පෝඩි නම් ලත් සොහොවුරන් දෙදෙනකුත් විසින් පාදගොඩ ගම පිහිටුවිණැයි මෙ ගම පැරැණ්නෙක් මා සමග කී ය.

වෙල්ලස්සෙන් පලා ගිය ඔවුහු නින්දූර නම් ගමේ කලක් නැවතී පසුව මේ කැලෑ රටට අවුත්, ගං හෝ ආදී ජල පහසුව ඇති තැන් බලා ගම් පිහිටුවා ගත්හ. වැව් ගම් පත්තුවේ හැම ගමකම ඇත්තේ මෙසේ වෙල්ලස්සෙන් පලා ආවුන්ගෙන් පැවැතෙන්නෝ වෙති.

යටකී ටිකිරි අප්පු, බඩ පිස්ස යන පෝඩි සොහොයුරන් විසින් හෝ ඒ කාලය ආසන්නයේ විසූවන් විසින් හෝ පල්ලම් ඔයේ තනන ලද කොටයක්[2] අදත් දක්ක හැකි ය. පල්ලම් ඔය ගලන වතුරෙන් යුතු කාලයට කොටේ පිහිටි තැන ඉන්නක් සිටුවා තබනු ලැබේ. ගලන වතුර ඉවර වූ පසු පූවළ කපා දිය ගනු ලැබේ. නියඟය බලවත් වී පූවළ වලින් ද දිය ගැණුම අමාරු වන කල, යටකී ඉන්න සිටුවා ඇති තැන වැල්ල හැරිය යුතු වෙයි. එකල කොටේ මතුවෙයි.

කොටේ සාදා ඇත්තේ මහ ගසක කඳකින්, යාරයක් පමණ දිගට කපන ලද කොටන්වල, මැද හරය ඉවත් කොට සාදා ගන්නා ලද, ඌරකැට වැනි වළලු දෙක තුනකිනි. වැල්ල හාරා එහි යට බැස්සීමෙන් ළිඳ සෑදෙයි. මේ කොටේ මෙසේ බස්වන ලද කොට කැලිවලින්, උඩ එකක් දිරා ගොස් ඇතත්, යට ඒවා තවමත් ඇති නිසා මහ නියං කල වුණත් වතුර ලැබිය හැකිය.

වර්තමාන ගම්වල යටකී පටන් ගැන්මේ ඉතිහාසයෙන්, ස්මරණ වස්තුවකට ඇත්තේ මේ කොටේ පමණය. එහෙත් අතීතයේ, ඈත

1. පෝඩියාරෙ යනු යමක් ඇති අයට පළාතේ කියවෙන නමකි. පෝඩි යන්න එහි ලුහුඬු පදයයි.
2. කොටේ යනු මහ කඳන්වල මැද හරිය සැස ඌරා කැට මෙන් වළලු සාදා ඒවා සවි කිරීමෙන් සාදන ළිඳ වෙසෙසකි. මේ නිසා සිමෙන්තියෙන් බැඳුණ ළිඳට ද ඔවුහු 'කොටේ' යි කියති.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ඉතිහාසයෙන් නෂ්ටාවශිෂ්ටයක් වන පැරැණි විහාර භූමියක්, පල්ලම් මයෙන් එතෙර, ඒ ඔය බඩ කැලේ මැද ඇත්තේ ය. එහි පැරැණි කුඩා දගැබක බිඳවැටී ඉතුරු වුණු ගඩොල් සහ පස් ගොඩකුත්, ඒ අවට තැන තැන ගොඩ නැඟිලිවලින් ඉතිරි වුණ ගල් කණු හා කැටයම් සහිත ගල් ලෑලි ආදියත් දකින්නට ලැබෙයි. මේ දේ මා මේ ලියන දවස දක්වාත් අපේ පුරාවිද්‍යාඥයන්ට දක්නට ලැබී නැත. එබැවින් එහි අතීතය ගැන යමක් නවම කිය නොහැකි ය. මීට අවුරුදු කීපයකට පෙර මෙහි කුටියක් තනවා ගෙන හාමුදුරු නමක් විසූ බවත්, ඒ හාමුදුරුවන් එහි වැඩ වසන ගමන් දගැබේ අඩි තාලමත්, නවත් නොයෙක් තැනුත් (නිදන් ගැරීමට) හාරන්නට පටන් ගත් බවත්, එහෙයින් හාමුදුරුවන්ට පිට ම. වන්නට සැලැස් වූ බවත් ගමේ ආරච්චිල කියයි. එහෙයින් එතැන දැනුත් රෑ දවල් අලි-වලසුන්ගෙත්, අනික් සතුන්ගේත් කෙළි පිටියකි.

පාදගොඩ ගම අවට අලින්ගේ ගෝට්ට මට බොහෝ දිනවල අසන්ට ලැබුණේ ය. එයින් එක් දවසක් මා මෙය ලියන දවසට දවස් තුනකට කලිනි. මේ දිනවල මා මගේ වාඩිය හදගෙන පදිංචිව උන්නේ පාදගොඩ ය. එද හැන්දෑවේ මම මගේ වාඩියේ මේසය ළඟ ඉඳගෙන පාදගොඩ ගම ගැනම ලියමින් උනිමි. කරුවල වැටුණු වේලේ සිටම **කුරුඳුවින්න මුම්මාරිය**[1] දෙසින් ඇතුන්ගේ කුඤ්චනාද විටින් විට ඇසෙමින් තිබුණේ ය. කල් ගත වෙන්නට වෙන්නට එක් විදියක කුඤ්චනාද පමණක් නොව නොයෙක් විදියේ තියුණු නාදත්, ගෙරවිලින් ඇසෙන්නට විය. මෙය මට මා කලින් සිටි තැනක දී අසා පුරුදු එකක් වුණේ නැත. ඒ ශබ්දවල හැටියෙන් අලින් එකකු දෙන්නකු නොව ලොකු රංචුවක් බවත්, උන්, මිනිසුන්ගේ ගම ළඟම ඇති බව දැන දැනම මිනිස් කටහඬ ඇසෙද්දීම - මෙසේ රෑ හඳපානේ පෙම් කෙළින බවත් මට හැඟුණේ ය.

මෙහි ගෙවල සිරිත වේලාසනම කන බොන දෙයක් කා බී නිදා ගැනීම ය. බොහෝ ගෙවල පහන් දැල්වීමක්වත් - දල්වන්නට තෙල් පහන්වත් ඇත්තේ නැත. එද ද එ පරිදි ගමේ ගෙවල කවුරුත් නිදි වේලාව ද පැමිණියේ ය. නිදිනැති බවක් පෙනුණේ **පෝඩියාරේ**[2] ගේ ගෙයි පමණ ය. එහි කීප දෙනකුගේ කතා බස් ඇසෙයි. අලින් ගේ හඬ ද තව තවත් සැරට ඇසෙයි.

මම ලිවීම නවතා නැගිට්ටෙමි. හඳ එළිය හොඳ හැටි තිබුණ නමුත් විදුලි පන්දමත් අරගෙන පාර දිගේ පෝඩි ගෙදර[3] අතට ගියෙමි.

1. පාදගොඩ ගමට ඇතුළුවන තැනම පිහිටි මෙහි කලින් ද විස්තර වුණු කුඹුරු බිම.
2. පාදගොඩ දන් ඉන්නා පෝඩියාරෙ. පෝඩියාරෙ යනු යමක් ඇති උදවියට කියන නමක් බව යට සඳහන් විය. මේ පෝඩියාරෙ ගැන විස්තරයක් මතු කියවෙයි.
3. පෝඩියාරෙ ගේ ගෙදර, මෙහි ව්‍යවහාරය ද පෝඩි ගෙදර යනුවෙනි.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

ටික දුරක් යනවිට මට ඉදිරියෙන් කුරුඳු වින්න අතට යන කිප දෙනකු පෙනුණේ ය. මම ද ඉක්මන් ව ගොස් ඔවුන්ට ළං වීමි. පෝඩි ගෙදර සුදු **බණ්ඩා** ත්, අසල තව ගෙදරක **වන්නිසිංහ** නමැති ගැටවරයෙකුත්, තවත් කොළුවන් තුන් හතර දෙනකුත් එහි වූහ. ඒ කට්ටිය පාරට බැස් උන්නේ **අලින්ට පුච්චන්ට**[1] යන්නට බව මම තේරුම් ගතිමි.

ඉන්පසු අපි කතා නොකොට, ශබ්ද නොකර ටිකින් ටික මුම්මාරිය අතට ගියෙමු. තවත් කොළුගැටයින් තුන් හතර දෙනෙක් ද එක් වූහ. කවුරුත් ගමන් කළේ බියෙනි. අපේ දකුණත් පැත්තෙනුත්, ඉදිරියෙනුත් ගස් කැඩෙන හා සෙළවෙන ශබ්ද ඇසුණේ ය. දකුණත් දෙසින් එක් යතකු ලැහැබේ සිටින තැනක් පසුකරගෙන ද අපි ගියෙමු. දැන් පාරේ සිටින අප ටිකදෙනා වටේ හැම අතකින්ම අලින් ඇති බව හැඟුණේය.

තුවක්කුව සුදු බණ්ඩා අතේය. අනෙක් කොකට නැතත්, තුවක්කුවට ඕනෑ අලියකු බව බව මම දැන සිටියෙමි. එහෙයින් මම සුදු බණ්ඩාගේ තුවක්කුව කෙරෙහි විශ්වාසය තැබීමි. එහෙත් එය කැප්ප තුවක්කුවකි.[2] හදිසියකට එයින් ඇත්තේ එක වෙඩිල්ලක පිහිට පමණකි.

අලියකුට, මිනිස් ඉවක් හෝ හඬක් ඇසුණු විට, ඌ කරන සිහින් ශබ්දයක් වෙයි. හින් අඩක් ඇති 'බෑන්ඩ්' නළාවකින්, යන්තමින් මොහොතකට උපදවන ශබ්දයක් වැනි එය, සමහර විට රංචුවේ අනෙක් ඇත්තන්ට කරන අනතුරු හැඟවුමක් විය හැකිය. නැතහොත් තමන් දෙසට එන මිනිසුන්ට තමන් ගේ නොකැමැති බව හැඟවීමක් විය හැකිය. මේ ශබ්දයක් පාර අයිනේ ලැහැබ ඇතුළේ බඹ කිපයකට එහායින් නික්මෙනු වරක් අපට ඇසුණේය. ඒ එක්කම ඌ කැලෑව අතරෙන් දුවන හඬ ද ඇසුණේ ය. නමුත් ඌ දිව්වේ අපෙන් ඈතට නොව, කැලේ අතරෙන් පාරේ අප යන අතටම බවත්, වැඩි දුරක් නොගොස් නතර වූ බවත් දැනුණේය.

කැලේට හඳ පෑවූ විට පඳුරු අතරේ නම් අලියා දැක්ක හැක්කේ අමාරුවෙනි. සමහර විට හැම පඳුරක්මත් ලොකු කුඩා අලින් මෙන් ද පෙනෙයි. මට හැම පැත්තෙන්ම පෙනුණේ අලින් අප වට කරගෙන ඉන්නාක් මෙනි.

---

1. 'අලින්ට පුච්චන්ට' යයි කියන්නේ අලින්ට වෙඩි තැබීමට යනුය. මේ වෙඩි තැබීම මැරීම නොව ශබ්දයෙන් බිය කොට පන්නා හැරීමය. වෙඩි තැබීමට කියන්නේ පිවිසීම ය. ගෝනෙක් පිවිසුවා, ඌරෙක් පුස්සගන්ඩ යනවා ආදී වශයෙනි.
2. කැප් තුවක්කුව පතරොම වෙනුවට බෙහෙත් දමා වෙඩිල්ල කොටා ගත්තා පරණ කාලයේ තුවක්කු. මෙහි ව්‍යවහාරය කැප්ප යනු ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

මේ පාර හරහා එක්තැනක මිනින්දෝරුවන් විසින් කැලෑව මැදින් කපන ලද ලැයිමක්[1] වෙයි. මේ ලැයිම ළඟට ආකල නැවතත් අර ටිකක් දුර දුව ගොස් නතර වුණු අලියාගේ ශබ්දයක් ඇසුණේය. එදෙස බැලූ අපට ලැයිම මැද සිටගෙන අප දෙස බලන අලියකු පෙනුණේය.

මේ ලැයිම මැද, හඳ එළියෙන් එහි සිටින අලියකු ගේ රුවෙන් අපට පෙනෙණ ප්‍රමාණය ඉතා සුළුය. අලියකු පෙනන්ට ඉන්න කල ඒ දෙස බලා ඉඳිම ද, පුළුවන් වැඩක් නොවේ. මිනිසුන් බැඳ ගෙන හිලෑ කරගත් අලියකු දකින්නාක් මෙන් වල් අලියකු දෙස බලා සිටිය නොහැකිය.

වෙඩිල්ල තබන්ට යයි මම සුදු බණ්ඩාට කනට කර කීමි. එහෙත් සුදු බණ්ඩා තුවක්කුව උස්සන්ටත් පළමු අලියා වෙතින් ශබ්දයක් නිකුත් විය. අප සමග සිට හැම දෙනාමත් දුවන්ට ඉගැලුණහ. අතිත් හැමෝම ගමට දුව යාම නිසා ඉතිරි වුණේ සුදු බණ්ඩාත්, වන්නිසිංහත්, මාත් පමණකි. අලියා දිවිවේ තවත් ඉදිරියට ම ය. අපිත් තව ඉදිරියට පාර දිගේ ගියෙමු.

ඉදිරියේ මුම්මාරියෙහි පෙම් කෙළින ඇත් රංචුවේ හඬ ළඟ ළඟම ඇසුණේය. අපේ බලාපොරොත්තු, ඒ වෙල් එළියටම ගොස් ඔවුන් පෙම් කෙළින හැටි බැලීමය. එහෙයින් අපි තුන්දෙන කතා නැතිව වෙල් එළිය ළඟටම ගියෙමු. තවත් ඇත්තේ බඹයක දෙකක පමණ දුරය.

හදිසියෙන් අපට බඹ දහයක් පමණ ඉදිරියේ අයිනකින් මහ හඬක් නැගුණේය. ඒ සමගම පාරට පැන්න දැවැන්ත අලියකු ඒ එළිමහන හරහා යන හැටි අපට පෙනුණේ ය. ඌ ගමන් කළ එතැන පදුරු අඩු පිටියකි එහෙයින් අපට ඌ හොඳහැටිම පෙනුණේ ඌ අප දෙසටම එන්නාක් මෙනි. ආවේත් එහෙම දැයි මම නොදනිමි. එවිටම 'වෙඩි තබන්ට' යයි සුදු බණ්ඩාට හයියෙන්ම කීමි. ඒ එක්කම වෙඩිල්ල පත්තු වී අප ඉදිරිය දුමින් පිරී ගියේ ය. මම මහ හඬින් හූවක් කීවෙමි. වන්නිසිංහ මහ හඬින් මන්තරයක් කීවේ ය.

එහෙත් අලි රංචුව සීසී කඩ දුවන හඬක් ඇසුණේ නැත. එහෙම දිවුම උන්ගෙ සිරිත නොවේ. මිනිත්තු තුන හතරකට පසුත් අප එතැන කතා කරමින් ඉඳිද්දීත් ඒ ඉදිරියේ යළින් අලින් ඉන්නා ශබ්ද ඇසුණේ ය. ඒ ඇසුණු වන්නිසිංහ

"හා රාෂා, ඉඳ, රාෂා ! ඉඳ" කියමින් මන්තරයකින් අඩ ගැසූ නමුත් ඌ ආවේ නැත.

1. යාරයක් පමණ පළලට හරි කෙළින් කපා සැදූ පාරක්.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

සුදු බණ්ඩාගේ තුවක්කුව බෙහෙත් කොටන කැප්ප තුවක්කුවක් නව කලින් කීම්. එහි තිබුණු වෙඩිල්ල අවසානය. අලින් තවමත් ඉන්නා නව දැනුණ නිසා අපි ආපසු ආවෙමු. ඔවුන් අප ආවාට පසු යන්නට ඇත. තවත් පැයකින් පමණ ගමෙන් අනෙක් පැත්තේ පල්ලම් ඔයේ දහලන අලින්ගේ හඬ මට නැවතත් ඇසෙන්නට විය. මම බියෙන් ශ්‍රිකෙන්නට වීම්. දැන් අලින් ඉන්නේ මගේ වාඩියේ පැත්තෙනි. එහෙත් ගමේ අනෙක් කවුරුත් නිදිය. එහෙයින් මම ඇතුළට වී දෙරවල් වහගෙන අලින් මගේ වාඩියට එයිදෝයි එහෙන් මෙහෙන් එබී බලමින් පාන්දර වන තෙක්ම නිදි මැරුවෙමි. මිනිසුන් අලින්ට ඇති බිය ද අපමණය. මේ ගම්වල මිනිසුන් සමග අලින් ඇති තැන්වල ගැවසෙන්නට යාම ද භයානකය. සමහර විට තුවක්කුවක් අතේ ඇතිව ඉස්සරහින් යන වෙඩික්කාරයා ද අලියකු මුණ ගැසුණු කල තුවක්කුවත් ගෙන පලා දිවීම සිරිත ය. එහෙත් එසේ අනෙක් අය දමා නුදුවන, නොහොත් නුදුවන බැව් කියන වෙඩික්කාරයෝ ද, මන්තර දන්නා හෙයින් එහි විශ්වාසයෙන් බිය අඩු කරගෙන, මහ හඬින් මන්තර මතුරා සතුන් බිය වද්දා පලවන ඇතැම්මු ද වෙති.

මන්තරයක් නැතත් කෙනෙකුට හිත බිය වද්දා නොගෙන මුණ දෙන්නට පුලුවන්නම් එක කට හඬකින් මේ සතකු පලවා ගත හැකිය. මෙසේ ශබ්ද නහා කෑ ගැසීමට ද මෙහි බොහෝ දෙන සමර්ථ ය.

පාදගොඩ දැන් සිටින පෝඩියාරෙ හොඳ හපන්කම් ඇති පුද්ගලයෙකි. ඔහු පෝඩියාරෙ කෙනකු වී සිටින්නේ ඔහුගේම උත්සහය නිසා විය යුතුය. පළාතේ බොහෝ දෙන නොකරන හපන්කම් ඔහු කරයි. වල් හරකුන් බැඳීම ඉන් එකකි. ඔහු ආණ්ඩුවෙන් බලය ලැබගෙන, කැලයේ ගොස් මදු දමා වල් හරක් නාම්බන් අල්ලා ගෙනවුත්, හණ ගසා පට්ටියට එක් කරයි. වතාවක් ඔහු මුස්ලිමුන් හා එක් වී අලින් දෙදෙනෙක් ද බැන්ද හැටි කියයි.

එහෙත් මේ කතා කියයුත්තේ පසුවය. අපේ ගමන - යන්නට ආ වඩිනාගල ගමන පිටත් වූ සැටි දැන් කිව යුතුය.

එද රෑ ඉස්කෝලෙ දී රෑට කෑම උයාගෙන කාලා අප නින්දට වූ බව කලින් සඳහන් කළෙමි. ගුරු නිවාසයේ නිදා සිටි මා පාන්දර පහට පමණ අවදි වුණේ සුරපති වන්නමේ නාදයකිනි. මා ඇස හැර බලන විට අපේ ගුරුතුමා - හැන්දවේ උණ කියා හිස සිට දෙපතුළට පොරවාගෙන නිදා උන් අපේ ගුරුතුමා - "අගය වඩන කව් වරුනා - රහය දැනෙයි කළ රචනා" යනුවෙන් සුරපති වන්නම මහ හඬින් කියමින්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

- අසුරු සනින් තාල දෙමින්, ඔහුට ම විශේෂ වූ නැටුමකින් නටමින් සිටිනු පෙනුණේය. රෑ යහපත් ආහාරයෙන් සහ විශ්‍රාමයෙන් පසු ඔහු සම්පූර්ණයෙන් සුවපත්ව සිටියේය.

ඉන්පසු අපි කවුරුත් නැගිට පළමුකොට ඉවිවෙමු. අපට ගමන පිටත්වෙන්නට පුලුවන් උදේ 9යෙන් පසුවය. එතෙක් වනසතුන්ගේ වේලාව හෙයින් මහට බැසිය නොහැකිය. වඩිනාගලට අප පිටත්වන තැන සිට ඇති දුර හැ. 10කි. උදේ හොඳහැටි බතක් උයාගෙන කාලා බඩවල් පුරවාගෙන පිටත්වීම අපේ අදහස විය. එහෙයින් උදේත් කවුරුත් එකතු වී යහමින් බතක් උයා, මාලුවක් ද හැදුවෙමු. බාස් අයියා ද උදේ සනීපයෙන් සිටියේය. එහෙයින් කවුරුත් එක් වී කෑම කා 9 ට පමණ ගමනට පිටත් වුණෙමු.

දැන් ගමනට පස් දෙනෙකි. දමනෙත් ආ තුන් දෙනාට මෙහි දී එක් වුණේ පාදගොඩ ගුරුතුමාත්, බාසයියාත් ය. ගුරුතුමාත්, බාසයියාත් දෙන්නාම මේ ගමනේ කලින් ගොස් පුරුදුකාරයෝ ය. අපි තුන් දෙන කොඩුකාරයෝ වීමු. එහෙත් මා ගමන් කළේ මගේ හෙල්ලත් අරගෙන ඉදිරියෙන්ම ය. බාසයියා ඔහුගේ මන්න පිහියත් අතේ ඇතිව පස්සෙන් ම ගමන් කළේය.

පාදගොඩින් එහා පාර එතෙක් ආ දුරටත් වඩා නරක බව කිවයුතු නොවේ. සමහර තැනක කරත්ත රෝද පාරවල් දෙක අතරේ වැඩෙන පඳුරු අප තරම් ම උස ය. ඉන් දෙපැත්ත බොහෝ තැන්වල උසට වැඩුණු මහ ගස්වලින් යුතු මහ බැද්දය. සමහර තැනක අපේ හිස් උඩින් ද එකට බැඳුණු කටු බැද්ද ය. මේ පාරේ කරත්ත යන්නේ ඉතාම කලාතුරකිනි. සමහර විට අතර මග ගස් වැටී තිබුණොත් කරත්තවලට කැලේ කපා පාර අමුතුවෙන් හදගෙන ද යන්නට සිදු වෙයි.

මහ බැද්ද අතරතුර තැන තැන ගත ව වැඩුණු ඉළුකින් වැසුණු තලාව ද විය. තලාවේ දී පාරේ රෝද පාර ද දෙපස ඉළුක් කොළවලින් වැසී ගෙන ය. තැන තැන ඉළුක් සමග පැටලුණු නිදිකුම්බ ගාල් ද වෙයි. ඒවායේ ගමන ලොකුම විදයකි.

කොහොම නමුත් අපි හැ. 3ක් ගෙවා **කොක්නහර** ගමට ළඟාවුණෙමු. අපේ ගුරුතුමා කලක් කොක්නහර පාසැලේ ද වැඩ බැලූ කෙනෙකි. එහෙයින් ඔහුට කොක්නහර ගම හොඳට පුරුදු ය. කොක්නහර එකල තිබුණ පාසැල දැන් නැත. එය හෙවිල්ලන්ට කෙනෙකු නැතිව කඩා වැටී ඒ ගෙපළේ පැලවුණු වරා පඳුරු දැන් මිනිස් උසකට වඩා උසය. කවුරුත් නමුත් උත්සාහවත් එක් ගුරුවරයකු මෙහි ඉදිද්දී වගාකරන

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ලද දෙඩම්, දෙහි, අඹ, කොස් ආදී ගස් දැන් වනයට එක් වී ඇත්තේ ය.

කොක්නහර, පාසැල පමණක් නොව ගම ද දැන් දැන් පාලුවට යනු පෙනෙයි. මේ ලියන දවස්වල කොක්නහර ගමේ තිබුණ ගෙවල් හත අටෙන් පාලුවට නොගොස් තිබුණේ ගෙවල් දෙකක් පමණය. ඒ ගෙවල් දෙකේ ඇත්තෝ ද එකිනෙකාට නොමනාපයෙන් වෙන් ව ජීවත් වූ හ. ඉන් එක් ගෙවත්තක තිබුණ පොල් ගසුත්, තවත් පැලෑටිත් වල් අලින් විසින් පෙරළා කා දමා තිබුණ හැටි මම ඊයේ පෙරේද දුටිමි.

එද අප යන කල ද නොක්නහර ගම අපට පෙනුණේ පාලුවක් ම මෙනි. පාරට පෙනෙන්නට තිබුණේ ගෙවල් දෙකක් පමණකි. මිනිසුන් ඉන්නා බවක්වත් පෙනුණේ ඉන් එකක පමණකි. ඒ ගෙදර ටිකක් නැවති වතුර බී අපි එගමින් ද පිටත් වුණෙමු.

වඩිනාගල දක්වා අතර මග ඇති ගම් හැම එකක්ම පල්ලම් ඔය අසලම පිහිටි බවත් එහෙයින් පාර පල්ලම් ඔයෙන් එතෙර මෙතෙර වෙමින් යන බවත් සිතියමෙන් දක්ක හැකිය.

අප මේ ගමන ගියේ මාර්තු මාසයක දී ය. මාරතුව ඇස්සෙන් පසු, තවමත් ඔය කඳුරුවල ගලන දිය ඇති කාලයකි. එහෙයින් ඉන් එතෙර මෙතෙර වුණු හැම තැනක දීම අපි ටික ටික නැවතුණෙමු. පල්ලම් ඔයේ මෙකල ගලන දිය ඉතා පැහැදිලිය. අහස් නිලට හුරු මද පැහැයක් වතුර වැඩි තැන්වල පෙනෙතත්, ඒ ඒ තැන එහා මෙහා දුවන පෙතියන්, අන්කුට්ටන් හොඳහැටි දක්ක හැකිය. එහි දිය ඉතා සිහිල්ය. මහ කැලේ මැද සිහිල් සෙවනේ ගළන හෙයින් විය යුතුය.

කොක්නහර පසු කොට හැ. 2ක් පමණ ගිය තැන **දේවාල හිද** නමැති ගමකි. එගම ඇත්තන්ට හරකුන් ඇති බව ගම පෙරමුණේ පිහිටි ගවගාලෙන් පෙනුණේය. එහි ගාලක් කොටුකර නැතත් අහල පහල ඇති කොටින්ට බිය නිසා හරක් ගම පෙරමුණට ම පැමිණ තිදති. මේ තැන තට්ටු ගණනක් බැඳී ඇති ගොම වැසි කලට තේමගත් කල එහි දර්ශනය අපූරු එකක් වෙයි.

දේවාල හිද සිට තවත් හැ. 3ක් ගිය තැන, පාදගොඩ ට හැ. 8ක් දුර **කිව්ලෙගම** ය. කිව්ලෙගම ද ගෙවල් තුන හතරක් ඇති ගමකි. අපේ පාරට පෙනුණේ ඉන් ගෙවල් දෙකක් පමණකි. ඉන් එක් ගෙදරක දී අපේ ගුරුතුමන් අඳුනන කෙනෙකුගෙන් තේ සංග්‍රහයක් අපට ලැබුණේ ය. ගෙහිමියාම වතුර මුට්ටිය ලිප තබා, වීදුරු කෝප්ප සියතින්ම සෝද, සියතින්ම තේ හද දෙනු දුටු මට අපේ පැරණින්නන් තුළ තිබුණ ආගන්තුක

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

සත්කාරයෙහි උසස් බැවින් කොටස් තවමත් මේ කැලෑ මැද දක්ක හැකි බව හැඟුණේය.

කිව්ලෙගමින් හැ. 2ක් දුර අපේ ගමනේ කෙළවර වූ වඩිනාගල ය. වෙහෙස හා අව්ව හොඳට ම බලවත් නමුත්, ගමන කෙළවර කොට නිවාඩු ගන්න අදහසින් අපි එතැනිනුත් පිටත් වුණෙමු. කිව්ලෙගම්ට හැතැප්මක් දුරින් යෝද ඇල නම් ගමක් ද තිබුණේ ය. මෙයට මේ තම දෙන යෝද ඇලක කොටස් ද, පැරැණි විහාරයක නටබුන් ද, ඒ පිළිබඳ කිය යුතු කතා ද බොහෝ ය. එහෙත් මේ එකකටවත් වෙලාව නොවේ.

එහෙයින් අපි කෙළින්ම යෝද ඇල පන්සලත්, ගමත් පසුකර ගෙන, ඉතිරි හැතැප්මත් ගෙවා ගොස් දවල් දෙකට පමණ වඩිනාගල ආරච්චිල ගේ ගෙදරට පැමිණියෙමු.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

6

යෝද ඇලේ කතාව

මේ තෙක් වෙහෙස විඳ එතෙක් දුර ගෙවා ගෙන අප වඩිනාගලට අවේ, නිකම් නොව, බැලිය යුතු දේවල් කිපයක් ම නිසා ය. අප එද්දී පසුකරගෙන ආ **යෝද ඇලේ පන්සල**[1] ඉත් එකකි. ඒ අසලම පල්ලම් ඔයෙන් අනික් පැත්තේ ඇති උණු දිය **බුබුල**[2] තව එකකි. **වඩිනාගල කන්දේ** සුදු ගල්ගුහාව අනිකය.

යෝද ඇල බැලීම පසුවද උදේ ආපසු එද්දී කිරීමට තීරණය කරගත් අපි ඒ හවසම වඩිනාගල කන්දට යන්නට සිතුවෙමු. ගමේ සිට කඳු පාමුලට දුර හැ. 3ක් පමණ බවත්, කඳු පාමුල සිටම අලි වලසුන් නොමඳව ගැවසෙන මහ බැද්ද බවත් කියන ලදී. එහෙයින් තුවක්කුවකුත් සමග මගපෙන්වත්තෙක් ආරච්චිල විසින් සොයා ගන්නා ලදී.

ගමේ සිට හැ. 2ක් පමණ ලඳු කැලෑ හා තලාව අතරින් ගමන් කොට කඳු පාමුලට පැමිණියෙමු. එතැන් සිට අප ඇතුළු වුණේ මහ වනයට ය. ඒ වේලාවේ පිටත හොඳ හැටි ආලෝකයත්, අව්වත් පැවති නමුත් වනය ඇතුළත අඳුරු විය. සිහිල් විය. උසට වැඩුණු රුස්ස පෙළ යට කුඩා පැලෑටි තිබුණේ තැනින් තැන පමණකි. එහෙයින් මහ ගස්වල කඳන් අතරෙන් වනයේ හුහක් දුර දැක්ක හැකි විය. එය, ගස් වැල්වල කඳන් නමැති සතුන් අරක්ගත් අමුතු ලෝකයක් බඳු විය. එහි මහත් නිශ්චල බවක් විය. වන මුදුනේ ඒ ඒ අතින් නොයෙක් කුරුල්ලන් ගේ නානාවිධ නාද ඇසුණේය.

වනයේ කොතෙක් ගස් වර්ග ඇතත් ඒවා වැඩීමෙහි පිළිවෙලක් දැක්ක හැකිය. එක එක මණ්ඩිවල ඒ ඒ වර්ගවල ගස් සමූහ වශයෙන් වැඩීම මේ පිළිවෙල ය. එහෙයින් කුඹුක් මණ්ඩියේ තරගෙට වැඩෙන

---

1. අහලේ සිහියමේ 'කිවිලෙගම විහාර' නමින් සඳහන් ය.
2. උණු දිය උල්පත ය. උල්පතට දිය බුබුල යනු මෙහි ව්‍යවහාර ය.
3. උඩ-නැගෙනහිර පළාත් සීමාව මේ කන්ද මුදුනෙන් වැටී ඇත්තේ ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

කුඹුක් ය. කොළොං මණ්ඩියේ යෝදයන් වැනි කොළොං ය. ගැමි ඉණ්ඩියේ තරගෙට අහස මනින හැම් ය.

මෙසේ එක ම වර්ගයක ලොකු වැල් රාශියක් එක ම මණ්ඩියක වැඩිමෙන් අමුතුම අලංකාරයක් ගත් බිමක් අපට දකින්නට ලැබුණේය. අප අවට මුළු පේන-මානය ම, ඒ ඒ අතට ඇඹරෙමින් අවට තිබුණු ගස් වහල් කොට ගෙන ඉහළට නැගුණ ඒ ඒ තරමේ වැල්වලින් ම යුතු විය. මේ වැල් එකිනෙක ගත් හැඩයෙන් එනතට ලැබුණු අමුතු පෙනුම සුළු පටු නොවේ. ළමයින් ගේ සෙල්ලම් ගෙයකට අමුතු රටකින් නොව, අමුතු ලෝකයකින් ගෙන්නූ උපකරණ සමූහයකින් එතැන අලංකාරව නිබෙන්නාක් මෙන් මට පෙනුණේ ය. සමහර වැල් සැප පහසු ලෙස ඉඳ ගැනුමට තුබූ අත් පුටු වැනිය. තවත් සමහරක් සනීප පුටු-කව්විවි. සෝපා වැනි ය. ඒ ඒ මට්ටමට තැනුණු ඔංචිල්ලා ඒ අතරය. ඉහළ දී ඒ ඒ අතට බෙදී ගිය වැල් පොටවල් ද, වැල් එල්ලාගෙන සිටි ගස්වල මුදුන් ද එතැනට කරවු සැරසිලි වැනි ය.

මේ උයනේ, නැන්තම් සෙල්ලම් මඩුවේ, සෙල්ලමෙහි යෙදෙන අය කවුරු ද යනුත් පිය සටහන්වලින් දැන ගත හැකි විය. බිම ඒ ඒ තැන තවමත් ටික ටික වතුර ඇති මඩ වළවල් ය. එහෙත් ඒවා වල් ඌරන් ගේ නොවන බව පා සටහන්වල මහතින් පෙනුණේය. ඒවා ඌරන් ගේ මෙන් ම කුර සටහන් ය. එහෙත් දිගින්, පළලින් සමහරක් වියතට අඩු නැත. එහෙයින් එය කුර ඇත්තන් ගේ වනයට ලොක්කන් වන වල් හරකුන් ගේ - - කෙළි බිමක් බව පැහැදිළි විය. වල් හරකුන්ටත් සබා මළු ඇත්නම් මේ ඉන් එකකි.

මෙය පසුකර ගෙන අපි තවත් ඉදිරියට ගියෙමු. වනය එන්නට එන්නට ම වඩ වඩා ගැඹුරු විය. වඩ වඩා අඳුරු විය. නැම්බර[1] අපේ මග පෙන්වන්නා තුවක්කුවත් කර තබා ගෙන ඉස්සරහින් යයි. ඊළඟට මම මගේ හෙල්ලත් ඇතුව ගමන් කළෙමි. සිරිමල් සහ කරුණාත්, වඩිනාගල ආරච්චිත් පස්සෙන් වූහ.

මේ බැද්ද අලි වලසුන් බොහොම ගැවසෙන බිමක් බව කලිනුත් කිමි. කැලෑවේ කරන මෙබඳු ගමනක දී අලියකු මුණ ගැසුණොත් සිදුවිය හැකි දෙය ආරච්චිල විස්තර කළේය. ඔහුගේ කිමේ හැටියට, පළමුවෙන්ම දුවන්නේ ඉදිරියෙන් තුවක්කුවත් අතේ ඇතිව ගමන් කරන වෙඩික්කාරයා ය. තුවක්කුවත් අරගෙන ම ඔහු දිවුම නිසා අනෙක් අයට

1. ඔහු ගමෙන් ගම්කාර්ය සභාවට තේරුණු සාමාජිකයා ය. එහෙයින් ඉංගිරිසියෙන් මැම්බර ය. ගමේ ඔහුට ව්‍යවහාරය නැම්බර ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ඉතුරු වන්නේ අතේ, පයේ නැත්තම් පුල්ලෙයාරේ[1] දෙවියන් හෝ කතරගම දෙවියන් හෝ පිහිට පමණකි. එහෙත් දෙවියන් පිහිට බලාගෙන සිටි තැන සිටිය නොහැකිය. එක්කෝ ලොකු ගහකට නැග ගත යුතුය. නැතහොත් අලියකුට වඩා හයියෙන් දිවිය යුතුය. අලියකුට වඩා හයියෙන් දිවීම ලේසි වැඩක් නොවේ. අලියා දිවීමෙහි සමතෙකි. එහෙත් එහාට මෙහාට හැරි හැරි දිවීම, තමන් ලොකු හෙයින් අපහසු ය.

මේ කැලේ අලියකු පස්සෙන් ඇතිව දිවීම කොහොමට වත් ලේසියක් නොවේ. නුවණට හුරු ගහකට නැග ගැනුම ය. එහෙයින් නගින්නට පුලුවන් ගස් ගැන මම විමසිල්ලෙන් බැලීමි.

දවසක් ද අලියකුට බයෙන් අපට ගහකට බඩගාන්නට සිදු වූ හැටි (විස්තර කිරීම පිණිස මදක් අවසර දෙනු මැනවි.) මෙහි දී සිහියට නැගෙයි.

එය සිදු වූයේ **කිණිහිරිත්ත** නමැති ගමක් අසල දී ය. එද අපි තුන් දෙනෙක් එගම මහ වෙඩික්කාරයා[2] හමුවීම පිණිස ඔහුගේ ගෙදරට ගියෙමු. ඔහු ගෙදර නොසිටියේ ය. ඔහු 'අලියට **පුච්චන්ඩ**' ගිය බව මිදුලේ සිටි ඔහුගේ බිරින්ද විසින් කියන ලදී.

"කොහා ?"යි අප සමග සිටි **අමරකෝන්** ඇසුවේ ය.

"**ඉළුක් මුම්මාරියෙ**" යන පිළිතුර ලැබුණේ ය.

"යමු, අපිත් !"

තවත් මොහොතකින් අපි තුන්දෙනා ඉළුක් මුම්මාරියට යන පාරේ දුවමින් සිටියෙමු. වෙඩික්කාරයා කොතැනක ද, අලියා කොතැනක දැයි නොදැන කරන මේ දිවුම ගැන මට සැක ඇති වූ නමුත් ඒ ගැන කතා කිරීමට වේලාවක් නොවී ය. අමරකෝන් ඉස්සරහින් දුවන අතර අපි දෙන්න පස්සෙන් දිව්වෙමු. දමන පාදගොඩ පාරෙන්, ඉළුක් මුම්මාරියට යන පාරට හැරුණු පසු දිවුම බාල කොට ඉක්මන් ගමනින් ගියෙමු.

දුර යන්නට යන්නට අපි තවත් පරීක්ෂාකාරී වුණෙමු. මේ හරියේ, බිම, තලාව අයිනේ තැන තැන වැඩෙන ලොකු කුඩා පඳුරු ඇති විය. එහෙත් මහ බැද්ද ද ඒ ළඟ ම ය. ඈත මීහරකුන් දක්කන කිසිවකුගේ හඬක් ඇසුණේ ය.

---

1. පුල්ලෙයාරෙ යනු ගණ දෙවියන්ට දෙමළ නම ය. පළාතේ අයගේ ඇදහීම පුල්ලෙයාරෙ සහ කතරගම දෙවියන් ය. දෙමළ ඇසුර නිසා කවුරුත් පුල්ලෙයාරෙ කියනු විනා ගණ දෙවි නමකුත් නොදනිති.
2. මහ වෙඩික්කාරයා, හීන් වෙඩික්කාරයා යයි සොහොයුරෝ දෙදෙනෙක් මේ ගම වෙති. මහ, හීන් යනු ලොකු, පුංචි යන තේරුම් ඇති වචන වෙති.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

දැන් අපේ ගමන හොඳටම විමසිල්ලෙනි. හදිසියේ ම මොකක්දේ ශබ්දයක් ඇසී අපි තුන් දෙන ම එක අතක් හැරී බැලුවෙමු. අපට බඹ පණහක් පමණ දුරින්, පඳුරු මැද, පිට්ටනි කොටයක කෙළවරේ, ඉත්නා අලියකු දකින්නට ලැබුණේය.

ඌ සනීප ලෙස වැඩුණු සිරුරකින් යුතු බවත්, ඒ වේලාවේ මඩ ගාගෙන මඩ පැහැයෙන් යුතුව සිටි බවත් මොහොතක කාලයක් තුළ අපි දුටුවෙමු.

"යමු, යමු දුවමු, ගහකට !" යි අමරකෝන් මැතුරුවේය. අපි ආපසු හැරී අසලින් තිබුන ලොකු දඹ ගසක් දෙසට දිව්වෙමු. අප දකින විට අලියා උන්නේ අපට හරහා පා ගෙන ය. එහෙයින් අප ඌ දුටුවාක් මෙන් ඌ අප දුටු බව ද නියතය. ඌ එළවාගෙන ආවොත් ඒ මහ පයකට මගේ පිටකොන්ද යටවන හැටි ද මට සිතට හැඟුණේය. එහෙත් ඌ ආවේ නැත.

අප දුවගෙන ගියේ බදන්නට බැරි මහත නමුත් පහළම දෙබලකුත් ඇති දඹ ගහක් වෙතය. අමරකෝන් කිසි අමාරුවක් නැතිවම අඩියෙන් දෙකෙන් ගස මුදුනට වුණේ ය. සිරිමල් ද ඒ පස්සෙන් නැඟුනේ ය. මමත් වැඩි අමාරුවක් නැතිව පළමුවැනි දෙබලට නැග ගතිමි. දෙවැනි දෙබලට ද අමාරුවෙන් නැග ගතිමි. එතැන් උස ද අලියකු ගෙන් බේරීමට තරම් නොවන හෙයින් තුන්වැනි දෙබලටත් නැග්ග යුතු විය. එය පහසු වැඩක් වුණේ නැත. නමුත් බය ! නිසා නොකළ හැකි වැඩක් නැත. එහෙයින් පපුවත්, දතත් තව තවත් සීරෙද්දී එතැනින් ද ඉහළට ඇදී ගතිමි.

මිනිසකු ඇස ගැසුණු පමණින් එළවීමවත්, ශබ්දයක් ඇසුණු පමණින් ඉහලූ අත පලායාමවත් අලියා ගේ සිරිත නො වේ. යමක් කිරීමට පළමු ඌ ඒ ගැන සිතා බලනවා විය යුතු ය. ඒ වෙලාවට ඌ පඳුරකින් ආවරණ ලැබ, නොසෙල් වී, ශබ්දයක් නූපදවා විමසිල්ලෙන් සිටියි. ඒ සිටීමේ දී, ශබ්දයක් නොකිරීමට ඌ ලොකු පරිස්සමක් දරන නමුත් නොදනුවත්වම උපදින ශබ්දයක් ද වෙයි. ඒ කන් පොතු සලන හඬ ය.

අප ගස උඩට වී මඳ වේලාවකින්ම අලියා හෙමි හෙමින් අපට ළං වුණු බව සලකා ගතහැකි වූයේ මේ කන්පොතු සලන හඬ නිසාය. තවත් ටික වේලාවකින්, මීහරකුන් දක්කාගෙන වෙඩික්කාරයා අප අසලට ම එන තුරු ඌ ඒ අසලම සිටියේය. ඔවුන් ළඟටම පැමිණෙන විට ද ඌ කැලෑවේ තවත් ටිකක් ඇතට වැදී නිශ්චල වුණා මිස පලා දිව්වේ නැත.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner



රෙන ලෙනක

ඡායා රූපය (වම් පැත්තෙ) යියාට පැල නවමු කිහිපී.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

මේ සිද්ධියෙන්, අලියකුගෙන් බේරීමට උවමනා වූ විටක ගසකට නැග ගැනීම මට හැකි බව දනගතිමි. අලියකුගෙන් බේරී අතපය සිරුණාට වරදක් නැති නිසා අවස්ථාවක් ආවොත් ඒ ක්‍රමයම යොදන්නට සිතා ගතිමි. එහෙත් අවස්ථාව වඩිනාගල ගමනේ දී ලැබුණේ නැත.

අන්තිමේ දී අපි කන්ද පාමුලට ම පැමිණියෙමු. එහි නැග්ම ශීඝ්‍ර විය. එහෙයින් ඒ ඒ අතින් ගස් අල්ල අල්ලා නගින්නට සිදුවිය. මේ නැග්මේ බිම, ස්වභාවයෙන් පිහිටි පස නොව ඉහළින් කඩා වැටුණු ගඩොල් සහ මැටි බව පෙනුණේය. සමහර තැනෙක පස්ගොඩ රෑරාගෙන පහළ බසින සුලු විය. එහෙත් නොවැටී අමාරුවෙන් නැග ගල්ගෙයට පැමිණියෙමු.

එය අඩි හැත්තෑවක් තරම පළල් වුත්, පිටත දී අඩි විස්සක් පමණ උස්වුත් විවරයකි. මෙය කුඩා කාමරවලට වෙන් කිරීම පිණිස ගඩොලින් කළ බිත්තිවලත්, තවත් දේවලත් කොටස් දකින්ට ලැබුණේය. වැසිදිය ඇතුලට වැදීමෙන් වැළකීම පිණිස කොටනලද කටාරමට ඉහලින් සෙල් අකුරු පෙළක් ද දක්ක හැකි විය.

පසුව අපි ගල්ගෙයට පිටතින් තවත් ඉහළට නැග එය පිහිටි ගල මුදුනට ද නැඟුණෙමු. මුදුන කුඩා තැනිතලාවකි. එහි ද ගස් අතරේ පැරණි ගොඩනැගිලි ආදියේ නටබුන් දක්ක හැකි විය. මේ මුදුනේ සිට වඩිනාගල පැත්ත බලන විට තැනින් තැන පිහිටි හෙල් සහිත වනයනේ වැසුණු තැනිතලාව පෙනුණේය. එවේලේ එය සම්පූර්ණයෙන් නිශ්චලව තිබුණේය. වන හිසෙන් යට බිම දහස් ගණන් වන සතුන් ගෙන් යුතු වූ බව අප දන්නා නමුත් කුරුල්ලන්ගේ නාද හැර අනෙක් ශබ්දයක් පවා නො වී ය.

කන්දේ මීට වඩා උස තවත් මුදුනක් ද තිබුණේ ය. එහෙත් එයට නැගීමට ඒ වේලාව නො වී ය. අපේ නැම්බර කතා කරමින් එය මුදුනේ නිදනයක්[1] ඇති බවත්, රැයට එය මුදුනේ දෙවිලියන් හැසිරෙන බව හා, ඔවුන්ගේ සිනාහඬ ඇසෙන බවත්, නිදනය ගන්නට තැත්කළොත් මිස ඔවුන්ගෙන් කාටවත් අනතුරක් නොවන බවත් කීවේය. දෙවිලියන්ගේ සිනා හඬ ඇසීමට එහි යාම අපට එදා කළහැකි වැඩක් නොවේ. එහෙයින් අපි අතේ තිබුණ දෙඩම් ගෙඩි කීපයක් කෑමෙන් පසු පහළ බැස ගමට ආවෙමු.

1. මෙහි හැම කඳු මුදුනකම, ගල් ගොඩැලිවල නිදන් ඇති බව කියනු ලැබේ. එවා ගන්නට උත්සහ කළ නොයෙක් දෙනා පිළිබඳ කතා ද, සළකුණු ද ඇත්තේ ය. එහෙත් ගොඩගත් නිදනයක් හෝ කෙනකු හෝ ගැන දනගන්නට නැත.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ගමට එද්දී සැලකිය යුතු දෙයකට වුණේ අපට වල් මිව්වන්[1] රංචුවක් මුණ ගැසීම පමණකි. අපට පෙනුණේ උන්ගෙන් දෙතුන් දෙනකු පමණය. හිස් මසවාගෙන, අං ඇති යෝදයන් මෙන් බලා සිටි ඔවුහු නැම්බර ගේ 'මහොයි' ශබ්දයෙන් පලා ගියහ.

වල් හරකා ද මී හරකාමය. එහෙත් ගමේ ඉන්නා මිව්වනුත්, මොවුනුත් දකින කල මිනිහා විසින් බැඳගෙන වද කරවීමෙන් ඔවුන් පිරිහීමට පත්කර ඇති තරම සිතා ගත හැකි ය.

ගමට ඒමෙන් පසු අපි එහි ගෙවල් ආදිය අතරේත්, හේත් යායේත් ඇවිද්දෙමු. ගම, මෙහි අනෙක් ගම් මෙන්ම එකටෙක ළං ළංව පිහිටි ගෙවල් කිපයකින් යුතු විය. මිදුල් නොඇස් වැටවලින් එකිනෙකින් වෙන් විය. යමහර මිදුල්වල කොස්, අඹ ආදි ගස් තිබුණ නමුත්, එලවළු ආදි වැවිලි කිසිවක් නො වී ය. ගමේ බොහෝදෙන හේත් යායවල හෙයින් ගැහැණුන් හා ළමයින් පමණක් ගමේ හැසිරෙනු දක්නා ලදි.

මේ ඇවිදීමේ දී මට එක්තරා අපූරු වචනයක් අසන්ට ලැබුණේය. එක්තරා වැඩිහිටි ගැහැණියක්, තවත් කෙනෙකුට ආරච්චි ගැන කිසිවක් කියන ගමන් 'ආරච්චි හපුවා'[2] යි සඳහන් කරනු මට ඇසුණේ ය.

ගමේ ගෙවල් අස්සේ වැටවලින් පැන පැන කළ අපේ ඇවිදීම ඔවුන් තුරුස්සන කරුණක් වේ ද ? යි මම සිතුවෙමි. "අප ගැන ඔවුන් කුමක් කියනවා ඇද්ද ?" යි මම ආරච්චි හපුවාගෙන් ඇසිමි.

"ආරච්චි හපුවා කැරකෙනවා මොක්කුදේ දන්ඩෝ වටේකුත් කැටුං" යනු ඔවුන් කියනවා ඇති දේ විය.

යෝද ඇලේ පන්සලත්, උණුදිය බුබුලත් බලන්නට අප ගියේ පසු ද උදේ ආපසු එන ගමන් ය. වඩිනාගලින් උදේ කෑම ගෙන පිටත්වූ අපි දහය පමණ වන විට යෝද ඇලට ළඟා වුණෙමු.

---

1. වල් හරකුන්ට පළාතේ ව්‍යවහාරය.
2. 'හපුව' යනු පණ නැති ඇති හැම නාමයකටම සාදර පූර්වක හැඟුමක් දෙන විශේෂණයකි. 'වතුර හපුව ගහමන්ඩ එපා - වතුර.... වීසි කරන්ඩ එපා කොලු හපුවා ඕගනවා - දරු පැටියා අඬනවා' ආදී වශයෙනි. ආරච්චි හපුවා ගමෙන්ම පැහැපත්, උගත්, පිරිසිදු තරුණයා විය. ඔහු එසේ සඳහන් වුණේ වැඩි හිටි නෑ දයකුගේ හුරකල් නමක් ලෙස ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යෝද ඇල ගමට මේ නම ලැබී ඇත්තේ, එ අසලින් තිබෙන පැරණි, යෝද-ඇලක් නිසාය. දැනුත් පළලින් හා ගැඹුරින් අඩි 20 හා 8 පමණ ඇති එය, පල්ලම් ඔය හරහා බඳින ලද බැම්මකින් හරවන වතුර පැරණි වැවකට ගැනීම සඳහා තනවන ලද්දකි. ඔය හරහා බඳින ලද බැම්මෙන් දැන් ඉතිරිව ඇත්තේ එහි වළළුකරක් වතුරට යටින් පෙනෙන අඩිතාලම පමණකි. එහෙයින් යෝද ඇල ද ගලන වතුරෙන් තොරය. කවද හෝ මේ ඇලට යෝද ඇල යයි කි නිසාම ගම ද යෝද ඇල විය.

එකල යෝද ඇල ගමට ගෙවල් තිබුනේ 6කි. ජනගහණය 22 ක් විය. ගෙවල් පිහිටි බිම අක්කර 25 ක් පමණ විශාල ඉතා සාරවත් බව පෙනුණ තැනිතලාවකි. එහි හැම තැනක්ම සරු ලෙස වැඩුණ කෙසෙල් හා දෙඩම්වලින් යුතු විය. මේ ගම කෙසෙල් ගැන ඒ පළාතේ අනෙක් ගම්වල ද ප්‍රසිද්ධ ය.

එහෙත් මේ ගම මා එද දක, අවුරුද්දක් ගත වනවිට වෙනස් වුණු ඉරණමකින් යුතු විය. අවුරුද්දක් ගතවන්ටත් කලින්, එහි විසූවන්, ගම පාලුවට හැර වෙන ගම්වලට ගිය බව අසන්ට ලැබුණේ ය. මට එය පුදුමයක් වූ නමුත් වැව් ගම් පත්තුවට පුදුමයක් නො වේ.

මීට පෙර අත් හරින ලද වැව්ගම් පත්තුවේ තවත් මෙ බඳු ගම් මෙන් ම, මේ ගම ද අත්හරින ලද්දේ, ඔවුන් සිතන හැටියට දේවකෝපයකට අසු වීමෙන් කීප දෙනකු මියයාම නිසාය. එය දේවකෝපයකින්ම වූවකැයි යන විශ්වාසය කොතරම් බලවත් ද යනු, ඔවුන් හැර දමා යන දේවල අගයෙන් පෙනෙන්නේ ය. එහි අගය දන්නෝ ද ඔවුහුම ය. මේ යාමෙන් ඔවුන්ට සිදුවන පාඩුව අසීමිත ය. එතැන් සිට නැවත හේනක් කොටා වපුරා ගෙපැලක් හද ගන්නා තුරු එවුන්ට ඉන්නට සිදුවන්නේ කාගේ හෝ ගෙදරක අයිනකය. වංගෙඩි-මෝල්ගස් ආදියත්, රෙදි කෑලි දෙක තුනත් හැරුණු විට වංචල දේපළකට ඔවුන් අත ඇත්තේ ඉරිහු-කුරක්කන් ආදී ඉතිරි වුණු බෝගයක් ඇතොත් එපමණකි. එහෙයින් දරු මල්ලන් ද ගෙන මගට බසින ඔවුන් වැටෙන අමාරුවේ තරම දන්නෝ ද ඔවුහුම ය.

මේ යෝද ඇල ගම පාලුවට හරින්නට හේතු වුණු මරණත්, ඒවා සිදු වූ අයුරුත්, ඒවා හා දේවකෝපයත් අතර ඇති සම්බන්ධයකුත් පිළිබඳ දිග කතාවක් මම ඇසීමි. කතාවට, මේ ගම පමණක් නොව, ඒ අසල පිහිටි පන්සලත්, ඒ කෙළින් පල්ලම් ඔයෙන් අනිත් පැත්තේ පිහිටි උණු දිය බුබුලත් සම්බන්ධය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පළමුවෙන් අප ගියේ උණු දිය බුබුල බැලීමටය. ගමේ අයිනේ දී යෝද ඇලට බැස, එය දිගේ ගොස් පල්ලම් ඔයේ වළඑකරක් වතුරෙන් එතෙර වී, මහ බැද්ද යටින් ටික දුරක් රිංගා එතැනට පැමිණියෙමු.

එය කළු පාට මඩ ගොහොරුවක අයිනකින් පිහිටි කුඩා දිය වළකි. ඒ අවට තවත් මඩ ගොහොරු හා දිය වළවල් තිබුණ නමුත් අනෙක් එවා උණු නොවී ය. එතැන පමණක් මඩ ගොහොරුව ද අඩිය තබන්නට බැරි තරමට උණුය. වටේට ගල් කැට කිපයක් තබා සකස් කරන ලද වළේ වතුර ඇඟට දමන්නට බැරි පුලුවන් තරම් උණු ය. එයින් නෑම නොයෙක් ලෙඩ රෝගවලට ගුණ බව කවුරුන් කියති. රෝගයක් නොතිබුණ නමුත් අපි කවුරුත් එයින් නෑවෙමු. තරමක් ලෙඩින් සිටි පාදගොඩ ගුරුතුමා ද නෑවේය.

ඊළඟට අපි නැවත ඔයෙන් මෙතෙරව පන්සල බලන්නට ගියෙමු. එද අප දකින විට එය, නොයෙක් වැවිලිවලින් පිරිගිය, කුඩා නමුත් පළාතේ හැටියට හොඳ ගෙයකින් යුත් අක්කර දෙකක් පමණ බිමකි. ඉඩමේ උඩහින් පැරණි විහාර ආදියේ නටබුන් විය. කුඩා දගැබක කොටසකුත්, ගොඩනැගිලි කිපයක ගල් කණු හා ඉන් එකක කැඩී බිඳී ගිය පිළිමයකුත් තිබුණේය. මේ හැම එකක් ම හැකි තරමින් සකස් කොට තබා, අලුතෙන් බෝ පැලයක් ද රෝපණය කරවා තිබුණේය. අලුත් දේවල් වූ කුඩා ගෙයත්, ඉඩමේ වැවිලිත් නොකම්මැලි යම් කිසිවකු විසූ තැනක ලකුණු පළ කළේය. මට දැනගන්නට ලැබුණු හැටියට මේ උත්සාහවත් පුරුෂයා වඩිනාගල හාමුදුරුවෝ ය. යෝද ඇල ගම පාලුවට හැරීම පිළිබඳ කතාවේ නයකයා ඔහුය.

වඩිනාගල හාමුදුරුවන් පළමු වරට මට මුණ ගැසුණේ, පළමුවරට අප වැවිගම් පත්තුවට යන ගමනේ දී - අක්කරපත්තුවේ - දී ය. අක්කර පත්තුවේ සිට අපට මග පෙන්වමින් තොරතුරු කියා දුන්නේ ඔහු ය. යෝද ඇල පිළිබඳ කතාවේ මුල අසන්නට ලැබුණේ එද ය.

පළමුවරට දකිද්දී ම මේ හාමුදුරුවෝ මට ආශ්චර්‍යයක් වූහ. ඇත තියා මට පෙනුණේ සිවුරු පොරවාගෙන තොප්පියකුත් හිසලා ගෙන සිටිනා අමුතු මිනිසකු මෙනි. හිසේ තිබුණේ නළලේ වූ තුවාලයකට බෙහෙත් දමා බඳින ලද සුදු වෙළුම් පටියක් බව පෙනුණේ ළං වීමෙන් පසුව ය.

ඔහු වයසින් තිහත් - හතළිහත් අතර යයි සිතිය හැකි - මධ්‍යම ප්‍රමාණ උස මහතින් යුතු - පාටින් තරමක් කළු, දළ දඩු පෙනුමක් ඇති කෙනෙක් වූහ. සංසුන් බවට වඩා, කඩිසර බවත්, සුකුමාර බවට වඩා,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ක්‍රියා ගුර බවත් මහු වෙත පෙනුණේ ය. එහෙත් හාමුදුරු නමකට අවශ්‍ය හැඟුම් හා පැතුම් ද, නො තිබුණා නො වේ. මේ පෙනුමට ආශ්චර්‍යයක් වූයේ තළලේ බැම්මෙන් ඇති වූ පෙනුමය.

තුවාලය ගැන ඇසූ විට හාමුදුරුවෝ, එය කැති පහරකින් වූවක් බවත්, වඩිනාගල එකකු තමන්ට කැත්තකින් කෙටූ බව හා ඒ ගැන උසාවියේ නඩුවක් ඇති බවත් කීහ. තළලේ බැම්ම ලිහා තුවාලය ද පෙන්වූහ. යෝද ඇල ගමේ ඉරණම පටන් ගැනුණේ ද මේ තුවාලය පිළිබඳ සිද්ධියෙනි.

හාමුදුරුවන් කියන්නේ තමන් පන්සල් බිම වවාගෙන දියුණු කරගෙන ඉන්නවා දැක, එයට ඊර්ෂ්‍යා කොට, එය අයිතිකර ගන්නා අදහසින් තමන් පලවා හැරීමට මේ අනතුර කරන ලද බව ය. ගමේ ආරච්චිල කිව්වේ, හාමුදුරුවන් නොයෙක් රළු පරුස කම් හා වැරදි කළ බවත්, ඒ කැති පහර කෙටූ වෘද්ධ මිනිසා ගේ රුවුළ හාමුදුරුවන් විසින් අනට උදුරා දමූ බවත් ය. කොහොම නමුත් ගමත්, හාමුදුරුවනුත් අතර ඇතිවුණ ආරාවුලකින්, දෙපක්ෂයේම නොඉවසිලිවත් කමින් කාරණය සිදු වී ඇති බව පෙනුණේ ය.

හාමුදුරුවන්ගේ නඩුව වැඩි සකිලයක් වුණේ නැත. හාමුදුරුවන් වරක් හෝ දෙකක් නැවතත් ඒ ගමට අවුත් යන්නට ගියා මිස නැවතුණේ නැත. එහෙයින් පන්සල් වත්ත පාලුවට හැරුණේ ය.

මේ අතර යටකී කැති පහර කෙටූ වෘද්ධ මිනිසා මිය ගියේ ය. මහුගේ මරණයට හේතුව, අස්වාභාවික බවක් නැති අසනීපයක් විය. එහෙත් ගම පාලුවට යාමට හේතුවුණු මරණ පෙළේ පළමු වැන්න එය විය.

ඊ ළඟට සිදුවුණු මරණයේ, මවුන් කියන හැටියට දේව කෝපයක සම්බන්ධය ඇති ලකුණු ද පෙනුණේ ය. ආරච්චි කියන හැටියට මේ දෙවැනි මරණයට ගොදුරු වුණු තැනැත්තා, නොයෙක් ලෙස හොරකම් වල යෙදෙමින්, නිතර සතුන් මරා ගෙන කමින්, අධාර්මික ලෙස ජීවත් වුණු තැනැත්තෙකි. පන්සලේ බෝපැලය රෝපණය කරද්දීත්, තවත් වරෙක දෙකකත් ඔවුන් විසින්ම නිදන් මෙන් තැන්පත් කළ රිදී කාසි කීපයක් ම නැති විය. ඒ හොරකම ද මොහු විසින් කරන ලද යි සිතනු ලැබේ. පන්සල් වත්තේ තවත් නොයෙක් දේත් ඔහු ප්‍රයෝජනයට ගත්තේ ය. මෙසේ සිටි මහු හදිසියේම අසනීප විය. කතාවේ හැටියට මුල දී ඔහුට හැදුණේ උගුර ඉදිමී කිසිවක් කන්නටවත්, බොන්නටවත්, කතා කරන්නටවත් බැරිව ගිය අසනීපයකි. දවසක් හෝ දෙකක් මෙසේ සිටි

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පසු සතා කරන්නට පුළුවන් වී, එ තැන් සිට කළේ, දෙවියන්ටත්, හැම දෙනාටමත් බැණීම සහ නැවත දෙවියන්ට පුද පඬුරු හා දන දෙවීමත්, යැදීමෙන් ය. මෙසේ දවස් කීපයක් විකාර කළ ඔහු මිය ගියේ ය. ඊට හය දවසකට පසු ඔහුගේ බිරිඳගේ සොහොයුරිය මිය ගියාය. ඉන් තුන් දවසකට පසු තවත් එකෙක් ද, ඒ එක්කම තවත් එකෙක් ද මිය ගියහ. ගම දෙව කෝපයකට අසු විණැ යි පාලුවට හැරීමට මේ මරණ ප්‍රමාණවත් විය.

මේ මරණ සිදු වූ අතර තවත් සිද්ධි කීපයක් ද මේ කතාවට ද සම්බන්ධ වෙයි. ඒ මෙසේ ය.

හාමුදුරුවන්ට කැති පහර කෙටූ වෘද්ධයාගේ මරණයෙන් පසුව එක් රැයක ආරච්චි හපුවා සිහිනයක් දුටුවේ ය. සිහිනයෙන්, කිසිවෙක් තමන්ගේ ඇහ උඩ හිඳ ඇහ ඒ මේ අතට අඹරවමින් පොඩි කරනු මහුට දැනුණේ ය. ඔහු ඊට විරුද්ධව කිසිවක් කරන්නටත්, කතා කරන්නටත් බැරි තත්ත්වයක සිටියේ ය. එහෙත් සිහිනය ඔහුගේ ඇහේ ඇටකටු කැඩී කුඩුවන තුරුත්, මස් තැළී යන තුරුත් පොඩි කළේ ය. අන්තිමේ දී ආරච්චි කතා කොට

"මාව ඉතින් මැරෙයි නේ ද?" යි ඇසුවේ ය.

"හෙට උණු දිය බුබුලට ගිහින් නාපි ය. ඔක්කොම සුව වෙයි" යනු සිහිනයෙන් ලැබුණ පිළිතුර විය.

පසුව ද හෝ ඊටත් පසු ද ඔහු පන්සලත්, උණුදිය බුබුලත් බලන්නට ගියේ ය. ඔහුගේ පුදුමයට කරුණු කීපයක් ම එහි දී පෙනුණේ ය. පන්සලේ රෝපණය කර තිබුණ බෝ පැලය, අලියකු විසින් උදුරා කෑලි කීපයකට කඩා දමා තිබුණේ ය. බෝ පැලය වටකර ඇල්ලූ ගල් ද, තවත් තැන්වල පිළිවෙලට තබන ලද ගල් කෑලි ද ඒ මේ අතට ඇද දමා තිබුණේ ය. වත්තේ තිබුණ වැවිලි ද පාගා පොඩිකර තිබුණේ ය. මේවා එකම අලියකු විසින් කරන ලද බව පා සටහන්වලින් ඔහු දුටුවේ ය. මීට පෙර කවදාවත් පන්සල අසල අලියකු ගැවසුණ බව ඇත්ත වුවත් මින් පෙර පන්සලට කිසි හිරිහැරයක් නොකළ බවත් ඔහු කීය.

පන්සලේ වැඩ දැකීමෙන් පසු ඔහු උණු දිය බුබුලට ගියේ ය. මහත් සිත් කැළඹීමෙන් යුතුව ඔහු ගියේ උණු දිය නෑමටය. එහෙත් ආශ්චර්‍යයකට මෙන් එදා උණු දිය බුබුල 'ඇල් වී තිබුණේ ය. වෙන දා ඇහට දමන්නට බැරි තරමට තිබුණු එහි වතුර එදා ඒ අවට අනෙක් තැන්වල වතුර මෙන් ම සිහිල්ව එහෙයින් අගයෙන් තොර ව තිබුණේ ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මෙයින් පසු ඔහු පන්සලේ පින්කමක් කරවන්නට සිතා ගත්තේ ය. ගම් වාසීන් උදව් කොට ගෙන ඇත බදුලු පළාතෙන් සංඝයා වැඩමවා, පිරිත් කියවා පන්සලටත්, ගමටත් සෙත් කරවන ලදී. මේ පින්කමෙන් පසු උණු දිය බුබුලේ දෝෂය පහ වී, යළිත් උණු දියෙන්ම යුතු විය. එහෙත් ගමට සෙතක් වුණේ නැති. එහි සිටි නරක මිනිසුන්ට දේව කෝපයෙන් ලැබෙන දඩුවම් මෙන් ඉහත සඳහන් කරන ලද මරණ එක පිට එක පැමිණියේ ය. ඉතිරි වුණු ටික දෙනා ගම අත් හැර වෙන අසල ගම්වලට ගියහ.

මෙසේ යෝද ඇල ගම දේව කෝපයක් නිසා හෝ අනෙක් හේතුවක් නිසා හෝ පාලුවට ගියේ ය. එහි වූ වැවිලි වනයේ රජදරුවන්ට අග්‍ර භෝජන විය. බිම යළිත් වන රාජ්‍යයට එක් විය. යළිත් මෙගම වනයෙන් එළි පහළිව මිනිස් වාසයක් වේදෑ යි කිව නො හැකි ය. ගලඔය යෝජනා ක්‍රමයෙන් දිය ලබන පෙදෙසට මේ යෝධ ඇලත්, වඩිනාගල, කිවිලෙගම, දේවාල හිද යන ගම් ද ඇතුළත් නො වේ. ඊට හේතුව ගලඔයෙන් වතුර හැරවිය හැකි පමණට වඩා එහි බිම උස් වීම ය. එහෙත් ඉන් පහළ ඇති කොක්තහර, පාදගොඩ යන ගම් පෙදෙස් නගර බවට පෙරළුණු කල, මේවා නගරයට නුදුරු සරු ගම් වන බවට සැක නැත. මේ කතා එකලට ආශ්චර්‍ය්‍ය වෙනවා ඇත.

වඩිනාගල හාමුදුරුවන් ඉන්පසු මට දකින්නට ලැබුණේ නැත. යෝද ඇලේ මරණවලට කලින් වරක් හෝ දෙකක් පැමිණ ආපසු ගියා පමණකි. ඔහු ගමට භූතියන් කළ බව ගම්මුන්ගේ විශ්වාසයයි. එහෙත් භූතියම්වලට වඩා මේ ගම්වල මරණවලට හේතු ලෙඩට බෙහෙත් නැතිකම ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

7

කොස්සපොල විත්ති

ගලමය හරහා අදහස් කරන බැම්ම බැඳුණු කල, ඉන් දිය පිරිගෙන යටවන පෙදෙසට ඇතුළත් වන ගමකි, කොස්සපොල. එහෙයින් තවත් අවුරුදු කුන හතරකින් මෙගම දිය යට රාජධානියක් වන්නේ ය. අද මිනිසුන් සහ වන සතුන් ගැවසෙන මේ බිම එකල, මසුන්ටත්, කිඹුලන්ටත් වාස වන්නේ ය. මෙතරම් විසිතුරු අනාගතයක් ඇති මේ ගම වර්තමානය ද ආශ්චර්‍යමත් දෙයින් අනුන ය.

කොස්සපොල ගමට ඇති එකම සැලකිය යුතු ගොඩනැගිල්ල එහි පාසල ය. ඒ අවට තවත් ගෙවල් දහයක්-දොළහක් ඇති නමුත්, ඒ සියල්ලම වැව්ගම්පත්තුවේ අනික් ගම්වල මෙන්ම ගෙපැල් ය. බොහොමයක බිත්ති, ගස්වල පොතුවලින් හෝ කොළ අතුවලින් හෝ අවුරණ ලද්දේ විය. ඒ අතර තිබුණු සැලකිය යුතු ගොඩනැගිල්ල වූ පාසල ද, අමුතු ලකුණු ඇති එකකි. සමහර විට මේ ගොඩනැගිල්ල හදන කාලයේ, මෙය මෙසේ අනාගතයේ දී වතුරෙන් යට ව නිෂ්ප්‍රයෝජනයව යන බැව්, එය සැදුවන් දන සිටියා ද යි නො දනිමි. එසේ දැන සිටියා නම් ඕය, මෙසේ ගොඩනැගිලි සැදීමක් විය නො හැකි ය. ගොඩනැගිල්ලක් සාදන විට බිම මට්ටම් කිරීම සිරිතකි. මෙහි එබන්දක් කර තිබුණේ නැත. පාසලට ඇතුළු වන දෙරටුව ළඟත්, එහි අනෙක් කොණේත් බිම් මට්ටමේ වෙනස රියනකට නො අඩු විය. එහෙයින් එහි කොතැනකවත් බංකුවක්-පුටුවක් හෝ මේසයක් මට්ටමට තැබිය නො හැකි ය. මේ මට්ටම නිසා දෝ එහි උස බිත්ති ඇද වී තිබුණු ප්‍රමාණය බියකරු විය. ගලඔයේ වතුර අවුත් පිරි ගන්නා තුරු බත්ති රැඳවීමට ඊට දී තිබුණු කරු ප්‍රමාණ වේ දැයි නො දනිමි.

මේ පාසලේ ඉගැන් වූ ගුරුතුමා අනෙක් හැම දෙයකට ම වැඩි ආශ්චර්‍යයකි. මේ පාසැලේ ගුරුතුමා පමණක් නොව, මේ පළාතේ තවත් පාසල්වල උන් බව කියවෙන, දැනුත් ඉන්න තවත් ගුරුවරුන් ද

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

මුල් නම් ආශ්චර්යයෙන් ය. මේ පළාත් මේ අද පවතින කළු එළියත් තැනිව ගැම අතින් ම විසම ව පැවතුණි, දුනට අවුරුදු විසි සහසට වඩා පෙර කාලයේ පටන් ම සිංහල ගුරුවරු මෙහි පාහල්පල සොයමින් ගම්වැසි බාලයන්ට අකුරු කරවූහ. මවුපිය ද ගම්වැස්සන් සමග පළාතේ තිබුණු දුෂ්කරතා මැද, සුදුම් සිරිත ගත කළහ. මෙහි සුදුමය නම් සිංහල ගුරුවරුන් හැර අනෙක් කිසිම එයේ පිටතින් පැමිණි ආගන්තුකයකු මේ පළාත්වල නොවසිමය. ගම්වලට මිනිසුන්ගෙන් තෝරා ගනු ලැබූ ගම් මුලාදැනින් හැර අනෙක් කිසිම සේවකයකු නබා, අනෙක් ව්‍යාපාරිකයනුවත් මේ ගම්වල දුෂ්කරතා විඳීමට කැමැති නො වූ නවුත් ගුරුවරු සිටියහ. ඒ ගුරුවරුන් අතරින් මට දකින්නට ආශ්චර්යමත් පුද්ගලයෙකි. කොස්සපොල ගුරුතුමා.

කොස්සපොල පිහිටියේ වැවිගම් පත්තු යටි පළාතේ බටහිර දෙසින්, උඩ පළාතේ සීමාවට ඉතාම ආසන්නවය. ගමේ පිදක් හෝ කොටියක් නුවූ හෙයින් නිමට වතුර ගැනුණේ ඒ අසලින් වූ ගුරුළු ඔයෙනි. පළාත් සීමාව වූයේ ද ගුරුළු ඔය ම ය.

මේ ගම සිට ප්‍රසිද්ධ පාරට දුර හැතැප්ම තිස් දෙකකි. පොදු වාහන, කිවිටුම් කැපැල් කත්තෝරුව, ආරෝග්‍යශාලාව ආදිය තිබුණේත් එහි ය. ගමට බඩු ලැබෙන සමුපකාර කඩයත්, ලියුම් බාර ගන්නා කත්තෝරුවත් පිහිටියේ හැ. 15 ක් දුර ය. මේ හැතැප්මවල් කෙබඳු ද යන බව මින් ඉහත මෙහි පාරවල් ගැන කියවූ ඔබට සිතා ගත හැකිය. කොස්සපොල පාරේ යන කරත්තයකට කැත්තත්, උදල්ලත් තිබිය යුතුමය. කැත්ත, උඩින් බැඳී ඇති විය හැකි අතුල් කපා ගැනීමට ය. උවමනාවක් වුණොත් පාරක් අමුතුවෙන් කපන්ට ද කැත්ත නැතිව බැරිය. උදල්ල බිම වළවල් මට්ටම් කිරීමට ය.

පස් වැනි පරිච්ඡේදයෙහි දී විස්තර වුණු පාදගොඩ නමැති ගම සිට මේ ගමට දුර හැ. 10 කි. ඒ අතරතුර මිනිස් වාසයකට ඇත්තේ, පාදගොඩට හැ. 2 කුත්, කොස්සපොලට හැ. 8 කුත් අතරේ පිහිටි හිද[1] නමැති කුඩා ගමක් පමණය. එය ද මෙය ලියන අද, පොල්ගස් සියයකට වැඩි ගණනකුත්, තවත් වැවිලිත් සමගින් පාලුවට හරින ලද ගමකි.

හිද සිට කොස්සපොල දක්වා ඇති හැතැප්ම අට, මා දුටු වැවිගම් පත්තුවේ අනික් හැම එකකටම වැඩියෙන් ගැඹුරු - වැඩියෙන් අඳුරු - මහ බැද්ද ය. මේ බැද්ද මැදින් ඇති පාර ද අනික් හැම

1. හිද, යනු අයින, එළිමහන, පිටත වැනි තේරුමක් ඇති වචනයකි. හිද බැහැපන් - එළියට පලයන් යනු උදාහරණය. හිද නමැති ගමකුත්, දේවාල හිද යයි ගමකුත් මෙහි ඇත්තේ ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

නැනකට ම වැඩියෙන් දුෂ්කර ගමන් ඇති කොටසකි. ඒ කොටසේ පාරේ ඇති නැගුම් සහ බැවුම් හුහකි. ඉන් සමහරක් ස්වභාවයෙන් පිහිටි කඳු ගැට නමුත් ඇතැම් ඒවා පුරාණයේ බඳින ලද බැම් මෙන් ද පෙනෙයි. ඒවායින් නංගවමින්, බස්සවමින්, ඇල කඳුරුවලින් එතෙර මෙතෙර කරවමින් කරන්නයක් ගෙන යාම පහසු වැඩක් නොවේ.

මේ අපහසු වැඩෙහි යෙදුණු කොස්සපොල ගුරුතුමා මට නොයෙක්විට දකින්නට ලැබුණේය. කරත්ත එකක් නොව දෙකකුත්, ගොන් දෙබානකුත් ඔහු සතු ව තිබුණේ ය. සමහර විට මේ කරත්ත දෙකත් මදි වී තවත් කරත්ත ද ලබා ගෙන යට කී හැතැප්ම තිස් දෙක තරණය කිරීමේ ගමන්වල ඔහු යෙදුණේය. කොස්සපොල මහතා තනිකඩයකු නොව පවුල්කාරයෙකි. ඔහු මේ කැලේ මැද ජීවත් වුණේ තනි ව නොව, ඒ පාසැලේ ම ගුරුවරියක් වූ භාර්යාවත්, දරුවන් තුන්දෙනකුත් සමගිනි. ඒ දරුවන් ගෙන් දෙදෙනකු ලැබුණේත්, මේ කැලෑ ජීවිත කාලයේ ම ය. මේ කැලෑවේ ජීවත් වෙමින්, සම්පූර්ණ ලෙස පෝෂිත මේ දරුවන් තිදෙනකු වඩා ගැනීම ප්‍රීතිය ඔහු විසින් දරන ලද වෑයමක - විඳින ලද වෙහෙසක ආශ්චර්‍ය්‍යය ඒ එක කරත්තයකින්, - එක ගමනකින් දක්ක හැකි ය. මේ ලියන දවසට හය අවුරුද්දකට පෙර පාසැල පටන් ගැනීමට එහි පැමිණි ද සිට, අද දක්වා එහි ඔහු කළ ගණන ද සුළු නොවේ.

මේ ගමනක් යනවා වාගේ ම, ගමන් උවමනා කළමනා තැන්පත් කරගෙන පිටත් වීමත්, ගමනේ දී අනෙක් උවමනාවන් කරගැනීමත් අමාරු ය. ගමන යන්නේ අසනීප නිසා වූ විට එය වඩාත් අමාරු වන්නේ ය. අසනීප ද පවුලේ කාටත් එතරම් හිහ වූයේ නැත. සමහර විට ලෙඩුන් දෙතුන් දෙනා එක විටත්, ඒ ලෙඩ බරපතලත් විය. ගමනේ සියලු අමුතු අංග එවිට දක්ක හැකි විය.

ලෙඩා ගුරුතුමා ම නො වී නම්, ලෙඩ කරත්තය ඇරියේ[1] හැම විටම ඔහු ම ය. ඊට හේතුව පරෙස්සමෙන් කරත්තය ගෙන යන්නට උවමනාව ය. එබඳු අවස්ථාවල පිටිපස්සෙන් කරත්තය ඇල්ලීමට[2] තවත් දෙදෙනෙකි. ලෙඩුනුත්, දරුමල්ලනුත් කරත්ත ඇතුළේය. වැඩ කරන තවත් උදවිය පිටිපස්සෙන් පයින් ගමන් කරති. කරත්ත ඇතුළේ ගමනට උවමනා නොයෙක් උපකරණ ය. වෙන රටේ මෙන් උපකරණ වහළ උඩ වත්, තට්ටුව යට වත් එල්ලන්නට පුලුවන් කමක් නැත. උඩින් තිබුණොත් අකුල්වලට යටින් රිංගන විට පැටලෙයි. යටින් එල්ලුවොත් යට රෝද

1. කරත්ත දක්කීමට මෙහි කියන්නේ කරත්ත ඇරීම ය.
2. පාරේ වළ ගොඩැලි නිසා ඒ ඒ අතට පෙරළෙන්නට ඉඩ නො දී අල්ලා ගැනීම.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පාරවල් දෙක අතරේ ඇති පදුරුවල පැටලෙයි. මේ නිසා සියලු උපකරණත්, විය යුතු කරත්තය ඇතුළත ම ය. මේ කරත්තය දක්ක යුතු පුදුමයක් වන්නේ මේ නිසා ය.

කොස්සපොලින් ගමන් පිටත් විය යුතු උදයක ම ය. වන සතුන් පිළිබඳ වේලාවන් ඉක්මවීමක් මෙහි නුපුළුවන. පාර ද රෑ ගමනට නුසුදුසු ය. පිටත් වීම උදේ හෙයින් දවල් බත ද මේ යන සියලු පිරිස අතේ තිබිය යුතු ය. නියං කාලයේ නම් වතුර ද විය යුතු ය. බත ඇත්තේ එක් වේලකට පමණකි. ගමනට කෑම වේල් එකකට වැඩි හෙයින් මග දී උයන කළමනා සියල්ල විය යුතුය. මග දී තේ කෝපි වලට, බේත්හේත්වලට උවමනා සියලු දේ තිබිය යුතු ය. ඊළඟට ඇඳුම්බැඳුම් ආදිය ය. දරුවන්ට - වැඩිහිටියන්ට - මේ ගමනට සහ ඈත සිදුවීමට පැමිණි විට ඇඳුමට - ලෙඩුන්ගේ උවමනාවලට යන සියල්ලට රෙදි පිළි - උපකරණ තිබිය යුතු ය. අතර මග නිදන උපකරණ, ඒ අයට දවසේ මූලික වැඩට උවමනා නොයෙක් දේ නැතිව බැරි ය. රාජකාරි පිළිබඳ ලියුම් කියුම්, ලියන උපකරණ ආදිය ද උවමනා ම ය. මේ හැර ටවුමෙන් ගෙදර යන විට ගෙදර ගත යුතු දේ අපමණ ය. හාල්, පොල්, ලුණු-මිරිස්, තවත් තුනපහ, ලාම්පු තෙල්, පොල්තෙල්, තවත් නොයෙක් බෙහෙත් තෙල්, බෙහෙත් ද්‍රව්‍ය, අනුපාන, ලෙඩ කෑම බීම ආදී වශයෙන් අපමණ දේ එහි විය යුතු ය. මේ හැමෙකකින් පිරීගත් මේ කරත්තයේ හැ. 32 ක් අක්කරපත්තුවට කරන ගමන ද සුකර නොවේ.

කොස්සපොලින් උදේම පිටත් වුණොත්, දවල් කෑම වේලාවට හැ. 10ක් ගෙවා පාදගොඩට පැමිණිය හැකි ය. හරකුන්ටත් ඒ වේලාවේ කැවීම උවමනා නිසා කරත්ත ලිහීම වැඩිපුර සිදු වුණේ හිද හා පාදගොඩ අතර කඳුරක් අසල ය. එහි දී කෑම ඟෙන පිටත් වූ කල නෙල්ලි කැලේ හෙම පසුකොට හැන්දවට දමනට ළඟා විය හැකිය.

දමන සිට ඉදිරි ගමන වැසි නැත්නම් රෑ කාලයේ කළ හැකි ය. එහෙයින් එහි දී රෑට කෑම උයාගෙන කාලා පිටත් වූ කල පසු දා උදය වන විට අක්කරපත්තුවට ළඟා විය හැකි ය. එහෙයින් මේ හැතැප්ම තිස් දෙකේ ගමනට යාමට පමණක් ගතවන සාමාන්‍ය කාලය පැ විසි හතරකි.

කොස්සපොල මහත්මයාට මේ ගමන්වල දී මුහුණ පාන්නට සිදු වී ඇති අකරතැබ්බ එකක් දෙකක් නොවේ. වතුරෙතුත්, නියඟෙතුත් වුණු පීඩා හැරුණු විට, වන සතුන් නිසා වූ පීඩා ද කීපයකි. වරක් හිඟුරාන නමැති ගම අසල දී නිදිමතෙන් කරත්තය අරින අතර ගොන් බානට

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

කොටියකුගේ ඉව දැනීම නිසා කරත්තයත් ඇදගෙන කැලයට දිවුමත් විය. වලසුන් හා අලින් මුණ ගැසී, අනතුරක් වුවුන බුත්, බියට හා කරදරයට පැමිණි වාර කීපයකි. ඉන් එකක් පමණක් විස්තර කරමි.

එද ගුරුතුමා, තමන්ට ම උණ ගැනී අසනිපවීම නිසා කරත්තය ඇදීමට ගමේ ඉලන්දරියකු යොද ගෙන, කරත්තය ඇතුළේ පැතපී ගෙන ගමනේ යෙදුනේය. කරත්තය ඇරිය තරුණයා හැර තවත් වෘද්ධයෙක් හා ළමයෙක් ද පස්සෙන් ගමන් කළහ. ඒ දෙදෙන කරත්තය පමණ තමන්ගේ ගමනක් ගියහ. පවුලේ අනික් කිසිවෙක් සිටියේ නැත.

කොස්සපොල සිට හැතැප්ම හතක් පමණ ගෙවූ පසු මහ බැද්ලද එක්තරා කඳුරක් අසල දී මහ හදිසි බයක් ඇති කරමින් අලියකුගේ නපුරු හඬක් ළඟින් ම ඇසුණේ ය. හඬ ඇසීමත් සමග ම කරත්තය අරිමින් සිටි තරුණයා කළේ ඊට ද වැඩි කරදරයකි. පණ බියෙන් පලා දුවනු පිණිස මහු බිමට පැන්නේ කරත්තයේ පිටිපස්සෙනි. ඉස්සරහ කව්වෝරු කට්ටයේ උන් මහු බිමට පැනීමට කරත්තයේ පස්සා කොනට තල්ලු වුණේ, එහි ඇතුළේ තිබුණ බඩුත්, ලෙඩින් වැතිර සිටි ගුරුතුමන්වත් පාගා ගෙනය. පස්සෙන් ගමන් කරමින් සිටි බාලයා හා මහල්ලාත් ඒ අනුව දිවූහ. අලියාගේ හඬින් බිය වුණු ගොන් දෙන්නා, බිය ඇත්තේ ඉදිරියෙන් නිසා, දුවන්නට අතක් නැතිව දෙපසට ඇදී නතර වූහ.

ගුරුතුමා හිස ඔසවා අවට බලා හෙමිහිට කරත්තයෙන් බැස ගත්තේ ය. බැහැගෙන හෙමි හෙමින්, අනික් අය දිවූ දෙසට ගමන් කළේ ය. ගසකට නැඟි උන් බාලයාත්, මහල්ලාත් පළමු ව මුණ ගැසිණි. එහි දී බාලයා තවත් ගසේ උඩට නංවා අලියා ඉන්නේ කොතන දයි බැලවූ විට ඉදිරියේ පාර අසල ම කඳුරෙහි බව දැනගන්නට ලැබුණේය. ඉන්පසු ඌ එලවා ගැනීම පිණිස හූව තබන ලදී. උසම ගසක සිටි අනික් තරුණයා හූවට හවුල් විය. එයින් බිය වී අලියා ටිකින් ටික ඈත කැලෑවට වැදුණේ ය. තිදෙනා ගසින් බැස්සේ ඉන් පසු ව ය.

එයින් පසු නැවතත් කරත්තය ළඟට යාමට කවුරුත් පිටත් වූහ. එහෙත් සිදු වූයේ අනිකකි. යට කී තරුණයා, ලෙඩ මහත්මයාටත්, බාලයාට හා මහල්ලාටත් කලින්, ඉක්මන් ගමනින් කරත්තය ළඟට ගොස්, එහි නැඟී, ගොන් දෙන්නා හැකි තරම් හයියෙන් එළවාගෙන නික්මුණේය. ඒ දුටු බාලයා සහ මහල්ලා ද ඒ පිටපස දිවූහ. ගුරුතුමා පමණක් තනි ව, ලෙඩ අමාරුවෙන්, ඉදිරියේ හැතැප්මක් පමණ දුර පිහිටි හිද නමැති ගමට යනතුරු පයින් යන්ට සිදු විය. ගමේ නැවතී සිටි කරත්ත කාරයා එතැනින් එහාට කොහොමටවත් ගමනට යැවුණේ

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යකුන් පිදිල්ල - නොකරම බැරි දේකි.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

තලප හැදිගාන්නට ඉහුරු - කුරහං ඇතොත් අපට ඇති දුකක් නෑ.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

නැත. එහෙයින් එතැන සිට දමන දක්වා කරන්නය ඇරියෙන් ලෙඩා ම ය. කොස්සපොල ගුරුතුමාගේ ගමන්වල හැටි මෙහෙම ය. නමුත් ඔහු ආණ්ඩුවේ සිංහල මිශ්‍ර පාඨශාලාවක මුල් ගුරුවරයෙකි. උපගුරු වැටුප් ලබන මුල් ගුරුවරයෙකි.

එහෙත් කොස්සපොල ගම ආශ්චර්යමත් විය යුතු මේ පාසැලවත්, ගුරුතුමාවත් නිසා නො වේ. මේ බඳු ම තවත් පාසැල් ද, තවත් ගුරුවරුන් ද ඇත. වෙන කොතනකවත් නැති, ලොවට ද දුබල එක්තරා ආශ්චර්‍යමත් පුද්ගලයකු නිසා ඒ ගම ආශ්චර්‍යවත් වන්නේ ය.

ඔහුගේ නම හින් බණ්ඩා ය. දැන් ඔහු විසිපහක් පමණ වයසැති, උස් කළු සිරුරකින් යුතු තරුණයෙකි. ඔහු ගේ පියා පැසුණු ඉස නිකට ඇති නමුත් තවමත් වැඩපලෙහි යෙදෙන කොස්සපොල ගමේ ගොවියෙකි. මව ජීවතුන් අතර නැත.

එහෙත් මේ හින් බණ්ඩා උපන්නේ - ඉපදුන විට පියා නම දුන්නේ - හින් බණ්ඩා හැටියෙන් නොව හින් මැණිකා නමැති ගැහැණු ළමයකු හැටියෙනි. එහෙයින් එකල ඔහු හින් බණ්ඩා නොව හින් මැණිකා ය. ඔහු නොව ඇ ය.

ඇ ද ගමේ අනික් ගැහැණු පිරිමි ළමයින් අතරේ ගැහැණු ළමයකු මෙන් හැසුරුණා ය. අනික් ගැහැණු ළමයින් මෙන් වැඩ පල කළාය. වැඩවලට ඇ වඩා දක්ෂ විය. අනික් ගැහැණු ළමයින්ට වැඩියෙන් - සමහරවිට පිරිමියකු කරන තරමේ වැඩවල ඇ යෙදුණා ය. එසේ කිරීමට හේතුවකුත් පැමිණියේය.

හින් මැණිකාගේ මව මැරුණේ ඇ බාල කල ම ය. මෙහි මව්පියන් දරුවන්ගෙන් වැඩ ගන්නේ යන්තම් බහ තේරෙන කල පටන් ම ය. මවගේ මරණයත් ඇයට වැඩ වැඩි වීමට හේතු විය. ඇයට සිටි වැඩි මහළු සොහොයුරිය ද, දරුවකු තබා මිය ගියා ය. සොහොයුරියට පුරුෂයාව සිටි තැනැත්තා මේ පවුල අතහැර අනික් ගෙදරකට බැඳුණේ ය. මෙයින් හින් මැණිකාත්, ඇගේ පියාත් තමන්ගේ අතින් ජීවත් විය යුතු පවුලක් විය.

මේ ගම්වල පවුලක් ආත්තු කිරීම වෘද්ධ පියකුට තනි ව කළ හැකි වැඩක් නො වේ. එහෙයින් ඇ හේන් කෙටුම්, පැල් රැකුම් ආදියෙහි ද යෙදෙන්නට වූවා ය. ගැහැණු වැඩ පළ ද ගෙදර දී කළ නමුත්, ගැහැණු ඇදුම් ද ඇන්ද නමුත්, ගැහැණුන් ආශ්‍රයෙහි නො සිටියා ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පුරිමින් ආශ්‍රයෙහි ද වඩා ගැවසුණේ නැත. මෙහි සමාජයේ ඉස්පාසු නැති ජීවිතයට එකිනෙකා ඇසුරෙහි වගක් නැත.

තවත් කලක් ගත විය. දන් දන් හීන් මැණිකා පෙනෙන්නේ ගැහැණියක නොව පිරිමියකු මෙනි. ඇඳුම් පැළඳුම් දතට ම නැත. ඒ මදිවාට ඔහුගේ කළු මුහුණේ තවත් කළු රැවුලකුත් එන්නට පටන් ගත්තේ ය. එවිට කවුරුත් ඔහු පිරිමියෙකැ යි කියන්නට වූහ. පාසැලේ ගුරුතුමා ඔහු ගෙන්වා, කරුණු දැන, හීන් බණ්ඩා යයි ව්‍යවහාර කරන්නටත්, පිරිමියකු මෙන් වැඩ කරන්නටත් නියම කළේ ය. ඔහුට ගොවිතැන් කිරීම ඉඩම් ලබා ගැනීමට කරදරයක් එළඹුණේය. ගෑණු ළමයකු හැටියෙන් ලියාපදිංචි වී සිටින ඔහුට හේන් සඳහා ඉඩම් දෙන්ට බැරි බැව්, කොස්සපොල ගමරාළ[1] පාදගොඩ ආරච්චිල ට කියා යැව්වේ ය. ආරච්චිල කෝරාළටත්, එතැනින් තවත් තැන්වලටත් සැළවීමෙන් පසු පරීක්ෂණයක්[2] පැවැත්විණ. ඉන්පසු ඔහු පිරිමියකු වශයෙන් සියලු උරුම ලැබ අදත් හීන් බණ්ඩා නමින් ඔහුගේ පියාත් සමග කොස්සපොල ගමේ වෙසෙයි. ඔහු ගේ මේ විපර්යාසයට කිසියම් බාහිර හේතුවක් වී නම් ඒ මේ ගම් වල ජීවිතයේ ඇති දුෂ්කරතාවය ම ය. වැව්ගම්පත්තුවේ කැලෑ ගම්වල ජීවිතය එතරම් බලවත් කම්කටුල්ලකි.

හෙලබොඩ වැව්ගම් පත්තුවේ යටි පළාතේ ගම් අතුරෙන් තවමත් විස්තර නො කළ එකම ගම ය. එය ද පැහැර නො හැර විස්තර කළ යුතු ම ගමකි.

මේ ගම පිහිටියේ දමන - යටි පළාතේ අගනුවර සිට හැ. 2ක් පමණ දුරින්, ඊට උතුරු දෙසින් හෙලබොඩ යන නම ම ගන්නා හෙලක් පාමුල ය. මේ හෙල මුදුනෙහි ද පැරැණි බැම් වැනි කිසිවක නටබුන් ඇති බව ඇතට පෙනෙයි. එය මුදුනෙහි බොහෝ තැන් ගල්තලා වූ නමුත් පහළ හරිය උස් ගස්වලින් සෑදුණු අඳුරු වනය විය. හෙලබොඩ ගම පිහිටියේ මේ වනය අයිනේ ය.

මේ ගමට තිබුණේ ගෙවල් දෙකකි. ඉන් එකක හෙලබොඩ වට්ට විදනේ[3]ත්, අනිකේ ඔහුගේ දියණියන් හා බෑණලාත් විසූහ. එහෙයින් මේ ගම ම වට්ට විදනේට අයත් විය.

---

1. ගමරාළ : මේ ගම්වල ගම් මුලාදැනීන්ට දෙවැනි, පඩියක් නො ලබන නිලදරියෙකි. මුලාදැනියකු නැති ගම් වලත් ඇත්තේ ගමරාළ ය. පඩිය වෙනුවට දඩයමින් ගාතයක්, මීයෙන් කොටසක් ආදී පාරිතෝෂික ලැබීම් ඇත්තේය. එහෙත් ඒ ලැබෙන්නේ සමහර විටක පමණකි.
2. වෛද්‍ය නිගමනය, ඔහු අසම්පූර්ණ ලිඟු ඇති පුරුෂයෙකි යනු විය.
3. වට්ට විදනේ යනු වෙල් විදනේට දෙමළයෙන් ආ නම ය. යම් ගමකට අයත් කුඹුරු බිමක් ඇතොත් එය නිසා ගමේ සිටින එකම පිරිමියා වුව ද වට්ට විදනේ වෙයි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

හෙලබොඩ වට්ට විදනේ සැලකිය යුතු පුද්ගලයෙකි. කොතැනක දී වුවත් ඔහු සැලකෙන විශේෂ ලකුණු ද වෙයි. ඉන් පළමු වැන්න ඔහුගේ උස මහත ය. මේ පළාතේ බොහෝ දෙනා උසින් මහතින් අඩු මිනිස්සු ය. නමුත් මේ වට්ට විදනේ උසින් මහතින් කලාතුරකින් දක්ක හැකි තරම් කෙනෙකි. ඔහු ගේ ඇඳුම් පැළඳුම්වල ද විශේෂ ඇත්තේ ය. පැවතුම් ද එබඳු ය. සමහර විට ඔහු ගෙදරට ඉන්නේත් සරොම් දෙකක් ඇඳගෙන ය. ගමනට සරොම් දෙකත්, සමහර විට උඩුකයට වැසුම් දෙකකුත් ඇත්තේ ය. ළහ ගමනකට වුවත් නිතර නො වරදින ඔහුගේ කුඩයේ රෙදි වැසුම් තට්ටු දෙකකි. උත්සව වැනි තැන්වලට ඔහු සුදු රෙද්ද ඇඳ හවඩිය දමා, කළු කබායකින් උඩුකය වසා, රතු පාට සේද සාලුවක් ද කර ලා ගෙන පැමිණෙයි.

ඔහු ගේ කතා බහ ද එබඳු ය. කවරෙකුට වුවත්, කොයි දෙයක් වුණත්, මුහුණට ම කියන්නට ඔහු බිඳකුත් නො පැකිලෙයි. වට්ට විදනේ ගේ පියා වූ හෙලබොඩ ගමරාළ ගේ කතාවකින් ඒ බව පැහැදිළි වෙයි.

හෙලබොඩ ගමරාළ ජීවත් ව සිටි කාලයේ, වතාවක් මඩකලපුවේ සිටි ඒජන්ත මහතෙක් දමනට පැමිණ ගම්වාසීන් එහි කැඳවා මවුන් ගේ ඕනෑ එපා කම් ගැන විමසුවේ ය. ඒ කාලයේ ගම් සභා උසාවියක් දමනට නො තිබුණ නිසා ඒ නඩු ඇසීම කෙරුණේ ඒජන්ත තුමා යටතේ පාලන නිලධාරීන් විසින් ම ය. මෙය වෙනස් කොට මේ තැනට ගම් සභා නඩුකාරයකු පත් කර දෙන ලෙස ඉල්ලන්නට ගමරාළට උවමනා විය.

එහෙත් ගමරාළ අතින් මෙය කියවුණේ වෙන හැටියකට ය. 'අපිට පොලිස් නඩුකාරයකු උවමනා' යයි ඔහු ගේ කටට වැරදුණේ ය. එහෙත් මේ වැරදීමට - සමහර විට වැරදීමක් බව දන දනත් - ඒජන්ත තුමා කිපුනේ ය. කිපී 'පොලිස් නඩුකාරයෙක් මෙහාට මොකට ද ?' යි, ඒජන්ත කමේ සැර පෙන්නන්නට මෙන් ගමරාළට ත් සැර වෙමින් ප්‍රශ්න කළේ ය.

ගමරාළ ඉදිරියෙන් තිබුණු අඩිය පස්සට ගත්තේ ය. පස්සට ගෙන ඒජන්ත තුමන් දෙනෙත දිහා කෙළින් බැලුවේ ය. බලා-

'තමුන්නැහැට මව්වර තරහ යන කොට මට කොව්වර තරහ යන්ඩ ඕනෑ ද ? මම වැද්ද !' යයි කියා එතැනිනුත් ඉවත්ව යන්ට ගියේ ය.

නමුත් කාරණය හරි ගියේ ය - ඔහුගේ ඉල්ලීම පරිදි දමනට ගම් සබා උසාවිය ලැබුණේ ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

8

ඉතිහාසය

වේල්ලස්සෙන් පැමිණි ටිකිරි අප්පු පෝඩි, බඩ පිස්ස පෝඩි නම් ලත් සොහොයුරන් දෙදෙනෙකුන් විසින් පාදගොඩ නමැති ගම පිහිට වූ බව 5 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් විය. මේ පෝඩි දෙබෑයන් ගේ පැමිණිම වූ කාලය වැව්ගම්පත්තු ඉතිහාසයේ වර්තමාන යුගයේ ආරම්භය බවත්, ඔවුන් පමණක් නොව දනට එහි වෙසෙන හැම දෙනෙක්ම ඒ කාලයේ වේල්ලස්සෙන් හෝ ඒ අසල උඟව පළාතේ ගම්වලින් පැමිණියවුන්ගෙන් පැවතෙන්නන් බවත් පෙනෙයි.

වේල්ලස්ස, වැව්ගම් පත්තුවට බටහිරින් රට මැද, උස්බිමෙහි පිහිටි සාරවත් ප්‍රදේශයකි. වැව්ගම් පත්තුව මැදින් ගලන ගලඔය එන්නේ වේල්ලස්සේ උස් බිම සෝදා ගෙන ය. උස් බිම හෙයින් එහි වැසි අධික ය. ගොවිතැන් ද සමෘද්ධ ය. එපමණක් නොව ඉතිහාසයේ ඈත යුගයන්හි දින් එය සමෘද්ධ ප්‍රදේශයක් ව පැවැති බවට සැක නැත. පැරැණි රුහුණු රාජ්‍යයේ මාගම ආදී නගරත්, රජරට, අනුර, පොළොන්නරු පුරයනුත් සම්බන්ධ කළ මහා මාර්ගය වැටී තිබුණේ වේල්ලස්ස මැදිනි. පසු කාලයේ මහ නුවර රාජධානිය හා නැගෙනහිර මුදුකරය සම්බන්ධ කරන මාර්ගයක් ද වේල්ලස්ස මැදින් වුටුණු බව සැළකිය හැකි ය. මෙසේ මධ්‍යස්ථානයක පිහිටීම ම පසු ව එහි වැසියන්ට පීඩාවක් විය.

වේල්ලස්සේ සිටි මේ පිරිසට ගම් බිම් හැර දමා කැලෑ වැදෙන්නට සිදු වී ඇති කාලයත්, ලංකා ඉතිහාසයත් සසඳ බලන විට එය වර්ෂ 1818 දී ඇති වූ වේල්ලස්සේ කැරළි කෝලාහල කාලය බව පෙනෙයි. තමන් ගේ පිය මුතුන් වේල්ලස්සේ සිට මේ කැලෑ රටට ආවේ යුද්ධ කොලාහලවලට බයෙන් බව දැන් ඇත්තෝ කියන්නට දනිති.

මේ කැරැල්ල ඇතිවීමට හේතුව වූයේ අලුත (1815) පිහිටුවුණු ඉංගිරිසි ආණ්ඩුව යටතේ පළාත පාලනයට මුස්ලිම් හජ්ජි කෙනකු පත් කිරීම යයි ද, එතෙක් සිංහල අධිපතීන් යටතේ සිටි සිංහලයන් විජාතික

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පාලනයට නො කැමැත්තෙන් කැරැල්ල උපදවන ලදැයි ද එය මැඩපැවැත්වීම සඳහා මහනුවරිනුත්, මඩකලපුවෙනුත් එවන ලද යුද සේනාවන් වෙල්ලස්ස ගම්, ගෙවල් ගිනි තබා, ධාන්‍ය නසා, වැසියන්ට පීඩා කළහ යයි ද ඉතිහාසයෙහි කියැවෙයි. මෙයින් බිය පත් වූ බොහෝ දෙන අතට කරට ගත හැකි දේත්, දරු මල්ලනුත් ගෙන කැලෑ වදින්නට බැලූහ.

මෙසේ භයට පැමිණියවුන්ට සුදුසු පරිදි ආවරණ සහිත ව, ගුප්ත ව එකල වැවිගම් පත්තු ප්‍රදේශය[1] පැවතුණේ ය. වෙල්ලස්සේ දී හානියක් වුණු මහා මාර්ග එකකටවත් වැවිගම් පත්තුව අසු නො වී ය. ඒ තබා මිනිස් ගමන්වලට සුදුසු මොන ම පාරක් වත් එකල එහි නො වී ය. ආදි ශිෂ්ටාචාරය නටබුන් බවට පෙරළාගෙන නැගුණු මහ වනය නිසා ප්‍රදේශය අමානුෂික ව, අන්ධකාර ව තිබුණේ ය.

වෙල්ලස්සේ ඇත්තන්ගේ සංක්‍රමණය දෙයාකාරයකින් වී ඇති බවත් පෙනෙයි. පෙළක් - සමහර විට ගෙන යා හැකි වත්කම් නැති අය ගම් බිම් හැර දමා, ගලඔය නිම්නය දිගේ පහළට පැමිණ, ක්‍රමයෙන් කැලෑවට වැදී, තැනින් තැන දිය කඳුරු අසල විසූහ. ගෙන යා හැකි මිල මුදල් ඇතියවුන් යයි සිතිය හැකි සමහරු, ගම්වලින් පැන, පළමුවෙන් මඩකලපුවෙන් පහළ මූදුකරයේ නින්දූර, කාරදූව ආදී දෙමළ ගම්වලට පැමිණියහ. සමහර විට අතේ වාසි ඇති ව පැමිණි මේ අමුත්තන් පිළිගැනීමට ඒ ගම්වල ද්‍රවිඩයන් නො කැමැති නො වෙන්නට ඇත. එහෙයින් ටික කලක දී ම සමහරු එහි දී දෙමළ ස්ත්‍රීන් හා ආවාහ විවාහයන් ගෙන් ද බැඳුනහ. නමුත් පසු ව ඔවුන් ද වැවිගම් පත්තු ප්‍රදේශය සොයා රට මැදට පැමිණ එහි තැනින් තැන වසන්නට පටන් ගත්හ.

මේ අමුත්තන් වෙල්ලස්සෙන් එන කාලයේ මේ ප්‍රදේශයෙහි කිසි මිනිස් පිරිසක් සිටි බවක් නො පෙණේ. ආදි ශිෂ්ටාචාරයෙන් පසු කාලයක් තිස්සේ පාලුවට තිබී, සම්පූර්ණයෙන් ම භූමිය වනගත වී තිබුණේ ය. එය පාලුවට හැරුණේ කොයි කාලයේ ද ? පෙර සමෘද්ධිමත් ව පැවතුණේ කොයි කාලයේ ද? යි සොයා දැක්වීම 'පුරාවිද්‍යාඥයන් සතු යුතුකමකැ 'යි සිතමි. මට දකින්නට හා කියවන්නට ලැබුණු දෙයින් මේ පිළිබඳ කරුණු කීපයක් දැක්විය හැකි ය.

වෙල්ලස්සෙන් පැමිණියවුන් විසින් පටන් ගැනුණු මෑත යුගයෙන් එහා, අතීතයේ ඇතට යන විට වැවිගම් පත්තු ඉතිහාසයේ ආශ්චර්‍යමත් කාලයන් දැක්ක හැකි ය. එකල මේ ප්‍රදේශය වැවිගම් පත්තු යන නමට

1. වර්තමාන වැවිගම් පත්තුව එකල නො වී ය. එය ඇති වූයේ 1924 දී ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ගැළපෙන ආශ්චර්‍යයෙන් සමෘද්ධියෙන් හා ශිෂ්ටාචාරයකින් යුතු ප්‍රදේශයක් ව පැවැති බවට, ඉහත නොයෙක් නැන විස්තර වුණු නටබුන් සාක්ෂි වෙයි.

සෑම හැනැප්මයක් ඇතුළත ම වාගේ හැම තැනක ම ඇති නටබුන් රාශියකි. ඒ සියල්ලක් එක ම කාලයකට අයත් විය නො හැකි ය. සමහර තැනක ඇති ගල්කණු ස්වභාව ධර්මයාගේ බලයට යටත් ව වැස්සෙන්, අව්වෙන් සෙදී ගිය තරම කියතොත්, සිටුවන ලද ඒවා මිස, පෙරළී ඇති ඒවා නටබුන් පුරාවස්තු ද, ස්වාභාවික ගල් කැලිදැයි තේරුම් ගැනීම දුෂ්කර ය. හෙල්මුදුන්වල හා බෑවුම්වල ඇති ගල්ගෙවල් අසල ගඩොළු ද, මැටිටෙන් කළ වෙනත් දේවල කොටස් ද ඇත්තේ ය. ගඩොලින් බඳින ලද දගැබ්වල කොටස් ද, කොටස් කැඩී ගිය පිළිම ද තවත් නැන්වල වෙයි. පැරැණි ගෘහ දෙරටු දෙපස තබන ලද 'කොරවක් ගල් ' නිපයක් හා සඳකඩ පහනක හැඩයට කපා බදමයකින් මප්නහා තිබුණු බව පෙනෙන ගලකුත් එක් විහාර භූමියක දී දුටිමි.

මේ දේවලින් මා තේරුම් ගත් එක් කාරණයක් නම් පුරාණයේ බොහෝ කාලයක් තුළ - සමහර විට ශත වර්ෂ දහයක් දෙළහක් පමණ වූ හෝ ඊටත් වැඩි කාලයක් තුළ මේ ප්‍රදේශය සමෘද්ධව පැවැති ඇති බව ය. සමෘද්ධියකින් යුතු ව නිසැකයෙන් ම තිබුණු බව සිතිය හැකි එක් කාලයක් 1 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් වූ එරගම නමැති මුස්ලිම් ගම 'රජගම' නමින් පැවති කාලය හා සම්බන්ධ විය යුතු ය. රජගම ක්ෂත්‍රියයන් විසූ කාලය, දිගාවැව හා ඒ අවට තිබුණ දහස් ගණන් වැව් එහි ගොවිතැනට දිය සැපයුණු කාලයම විය යුතු ය. දැනට දිගාවැව[1] පිහිටියේ වැවිගම් පත්තුවට පිටතින් ඒ අසල ය. එහෙත් එහි ඇතුළත හා පිටතත්, අවට මුළු පළාතේවත් ඇති වැව් රාශිය දෙස බලන කල, මේ ප්‍රදේශයම එක ම ගොවි ජනපදයක් නොහොත් රාජ්‍යයක් ව පැවැති බව සිතිය හැකි ය. එය පැරැණි දිගාමඩුලු ජනපදය යැයි සලකතොත් මේ ගැමුණු කාලයේ නිස්ස කුමරුන් විසින් අස්වැද්දුණු කුඹුරු ප්‍රදේශ බව නිශ්චය කළ හැකි ය. එකල රටට අවශ්‍ය ධාන්‍ය සම්භාරය සැපයුණු, මේ ප්‍රදේශය සිංහල ඉතිහාසයේ බොහෝ කලක් යන තුරුත් ඒ සමෘද්ධියෙන් ම පැවතිණැ යි නො සිතීමට කරුණු නැත. රුහුණ හා රජරට සම්බන්ධයත්, රාජ බලයත් පැවැති තාක් කල් මෙහි සමෘද්ධිය පැවතුණා විය යුතු ය. එහෙයින් ඒ ගැමුණු සමයේ සිට පරාක්‍රම බාහු කාලය දක්වාත්, සිංහල රාජධානිය රුහුණු, පිහිටි දෙ රටින් ම වෙන් ව මායා රටට යන තුරුමත් මේ ප්‍රදේශය දියුණුවෙන් අඩු නුවුයේ ය.

1. දන් 'ඉරක්කාමම් තුලම්'.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

එකල මේ බිමෙහි එක් අහලක් වත් මුඩු නො වී ය. හැම පහත් බිමක ම වැවක් හෝ කුඹුරක් ද, හැම ගොඩැල්ලකම වත්තක් ද විය. වෙන දෙයක් තබා ප්‍රයෝජන ගත නො හැකි උස් බිම් පවා බෙහෙත් උයන්[1] වවා සශ්‍රීක ව තිබුණේ ය. ජන ගහණය බොහෝ වූ හෙයින් - වැවිලිවලට පහත් බිම යෙදුණු හෙයින් - තැන තැන පිහිටි හෙල් බෑවුම් හා මුදුන් පවා පරිහරණයට ගෙන තිබුණේ ය. විහාර දගැබ් ද, තවත් ගොඩනැගිලි ද හෙල් මුදුන්වල විය. බෑවුම්වල සුදුසු හැඩයෙන් යුතු ව තිබුණ හැම ගලක් ම කටාරම් කොටා ගෙවල් වශයෙන් ප්‍රයෝජනයට ගෙන තිබුණේ ය. සමහර උස් හෙල් මුදුන්වල රජුන්ගේ හෝ අධිපතීන්ගේ බලකොටු - මුර පළවල් වශයෙන් සකස් කොට තිබුණු බැව් ද පෙනෙයි.

මේ අනුව එකල පැවැති ශ්‍රී සමෘද්ධිය පිළිබඳ හැඟීමක් ඇති කර ගත හැකි ය. එකල මෙහි විසූ සිංහලයන් සම්පූර්ණයෙන් ස්වයංපෝෂිත ගොවීන් වූ බවට සැක නැත. රටට උවමනා සහල් ඉපදවීම සම්බන්ධයෙන් මෙය ප්‍රමුඛ ප්‍රදේශයක් වූයේ ය. මේ නිසා මෙහි වැස්සන් සැපතින් කල් යැවූ බව ද නිසැක ය. තිබුණු බව පෙනෙන විහාර ආදියෙන් බුද්ධාගම එකල උසස් ලෙසින් පැවැති බවත්, එහෙයින් එකල විසූ මිනිසුන් ද යහපත් ගුණයෙන් හෙබි සිංහල බෞද්ධයන් වූ බවත් සළකා ගත හැකි ය. මෙයින් වැව්ගම් පත්තුව ආදි සිංහල සභ්‍යත්වය උසස් ලෙසින් පැවැති ප්‍රදේශයක් බව නිගමනය වෙයි.

බොහෝ කාලයක් තුළ මහත් දියුණුවකින් පැවැති මේ ප්‍රදේශයේ පරිහානි කාලය ආරම්භ වූයේ දඹදෙණි-කෝට්ටේ-ගම්පල කාලයන් අතර දී යයි සිතිය හැකි ය. වැව්ගම් පත්තුවේ පමණක් නොව සිංහල ජාතියේ ම පරිහානිය ආරම්භ වූ කාලය ද මේ යයි සිතීම එතරම් වැරදි නො වේ. දඹදෙණි-කෝට්ටේ කාලවල දීත් සිංහල බල වික්‍රමය නො මඳව පැවැති නමුත්, යුරෝපීය සතුරන්ගේ පැමිණීමෙන් පටන් ගත් පරිහාණිය වළකනු නො හැකි විය. සතුරන් හා සටනෙහි යෙදෙන්නට වීම නිසා ගොවිතැන, ගම් බිම් දියුණු කිරීම් අත්හිටියේ ය. ක්‍රමයෙන් සතුරන්ගේ බලයත්, ක්‍රියාත් වැඩිවෙත් ම පරිහාණිය ද දරුණු විය.

යුරෝපීය සතුරන්ගේ මධ්‍යස්ථානය වූයේ කොළඹ ය. එයින් සිංහල රජුන්ට මායා රටේ කෝට්ටේ, සීතාවක, ගම්පළ, මහනුවර යන නගරවල වෙසෙමින් ඔවුන් හා සටන් කරන්නට සිදු විය. මෙයින්, එතෙක් ජනාකීර්ණව නො පැවැති බටහිර දිග පෙදෙසට ජනයා ඇදී එන්ටත්, ඉන් විරුද්ධ පාර්ශ්වයෙහි පිහිටි වැව්ගම් පත්තුව පාලුවට

1. පාෑගොව අසල ඇති බව 4 වැනි පරිච්ඡේදයෙහි කියවුණු නෙල්ලි කැලේ වැව්ගම් පත්තුවට ඇතුළත්ය. උඹ පළාතේ නීල් ගල තලාව ද එබඳුම බෙහෙත් වගා කළ විසාල බිමකි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යන්නටත් හැරුණේ ය. සෙනග හැම දෙනෙක් ම බටහිර දිගට - රාජධානි ප්‍රදේශවලට ඇදී යාමෙන් වැව්ගම් පත්තු ප්‍රදේශය හිස් විය. එවිට රැක බලාගන්නට කෙනකු නැති වීමෙන් වැව් බැම් කැඩී දිය සිඳී ගියේ ය. කුඹුරු පුරන් විය. වතු - ගෙවතු වල් වැදුණේ ය. ගෙවල් - දෙරවල් කඩා හැලුණේ ය. එතෙක් සසුන් බබුළුවමින් සිටි සංඝයා වහන්සේ ද ගොදුරු ගම් සොයා යාමෙන් පසු විහාරාරාම ද ස්වභාවයේ පිඩාවන්ට ගොදුරුව ඇදහැළුණේ ය. ඒ හැම යටකරගෙන ක්‍රමයෙන් වනය වැඩුණේ ය. වනය මොරද්දී එය අයත් වන සත්තු පහළ වූහ. මිනිසුන් වැවූ බෝගයෙන් ඉතිරි දෙයක් වී නම් ඒ වන සතුන්ට ගොදුරු ව නැසුණේ ය. ඉන් පසු පාලනය සොබා දහමට අයත් විය. සොබා දහමට උවමනා හැටියට එතැන් සිට වනය වගා විය.

ඉහත ගැමියන් විසූ ගෙවතු කුඹුරු මැදින්, කොහෙන් ආවාදැයි කිය නො හැකි මහ රුක් වැඩෙන්නට විය. බැම් කැඩී, දිය සිඳී ගිය වැව් පතුල් ද, නිසරු උස් බිම් ද ඉක්මනින් වැසුණේ ය. වන සත්තු ද, වතුර ද, හුළඟ ද ඒ ඒ තැන වන බීජ ගෙන ගොස් ඉන්ද වූහ. ගසින් ම උපන් වෘක්ෂාහාරය වතුරෙන් කලතා බෙද හැරිණි. තැන තැන හැසිරෙන වැද්දන් හෝ යකුන් හෝ සිටියා නම් මිස කිසි මිනිස් පියක් නැති ව මෙසේ වැව්ගම් පත්තුව ශත වර්ෂ දෙක තුනක් ම වල් වැදෙමින් තිබුණේ ය.

සිංහලයන් බලයෙන් හීන කළ 17, 18, 19 ශත වර්ෂ තුළ දී වැව්ගම් පත්තුව මෙසේ පාලු ව පැවතිණැ යි සිතිය හැකි ය. සිංහලයෝ පළමුව පෘතුගීසීන් හා ලන්දේසීන් ද සමග යුද කොට පසු ව ඉංගිරිසින් අතට පත් වූහ. 1815 දී තහවුරු වුණු ඉංගිරිසි ආධිපත්‍යයෙන් පසු 1818 දී වෙල්ලස්සේ අමුත්තන් පැමිණීමට හේතු වුණු සිද්ධිය මේ පරිච්ඡේදයේ මුලින් ම සඳහන් විය.

වර්ෂ 1818 හෝ ඒ ආසන්න කාලයක දී වෙල්ලස්සේ අමුත්තන් එන විට මේ ප්‍රදේශය පැවතුණේ යට කී ශතවර්ෂ තුනක් පමණ තුළ වල් වැදුණු හැටියට ය. එහි මිනිස් හසරක් නො වී ය. වන සතුන් එහා මෙහා ගමන් කළ පාරවල් මිස වෙන මාර්ග කිසිවක් නො වී ය. ගම් බිම් හැර දමා පැමිණි අමුත්තෝ එහි ඔය කඳුරු අසල සරු බිම් කැබලි කොටා ගෙන එක ළඟ ම පැල් හද ගෙන වනය මැද තැන් තැන්වල පදිංචි වූහ.

වෙල්ලස්සේ දී මේ පිරිස හොඳ ගම්-බිම්, ගෙවල්-දෙරවල් ඇති ව ජීවත් වූ බවට සැක නැත. නමුත් වැව්ගම් පත්තුවේ කැලෑවට පැමිණීමෙන්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පසු ඔවුන් ගේ ජීවන පැවතුම් බොහෝ දුර වෙනස් විය. ඊට හේතු වූයේ කැලෑවේ දී මුණ පාන්නට වූ දුෂ්කරතාවන් ය.

පැමිණි අලුත ම ඔවුන්ට කරගත හැකි වූයේ හේන් ගොවිතැන පමණකි. හේනක් කොටා වපුරා ගත් කල එය රැක ගැනුම සඳහා පවුල ම එහි පදිංචි වීම පහසු ම ක්‍රමය විය. එසේ හේන් පදිංචියට යාමෙන් නැතිවන්නට ගමක්-ගෙයක් නුවූ නිසා කවුරුත් හේන්වල ම ජීවත් වන්ට පුරුදු වූහ. හේන අවුරුද්දෙන් අවුරුද්ද මාරු වූ බැවින් මේ ගම් ද අවුරුද්දෙන් අවුරුද්ද තැනින් තැනට යැවුණේ ය.

එකල වන සතුන් හා කළ යුතු සටන බලවත් විය. ගමන්-බිමන් සඳහා පාරවල් නො තිබුණේ ය. මිනිසුන් පාරවල් සොයාගත යුතු වූයේ සතුන්ගේ පාරවලිනි. සතුන් නිසා ද, නියං කාලවල දී වතුර හිඟ නිසා ද, ආහාර පාන හිඟයෙන් හා තවත් නොයෙක් දෙයින් ද ඔවුන්ට පීඩා පැමිණියේ ය.

එකල මේ ප්‍රදේශයට ද වැව්ගම් පත්තුව යයි නමක් නො තිබුණේ ය. වැව් ද නො වී ය. එකල මේ සිංහලයන් විසූ ගම් ද නැගෙනහිර මූදුකරයේ ද්‍රවිඩ රාජ්‍යයන්ට අයත් විය. මූදුකරයේ විසූ දෙමළ 'වන්නියාර්' ලා මෙහි ගම් ද පාලනය කළහ. වෙල්ලස්සේ ඇති වූ කැරැල්ලට හේතු වූයේ එහි විසූ සිංහලයන් විජාතික අධිපතීන් ගේ පාලනයට නො කැමැති වීම බව යට කියැවිණ. කැරැල්ල නිසා වැව්ගම් පත්තුවට පැමිණියවුන් ගේ පාලනය එතැන් සිට මුස්ලිම් 'හජ්ජි' ගෙන් වෙනස් වී දෙමළ 'වන්නියාර්' අතට පත් විය. මේ කාගේත් පාලනය වූයේ ඒ කරන හේන් ගොවිතැනට පවා අයබදු අය කිරීමෙන්, ඒ වැස්සන්ගේ දුෂ්කරතාවන්ට තවත් පීඩාවන් එක් කිරීම පමණකැයි කිව යුතුය.

එකල පාලනය දෙමළෙන් විය. ඒ පිළිබඳ ලියුම් කියුම් ද දෙමළෙන් විය. සමහර තැන්වල දෙමළ ඉගැන්වීම කරන පාසැල් ද යන්තමින් තිබුණේ ය. දෙමළ කතා බහ සිංහලයන්ට ද පුරුදු විය. සමහරු උගත්තේ ද දෙමළ බස ය. සමහරු අත්සන පමණක් දෙමළෙන් කළහ. මෙසේ මේ සිංහල මිනිස් පිරිස දෙමළයට බැතිස්ම කළා වැනි වෙනසක් විය. එකල ආශ්‍රයට ලැබුණේ ද ද්‍රවිඩ හා මුස්ලිම් මිනිස්සු ය. ගනුදෙනු ද ඔවුන් සමග විය. මූදුකරයේ ද්‍රවිඩ හා මුස්ලිම් ගොවීහු මේ කැලෑගම් අතරේ කුඹුරුවල වී ගොවිතැන් කළහ. සමහරු මූදුකරයෙන් මේ ගම්වලට උවමනා බඩු කරත්තවල පටවාගෙන මේ ගම්වල ඇවිදිමින් ඒ බඩු වලට හේන්වල උපදවන බෝග භුවමාරු කරමින් ජාවාරම් කළහ.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

මේ නිසා මෙහි සිංහලයන්ගේ ආගමික චාරිත්‍රත්, සිරිත් විරිතුත් දුවිඩ ශිෂ්ටාචාරයට අනුව හැඩගැසුණේ ය. මේ කාලයේ ලංකාවේ බටහිර දිග පෙදෙස කොළඹ ආශ්‍රයෙන් යුරෝපීය ක්‍රමයට අනුව හැඩ ගැසෙමින් තිබුණේ ය. එහි ශිෂ්ටාචාරය යුරෝපීය තාලය ගනිද්දී වැව්ගම් පත්තුව දෙමළ ඌරුව ගත්තේ ය. කොළඹ රට ඉංගිරිසියට ගරු කරද්දී වැව්ගම් පත්තුව දෙමළ බසට සැලකිලි දක්විය. කොළඹ රට, පාරවල් වැටී එළි පෙහෙළි වී සකස් වෙද්දී වැව්ගම් පත්තුව තව තවත් අඳුරු විය. දුර්ගම විය. මෙසේ දෙ පැත්ත දවසින් දවස දෙ පැත්තකට ගමන් කළේ ය. නවීන ශිෂ්ටාචාරය සමගින් අධ්‍යාපනයත් කොළඹ රටට ගලා ආ නමුත් වැව්ගම් පත්තුවට ඒවා ළං නො වී තව තවත් වල් වැදුණේ ය.

මේ සිංහල මිනිසුන් විසූ ගම් මුදුකරයේ වන්නියාර් ගේ පාලනයෙන් වෙන්කොට, වැව්ගම්පත්තුව නමින් පළාතක් සාදා සිංහල දිසාපති තුමකුගේ පාලනයට ගැනීම 1924 දී සිදු විය. වැව්ගම් පත්තුව යළිත් සිංහල රටක් වන්නට පටන් ගත්තේ එතැන් සිට ය. දෙමළ පාලනයට යටත් ව ඉස ඔසවාගත නො හැකි ව සිටි බොහෝ සිංහලයන්ට මෙයින් ලැබුණේ ලොකු සැනසීමක් විය යුතු ය. මෙසේ සිංහල රටක් කිරීමෙන් පසු පළමු වරට 'වැත්තෑවේ' නමින් සිංහල රටේ මහතෙකු පැමිණ මේ ගම් වැසියන් දියුණු කිරීමට කටයුතු කර වූ හැටි තවමත් සමහරු කියති. එතැන් සිට ගම්වලින් ම සිංහල මිනිසුන් තෝරා ගම් මුලාදැනින් වශයෙන් පත් කරන ලදී. මිනිසුන් සිංහල නම් ගම් ඇති ව ලියාපදිංචිකරවා ගොවිතැන් දියුණු කිරීමටත්, ස්ථිර ගම් පිහිටුවීමටත් අනුබල දෙන ලදී. සමහර ගම්වල පාසැල් තනවා සිංහල ගුරුවරු පත්කර එවන ලදහ.

වැව්ගම් පත්තුවට කොළඹ රටේ සිට පැමිණි මට දකින්නට ලැබුණේ මෙසේ 1924 සිට 1948 දක්වා දියුණු වීමෙන් පසු පහළ ව තිබූ තත්ත්වයකි. ඒ තත්ත්වය පවා කොතරම් ආශ්චර්යමත් දැයි මෙතෙක් කිය වූ දෙයින් ඔබ දන්නෙහි ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

9

ගොවිතැන්

වැවිගම් පත්තුවේ ප්‍රධාන ආහාරය බත නොව තලප බව යට සඳහන් විය. එහෙයින් එහි ප්‍රධාන ගොවිතැන ද වී නොව, 'ඉහුරු-කුරහං'[1] ය. ඇත්ත වශයෙන් ම ඔවුහු බතට වඩා ඉහුරු-කුරහං ප්‍රිය කරති. අවුරුද්දේ නියම සෘතුවට කොහේ සිටියත් මෙහි ගැහැණු-පිරිමින්ට තමන්ගේ ඒ ප්‍රිය ආහාර නැති ව බැරි වෙයි. රක්ෂාවල යෙදී පිටත යන සමහරු ඒවා නො ලැබෙතොත් රක්ෂා ද අතහැර ආපසු යාමට පසුබට නො වෙති. අක්කර පත්තුවේ ගෙවල, රක්ෂාව සඳහා උයන්තට ගොස් සිටි ගැහැණු ආපසු ගමට එන්නේ 'ඉහුරු නොකා ඉන්ඩ බැරුං බොටා ! ඒකයි මං ගමට පද්දන්නේ !" කියාගෙන ය.

වැවිගම් පත්තු වැස්සන් ඉහුරු-කුරහං ප්‍රිය කිරීම පුදුමයක් නො වේ. එයින් හැදෙන සමහර කෑම කාටවුණත් පුරුදු වුණොත් අමතක කරන්නට බැරි තරම් රස ය. හේනෙන් පළමු කොට ම ලැබෙන්නේ 'කිරි ඉහුරු' ය. කිරි ඉහුරු නම් යන්තම් කිරි වැදෙන ලා ඉරිහු කරල් ය. ලා කොළ පැහැති කොපුවලින් වැසුණු මේවාට 'ඉහුරු මුව' යයි කියති. එය පතුරු හැර ඇතුළේ ඇති කරල් තම්බා හෝ අහුරු මතුයේ දමා පුලුස්සා හෝ ආහාරයට ගනිති. මේ දෙක ම එක වාගේ රස ඇති කෑම ය. තැම්බූ ඉරිහු පොලුත් සමග බඩ පිරෙන තුරුවත් කෑ හැකි ය. අහුරු මත පුලුස්සා තරමක් රස්නය ඇති ව ගත්කල එය අපූරු කිරි රහ ඇති ව කෑ හැකි වෙයි. කිරි වැදුණු අමු ඉරිහු ඇට වංගෙඩියේ කොටා, පිටිත් කුඩා කෑලිවලින් හාලකුත් ලබා ගනිති. පිටියෙන් පිට්ටුත්, රොටිත්, කැවුම් ආදියත් හැදිය හැකි ය. ඉරිහු පිට්ටුත්, මුදවපු කිරිත් එකට ගෙන ලුණුත්, සමහර විට සීනිත් දමාගෙන කෑමට ඔවුහු ප්‍රිය කරති. කුරහන් පිට්ටු ද, බත් ද මෙසේ මුදවපු කිරි සමගින් කැවෙයි. රොටි හෝ මයියොක්කා අලත්, මී පැණි සමග අනාගත් පොලුත් තව හොඳ

---

1. ඉරිහුවලට ඉහුරු කියවෙන හැටියට සකස් විය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ආහාරයකි. වියලි දඩමසුත්, මී පැණිත්, පොලුත් වුව ද වරදක් නැත. නගර වැසියන් නො දන්නා තවත් නොයෙක් කැවිලි, ඉතුරු-කුරහංවලින් මෙහි ඇත්තෝ සද ගෙන බුදිති.

මෙ තරම් අගේ ඇති ඉතුරු-කුරහං උපදින්නේ හේනෙනි. හේන් ගොවිතැන මිස කුඹුරු ගොවිතැන සමහර ගම්වල කෙරෙන්නේ ම නැත. සමහර ගම්වලට කුඹුරු ඇත්තේ ම නැත. සමහරු හේන්වල ඇල් වී වපුරති. එහෙත් ආහාරය බත වීමට එය හේතු වී නැත.

කුඹුරු ඇතත් වී ගොවිතැන මෙහි අපහසු - වියදම් යන, හේන තරමවත් විශ්වාස නැති වැඩකි. බොහෝ කුඹුරු අහස් දියෙන් ගොවිතැන් කෙරෙන මුම්මාරි[1] විය. උවමනා පමණ වැසි ලැබීම සැක සහිත ය. අහස් දියෙන් කරන ගොවිතැන් පාලු වීම ද අහස් දියෙන් ම විය හැකි ය. දියතර[2] හෙවත් මානාවාරි[3] යයි තවත් කුඹුරු වර්ගයකි. ගහේ වතුර ද සැක සහිත ය. ඊටත් වඩා මේ කුඹුරු බිම් තිබුණේ ගම්වලින් හැතැප්ම දෙක, තුන, හත, අට ඈත කැලෑ මැද ය. එහෙයින් පැළ කටට අසුවන තරමට වැඩුණු ද පටන් ම අස්වනු අස්කර ගන්නා තෙක් දවසක්, පැයක් නැර වන සතුන්ගෙන් රැක්ක යුතු වෙයි. එසේ රැක්ම සඳහා අඳයට ගොවියන් යෙදිය යුතු වෙයි.

වී ගොවිතැනෙහි දී මෙහි මිනිසුන් කරගන්නා ලොකු පාඩුවක් නම්, ගොයම් කපා-පාගා ගැනීම සඳහා මූදුකරයෙන් දෙමළ-මුස්ලිම් ගැහැණු-පිරිමින් ගෙන්වා ගැනීම ය. ගම්වල සෙනග අඩුකම නිසාවටත් වඩා එකමුතු වී වැඩ කරගැනීමට තරම් සමගියක් නැති නිසා - එකිනෙකා කෙරෙහි විශ්වාසයක් නැති නිසා - මෙසේ මූදුකරයෙන් දෙමළ ගැහැණු පිරිමින් එතෙක් තමන් කළ ගොවිතැනේ අස්වනු රැස් කරගැණුම සඳහා ගෙන්වන්ට සිදු වෙයි. මෙසේ ගෙන්වා ගන්නා අයට කුලි වියෙනුත්, මුදලිනුත් ගෙවනු ලැබේ. මේ කුලිත්, රැක්කවුන්ට, හරකුන්ට, තවත් වැඩකළ අයට කුලි-මළිත් බෙදන විට උපදවාගත හැකි සැළකිය යුතු ආදයමක් වන්නේ නැත.

හේන් ගොවිතැනට මෙබඳු බාධා නැත. හේන් ගොවිතැනේ දීත්, එකමුතු කමින් කෙරෙන එක ම දෙය එකට යාව හේන් අල්ලා ගැනීම[4] පමණකි. එකට යාව තම තමන්ගේ වැඩ කරගන්නවා මිස එකමුතුවෙන් කෙරෙන වැඩක් නැත.

1. මුම්මාරිය - අහස් දියෙන් ගොවිතැන් කරන කුඹුරු බිමට කියවෙන නමකි.
2. ඕතෙර.
3. මානාවරි - ගහක වතුර හරවාගෙන ගොවිතැන් කරන කුඹුරු බිම.
4. හේන් බිම් තෝරා කොටස් වෙන් කර ගැණුම.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පළමුවෙන්ම කළ යුතු වන්නේ හේන් අල්ලා ගැනීම ය. ඒ සඳහා සුදුසු බිම් ගම් අසල ම හැමදම ලැබිය නො හැකි ය. කුඩා දියපාරවල් අතරතුර පිහිටි මේරු බැදි කුට්ටි හේන්වලට උවමනා ය. අතින් සාත්තුවක්-පෝරක් නො කරන හෙයින් වෘක්ෂාහාර වැඩියෙන් ඇති බිමක් අවශ්‍ය වීමත්, පහසුවෙන් පුලුස්සා ගත හැකි පමණ කොළ අතු-දඬු ඇති තැනක් විය යුතු බවත් මීට හේතු ය.

මෙසේ බිමක් තෝරා ගැණීමෙන් පසු නැකතකින්[1] හේන් ඇල්ලීම කරනු ලැබේ. බඹ එකොළහක් දිගට දම්වැලක් හදගෙන එයින් එකක් පළලට හා දහයක් දිගටත්, දෙකක් පළලට හා පහක් දිගටත් ගැණීමෙන් අක්කරය මැණ ගන්නට ඔවුහු දැන සිටියහ. සමහර විට තමන්ගේ වාසියට මණින තැන දී ඉදිරියෙන් වැල්පට ගෙන දත පිටට නමා බඹය දික්කර මැණීමට ද ඔවුහු දනිති.

හැමට ම අමාරු වැඩය හේන් බිම වල් කෙටුම ය. යහමින් බිමක් කොටා ගිනි දමා ගත්තොත් වැඩකට ඉතුරු වන්නේ වැපුරුමත්, රැක ගැණුමත්, පල නෙළා ගැණුමත් පමණකි. එහෙත් කොටා ගැණුම නොයෙක් කරුණු නිසා අමාරු ය.

හේන් කෙටුම මෙහි සාමාන්‍යයෙන් පොසොන් මසේ දී පටන් ගැණෙයි. මේ නියහය ද පටන් ගැණෙන කාලය යි. මේ කාලයේ ආහාරය සඳහා පසුගිය අවුරුද්දේ හේනෙන් ධාන්‍ය ඉතිරි ව ඇති තැන් ඉතා අඩු ය. එහෙයින් එකල බොහෝ ගොවීන්ට හේන් කෙටුම අමාරුවක් වෙයි. සමහරුන්ට හේනෙන් උපදින බෝගය ඇපකොට ණයට කෑම ද්‍රව්‍ය ලබා ගැණුමට සිදු වෙයි. ගමේ ම ඇත්තන් ගෙන් හෝ ගමේ වෙළඳමේ එන මුස්ලිම් ජාවාරියන් ගෙන් හෝ ණය ගැණීම කරනු ලැබේ. හේනෙන් ලැබෙන බෝගයෙන් අවුරුද්ද කෑම බැරිවීමට එක් හේතුවක් මෙය වෙයි.

කොහොම නමුත් හේන් කෙටුම පොසොන් ඇසළ මාස්වල දී පායන හැටි බලාගෙන කෙරෙයි. නිකිණියේ දී ගිනි දැමීම කරනු ලැබේ. පුලුවන් කම ඇතොත් මේවා ද නැකත් නො බලා කරන වැඩ නො වේ. හොඳ පායන දවසක - මද්දහනේ - සෑහෙන හුළඟකුත් ලැබුණු කල පිළිස්සීම හොඳින් සිදු වෙයි. පිළිස්සීම ද වැදගත් ම වැඩකි. හොඳින් ගින්න ඇවිලී කොළ-දඬු සියල්ල ද ගියොත් ගොවියාට වැඩ අඩු ය. නැතහොත් ඉතිරිවන දඬු නැවත කපා, කොටා, මැළ ගසා, පිළිස්සිය

1. ලිතකින් නැකතක වේලාවක් සොයා ගත හැකි අය සමහර ගම්වල වෙසි. එහෙත් බරලෝසු කොයි ගමකවත් ඔවුන් අතරේ පාවිච්චි වුණේ නැත.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

යුතු වෙයි. හොඳින් පිළිස්සෙන හැටියට ගස් එකිනෙක පිට ඇදවැටී, තද වී සිටින ලෙස වල් කෙටුම දැන ගෙන කළයුතු වැඩකි.

හේන් කපා පුළුස්සා ගත් පසු වැට බැඳීම කරති. බොහෝ දෙන කරන්නේ හේනේ ඉතිරිවන දඬුත්, යාව වනයෙන් කපා පෙරළන ගසුත් වලින් වැටිය දැමීම[1] ය. හේනේ මේ වැඩවල දී ගැහැණු ද සහභාගි වෙති. එහෙත් කුඹුරු ගොවිතැන් වැඩවල මෙහි ගැහැණුන් යෙදෙන බවක් නො පෙනේ.

වැපිරීම සඳහා කල් බලාගෙන බිජු[2] රැස්කර ගෙන - බොහෝ විට සියයට පනහේ පොළියට ණය ලබාගෙන - ගොවියෝ වැස්ස එන තුරු බලා ඉන්නේ වප්, ඉල් මාසවල ය. සමහර අවුරුදුවල දී වැස්ස එතරම් ඉක්මන් නො වෙයි. විටෙක ඔක්තෝබර-නොවැම්බර මාස දක්වාත් ඊසාන මෝසමේ ජල වාෂ්ප සහිත සුළඟ මෙහි නො ලැබෙයි. එහෙයින් වහින්නට ලෑස්ති වෙවී, නැවත කල් දම දමා හුඟ දවසක් තිබී පසු ව වහින්නට වෙයි.

වහින්නට වූ කල බෝග වැපිරීම වත්, එකමුතු ව එක විටක කිරීමක් වත් පෙනෙන්නට නැත. සමහර විට හදිසියේ පායන දවස් අසු වීමෙන් ද, පමණට වඩා වැසි වැස කුණු වීමෙන් හෝ සේදී යාමෙන් ද බෝගය පාලු විය හැක.

කොහොම නමුත් මේ බාදවල් මග හැරී වල්කෙටුමත්, ගිනි තැබුමත්, වැපුරුමත් හොඳින් කෙරුණොත් ගොවියාගේ මහන්සිය සඳහා බෝගය වැඩීම නො වරදවා කෙරෙන වැඩකි. සුදුසු පමණ වැසි ලැබී හේනක බෝගය වැඩෙන හැටි බලන්නට ආසා උපදවන දෙයකි. එය මෙහි වෘක්ෂාහාර සහිත පසෙහි අගය විය යුතු ය. පිළිස්සී අලු සමග වැස්සෙන් තෙමෙන පොළව එරායන තරම් බුරුල් ය. එහි තැන තැන වළවල් කොටා පැලකරන ලද බිදි ඉහුරු[1] සිටුවනු ලැබේ. ඉරිහු පැල කුකුළකු උසට වැඩෙන කල සමහරු ඒ අතර කුරහං වපුරති. සමහරු තල ද, මුං ආදිය ද ටික වශයෙන් වපුරති. බටු මිරිස් ඇට කුරහං හෝ තල සමග මුසු කොට වපුරති. වට්ටක්කා, තියඹරා ආදිය ඉඳුවීම ද, කොයි හේතේත් කෙරෙයි. සාමාන්‍යයෙන් කොතැනත් මෙසේ මිශ්‍ර වැවීම ම සිදු වෙයි. අල වල ම වවනු ලැබේ.

---

1. වැට වෙනුවට ඒ මේ අසින් එක පිට එක ගස් කපා පෙරළා පවුරක් මෙන් දඬු වැට බැඳීම.
2. බිත්තර බෝගවලට බිජු, බිදි ඉහුරු (බිත්තර ඉහුරු) බිජු කුරහං ආදී ව්‍යවහාර වෙයි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

වල් කොටා පුලුස්සා ගැනීමෙන් පසු වැසි ඇත්තම් පැළවීමත්, වැඩීමත් කාරියක් නො වේ. දවසට දෙකට නැගෙන පැල මෝරා පල දරන්නේ, ගොවියාගේ මහන්සියට මිහිකත සිනාසෙමින් තුටු පඬුරු ගෙන එන්නාක් මෙනි. එහෙත් පැල යන්තම් නැහුණු ද සිට කළ යුතු රැකුම පහසු කාරියක් නො වේ. පැල යන්තමින් සතුන්ගේ කටට අසුවන්නට ඇති වූ ද සිට ම ගොවියා කල ගෙවිය යුතු හේනේ පැලේ ය.

මෙය ද ගොවියාට සැප-ඉස්පාසු ඇති කාලයක් නො වේ. හේනේ පැල නැහුණත් පල ගන්නා තුරු ගෙදර කෑම හිඟය බොහෝ දෙනකුට ඇත්තේ ය. ඒ සඳහා දුව පැන ඇවිදින ගමන් හේන රැක ගැණුම ද නො වරදවා කළ යුතු ය. ගමෙන් පිට රැයක් නතර වෙන්නට යාම නො කළ හැකි වැඩකි. එහෙයින් යන්තමින් හෝ ලැබෙන දෙයකින්, රෑ කෑම අඳුරු වැටෙන්නට පෙර ම ගන්නා ඔහු ගිනි පෙනෙල්ලකුත් වන විනා හේනේ පැලට එයි.

හේන්යායේ ඒ ඒ කොටස්වල කවුරුත් පැල් සාද ගැණුම සිරිත ය. සමහරු නො පිළිස්සී ඉතිරි වන ගස්වල දෙබල් ආධාර කොට ගෙන මැසි බැඳ, ඒ පිට කුඩා පැල් තනා ගනිති. ගස් නැති කල උස කණු සිටුවා මැසි බැඳ ගනිති. මැස්සෙන් පහළ බිම ගිනි මැලය පත්තු කර ගොවියා උඩ මැස්සේ කුදහයි.

පැල් රකින්නට වන මේ කාලය නියතින් ම වෂ්ා සෘතුව ය. වෂ්ාව පටන් ගත් විට දින ගණන් තිස්සේ නොකඩවා වහින්නට වෙයි. වැස්ස මෙ සේ වසින්නට වූ කල බොහෝ සත්තු කෑම නවතා අයින් වන හෙයින් තද වැසි ඇති රැයට සතුන් පැමිණීම අඩු විය හැකිය. වැසි දවසට නින්දට තව වාසියක් නම් මදුරුවන් නොපැමිණීම ය. ඒ නිසා එද ට ඔහු උඩ මැස්සටත් ගිනිමැලයක් හද ගෙන, ඉණෙන් ලිහා ගත් සරම ඇතුළේ තව තවත් වකුටු වෙවී කුදහයි. එහෙත් එය ද සම්පූර්ණ නින්දක් නො විය යුතු ය. වැස්ස ටිකක් වත් පායා, සතුරකු හේනට වැදුණොත් එක ම නින්දක් නිසා හේනෙන් බාගයක් වුවත් පාලු විය හැකි ය. ඒ නිසා නින්ද ගියත් හීනෙන් වැනි හැඟීමකින් වත් සතුරන් එන විට 'ෂා, ෂූ' ගා කෑගැවෙන තරමට පැල් රැකුමේ පුරුද්ද ඔහුට තිබිය යුතු ය.

වැසි නැති නමුත් තෙත් සහිත, සඳපහන ඇති රැයක කැලේ මැද හේනක, ගහක් උඩ උසින් බැඳි මැස්සක දී සරු ලෙස වැඩෙන පැල අතරෙන් පෙණෙන දර්ශනයක් අගේ විය යුතු නො වේ ද ? නගරයක ඉඳගෙන කවි ලියන කෙනකුට මෙය තුන් ලෝකයෙනුත් එහා ඇති

3. ඉරිතු ද වී මෙන් ම ෘතුමනය ඇතිව බර කැබීමෙන් පැලකර සිටුවනු ලැබේ.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

පාරාදීසයකැ යි කිය හැකි ය. එහෙත් මේ පිටිසර ගොවියාට එය එතරම් සුව පහසු ඇති තැනක් නො වේ. මේ රය පාරාදීසයක් වන්නේ ගොවියාගේ සතුරන්ට ය. බෝගය කෑමට එන සතුරන් මදිවාට ඇහේ ඇති ලේ ටික උරන්නට එන මදුරුවෝ වදයක් දෙති. එහෙයින් ගොවියා වරින් වර ගින්න ජයකර කර, මදුරුවන් තළ-තළා තොරක් නැති ව එන සතුරන්ට හා හූ ගගා රය ගෙවයි.

හේනේ බෝගයට පාඩු කටින්නට එන සතුරෝ බොහෝ වෙති. සතුරන් වැඩි වන්නේ පල ගන්නට පටන් ගත් විට ය. එකල රෑ දවල් දෙකේ ම පැයක් නැර හේන බලා ගෙන ම රැක්ක යුතු වෙයි. එහෙයින් එකල ගොවි පවුල ම ගමේ ගෙදර ඇති ගේ-දොර කළමනාත් ඉහපිට තබා ගෙන හේනේ පැලකට සේන්දු වීම සිරිත ය. ගේ-දොර කළමනා වැඩිපුර නො තිබීම මෙහි පහසුවකි. වංගෙඩිය-මෝල-කුල්ල-පැදුරු-වළං යන මේ කොයි දේත් දෙ මහල්ලන්ගේ ඉස පිටින් පහසුවෙන් යැවෙයි.

ගොවි පවුල හේනට සේන්දු වීම ගොවියා සුව පහසු ලබන කාලයේ ආරම්භය වෙයි. එකල කළ යුතු වන්නේ - කරන සිරිත ඇත්තේ - දරු මල්ලනුත් සමග යන්තම් පැලක ඉඳගෙන, පල ගන්නා දෙයින් ණය ගෙවා ඉතිරි වන දෙය බුත්ති විඳින්නට පටන් ගැණීම ය. එය අඩුවක් නැති ව කරන්නට ද ගොවි පවුල සමත් ය.

පළමුවෙන් ම හේනෙන් ලැබෙන බෝගය 'කිරි ඉහුරු' ය. තැම්බූ හෝ පිලිස්සූ ඉරිහු කරල් එකල ළමයින් අතේ නැති වෙලාවක් නැත. ඒවා බඩ පිරෙන තුරු කෑම අපහසු නො වේ. පැත්තකින් කැවෙන කල ණය ඇත්තන් ඔවුන්ගේ කොටස් වෙන් කරන විට - වන සත්තු ද දවසින් දවස ඔවුන්ගේ කොටස් බුක්ති විඳිති. මෙහෙයින් හේනේ බෝග ඉවර වන විට ගෙයින් ද ඉවර වෙන්නටත් බැරි කමක් නැත. වැස්ස පදමට හිටියොත් ඉරිහු ළහට කුරහන් ද, ඉන්පසු බටු, මිරිස්, මයියොක්කා ආදිය ද ලැබෙයි. ඉක්මනින් නියහ ආවොත් මුල දී ම බෝග නැසී යන්නටත් පුලුවන. වැව්ගම් පත්තුවේ ගොවියා ගේ ජීවිත චක්‍රය කැරකෙන්නේ මෙබඳු මේ හේනේ ඉරණම අනුව ය.

මෙසේ ඉරිහු-කුරක්කන් ගොවිතැනේ යෙදෙමින් අවුරුද්දෙන් අවුරුද්ද හේනෙන් හේනට යාම මෙහි වැස්සන්ගේ දියුණුවට බාදවක් විය. සමහර තැනක ස්ථිර ගම් පිහිටුවා කොස්-පොල් ආදී වැවිලි කරගෙන ඉන්නට වෑයම් දරා ඇති බව ද පෙනේ. එහෙත් එය සාර්ථක වී නැත. ඊට හේතුව ප්‍රධාන ආහාරය උපදවන හේන නිසා ගම පාලුවට හරින්නට

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

සිදු වීම ය. මෙසේ පාලුවට හරින ලද ගම්වල කොස්-අඹ ආදි ගස් වන මැද බොහෝ තැන්වල දකින්ට ලැබේ. මේ ගම් අත්හැරීම්වලට හේතු යොදා යෝද ඇලේ කතාවට සමාන සිද්ධි විය හැකි ය. කොහොම නමුත් වෙල්ලස්සෙන් පැමිණි තැන් පටන් 1924 වනතුරුත්, ගමක් ගෙයක් හරි හැටි ඇති කරගත් කිසිවෙකුත් මෙහි නැත.

වර්ෂ 1924 දී ආණ්ඩුවෙන් මේ ප්‍රදේශය දියුණුවට කටයුතු කරන්නට පටන් ගත් බව පසුගිය පරිච්ඡේදයෙහි කියැවිණි. එකල ගම්වලට තැන් නියම කරවා, එහි සුදුසු පිළිවෙලට ගෙවතු හා ගෙවල් ඇති කිරීම නිති මගින් කරවන්නට පටන් ගැණිනි. එදා සිට අද (1948) වනතුරුත් එසේ ආණ්ඩුවෙන් බල කිරීමෙනුත් එය සම්පූර්ණයෙන් සපල වී නැත. එහෙයින් අදත් ස්ථිර වැවිල්ලකින් සෑහෙන ආදායමක් ලබන දෙන්නෙක් වත්, උරුමයකින් හෝ බුත්තියකින් හෝ අක්කර හත අටකවත් බිමක් වගා කරගෙන ඇති දෙන්නෙක් වත් සෙවිය නො හැකි ය.

සමහර ගම්වල අවුරුදු දහය දෙළහකට පෙර වැවූ පොල් ගස් ඇතත්, වල් වැදුණු ඒවා කුරුමිණියන්ට ගොදුරු වෙයි. දෙඩම් නොදට පල දරණ නමුත් තවමත් සෑහෙන තරම වගා කළ ඉඩමක් නැත. ස්ථිර එලවළු වැවිලි හෝ නියම වශයෙන් අවුරුදු පතා වැඩ කෙරෙන කුඹුරු හෝ නැත. මෙහෙයින් අදත් වැව්ගම් පත්තුවේ ගොවිතැන සීමා සහිත ය. බොහෝ එලවළු හා පලතුරු වර්ග වැව්ගම් පත්තුවට ආශ්වයීමත් ය. ලේ පාට බිට් අල-කැරට් ආදිය, මල් වර්ග, හිතුරල-ජාවල ආදි අල, රඹුටන්, ලොවි, ඇපල්, මිදි, මුදු මාලු, ටින් ආහාර ආදි දහසක් නොයෙක් දේ වැව්ගම් පත්තුවට අමුතු ය. රඹුටන් ගෙඩියක්, රෝස මලක්, වොලි බෝලයක් යන ද්‍රව්‍ය අදත් වැව්ගම් පත්තුවේ ළමයින්ට කෞතුක දේ ය.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

10

ජීවිත කතාව

වැවිගම් පත්තුවේ ජීවිත කතාව කීමට මා පටන් ගත්තේ විවාහය පිළිබඳ සිද්ධීන්ගෙනි. ඊට හේතුව එය එහි ජීවිතය කෙරෙහි විශේෂයන් කුඩා කල සිට ම බලපවත්වන්නක් වීම ය.

සමහරවිට මෙහි ජනගහණය අඩුකම නිසාදෝ මෙහි පිරිමින්ට ගැහැණුත්, ගැහැණුන්ට පිරිමිත් හිහ බවක් මෙන් පෙනේ. ඒ නිසා ම දෝ බොහෝ මව්පියන් තම දූ පුතුන්ට අනාගතයෙහි කර දෙන සරණ නියම කරගන්නේ ඔවුන්ගේ උපතත් සමඟින් ම ය. නොහොත් ඒ අලුත ම ය. එය හැම විට ම නෑකම් අනුව - ඇවැස්ස නෑකම අනුව - සිදු වීම සිරිත ය. එහෙයින් බොහෝ ළමයින් - හැම ළමයෙක් ම වාගේ - හය හතර දන ගන්නේ, තමන්ගේ අනාගත විවාහය ගැන ද දන ගන්නා ගමන් ම ය. සමහර විට ඔවුන් බාල කල සිට ම 'මාමාගේ ගෙදරට' ඇබ්බැහි වී එහි වැඩ පළ කරගෙන සිටිනු ද පෙනෙයි. මෙහෙයින් දහ-දෙළොස් හැවිරිදි විය සිටින ගැහැණු පිරිමි ළමෝ, එකි අනාගත සම්බන්ධ කම් දන දන ම එක ඇසුරෙහි වැඩෙති.

මෙවැනි ජීවිතයක සිටින ළමයින් අතර පහළ වන සිතුවිලි මොනවා ද යි මට විස්තර කළ නො හැකි ය. රටේ කොතනත් සිරිත එක බදු හෙයින් සමාජය ඉදිරියෙහි ඔවුන් තුළ විළියක් පහළ නො වේ. එහෙත් නුසුදුසු කල සිත් තුළට ඇතුළුවන මේ හැඟීම් නිසා, ඔවුන් නුසුදුසු පැවතුම්වලට පහසුවෙන් පෙළඹෙන බව නිසැක ය. මේ නිසා විවාහයට පළමු ව මිනිසකු සුදුසුකම් වශයෙන් ලැබිය යුතු ඉගෙණීම, හික්මීම, වස්තුව ආදි කිසිවක් ලැබීමට අවස්ථාවක් නො ලැබෙයි.

ඉගෙණීමට-හික්මීමට සුදුසු වූ ළමා කාලය මෙසේ බාල විවාහය පිළිබඳ හැඟීම් නිසා දූෂ්‍ය වෙයි. ඒ අතර ළමා සිත්වල ළමා ගති නැති කරවන තවත් කරුණු ද එළඹෙයි. මෙහි මිනිසුන් දරුවන් වැඩවල යොදවන්නට පටන් ගන්නේ ඉතා ම කුඩා අවදියේ සිට ය. බහ තේරෙන

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

විට දිය යුතු පොන්-පතේ දැනුම වෙනුවට මෙහි මව්පියන් දෙන්නට බලන්නේ අනේ පයේ වැඩවල පුහුණුව් ම ය. එය ද ළමයාට ඒ දනිම් දීමේ උවමනාව නිසා නොව වැඩයේ උවමනාව නිසා ම කෙරෙන්නක් බව ද පෙනේ. එහෙයින් පාසැල් යන වයසටත් කලින් සිට ගේ දොර කුදු මහත් වැඩවල යෙදී වද විඳින ළමයින් නිතර දක්නා ලැබේ. මෙසේ වැඩවල බරත් -- ඒ මදිවාට විවාහ හැඟුමකුත් සිත්වලට ඇා කල ඒ දරු-දරියෝ නොයෙක් කසලවලින් පිරුණු මොළ ඇති, පමණට වඩා පැසුණු මිනිසුන් බවට පැමිණෙති. ළමා ජීවිතයට උවමනා ඉගෙණීම් වත්, හික්මීම් වත්, ළමා මුහුණුවලට ප්‍රීති ප්‍රමෝදය ගෙන දෙන සෙල්ලම් වත් නැති ඔවුහු ද, ඔවුන්ගේ මව්පියන් මෙන් ම ජීවිතය පිළිබඳ අවබෝධයක් නැති පිරිසක් සේ වැඩෙති. මෙසේ වැඩෙන අතර හේන් අක්කරයක් කොටා ගෙන පැල රැක ගන්නට පුලුවන් කම ලැබුණ ද මහු විවාහයක් කරගැනීමට සුදුසුකම් ලැබුවා නම් වෙයි.

විවාහය පිළිබඳ සිද්ධියත්, එයින් ඇති වන සම්බන්ධයත්, එහි ප්‍රතිඵලත් යන තුන් කාරණය ම මෙහි සමාජයෙහි ඉතා සුළු බලයක් ඇති දේ ය. කැළඹීම්වලට මුහුණ දෙන උත්කර්ෂ අවස්ථාවන් හෝ අමුතු විචිත්‍ර හැඟීම් උපදවන ක්‍රියා හෝ ජීවිතයන්ට අමුතු බල පෑම් හෝ නැති ව, නිශ්ශබ්ද ලෙස විවාහයන් පිළිබඳ සියලු කරුණු සිදු වෙයි. කොටින් කියතොත් විවාහයන් නිසා මෙහි මව්පියන්ට වත්, මනාළ-මනාළියන්ට වත් මූණපාන්නට වන අමුතු වියදමක් හෝ කරදරයක් වෙහෙසක් හෝ නැත. ඒ නැතිවීමට හේතුව ද නැති බැරිකම් ම මිස අමුතු ගුණයක් නොවේ.

දවැද්ද දීමක්-ගැනීමක් නැතිකම මෙහි ඇති පළමුවන පහසු කම ය. රැස් කළ මුදල් හෝ අයිති ඉඩ-කඩම් හෝ නැති ඔවුන් අතර දයාද ප්‍රශ්නයක් නැගෙන්නට හැටියක් නැත. එහෙයින් විවාහ වීමට පුරුෂයකුගේ සුදුසුකම් හේනක් කොටාගන්නට පුලුවන් කම මෙන් ම ගැහැණියකගේ සුදුසුකම් වන්නේ තලප හැඳිගාගෙන හොද්දක් උයාගන්නට පුලුවන් කම විය යුතු ය. මේ නිසා නාගරිකයේ දියණියන් ඇති මව්පියනට මෙන් දවැද්දක කරදරයක් මෙහි මව්පියනට නැත. මේ තබා වෙනත් විය-හියදමක කරදරයක්වත් මනාළියගේ මව්පියනට නැත. මනාළයා මනාළියට උවමනා ඇඳුම් පැළඳුම් ආදිය ද රැගෙන, කත් මළු බැඳගෙන ඇගේ ගෙදරට ගොස් අඳින්ට දී, ඇ කැන්දගෙන ඒම හෝ එහි නැවතීම හෝ සිරිත ය. මේ නිසා මහුල් තුළාවල් අමුතු කරදර නැති ව මෙහි සිදුවෙයි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

විවාහයන් ලියාපදිංචි කිරීම මේ පළාත්වලට පුරුදු වීගෙන එන්නේ දැන් දැන් ය. තවමත් බොහෝ දෙන කරන්නේ සිරිත් වශයෙන් අඳින්ට දීමෙන් විවාහය පිළිබඳ ක්‍රියා අවසන් කිරීම ය. විවාහය ලියා පදිංචි කළත්, නොකළත් ඉන් පහළවන වෙනසකුත් නැත. බැඳෙන දෙන්නා නො ගැළපුණොත්, ඉන් එක්කෙනකු හෝ වෙන් වන්ට උවමනා වුවොත් දික්කසාදය ද කසාදය මෙන් ම පහසුවෙන් කෙරෙන්නකි. එහෙයින් කසාද ලියාපදිංචි කිරීම ගැන කාගේත් ඇති සැළකිල්ල ද එබඳු ය. දික්කසාදය නොහොත් වෙන් වීම පහසු කරන කරුණු ද කීපයකි. නීතියේ බැඳීම ඇතත් නැතත් ඒ ගැන සැළකිල්ලක් කරන හෝ නඩුපනත් කියා ගන්නා කිසිවෙක් නැත. එහෙයින් එතැන කිසි බාධාවක් නැත. බෙදිය යුතු දේපළක්වත්, ලබන්ට තිබී නැතිවන උරුම කරුමයක්වත් නැතිකම, වඩාත් ලොකු බාධාවකින් ගැළවීමකි. එහෙයින් වෙන් වීම උවමනා වූ කල පුරුෂයකු නම් කළ යුතු 'දුවපිය' කියා ගැහැණිය පන්නා ගැනීම ය. ගැහැණිය පුරුෂයකු එපා වූ විට කළ යුතු, තමන්ගේ රෙද්දක්, හැට්ටයක් ඇතොත් එය අකුළාගෙන පාරට බැස මව්පියන්ගේ හෝ හිතවත් අනික් නෑයකුගේ හෝ ගෙදරකට යාම ය. මෙසේ බැඳුණු විවාහයන්ගෙන් වෙන් ව යාම නින්දවක්-මදිකමක් හැටියෙන් සැළකීමක් වත්, එයින් අනික් විවාහයකට බාධා පැමිණීමක් වත් නැත. එහෙයින් බොහෝ පවුල් වරින්වර වෙන් වී නැවත එක් වුණු - නැතහොත් තැනකින් දෙකකින් වෙන් ව ගොස් නැවත අලුත් තැන්වල බැඳුණු - මෙහෙයින් දෙ වැනි-තුන් වැනි-හතර වැනි-පස් වැනි දිග කන ගැහැණු පිරිමින්ගෙන් යුතු ය.

එහෙත් මෙසේ වෙන් ව නො ගොස් පළමු වරට බැඳුණ දිගය ම කමින්, දරුමල්ලන් ලබමින් වෙසෙන්නන්ගේ පවුල් ද මෙහි ඇත. එවැන්නවුන් ගේත්, යටකී පරිදි වෙන්වන්නවුන්ගේත් ජීවිතවල තත්වයෙහි වෙනසක් හෝ විශේෂයක් ද දක්ක නො හැකි ය.

නාගරිකයේ සමහර තැන්වලටත් වඩා මෙහි විවාහයන් සිදු වන්නේ මව්පියන්ගේ කැමැත්ත හා තෝරා දීම් අනුව යයි කිව යුතු ය. පිරිමි පුතකු නිතුවක්කාර විවාහයක් කරගැනීම සිදු වෙතත් බොහෝ ගැහැණු දරුවන්ට සිදු වන්නේ විවාහයක් පිළිබඳ වැටහීමක් - පුරුෂයකුගේ සුදුසු නුසුදුසු කම් ගැන යමක් සිතීමට තරම් දැනීමක් - ලැබෙන්නට පළමු ව මව්පියන්ගේ කැමැත්ත පරිදි විවාහයක බැඳීමට ය. සමහර විට තරුණියක් කිසියම් පුරුෂයකු සමග යන්ට බැරි යයි කෙඳිරි ගැවත් ඒ ගැන සළකන කෙනෙක් නැත. මේ සිරිතේ හොඳ-නරක විනිශ්චය කිරීමට වෑයමක් මම නො දරමි. එහෙත් සමහර මව්පියන් මෙසේ ගැහැණු

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

දරුවන් දිග දිමේ දී ඔවුන්ගේ වයස් ගැන ටිකක්වත් නොසැලකීමෙන් - සමහර විට වැඩිවිය වත් නොපැමිණි ගැහැණු දරුවන් විසි-තිස් විය පසු කළ පිරිමින්ට දීමෙන්, පහළ වන ඇතැම් තොරතුරු ඇසෙන විට දෙකන් වසා ගත යුතු බව නොකියා නොහැකි ය.

විවාහය කොහොම බැඳුණත්, ඔවුන්ගේ වයස් ගැළපීම් ආදිය කොහොම වුණත් මේ පවුල්වලට ළඟා නොවන එක් දෙයක් ඇත. ඒ නොලබන දෙය මම විවාහ ජීවිතයේ 'මාධුර්යය' යි නම් කරමි. එය නොලැබෙන්නේ අනෙකක් නිසා නොව ඒ ගැන හැඟීමක්-දැනීමක් නැති කම නිසා ය. මාධුර්යය නොහඳුනන නිසා ය. ජීවිතයේ අවස්ථාවන්ගෙන් උරා පෙරා ගත යුතු උසස් මාධුර්යයක් තබා, පවුලක එකිනෙකා වෙත පැවැතිය යුතු තාවකාලික විහිළු තහළුවක-විනෝදයක රසයක්වත් එහි නොලැබේ. කොතැනක වුවත් සිත් ඇත්තවුන්ට මවා ගත හැකි මිහිරක් ඇතිකර ගැනීමට දැනුමක් නැත. පරිසරයේ එවැනි රසයක් ලැබීමට කිසිවකුදු නැත. එහෙයින් මිහිරි කවටකමකින් ලැබෙන විනෝදයක්වත්, පොත-පතකින්, කතාවකින් ලැබිය හැකි පහන් සංවේගයක්වත්, නෘත්‍යයකින් - සංගීතයකින් රසයක්වත් මේ ආදී කිසි ම ක්‍රමයක ආස්වාදයක්වත් මෙහි නැත. එහෙයින් පුරුෂයා දිනපතා ඉස්පාසුවක් නැති ව හේනේ ගොවිතැනෙනුත්, ස්ත්‍රිය ගෙදර-දොරේ වැඩවලින් හා දරුවන් හැදීමෙහිත් යෙදීමෙනුත් ඔවුන්ගේ කාලය ගෙවේ.

නොදැනීම, නැති-බැරිකම, මෝඩකම ආදී දේවල් ආශීර්වාදයක් බවට පැමිණෙන අවස්ථා තිබේ. මේ කැලෑ රටේ දයාද ප්‍රශ්නයක් නැත්තේ දිය හැකි කිසිවක් කාටත් නැති නිසා ය. එහෙත් එය එහි ගැහැණු පිරිමි හැමටම මහා ආශීර්වාදයකැ යි කිව යුතු ය. නාගරිකයේ බොහෝ තැන්වල නාකි ලමිස්සියන් හා තරුණයන් ඇතත්, වැව්ගම් පත්තුවේ කොතැනක වත් එබඳු අභාග්‍යවතුන් දක්නට නැත.

නොදැනීම නොහොත් මෝඩකම මීට ද වැඩියෙන් මේ කැලෑ රටේ ජීවිතයනට ආශීර්වාදයකැ යි කිව යුතු ය. හොඳ ගෙයක්-දෙරක් ඇති ව, සැප පහසු පිණිස ඇඳ පුටු මේස උපකරණ ඇති ව, යාන වාහන ඇති ව කල් ගත කිරීමේ පැතුමක් ඔවුන් තුළ නැත. පැතුමක් නැති හෙයින් නොලැබිණැ'යි තැවීමක් ද නැත. එහෙයින් කවුරුත් පුරුදු පරිදි ලැබී ඇති සැප පහසුවෙන් යැපෙමින් කල් ගෙවති.

මෙහි ජීවිත, නාගරික ජීවිතයට වඩා ස්වභාව ධර්මයට අවනත ය. උපන් තැන් සිට මරණය තෙක් නොයෙක් අතුරු අනතුරු මැද ජීවිත රැකුණේ දෙවියන්ගේ නොහොත් ස්වභාවයේ ම කරුණාව යටතෙහි ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මෙහි මිනිසුන් කෑවේත්, ඇන්දේත් දෙවියන්ගේ පිහිටෙනි - ලෙඩදුක්, අනතුරු ලැබුවේ දෙවි කෝපයෙනි. එහෙයින් නාගරිකයේ වෙදකෙනෙකුවිදියේ මිනිස් ජීවිතයට ලැබුණු සියලු පිහිට මෙහි ජීවිතයන්ට ලැබුණේ, දෙවියන් හෝ යකුන්ගෙනි. ඒ ලැබුවේ පූජා හා බලිතොවිල් මන්තරවලිනි.

ගමේ වෛද්‍යයා 'පාරිෂාරි' නම් විය. ඔහුගේ වෙදකම මන්තර වලින් ම විය. සමහර පරිෂාරිලා සමහර ඖෂධ වර්ගයන් ද දන සිටි නමුත් වැඩි දෙනෙකු වැඩි වශයෙන් ම කළේ මන්තරවලින් ප්‍රතිකාර ම ය. උත්පත්තියේ සිට මරණය දක්වා ඇතිවන හැම උපද්‍රවයක දී ම, ඉසරදයේ පටන් මහලෙඩ දක්වා හැම ලෙඩකට ම කරන ලද්දේ මැතුරුම සහ බලි බිලි දීම ම ය.

ස්ත්‍රියක් ගැබ් ගත් බව දැනගත් විට - පළාතේ යමක්-කමක් දැති ඇත්තන්ගේ ගෙවල කරන තොවිල් ඇත්තේය. තනි පොළ කටිනා රූපරිරියක් බලි එයින් සමහරකි. ඉන්පසු වරින් වර නුල් බැඳීම් කරනු ලැබේ. නාගරිකයෝ දරුවන් ලබන්නට ආසන්න වන ස්ත්‍රීන් ආරෝග්‍යශාලාවලට යවන නමුත්, මෙහි ඇත්තෝ ආරෝග්‍යශාලාවලට යාමට කැමැති නො වෙත්. අරෝග්‍යශාලාවල නො දන්නන් ඉදිරියේ ලජ්ජා වීමට වඩා ගෙදර මිය යාමට වුව ද ඔවුහු කැමැත්තෝ ය. එහෙයින් 'පරිෂාරිලාගේ උදව්වෙන් ඔවුහු දරුවන් ලබන අවස්ථාව බේරා ගනිති. පරිෂාරින් නැතුව සොබා දහම අනුව බොහෝ දෙන දරුවන් ලැබ සැපසේ ද වෙසෙති.

පුහුණු වින්නඹුවන් ද මෙහි නැත. පුහුණු වූ තබා ගොඩේ වින්නඹුවන් වත් ඇත්තේ සමහර තැනක පමණය. උන්දගේ වින්නඹුකම ද ඵැඩි වශයෙන් මන්තරවලින් ම කෙරෙන්නකි. දරු උපතින් පසු කැරෙන සාත්තු මේවිවල්, වෙද හෙද කම් ද එබඳු ම ය. උපන් පසු හැම විට ම ලෙඩවල දී ද මන්තර ම පිහිට වෙයි.

මන්තර මෙහි ගැහැණු පිරිමි කවුරුත් පාහේ දනිති. කවුරුත් මන්තර දැනීම අගය කොට සළකති. ලෙඩදුක් දුරු කර ගැනීම පමණක් නොව අතර මග හදි අනතුරු වළකා ගැනීමත් මන්තරවල පිහිටෙන් ම වෙයි. අතර මග හමු විය හැකි අලියාට, වලහාට, කුළාට වෙන වෙන මන්තර ඔවුන් වෙත ඇත්තේ ය. එහෙයින් හැම ආපදවක දී ම කවුරුත් දන්නා මන්තරවල පිහිට ලැබෙයි.

මේ මන්තරත්, ඒවායේ පිහිටත් කෙතෙක් දුර සැබෑ දයි නිශ්චය කිරීමට මට නුපුලුවන. එහෙත් ඒවා කෙරෙහි විශ්වාසය තබන ඔවුනට ප්‍රත්‍යක්ෂයෙන් ම පිහිට ලැබුණ බව සැබෑ ය. ඔවුන්ගේ හැම ලෙඩ

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

දුකක් ම දුරු වුණේ මන්තරවලින් ම බව ඔවුන්ගේ විශ්වාසය වෙයි. මැදහත් ව සිතන කෙනකුට මෙහි සත්‍යාසත්‍යතාවය ගැන යමක් සිතීමට ඒවායේ ස්වභාවය ගැන සෙවීම සුදුසු ය.

මන්තරයක් මතුරන විට එය ඇසිය යුතු කෙනෙක් ද වෙයි. ලෙඩකට නම් එහි ආතුරයාට මන්තරය ඇසෙන්නට උවමනා ය. ඇසීම නො වෙතත්, පෙනෙන්ට සැලැස්වීමෙන් හෝ ආතුරයා තුළ ඒ ගැන විශ්වාසය උපදවන හැඟීම් පහළ කරවනු ලැබේ. වලහා හෝ කුළාට මතුරන විට ඌට ඇසෙන සේ මහ හඬින් මන්තරය කිය යුතු වෙයි. එහි දී මන්තරයේ අකුරුවල හාස්කම තරම ම ලොකු බලයක් එය කියන උච්ච ස්වරයෙහි ද පිහිටන බව පෙනේ. සතුරා බිය වැදෙන්නේ මන්තරයේ උස් හඬින් බව ද සිතිය හැකි ය.

අලියාට මැතිරීම දෙයාකාරයකින් කෙරෙයි. එකක් හීන් හඬින් - එහෙත් අලියාට 'මුණු මුණු' හඬ ඇසෙන සේ මැතිරීම ය. අනික් විදිය මහ හඬින් කෑ ගසා මන්තරය කීම ය. මහ හඬින් කීමට ද වඩා අලියා බිය වදින බව පෙනෙන්නේ හෙමින් මතුරන මන්තරයට ය. මන්තරයක් පමණක් නොව මොකක් නමුත් කියුමක් එසේ හෙමින් හෝ මහ හඬින් කිව්වත් මේ සතුන් බිය වැද්දිය හැකි යයි සිතිය හැකි ය. අලියා අනික් වන සතුන්ට වඩා කල්පනාකාරී කම් දක්වන - නිකරුණේ කඩා බිඳ ගෙන දිවීම හෝ ලුහුබැඳීම හෝ හිතුමතයේ නො කරන සතෙකි. හෙමින් කියන මන්තර පමණක් නො ව කොයි දෙයක් වුවත් ඔහු තේරුම් ගන්නේ තමන්ට හතුරු කමක් කිරීමට මිනිසා රහසින් කරන කතාවක් හැටියෙනි. හෙමින් කියන මන්තරයෙන් ඌ මග අරින්නේ ඒ නිසා විය යුතු ය. කොයි මන්තරවලත් ඇති ආනුභාවය මෙබඳු වෙන්නට බැරි නැත. එහෙත් අද දක්වාත් වැව්ගම් පත්තුවේ ජීවිතවලින් වැඩි හරියක් රැකුණේත්, රැකෙන්නේත් මන්තර නිසා බව එහි හැම දෙන ම ප්‍රත්‍යක්ෂයෙන් දනිති.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

11

අම්ම හාමුදුරුවන්ගේ කාරිය

හෙලබොඩ - 8 වැනි පරිච්ඡේදයෙහි විස්තර වුණු හෙලබොඩ වට්ට විදනේ, මහුගේ බෑණලා දෙන්නාත් සමග වසන ගම වූ හෙලබොඩ - පිළිබඳ ව අපට කදිම ආරංචියක් ලැබුණේ ය. මේ කදිම ආරංචිය වූයේ, එහි සිරිත් පරිදි අවුරුදු කීපයකට වතාවක් බැගින් කැරෙන එක්තරා තොවිලයක් ඒ වතාවේ ජයට කැරෙන බව ය.

නියමිත දවසේ සවස 4 ට පමණ අපි තුන් දෙනෙක් කරත්තයකුත් බැඳගෙන හෙලබොඩ යාමට සූදනම් වුනෙමු. එබ්බැහැරෙ මුත්තා[1] ගේ බෑණා කරත්තය බැඳ ගත්තේ ය. අනික් අමුත්තාත්, මමත් එහි නැහුණෙමු. එ තැන් සිට හැතැප්ම හතක් පමණ දුර කැලෑ හා තලා මැදින්, ගල් මුල් උඩින්, වියලුණු දිය කඳුරුවල වැලි තලා පිටින් හැල හැප්පෙමින් ගමන් කොට රෑ අටට පමණ අපි හෙලබොඩ ගමට ළඟා වුණෙමු. (ගම පිළිබඳ විස්තර 8 වැනි පරිච්ඡේදයේ සඳහන් වෙයි.)

මේ ගෙවල් දෙකෙන් වඩා පැරණි, වඩා ලොකු ගෙය වූ වට්ට විදනෙ වසන ගෙයි මිදුලේ තොවිලය සඳහා සූදනම් කොට තිබුණේ ය. ගෙයි පිල පිටත්, මිදුල වටේත් වටා පිටා ගම්වලින් පැමිණි නෑදෑයෝ, අමුත්තෝ පිරී සිටියහ. තොවිලය තව ම පටන් ගැනී නො තිබුණ නමුත්, රටේ සිරිතේ හැටියට විය යුතු පරිද්දෙන් ම පැත්තක බුරු ගැසීම පටන් ගැනී ජය වී තිබුණේ ය.

මිදුලේ එහා මෙහා හැසිරෙමින් මම, තොවිලය සඳහා කර තිබුණ සැරසිලි බැලුවෙමි. ගෙමිදුලේ එක් අංශයකින් බඹ එක හමාරක්-දෙකක් දිග පළල ඇති මඩුවක් තනා එය වටකරේ තුන් පැත්තකින් රතු පාට රෙදිවලින් තිර වසා ඇතුළත පිදවිලි සකස් කොට තිබුණේ ය. මේ මඩුවට මුණ ලා මිදුලේ අනිත් අංශයේ තවත් කුඩා මඩුවක් ද, එසේ ම

1. පළාතේ ව්‍යවහාර නමකි.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

වැඩි වශයෙන් රතු පැහැගත් රෙදිවලින් වටකර තිබුණේ ය. මඩු දෙකෙහි ම විශේෂයකට පෙනුණේ එහි පුරවා තිබුණ කොහොඹ අතු ය. පහත රට 'දෙවොල් මඩු' පොළවල පොල් මලට ලැබෙන තැන මෙහි කොහොඹ අත්තට ලැබෙන බව පෙනුණේ ය.

මේ තොවිලයේ ස්වභාවය ගැන තොරතුරු ටිකක් ද මට අසන්නට ලැබුණේ ය. පහත රට සමහරුන් අවුරුදු පතා හෝ අවුරුදු කීපයකට වරක් දෙවොල් මඩු නටවන්නාක් මෙන් මෙය ද සිරිත් පරිදි කරවන දේව කාරියකි. අම්මා දෙයියන් වෙනුවෙන් කරන හෙයින් ඒ 'අම්ම හමුදුරුවන්නේ කාරිය' නමැයි වට්ට විදනේ කියයි. මෙය නො කළොත් පවුලේ ලෙඩ දුක්-කරදර-අනතුරු වැඩිවන බව ද, කිරීමෙන් ඒ සියලු උවදුරු දුරු වී ශාන්තිය සැළසෙන බව ද ඔහු කියයි.

හෙලබොඩ වට්ට විදනේ පිළිබඳ තොරතුරු කලින් සඳහන් විය. ඔහු වැව්ගම් පත්තුවට විරළ, තරමක් උස මහත සිරුරක් ඇත්තෙකි. ඔහුගේ මුහුණත්, මුවත් පළල් ය. කට හඬ රළු ය. වයසින් පණහට කිට්ටු විය යුතු ය. ඔහු දරු මුණුබුරන් දුටු අංග සම්පූර්ණ තලතුනා ඇත්තෙකි. ඔහුගේ බිරින්ද ද වයසින් ඔහු තරමට පමණ යැයි සිතිය හැකි - වැහැරුණු සිරුරින් යුතු ගැහැණියකි. ඇගේ දියණියන් දෙදෙනෙක් දරුවන් ලත් මව්වරු වූහ.

මේ තොවිලය පිළිබඳ ඉතාම ආශ්චර්‍යවත් සිද්ධිය මට දකින්නට ලැබීමට ඒ තරම් වේලාවක් ගියේ නැත. තොවිල් කාරයන් කෑම් බීම් සප්පායම් වී ලැස්ති වන විට රෑ දහය පමණ විය. එදා පායා තිබුණ හඳ හෙලබොඩ ගමට ම පෑවුවාක් මෙන් මට පෙනුණේ ය. හතර වටේ වන බිම සතුන් ගේ හඬ ඇසුණේ නැත. මම අප ආ කරත්තය උඩ දිග ඇදී සිටියෙමි.

එක් වරට ම උඩැක්කිය හඬකුත්, ගී හඬකුත් නැගුණේ ය. තවත් විනාඩියකින් මිණිගෙඩියක නාදයක් ද ඊට එක් විය. ගීය දෙමළයෙනි. තොවිලයට පැමිණ සිටි පූෂාරී[1] නමැති ප්‍රධාන ඇදුරා දෙමළ ජාතිකයෙක් විය. දෙමළ ගීය උඩැක්කිය හා එක් ව ටික වේලාවක් ගිය පසු හෙතෙම ගීය නවතා මන්තර කියන්නට විය. ඒ ටික වේලාවකින් අමුතු ම හඬක්, තවමත් කරත්තය උඩ දිග ඇදී සිටින මට ඇසුණේ ය. මිනිසුන්, දෙවියන් ආරූඪ වන බැව් කියන වේලාවට නගන හති හඬකි, එය. ඒ සමග ම එබඳු ම ගැහැණු හඬක් ද ඇසුණේ ය. කවුරුන් මඩුව අවට රැස්වන්නට වූහ. මමත් කරත්තයෙන් බැස ඒ අසලට ගියෙමි. මඩුව

1. 'පූෂාරී' යි දෙමළ යකැදුරන්ට කියති. පරිෂාරිලා සිංහල වෙද්දු වෙති. දෙමළ නම් විය යුතු ය.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

ඉදිරියේ රොක් වුණ පිරිස අතරෙන් පෙනුණේ මට පිටිපා පිදවිලි දෙස බලා බිම වැටී ඉදගෙන හිස් කරකවන දෙදෙනෙකි. ඒ අතින් හොඳ හැටි නො පෙණෙන නිසා මම මඩුවේ අනික් අතින් කරකැවී පිදවිලිවලට පිටුපස තිරයට පිටින් සිට ඊට උඩින් හිස ඔසවා බැලීම්. කෙළවරක් නැති විස්මයකට මා පත් කරවමින් එතැන බිම දණින් වැටී ඉදගෙන, **කොහොඹ අතු මිටි දෙකක් ගෙන වෙවුළුවමින්, හිස් කරකවමින්** උන්නේ **අපේ වට්ට විදනේක්, උන්දගේ පවුලත් ය.** මෙහි ඉහතින් විස්තර වුණු තලතුනා වට්ට විදනේ සහ ඔහුගේ බිරින්ද ය. දෙදෙන එකිනෙකාට ළංව දෝතින් ගත් අතුමිටි සළ සළා හිස් කරකව කවා කටින් හඃ ! හඃ !! ගා මහ හඬක් නගමින් සිටියහ. මේ දෙදෙනාට දෙ පැත්තෙන් යටකී පූජාරිත්, තවත් සිංහල තැනැත්තකුත් දෙමළ ගී කිය කියා උඩැක්කි නැඩවූහ. තවත් අයෙක් පැත්තක හිටගෙන මිණි ගෙඩියක් සැළී ය.

ටිකකින් පූජාරි ගී නතර කොට මන්තරයක් මතුරයි. එවිට බිරින්දත්, විදනේත් මහා අවේශයකින් යුතු වූවාක් මෙන් දහළන්ට වෙති. විදනේ ගේ රළු හඬිනුත් බිරින්ද ගේ හීන් හඬිනුත් 'හඃ! හොඃ !' ගාන හඬ පැහැදිලි ව වෙන වෙන ම ඇසෙයි. බිරින්ද විටෙක දණින් හිටිමින්, මහත් වේගයෙන් දනේ අතු මිටි සළ සළා වේගවත් ව දහලයි. එවිට විදනේ ද වේගවත් වෙයි.

වට්ට විදනේගේ ඇඳුම වූයේ පුරුදු පරිදි සරමකට හෝ දෙකකට මතුපිටින් අඳින ලද පිරුවටක් පමණ ය. බිරින්ද සුදට හුරු රෙද්දකින් උරයක් වසා සාරිය ඇඳ, හැට්ටයක් දමා උන්නා ය. මේ දහලන දහලුමේ වෙහෙසක තරම දෙන්නාට ම දඩිය දමන තරමින් පෙනුණේ ය. ටික වේලාවකින් බිරින්ද, ඉදිරිපිට තිබුණ වතුර කොරහ ගෙන හිසේ හළා ගත්තා ය. ඒ සමග ම විදනේත්, වතුර කොරහක් ගෙන්නා ගෙන හිසේ හළා ගත්තේ ය.

ඔවුන්ගේ ඇඳුම් දඩියෙනුත්, වතුරෙනුත් එක හැටි තෙමිලා ය. ඒ තත්ත්වයෙන් බිම දණින් හිඳගෙන - අසුන් පිට ගමනක යෙදෙන්නාක් මෙන් කඳ සළ සළා ඔවුහු මායම් වූහ.

මේ හදිසි දිය නෑමෙන් පසු දෙදෙනා ම මඳක් නිශ්චල වෙති. යුගත් කොහොඹ මිටිය සමගින් එක් කොට ගෙන ඉදිරි පිට ඇති පිදවිලි දෙස ඇරගත් දෙනෙතින් යුතු ව බලා සිටිති. පූජාරියෝ ගී ගයති. උඩැක්කි නද දේ. මිණි ගෙඩිය සැලෙයි.

යලිත් ටිකෙන් ටික මායම වැඩිවෙයි. බිරින්ද හෝ විදනේ කොහොඹ මිටිය තබා, ඉදිරි පිට පානෙන් පාන් වැටියක් අතට ගෙන එය වෙවුලුවමින්,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ඒ ඒ අතට වනමින් ටික වේලාවක් සිට පාන් වැටිය, ගිනි ඔලත් සමඟින් කටෙහි ඔබාගෙන දස්කමක් පෙන්වයි.

එයින් පසු ඇදුරා යලිත් මන්තර මතුරයි. මායම වැඩි වී විදනේ පේන කියන්නට පටන් ගනියි. පේන කීම පිළිබඳ සියලු කතා දෙමළයෙන් විය.

නැවත, අනෙකුත් අමුත්තන්ට, දූ දරුවන්ට, නෑයන්ට දෙවියන් වෙනුවෙන් යාතිකාව වීම නොහොත් ආසිරිවාදය පටන් ගැනෙයි. එය ද කෙරෙන්නේ මේ නටන දෙමහල්ලන් අතිනි.

ආසිරිවාද ලබන අය, බාරහාර දෙන අය, පිළිවෙලින් එක් එක් කෙනා මේ යුවළ මායමින් සිටින තැනට පැමිණෙති. පැමිණීම වූයේ ඒ වරට අඩ ගහන හැටියට ය. පැමිණෙන කාටත් ආශීර්වාද දීම් වශයෙන් කරන්නේ අතේ අතු මිටියෙන් හිසට-මුණට තළා, මොනවා වත් කියා මොනවාදෝ තවත් අලේපයක් නළලත ගෑම ය. ඉන් පසුත් කෙනෙකු කැඳවති.

පළමුවෙන් ම කැඳවන ලද්දේ වට්ට විදනේ ගේ වැඩිමල් දුව ය. මායමින් සිටියත් මව්පිය දෙදෙනා දියණියන් අඳුනන බව කාටත් පෙනුණේ ය. මව ඇය අතින් ඇද ළඟට ගෙන, ගෙළ වැළඳ හිස අතු මිටියෙන් පිස, නැවත යටකී ආලේපයක් නළලත ගා ආපසු යැව්වා ය. ඉන්පසු එකිනෙකා ආසිරිවාද ලබනු පිණිස පැමිණියහ. පැමිණෙන හැම කෙනෙකුට ම අතු මිටි දෙකෙන් තැළීම මායම් වන දෙදෙනාගේ සිරිත විය. සමහරුන්ට වැදුණු පහරවල් මුහුණු පුපුරු ගහන තරම් වූ බවට සැක නැත. එහෙත් ඊට කිසිවෙකුත් නො කැමැති වූයේ නැත. බොහෝ දෙන එකා පස්සේ එකා බැගින් ගොස් මායම් වන විදනේ දෙමහල්ලන් ඉදිරියේ දනින් වැටී අතු මිටියෙන් පහර ලැබ, නළල අලේපයෙන් ආසිරිවාද ලැබූහ. එහෙත් මේ ආසිරිවාදය එක් එක් අයට වෙන වෙන අන්දමේ සැළකිල්ලෙන් කෙරුණු බවත් කාටත් පෙනුණේ ය. තමන්ගේ දරුවන්, සමහර අය පැමිණි විට කොහොඹ අත්තෙන් කෙරුනේ ඊටත් සැළීමකි. ඇතැමුන්ට පහර දීමකි.

කොහොම නමුත් මේ ආසිරිවාදය ලැබීමට බොහෝ දෙනා දක්වන කැමැත්තක තරම ඒ සඳහා පොර කමින් රොක් වන අයගේ ගණනින් පෙනුණේ ය. සමහරුන්ට වට්ට විදනේ 'පේන' කීවේ ය. දෙමළයෙන් කී ඒ පේනවල අදහස් ගැන මට නියමිත වචනයක් කිය නො හැක. මෙසේ ඒ මඩුවේ බොහෝ වේලාවක් රැඟුමෙන් පසු මේ යුවළ ඉදිරිපිට තිබුණු

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

අනික් කුඩා මඩුවට ගියහ. එහි දී ද ටික වේලාවක් හොරගල් අවුලමින් සිට ඉන්පසු උඩැක්කි - මිණි හඬින් - ගීයෙන් - මන්තරයෙන් ඇවිස්සි - මායම් වී - නැටුම් වතුර නා - ගිනි සපා - පේන කියා ආසිරිවාද දීම කැරුණි.

එතැන් සිට එළිවන තෙක් ම ඇත්තේ මේ රැහුම් ම බව අපට දැනගන්ට ලැබුණේ ය. එහෙත් දිගට ම රැහුම් කරන්නේ ඒ දෙන්නා ම නො වේ. විටින් විට ඒ යුවළ මාරු වේ. ගෑණුන් හෝ පිරිමින් හෝ මිශ්‍ර ව හෝ වරකට දෙන්නා බැගින් සිට මායම් වී පතන්නන්ට ආසිරිවාද දෙනු ලැබේ. අනික් බොහෝ තොවිල් මෙන් ම මෙයද පාන්දර යාමයට වඩ වඩා උත්කර්ෂවත් වෙන්නකි. නැටුම්-මායම් කරන්නවුන්ට අරක්කු පොවා කරන රැහුමක් ද ඇති බව අසන්ට ලැබුණේ ය. එය බීගත් කල වට්ට විදනේන්, බිරින්දන් මා දකිද්දී නැටූ තරමට වැඩියෙන් නටන බවට ද සැක නැත.

වැවිගම් පත්තුවේ පරිහාරිලාගේ තවත් තොවිල්-කංකාරි කිපයක් ම මට දකින්නට ලැබුණේ ය. කොළඹ රටේ කෙරුණු එබඳු තොවිල් කංකාරිවලට වඩා මේවායේ වෙනස් කම් බොහෝ විය. ඉහත විස්තර වුණු 'හෙලබොඩ - අම්ම හාමුදුරුවන්ගේ කාරිය' වැනි අවුරුදු පත සිරිත් වශයෙන් කෙරුණ කංකාරි වශයෙන් වෙනත් ගම්වල නිබුණ දේවාලයවල 'මංගල්ල[1] හා අඩුක්කු' පිදීම පමණකි. ලෙඩ-දුක්ඛිත මිදීම සඳහා කරන තොවිල් තවත් වෙසෙසකි.

රටේ වෙන පළාත්වලත් - ඉතාම උසස් යයි කියන නාගරිකයේත් යකදුරු කම් හිඟ නොවේ. එහෙත් එහි ඒ තරම් ම නොහොත් ඊටත් වැඩියෙන් ඖෂධයෙන් කරන වෙදකම් ද ඇත්තේ ය. වැවිගම් පත්තුවට හැම ලෙඩට ම යකැදුරු කම් මිස බෙහෙත් ඇත්තේ ම නැතැ යි නිව යුතු තරම්.

වැවිගම් පත්තුවට වෛද්‍යයන් නැති බව කලින් ද සඳහන් විය. සමහර ගමක සුළු බෙහෙත් කිපයක් දන්නා අය ඇතත්, ඇතැම් ගමකට එය ද නැත. ඖෂධ අඳුනන්නන් ද නැත.

මෙසේ පුරුදු නැති කම නිසාම දෝ ඔවුන් බොහෝ දෙනකුට මන්තර ගැන මිස ඖෂධ විශ්වාසයකුත් නැත. සතියකට වරක් දෙස්තර මහතකු කරත්තයකින් මේ ගම් සමහරක හැසිරෙන බව ද යට සඳහන් ය. දෙස්තර මහතා ආ විට සමහර ගෑණු-පිරිමි බෙහෙත් ගැනීමට රැස්වෙති. එහෙත් කවුරුවත් තමන්ට ඇති අසනීප කියා බෙහෙත් ඉල්ලීමක්

1. දේවාලයන්හි අවුරුදු පතා කෙරුණු උත්සව - මේ වැවිගම් පත්තුවේ වචනයක් නො වේ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

නැත. කවුරුන් 'මට තෙලම්,'[1] 'මට තෙල්'[2] කියා තමන්ට උවමනා දෙය ඉල්ලති. ඒවා ඉල්ලන්නේත් බෙහෙත් වශයෙන් පාවිච්චියට නොව වෙන උවමනාවලට හෝ නිකම් ලැබෙනුවාට පමණ ය. ඒ මිස ලෙඩවලට මන්තර-තොවිල් ඇර වෙදකමක් නැත. එහෙයින් වතුර මැතිරීම, තෙල් මැතිරීම, නූල් බැඳීම, දෙහි කැපීම, හූනියම් කැපීම යන මේවා වැව්පවු පත්තුවට වෛද්‍ය හා සෞඛ්‍ය සේවය යි කිව යුතු ය.

මේ පළාත්වල යකැදුරු කම් කරන දෙතුන් වර්ගයක පරිෂාරිලා දක්නා ලැබෙති. ගම්වල වසන සිංහල යකුන්නැහේලා[3] හැරුණු විට මූදුකරයේ අක්කර පත්තුවෙන්, නින්දූරෙන් එන දෙමළ හා මුස්ලිම් පූෂාරිලාත් සමහර විට බ්‍රාහ්මණයන් යයි කියා ගන්නා ඇත්තෝ ද වෙති. මේ කවුරුත් කළේ මන්තරවලින් වෙදකම් ම ය.

මේ කාගේ මන්තරවලිනුත් ලැබුණු ප්‍රතිඵල ද එක බඳු විය යුතු ය. ලෙඩුන්ට කොහොම වෙතත් කැලේ ඉන්නා අහිංසක වදුරන්ටත්, ගම්වල ඉන්නා කුකුළන්ටත් මේ තොවිල් අපල දායක විය. වෙන රටේ තොවිල්වල දී යකුන්ට ගොටු සඳහා කුකුළකුගෙන් ලේ බින්දු කිපයක් පමණක් ගන්නා නමුත් මෙහි සතුන් එහෙම පිටින් ම ගැනුණේය. හැම තොවිලයකට ම වාගේ වදුරකු මරා උගේ ලෙයත්, මසත් එහෙම් පිටින් ම උවමනා විය. ගැබිණියන් ගේ ලෙඩවලට ආරක්ෂාව සඳහා කරන තොවිල්වල දී වදුරා උවමනා ම වූ බව පෙනුණේ ය. ඇතැම් විට වදුරකු නො ලැබුණොත්, රිළවකු හෝ දඩුලේනකු වත් මරා ගනු ලැබේ. මරා ගන්නා වදුරාගේ ලෙය වෙන ම ලොකු ගොටුවලට පූරවා ගනු ලැබේ. මස් කුඩා කැලි කපා උල් කළ කෝටුවල අමුණා, කෙසෙල් පතුරුවලින් කළ පිදවිලි සරසති. මසින් වැඩි කොටසක් පරිෂාරිට අයිති වෙයි. වදුරු මස යකුන් පමණක් නො ව මෙහි ඇතැම් මිනිසුන් ද ඉතා ප්‍රිය කරන කෑමක් බව ද සිහි කට යුතු ය. බොහෝ ගැබිණියන් වදුරු හිසේ මසට දෙළදුක් ගන්නා බව ද ඇසීම්.

වරක් ද්‍රවිඩ හා මුස්ලිම් මිනිසුන් ගේ තොවිලයක දී කුකුළු බිළි කීපයක් දුන් කණගාටු දායක ආකාරයක් මට දකින්නට ලැබුණේ ය. එද එහි දකින්නට ලැබුණු අමුතු ලකුණු කීපයක් ම විය.

එය කලක පටන් ලෙඩින් සිටි එක්තරා තරුණයකු උදෙසා කළ තොවිලයකි. මූදු කරයෙන් පැමිණි ද්‍රවිඩ, මුස්ලිම්, බමුණු තුන් වර්ගයක

1. තෙලම් කියන්නේ 'ලිනමන්ට්' ය.
2. තෙල් එඩරු තෙල් ය.
3. යකුන්නැහේ යනු කට්ටඩි රාළට නාම ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පූජාරිලා, යකැදුරෝ එයට සහභාගි වූහ. පළමුවෙන් එක් යකැදුරෙක් බුලත් කොළයක අදුනක් ගා එයින් බලා ලෙඩාට හුනියමක් කර ඇති බවත්, එය ඉඩමේ වළලා ඇති බවක් කීවේ ය. එයින් පසු ඒ හුනියම කැපීම පිණිස නොයෙක් 'ගුරුකම්' කරන ලද්දේ ය.

බ්‍රාහ්මණ තෙමේ වෙන ම පැත්තකට වී නොයෙක් පලතුරු-කැවිලි යනාදියෙන් මල්-බුලත් පුටුවක් සරසා ගෙන සංස්කෘත මන්ත්‍ර ජල්පනයෙහි යෙදුණේ ය. අනික් අය නොයෙක් මැනිරිලි මැතුරූහ. දෙහි කැපූහ. අවේෂයෙන් නොයෙක් දේ කළහ.

මෙහි ද කොහොඹ අතු මිටිය පොල් මල වෙනුවට වැඩ කළේ ය. අමුතු විදියක පුන්කලස් ද දකින්ට ලැබුණේ ය. මේ කලස්වල පොල් මල් තිබුණේ ද නැත. අමුතු දෙයකට තිබුණේ එක් එක් කලසක් පාසා තිබූ කුකුළු බිත්තරයකි. වරක් ඇදුරා දිග කඩුවක් අතට ගෙන, ආතුරයා ඒ එක් එක් කලසට උඩින් පන්නවමින් එක් එක් කලස ගසා දෙපළු කළේ ය.

කුකුළු පැටවුන් තුන්දෙනකු ගේ අවාසනාවන්ත ඉරණම මා දුටුවේ එතැන දී ය. ඇදුරා කුකුළු පැටවා ගේ හිස මුදුනෙන් වමතින් ද, දකුණතින් දෙපය ද අල්ලා ගෙන දනට අදිමින් මන්ත්‍ර ජප කළේ ය. කුකුළු පැටවාගේ හිස මුදුනේ හමෙන් අල්ලා ගැනීම නිසා කට විවෘත ව සිටි නමුත් ශබ්ද නො කළ හැකි විය. ඇදුරා හාස්කමකට හරවා ගත් මේ ක්‍රමයෙන් අල්ලාගෙන වරක් උෘව දුම්මල කබලට ඇල්ලුවේ ය. වරක් මහ හඬින් මතුරමින් දෙ පසට ඇද 'ඝුහුම්' කියා උගේ කටට පිම්බේ ය. පැය බාගයක පමණ වදයෙන් පසු දනට ඇදි මළ කුකුළු පැටවා බිම දමා තවත් එකකු ගන්නා ලදී. මෙසේ පැටවුන් තුන් දෙනකු මරා ඇතට ගෙන ගොස් ගහකට තබා බෙල්ලෙන් ඇණ ගැසීම සිරිත විය. ඒවා බිලිගත් යකුන්, කලවැද්දන් හෝ එබඳු වෙනත් සතුන් විය යුතු ය.

ඉන්පසු වළලා තිබුණු හුනියම ගොඩ ගැනීම සිදු විය. ඒ සඳහා ඇදුරා පළමු ව දකින් කොහොඹ මිටි දෙකක් ගෙන බිම වැටී දඟලුවේ ය. පසු ව මහ ආවේශයකින් උඩ පැන නැගී සිටියේ ය. දතේ අතු මිටි දෙක වේගයෙන් සල සලා පමණට වැඩියෙන් හඬින් හති දම දමා කළ මායම් වීම ද වෙන රටේ යකැදුරන්ගේ මායම් වීමට වඩා වෙනස් විය. මේ මායමින් බොහෝ වේලාවක් දහලා ඒ මේ අත දිවි ඔහු අන්තිමේ දී ගෙයි දෙරටුව ළඟ හාරන්නට අණ කළේ ය. සමහරු යකඩ උල්, උදලු ගෙන ඔහු කියන හැටියට පොළව හැරූහ. කොටන්ට බැරි තැන පස බුරුල් වීමට වතුර දම දමා හැරූහ. අන්තිමේ දී ඇදුරා ඒ වළේ මඩ

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

සේනානායක යුවළගේ ඇත කොළවරස්

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

ඡායාරූපය 1 - ඉන්දියාවේ ඔරිස්සා ප්‍රාන්තයේ පිහිටි කොනාරක් සූර්ය දේවාලය

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

පැළෑ මොකක්දේ ගුළියක් 'වළලා තිබුණු භූතියම්' හැටියෙන් ගෙදර ඇත්තන්ට දැන්නේ ය. එය මැටි ගුළියක් මෙන් අපට පෙනුණේ ය. නොවිලය නමාර වුණු නමුත් ලෙඩා පිළිබඳ වෙනසක් එයින් වුණු බවක් නො පෙනුණේ ය.

එහෙත් මන්තර ගැන සැක සිතන්නෝ කොහේත් හිහ නැත. මෙහි ඇත්තේ ම නැත. කිසියම් පරීක්ෂණයක් කළොත් මෙහි හැම දෙනකුගේ ම ජීවිත රැකී ඇත්තේ 'මන්තර නිසා' යයි නො කියන අය තුන්-හතර දෙනකුවත් වැවිගම් පත්තුවේ ඇතැයි නො සිතමි.

සමහර ගම්වල ඇති දේවාලවල මංගල්ල තවත් දේවකාරී විශේෂයකි. මෙසේ ගම්වල හෝ ඒ අසල දක්නා ලැබෙන දේවාල නොහොත් කොවිල් ද ප්‍රධාන වශයෙන් දෙ වර්ගයකි. එක් වර්ගයක් ගම්වලට නුදුරු ව පාරවල් අයිනේ දක්නා ලැබෙන පුල්ලෙයාරෙ හෙවත් ගණදෙවි කෝවිල් ය. මේ වායේ සාමාන්‍ය වශයෙන් ඇත්තේ කළු ගල් ගොඩක් පමණ ය. එහි මුදුනේ තබන ලද ත්‍රිකෝණාකාර ගලක් වෙයි. ගරු සත්කාර කරන්නෝ ඒ ගලට කරති. මේ තැන්වල පූජා වශයෙන් කෙරෙන්නේ අතු එල්ලීම, පොල් බිඳීම වැනි දේ පමණ ය.

අනික් කෝවිල් වර්ගය නම් සමහර ගම්වල හෝ අසල ඇති දෙවිවරුන්ගේ කෝවිල් ය. 'පාදගොඩ අලුත් දෙවියෝ', 'නිකවැටියේ අලුත් දෙවියෝ' යයි දෙවියන් දෙ නමක සඳහා සාදගත් දේවාල මා දන්නා හරියේ තිබුණේ ය. පාදගොඩ අලුත් දෙවියන් නොහොත් අලුත් බණ්ඩාර හාමුදුරුවන් මේ පාදගොඩ ම වැස නැසී ගිය කොරාළ කෙනෙකුගේ අවතාරයක් හැටියෙන් ඇළකෙයි. නිකවැටියේ 'දිසානායක අලුත් බණ්ඩාර හාමුදුරුවන්' ද මෙ බඳු ම දෙවි කෙනකු විය යුතුය.

මේ දේවාලවල අවුරුදු පතා මංගල්ල සිදු කරනු ලැබේ. ඒවා සිදු නො කළොත් නොයෙක් කරදර අලාභ ඇතිවන බවත්, ඒ දෙවියන්ට බාර භාර වීමෙන් නොයෙක් විපත්වල දී පිහිට ලැබ ගත හැකි බවත් ගම්මු කියති.

දඩයමේ යන මිනිසුන් මේ අලුත් දෙවියන්ට බාර වීමෙන් ප්‍රයෝජන ගත්තා හැටියක් මට අසන්නට ලැබුණේ ය. දඩයමට පිහිටක් ලබනු කැමැති අය දෙවියන් වෙනුවෙන් 'අඩුක්කුවකට' හාල් සහ පොල් ගෙඩියක් වෙත් කොට එය මුට්ටියක දමා දුම් දී එය අත පිට තබා ගෙන දෙවියන්ට කන්නලව්වක් කරති. එසේ කොට එය උසක තබා දඩයමෙහි යති. එසේ ගිය කල නො වරදවා දඩයම් ලැබෙන බව ඔවුන්ගේ

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

විශ්වාසය යි. ලැබුණොත් යටකී වෙන් කළ හාල්, පොල් හා මස් ඵයා අඩුක්කු පිදීම සිරිත ය. දඩයම් ලැබුණොත් ඒ දෙවියන්ගේ පිහිටෙනි. වැරදුණොත් දෙවියන් කෙරෙහි තමන් කළ වරදක දෝසයෙනි. ඒ නිසා විශ්වාසයට හානියක් නොවේ.

දඩ වැද්දකු අලුත් දෙවියන්ට කරන කන්නලව්ව මෙ බඳු වැකියකි.

"මේ පාදගොඩ නින්දගම් ඇල්ලූ අලුත් බණ්ඩාර හාමුදුරුවෝ, මේ දඩ වැද්දට අද වූ දවසේ, ගවර මාගල්ලයෙක්[1] ගවර මාගල්ලියෙක්[2] - දෙපාට වං අම්බරයෙක් අම්බිරියක්[3] මේ දඩ වැද්ද යන ඉස්සරට අං ගස්සල - කං ගස්සල - කොවි ගස්සල[4] - දැස් ඇදිරි කරවල - දෙකන් බිහිරි කරවල - කණා - කොරා - ගොලුවා - බිහිරා කරවල - ගෙනත් බස්සා දිල වෙඩි මුණ උඩ පාත නො කර - අමර දෙළහෙන් ගියත් මර දෙළහෙන් වද්දල[5] - එහෙම්ම අකා මකා කරවා දුන්නා සේ ම තමුන්නාන්සේලාට

- පාදගොඩ අලුත් බණ්ඩාර හාමුදුරුවන්ටත්

- පේරාදෙණි අලුත් බණ්ඩාර හාමුදුරුවන්ටත්

- නිකවැටියේ පස්සර පලාවත්ත නින්දගම් ඇල්ලූ දිසානායක අලුත් බණ්ඩාර හාමුදුරුවන්ටත්

ඉහින් මාලු ඇතුව - කරින් මාලු ඇතුව - හතරගාතෙන් මාලු ඇතුව - ඇතුල් වැටි - පිට වැටි[6] - ලීල ගෙඩි[7] - මිට ගෙඩි[8] ඇතුව තමුන්නාන්සේලාට මෙහෙව් නෑ කියන්ඩ[9] රුවන්[10] අඩුක්කුවක් ඔප්පුකර දෙන්න - හාමුදුරුවෝ.

බොරු අර්දියක්[11] නො වෙයි සුබ අර්දියයි.

---

1 සහ 2. ගවර මාගල්ලයෙක් මාගල්ලියෙක් - ගොන් නාම්බෙක් හෝ නෑම්බියක්.

3. දෙපාට වං (පාට දෙකක් ඇති හෙයින් විය හැකි ය.) අම්බරයෙක් හෝ අම්බිරියක් යනු මුවෙකු හෝ මුවදෙනකි.

4. කෑ ගස්සල.

5. මර නො සිදුවන විදි දෙළහෙන් ගියත් මර සිදුවන විදි දෙළහෙන් යවා.

6. ඇතුල් වැටි - පිට වැටි.

7. ලීලගෙඩි හඳය විය යුතු ය. රිරි ගෙඩිය හෝ පිරි ගෙඩිය ම ය.

8. මිටගෙඩි කියන්නේ වකුගඩුවලට ය.

9. මෙහෙ ම දෙයක් නැතෙයි කියන්ඩ.

10. රුවන් කියන්නේ පිරිසිදු යන්නටලු.

11. අර්ථයක් විය හැකි ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මේ දඩ වැද්දට - අද හෙට අනිද්ද කියන්ඩ - තුන් දවසෙන් - පස් දවසෙන් - හත් දවසෙන් මෙ පිට හොඳ දඩයම් එල්ල පහමු කරවා දෙන්ඩ යහපති - ආයි බොහෝ - ආයි බොහෝ."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

12

කැලේ වීරයෝ

විනය වන සතුන්ගේ රාජ්‍යය වුව ද එහි කොතෙකුත් මිනිස්සු ද හැසිරෙති. තැනින් තැන පිහිටි ගම්වල ඇත්තෝ මහ බැදි යටින් - කටු පඳුරු අතරින් - ලිය මඩුලු අස්සෙන් රිංගමින් දඩයමේ යති. ගැමි කොල්ලෝ රංචු ගැසී හෝ තනි ව හෝ හරකුන් සොයමින් වන මැද වෙල් එළි - තණ පිටිවල ඇවිදිති. ගැහැණු පිරිමි දෙගොල්ල ම වාරයට මඩු ගෙඩි සොයා ද, මොර බිඳිනු[1] පිණිස ද වල් වදිති.

කැලේ ගම්වලට අමුත්තන් වූ සමහරු ද වනගත පාර තොට දී දක්නා ලැබෙති. ඔවුන් ගෙන් ඇතැම්මු රජයේ නිලදරියෝ ය. මිනින්දෝරු වරු වන මැද පුදුපු තැන් සොයා කුඩාරම් නංවා ගෙන සිය පිරිවර සමග එක තැන සති-මාස ගණන් කල් ගෙවති. කෑම උයන්නකු සහ දක්කන්නකු ද සමගින් බර කරත්තයක නැගී ගෙන සතියකට හෝ දෙකකට වරක් කැලෑව අතරින් ගමනේ යෙදෙන දෙස්තර මහතා තව කෙනෙකි. කලාතුරකින් ජීප්පුවකින් එන මදුරුවන් වනසන කංඩායම වෙයි. ආදයම් පාලක - දිසාපති ආදි නිලදරියෝ ද එන්නේ ජීප්පුවෙනි.

පාසල් ගුරුවරු ද මේ කැලෑ රටේ හැසිරෙන තවත් පිරිසෙකි. වන මැද ඇතැම් ගම්වල ළමයි 20-30-40 පමණ උගන්නා පාසල් ඇත. එහි ගුරුවර-ගුරුවරියෝ එකා-දෙන්නා බැගින් වෙති. ඔවුන් ගේ ජීවිත පුවත් ද ගැමියන්ගේ මෙන් ම සිදදියට වඩා හොඳට ම අමුතු ය. නගරයේ ගුරු මහත්ම-මහත්මීන් මට සිළුටු රෙදි බැනියම් - දිලිසෙන සපත්තු - පැන් - ඔරලෝසු - කන්නාඩි කුට්ටම් සහ මල් මල් සාරි - වෙවාරන්න මෝස්තරයෙන් ද සැරසීගෙන ඇවිදින මහුල් ගෙවල් මෙන් පෙනෙමින් කාර්-බස්-ලුම්රියවලින් ගමන් කරන නමුත් මෙහි උන්දලා වනයේ දුක් පීඩාවන් ඉස පිටින් ගත්තා සේ කරබාගෙන ගමේ පංජයියලා වාගේ පයින් නැත්නම් බරකරත්තයෙන් ගමන්හි යෙදෙති. පාඨශාලා පරීක්ෂක

1. මොර ගෙඩි නෙළීමට.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

වරයන් සහ සංඛ්‍යාරක්ෂක නිලධාරි ද මේ පායල් අතර හැසිරෙති. ඔවුන් ද ඇතැම් විට ගමේ ගමරාළලා මෙන් ම කොක්නපයි උරෙන්-කටින් එල්ලා ගෙන පයින් නැත්නම් බරකරත්තයෙන් ගමන් කරනු දක්ක හැකි ය.

මේ හැරුණු විට ගමින් ගම යන ජාවාරියෝ ද, සම්මාදන් කාරයන් සහ හිහන්නෝ ද අතරින් පතර වන මං තරණයෙහි යෙදෙති. මෙසේ හැසිරෙන කැලේ මිනිසුන් වන සියල්ලන් ගේ ජීවිත ප්‍රවෘත්ති ද ගැමියන්ගේ මෙන් ම ආශ්චර්‍යමත් ය.

මා දමන ඉන්නා කාලයේ එක් සවසක දමන කෝරාළ මහතා ගේ නිවෙස දෙසින් ඇසුණේ මේ කැලෑ රට නුහුරු-නුපුරුදු-අමුතු හඬෙකි. හොඳින් කන් යොමු කළ මට කිසිවකු රබානක් හඬවමින් විරිදු ගායනයක් කරනු ඇසිණි. මෙබඳු අමුත්තකු ගමට ආවා නම් මගේ වාඩියට ද එන බව මට සහතික ය. එහෙයින් මම මගේ වැඩෙහි යෙදුණෙමි. ගමේ තවත් ගෙවල හැසිරීමෙන් පසු විරිදුකාරයා හැන්දෑවේ මගේ වාඩියට ද පැමිණියේ ය.

පළමුකොට මා දෙසට තියුණු බැල්මක් හෙලූ හේ බංකුවක් මත හැරගැහී ඉඳගෙන දිග විරිදු ගායනයක් කෙළේ ය. ඔහු ගේ විරුදුවෙන් කියැවුණේ යස කතාවෙකි. 'නෙයිනගේ සූදුව' නම් ඒ කතාවෙන් ඉස්සර හිටි කොතලාවල නම් පොලිස් නිලධාරියකු නෙයිනා නම් වංඩියකු ගේ සූදු පිටියක් වටලා ඇල්ලූ සැටි විස්තර විය. තාලයට රබාන හඬව-හඬව ඔහු ගායනය කරද්දි මම ආසාවෙන් සවන් දුනිමි. රබන් පදයට විරිදුවේ සමහර තැන් නො ගැළපී කියැවුණු නමුත් සංගීතය අරුමයක් වූ ගමේ පරිසරය නිසා මට එය පුදුම මිහිරකින් ඇසිණි.

අන්තිමේ දී මම ඔහුට තේ කෝප්පයකින් සංග්‍රහ කොට අතට සත පණහක් ම දුනිමි. සත පණහ මිට මොලවාගත් ඔහු මේ වර මා මුහුණ බැලුවේ වඩාත් තියුණු සැක සහිත බැල්මකිනි. එහෙත් ඒ ගැන නො තැකූ මම ඔහු හා තොරතුරු කතාවට බැස්සෙමි. නුරුස්තා ගතියකින් යුතු ව පිළිතුරු දුන් හේ තමන් කොළඹ නුදුරේ ගමක අයකු බවත්, නොයෙක් රස්සාවල් කර අසනීපයෙන් බැරි-ගැහී හිඟමනට වැටී, පසු ව විරිදු කීම පුරුදු කරගත් බවත්, අහම්බෙන් කැලෑ රටට පැමිණීමෙන් පසු එය සිත් ගත් නිසා මෙසේ වනගත ගම් අතර ඇවිදින බවත් කී ය.

ඔහු ගේ හැසිරීමෙන්, පිටිසර ගැමියන් මිස මා වැනි මහ රටේ මිනිසුන් නුරුස්සන ගතියක් පෙනුණ නමුත් පසු දින ද හේ මගේ වාඩියට අවේ ය. මා දැක් වූ අහිංසක ගුණය නිසා දෝ එදා මදක් සැක

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

දුරු කර කතා ද කළේ ය. අන්තිමේ දී මම යෝජනාවක් කරමින්, විරිදු කියමින් ඇවිදීම අත්හැර මාත් සමග මගේ වාඩියේ වෙසෙමින් ගොවිතැන් කරන්නට නරක ද යි ඇසීමි.

ඒ ගැන හුහක් වේලා කල්පනා කළ ඔහු ලැබෙන පඩි-නඩි, කරන වැඩ - පොළ ආදිය ගැනත් කතා කොට-

'හා හොඳයි, ඔන්න එහෙනම් අද පටන් හිහා කෑම ඉවරයි' කියා ඔලගුවක් කොට මසා ගෙන තිබුණු සරමේ මැහුම් ලිහා ඇදගෙන, එතැන් පටන් මගේ වාඩියේ වාසයට පටන් ගත්තේ ය.

ඔහු මගේ වාඩියේ කොණක නිද ගත්තේ දවස් දෙකක් පමණි. පසු ව වත්තේ ඇත කොණක හේ තමන් උදෙසා වෙන ම පැලක් තනා එහි මැස්සක් ගහ ගත්තේ ය. එහෙත් කෑම්-බීම් ආදිය මගේ වාඩියේ ම කෙරිණි.

ගමේ ගැහැනු පිරිමි 'රබන් කාරයා' යන නමින් ඔහු ඇමතූහ. මම 'කාරයා' අතහැර 'රබන්' යන නම ම ව්‍යාවහාර කෙළෙමි. පසු ව 'රබන්' යනු ම ඔහු ගේ නම වශයෙන් ස්ථිර විය.

රබන් විස්සටත්-තිහටත් අතර වයසක විය යුතු කෙට්ටු සිරුරකින් යුතු පුංචි මිනිසෙකි. කළුවර අරටුවෙන් කළ රුවක් මෙන් කළු ඔහු ගේ උරයේ විශාල පිළිස්සුම් කැළලෙකි. එක් අතක ඒ දැවීමෙන් ම සෑදුණු සුළු කොර බවෙකි. හිහා කෑමේ දී උවමනාවෙන් මෙන් කරගෙන තිබුණු ඔළුවේ සහ ඇඳුම්-පැළඳුම්වල විකාර දුරු කළ පසු ඔහු විරූපී බවක් නැති මිනිසකු බව ද පෙනිණ.

ඔහු ම කී පරිදි අසනීපයට ද වඩා බෙහෙත් වියෙන් වියලී, දරදඬු වී තිබුණ ඔහු ගේ සිරුර අව්වටත්, වැස්සටත් එක සේ ඔරොත්තු දෙන්නකි. අඹිං කෑවකුට මෙන් ඔහුට ද නිකම් ඉඳිම නො ව වැඩක් කිරීම ම විනෝදය විය. එහෙයින් දවස තිස්සේ ඔහු ඒ ඒ වැඩවල යෙදුණේ ය. ගොවිතැනට ඔහු කෙරේ තිබුණ අත් වාසිය පුදුම එළවන්නෙකි. ඔහු අතින් සාත්තු ලබන බෝග පැලෑටි විජ්ජාවකින් මෙන් වැඩෙමින් පිස්සු වැටුණු කලෙක මෙන් පල ගත්තේ ය. දවසකට තේ කෝප්ප හත-අටකුත්, නිතරම බුලත් විටත්, දෙ වේලේ බතුත් මිස අනෙක් කෑම-බීමක් ඔහුට අවශ්‍ය නො වී ය. ඇඳුම් වශයෙන් සරම් දෙකකුත්, අමුඩ දෙකක් සහ පොරවන රෙද්දකුත් පමණක් ඔහුට සෑහිණි. එහෙයින් ම දෝ මාස දෙක තුනකට පසු පඩි බේරන්නට සැරසුණු විට ඔහු,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

"පව් මට මොනවට ද ? ඕනෑ කරන දේ ඔක්කොම මේ තියෙන්නේ - සල්ලි මහත්තයා තියාගන්න !" යි මට කී ය.

ඔහු සමත් වූයේ ගොවිතැනට පමණක් නො වේ. කැත්ත ඔහු අතට ගත් විට වඩුවකුගේ කියත, නියන, යත්ත ආදී හැම උපකරණයක් ලෙස ම ක්‍රියා කෙළේ ය. එහෙයින් ඔහු මගේ වාඩියට අඩු ව තිබුණු හැම භාංඩයක් ම - රළු ලෙස නමුත් - වැඩගත හැකි ලෙස කැලෑවෙන් ලැබෙන ලී දඬු, වේවැල් ආදියෙන් තැනී ය.

මා දමනෙන් අස් වී වාඩිය පාදගොඩට ගෙන ගිය පසු ද ඔහු එහි පැලක් හදගෙන මා සමග ම විසී ය. මෙ කල අපේ දිනවරියාව අපූරු එකක් විය.

සිරිත් විශයෙන් උදේ අවදි ව දවල්ටත් සමග කෑම පිසීමෙන් පසු මම නා ගෙන අවුත් වැඩ පටන් ගනිමි. එහෙත් එය වෙනස් වූ දට - මා උයන්නට සැරසෙන හැඩක් නො පෙනෙන විට - හේ උදේ නවයට පමණ දිය නා ගෙන අවුත් අලුත් කඩක් හැඳගෙන දෙවියනට අඩුක්කුවක් පිසන පිරිසිදුවෙන් අපට කෑම ඉව්වේ ය. කෑම උයා මැස්ස පිට වසා තබා, නැවත කුමක් නමුත් වැඩක යෙදුණේ ය. එසේ කරමින් සිට ඔහුට බඩගිනි වී නම් ඔහු පළමුකොට බෙද ගෙන කෑවේ ය. මට සිතුණු විට මම කෑවෙමි. අපේ මුදල් හදල් මගේ වාඩියේ යතුරු මුදු නැති කඩදසි පෙට්ටියක විය. ඔහු කැමැති විට ඔහුත්, උවමනා පරිදි මමත් ඉන් වියදම් කෙළෙමු. මෙසේ අප දෙන්නා ගේ ම ජීවිත නිදහසේ, සිත් සේ අවුරුදු කීපයක් ම ගෙවිණි.

රබන් මෙසේ කොතෙකුත් වැඩ කළ නමුත් තවත් විරිදු කීම නම් කෙළේ නැති. රෙදි කෑල්ලක දවටා පැලේ උඩ මැස්සක සහවා තැබූ රබාන එළියටවත් ගත්තේ නැති. අන්තිමේ දී කැලෑ ගම් ඔස්සේ ඇවිදගෙන ආ ඔහු වැනි ම මිතුරකුට එය තෑගි කළ බැව් කීවා මිස මා දුටුවේ ද නැති.

විරිදු කීම නො කළ නමුත් ඔහු ගමේ ගැහැණු පිරිමින් සමඟ තමන් ගේ පරණ හපන් කම් කීම නිතර ම කෙළේ ය. මාළු වෙළෙන්දකු වූ පියා ගෙන් පුංචි කාලයේ තමාත්, මවත් නිතර ගුටි කෑ හැටි - දවසක් පියා මවට තළද්දී තමන් කැත්තක් ගෙන පියාට කෙටීමට ගිය හැටි - එවිට පියා තල්ලු කර දැමුවෙන් ළිප මත ඇද වැටී පිළිස්සුණු හැටි - රෝහලින් සුවය ලැබ පිට වුණු තැන් පටන් නැවත ගෙදර නො ගොස්, තමන් ද මාළු වෙළඳමකින් යැපෙමින් මවට සංග්‍රහ කළ හැටි - මව මළ පසු ඉබාගාතේ ඇවිද ලෙඩ වී, සිය ගණන් බෙහෙත් විදුම් කා

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

රෝහලින් පිට වී හිහා කෑ හැටි - හිහන රැළට එක් වී උදේ කනුත්, කොරුන්, ළදරුවන් ඔසොවා ගෙන හම්බ කරගෙන අවුත් හැන්දෑවේ බුරු ගැහූ හැටි - පසු ව හිහන්නන්ගේ දුසිරිත් එපා වී විරිදු කීමට බැස කැලේ ගමන්වල දී කළ හපන් කම් ආදිය අතිශයෝක්තියෙන් හේ කියා පෑවේ ය.

මෙසේ සන්තෝෂයෙන් ජීවත් වූ නමුත්, ඔහු තුළ මහ නපුරු ගුණයක් ද ඇති බව පෙනිණි. උන්හිටි හැටියේ මහ මූලග්ගින්නකින් මෙන් ඇවිස්සී කා සමග හෝ කෝපයක් හද ගෙන, විරිදු කියන තරම් ම මුකරි කමකින් කුණු හරුපයෙන් බැණ වැදීම ඒ ගුණය ය. අමු තිත්ත කතා කීමට ඔහු ගේ කරට-කර හරියන පිරිමියකු තබා ගැහැණියක වත් මුළු වැව්ගම්පත්තුවේ ගමක නැති වන තරමට ඔහු චතුර විය. තමනට සුළු හෝ වරදක්, පාඩුවක් කළ විට උසස්-පහත්, ගැහැණු-පිරිමි, ළමා-ළපටි කිසි බේදයක් නැතිව කාට වුව ද ඔහු පැය ගණන් තිස්සේ දෙහි කැපුවේ ය. එහෙයින් ගමේ අයට ඔහු ගේ කට දෙව කෝපයක් තරමට දරුණු විය.

ඔහු මා ඇසුරු කෙළේ අමුතු ලෙසකිනි. කිසි විටක ඔහු කළ යුතු හෝ නො කළ යුතු හෝ වැඩක් මම නො කීවෙමි. ඔහු උවමනාවෙන් ම කළ වැඩවල ඇදක් හෝ නො කීවෙමි. එහෙයින් අප අතර අරගලයක් ඇති වන්නට ඉඩක් නො වී ය.

ඔහු හේන් කෙටුවේ ය. පැල් බැඳ රකිමින් ගොවිතැන් කොට හම්බ කෙළේ ය. මුදල් අපේ හවුල් පෙට්ටියට ම පැමිණියේ ය. හිතුවක්, මා මෙන් ම ඔහු ද වියදම් කෙළේ ය. මේ අතර දඩබ්බර වැඩ ද නො කෙළේ නැත.

එක් සිංහල අවුරුදු කාලයක මම අසනීපයෙන් ඉහිනියගල රෝහලට ඇතුළු වීමි. ඒ අතර ලැබුණු මාසයේ පඩි මුදල වාඩියේ තබන ලෙස මම රබන්ට දුනිමි. සුවය ලැබ වාඩියට ආවායින් පසු රහසක් හෙළි කරන ලීලාවකින් හේ මෙසේ කී ය.

"අවුරුද්දට මට බුරු ගහංඩ හිතිලා මහත්තය ගෙ සල්ලි ගෙනිහින් සෙල්ලම් කළා - රුපියල් සීයක් විතර ම පැරදුණා !"

"ඉතින් මක් කරන්න ද ?" යි මම වගක් නැතිව ඇසීමි.

"ලාව්වුවේ තව සල්ලි තියනවා - මම තව විසි පහක් අරන් ගිහින් පැරදුණු ඒවා දිනා ගෙන එන්නම් - අද මම දිනනවා !" රබන් කී ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

"රබන්ට ඕන තරමක් ගෙනියන්න. ගෙනිහින් සෙල්ලම් කරලා දිනා ගෙන එන්න" යයි මම කීම්.

ඔහු එදත් ගැමියන් ගේ බුරු මංඩියේ සෙල්ලම් කොට තවත් රුපියල් පණහක් පැරදී ආවේ ය. අවුත්-

"ආයත් ඉතින් සුදු කෙළියට මම යන්නේ නෑ !" යි අහසට කියන්නාක් මෙන් කියා ගෙන උදැල්ලක් ගෙන වත්තට ගොස් හතුමකු මෙන් කොටන්නට පටන් ගත්තේ ය.

මා සමග පාදගොඩ සිටිය දී රබන් කළ එක ම දඩබ්බරකම මෙය නො වේ.

දවසක් ඔහු මුලග්ගින්න ඇවිස්සී දබර කරන්නට හතුරකු හදගෙන හේනටත්, වන සතුනටත්, අහල පහල සියලු මිනිසුනටත් සාප කරමින් මගේ වාඩියටත් ඇසෙන සේ වුව ද, ඈත සිටිමින් බැණ වැදී සරුබ්බයක් පොදි බැඳගෙන ගම හැර ගියේ ය. මම කරබා ගතිමි.

එහෙත් සතියකට පසු රබන් ආ පසු අවේ, තනියම නො ව අඹුවකුත් සමගිනි. අඹුවක පමණක් නො ව දරු සතර දෙනෙක් ද ඒ සමග වූහ. මේ පවුල එහි අනෙක් ගමක, කව්දෝ සැමියකු විසින් කවර හෝ කරුණක් නිසා අත් හරින ලද්දකි. රබන් අඹුදරුවන් හේනේ පැලේ රඳවා අවුත්,

"මම ගෑනියක් ගෙනාවා - ඒකිට දරුවනුත් ඉන්නවා - උන් හොඳට වැඩට දස්සයි !" මට කී ය.

"කොච්චර හොඳ ද, රබන් ?" මම සතුටින් ඇසීම්.

ඉන්පසු රබන් දැඩි ව ගත් උනන්දුවකින් මහන්සියෙන් වැඩ කළේ ය. වැඩි මහලු කොලුවා රබන් සමග වැඩෙහි යෙදුණේ ය. ඊ ළඟ දුව ගෙදර වැඩත්, හේනේ වැඩත් දෙක ම කළා ය. පුංචි දරු දෙදෙනා බලාගන්නා ගමන් බිරිඳ ද සියලු වැඩට සහභාගී වූවා ය. ඒ පවුල ඔවුන් ගේ හේනේ පැලේ උයා කමින් ජීවත් වෙද්දී මම මගේ වාඩියේ මගේ වැඩ කර ගතිමි. රබන් මගේ වැඩ ගැනත් සොයා බලන අතර පවුල සමග කල් ගෙවී ය.

එහෙත් මේ අලුත් පවුල වැඩි කලක් සකල ව පැවතුණේ නැති. පළමුවෙන් ඔහුගේ රළු-කරළු ගති නො රිස්සූ කොල්ලා වෙන ගමක සිටි තම පියා වෙත පැන ගියේය. ඊ ළඟ කෙල්ල බාල කල සිට දීගයකට නම-නියම කර ගෙන තිබුණ නැන්ද-මාම කෙනකුගේ නිවෙසකට යොමු

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

වූවා ය. ඉන් පසු ගෙදර සංඩු-සරුවල් ඇති විය. තවත් ටික දවසකින් බිරින්ද බාල දරු දෙන්නාත් ගෙන කොහේ දෝ වෙන දිගයක් සොයා ගියා ය.

මින් පසු අපි නැවතත් එක වළඳේ උයා කමින් ජීවත් වුණෙමු. හැර-ගිය පවුල ගැන වගක්වත් ඔහු මා සමග සඳහන් නො කෙළේ ය.

පසු කලක මගේ අවංක හිත මිතුරා ලෙඩ විය. අත-පය ඉදිමී, වැඩක් පළක් කරගන්නට බැරි ව ගිය විට කොළඹ කරයට ගෙන ගොස් වෙද-හෙදකම් කර වූ නමුත්, ඔත්පොළ ව පවා කිසියම් වැඩක හෝ චතුර කතාවෙහි හෝ යෙදෙමින් කලක් ගතකොට මිය ගියේය.

රබන් දුගියෙකි. අත්තයට ම දුගියෙකි. එහෙත් අප මෙන් ම හතරකත් හරුව ඇති මිනිසෙකි. අවාසනාවකින් දුගියකු ව ඉපිද දුක් විඳ මිය ගිය නමුත් ඔහු තුළ තිබුණ උතුම් ගති-ගුණ මට දිවි පවතින තෙක් අමතක නො වේ. ඔහුට තිබුණේ ඇද නැති සිතෙකි. ඔහු ගේ ඒ සිත කිසි විටක කිසි ම බියකින් නො සැළුණේ ය. ජීවිතය පිළිබඳ සියලු පැතයනට ඔහු එසිතර ව මුහුණ පෑවේ ය. කිසිවකුගේ නිලයකට හෝ බලයකට හෝ දනයකට හෝ කත් නෑද්දේ ය. එහෙත් ඉවසන සුළු කරුණා ගුණය ඉදිරියේ ඔහු දණ නමා වැන්දේ ය. පණ කඳ ඇති තෙක් හැම විට වැඩක යෙදුනේ ය. මෙවැනි උතුම් ගති ගුණ ඇත්තේ අද සමාජයේ කී දෙනකුගෙන් කී දෙනකු අතර ද ?

කියවන්නා උරණ නො වතොත් වනයේ තවත් වීරයකු ගැන වචනයක් කියනු කැමැත්තෙමි. ඒ අනෙකකු නො ව මේ වනගත රාජධානියේ හැම තැනක මා හා එකට හැසුරුණු සිරිමල් ය.

සිරිමල් වෘත්තියක් වශයෙන් කෙළේ රජයේ යම් කිසි සේවයෙකි. නොයෙක් විට මා ඇසුරෙහි සැරි සරූ නමුදු ඒ කෙළේ ඔහු ගේ රාජකාරියෙහි ද යෙදෙන අතර ය.

තම රාජකාරිය උදෙසා යන එන ගමන් අතර මහ දී ඔහු මගේ වාඩියට ඇතුළු වූයේ වනයේ සියලු අතවර අමතක කරවන තරම් මිහිරි මුහුණක් රැගෙන ය. අඳුරු ගල් ගෙයක සිර කරනු ලැබ සිටින්නකුට සදරුස් කළඹක එළියෙන් වැනි ප්‍රීතියක් ඔහු ගේ පැමිණීමෙන් මට ලැබිණි.

උස නැති නමුත් හැඩ වැඩ ඇති, වෙහෙසට මරොත්තු දෙන පරිදි සැදුණු සිරුරකින් යුතු ඔහු ගේ මුහුණ, අවංක-හිතෛෂී ශෝභාවෙකින් යුතු විය. කොතැනක දී හෝ කවරකුට හෝ කුමන කාරියක දී හෝ

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

උපකාරයක් අවශ්‍ය වී නම් ඊට එකපයින් නිතර සැරසී සිටි ඔහු ගෙන් මේ වනගහණයේ දී නොයෙක් දෙනා ලැබූ උදව් අපමණ ය. වනයේ හැසුරුණු නොයෙක් නිලදරියනට වන සතුන් ගෙන් ආරක්ෂාව සඳහා පළිහක් මෙන් ඔහු ක්‍රියා කළ අවස්ථා මම දනිමි. එමෙන් ම වන සතුන් මුණගැසී ඔහු නොයෙක් කරදර විඳි අවස්ථා ද ඇත.

වනයේ ඇසළ ගසක සේයාරුවක් දතුත් සිරිමල් ළඟ තිබේ. එය වරක් ඔහු ගේ දිවි ගැළවූ ගසෙකි. සිතින් නිතර සිහි කරමින් තවමත් ඔහු එය තබාගෙන ඉන්නේ එහෙයිනි.

දවසක් ඔහු **බක්මිටියාවේ** සිට හුලංනුගේට පයින් එමින් සිටියේ ය. වනයේ ගමනට තව ම ඔහු නුපුරුදු හෙයින් - මේ ගමනේ යෙදුණ පළමු වන වතාව හෙයින් - බක්මිටියාවෙන් තනියට කැන්දගත් (සුබ්බු නමින් මා හඳුන්වන) දෙමළ මිනිසෙක් ද ඔහු හා ගමන් කෙළේ ය.

සිරිමල් සුදු රෙදි-බැනියමින් ජාතික ඇඳුම අඳින්නෙකි. මේ වේලේ ද ඔහු එයින් සැරසී සිටියේ ය. ඔහු ගේ අතේ අත් බෑගයෙකි. පයේ සපත්තු යුවළෙකි. ඒ මිස අවි මෙවලම් කිසිවක් දෙන්නා අත ම නැත. ඉණේ රෙදි කැසපට කවා ගෙන මහ සුළඟින් හෝ හඬින් සෙලවෙන මහ තුරු පෙළින් සැදි වනය මැද වල් වැදුණු රෝද පාරක් ඔස්සේ ඔවිහු කතා බහේ යෙදෙමින් ගමන් කළහ. බක්මිටියාවේ සිට හුලං-නුගේ දක්වා මේ වන මගේ දුර සැ. 10 කි. අතරතුර කිසි මිනිස් වාසයක් නැති.

ගමනේ මැද හරියේ සුළු එළිමහනක පිහිටි එක් ගල්තලාවෙකි. දෙපස ගම් දෙකින් එන තැපැල්කාරයන් ලියුම් මලු හුවමාරු කර ගන්නා නිප්පොළ මේ ගල්තලාව ය. ඒ පසෙක මහ තුඹසක් සහ ලොකු වීර ගසක් ද ඇත.

එදා සිරිමල් සහ සුබ්බු එද්දී මේ තුඹසේ වේවැද හාරමින් වලස් යුවළක් ද සිටි බව ඔවුහු නුදුටුවහ. වීර ගස පැත්තෙන් තුඹසට වැසී උන් බැවින් වලසුන් මේ දෙදෙනා දක්කේ නැති.

තුඹස මුවාවෙන් මෑත් වී - තමන් නිසා ම කුළප්පු වූ වලසුන් දකින විට වලස් යුවළ හා මිනිස් යුවළ අතර දුර බඹ අටකට වැඩි නැති. වලස් යුවළ ගොරනාඩු කරමින් එළවා ආහ. සිරිමල් අසල තිබුණ අතු සහිත බුරුත ගසකට නැඟගන්නා වෑයමක් කෙළේ ය. එහෙත් සුබ්බු,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

"ඕකට නෙමෙයි - මේකට, මේ ගහට !" කියමින් ඔහු ව ආපසු ඇද පුංචි ඇසළ ගසකට යොමු කෙළේ ය. එහෙත් ඉහළින් ඇති අත්තේ එල්ලීගෙන නැඟ ගැනීම, පයේ ඇති සපත්තු නිසා ඔහුට අපහසු ය. මෙවිට සුබ්බු සිරිමල් ගේ පස්සට දැන තබා ඉහළට එසවී ය. ඒ වාරුවෙන් සිරිමල් ඒ දෙබලට සහ ඉන් ඉහළ අත්තටත් නැඟ ගත් පසු සුබ්බු පහළ දෙබල ට නැංගේ ය. ඉන්පසු දෙදෙන ම ඇති හයියෙන් කෑ ගසන්නට පටන් ගත්හ.

බියකර ගොරහැඩි හඬක් නහමින් එළවා ආ වලස් ජෝඩුව ඇසළ ගස වටා කැරකෙමින් උඩ බලා විරිත්තූහ. ගස මුල දෙපයින් සිටිමින් ඔවුන් අල්ලා ගැනීමට වෑයම් කළහ. ගසේ නහින්නට කළ වෑයම් ද, දතින් බද ගැනීමේ දී අසු නොවන පමණට කඳ කුඩා හෙයින් නිෂ්ඵල විය. වලසා ගේ ග්‍රහණයට අසුවන තරම් මහත ඇති බුරුත ගසට නොනැඟ පුංචි ඇසළ ගසට නැඟීමෙන් ලද ප්‍රයෝජන සිරිමල්ට වැටහුනේ එවිටත් නොව පසුව ය.

මිනිසුන් දෙදෙන ගසේ හිඳිමින් හැකි තරම හයියෙන් කෑ ගැහ. ඒ ගැන සඳහන් කරමින් සිරිමල් කීයේ මෙසේ ය.

"එද ඒ ගහ උඩ අපි පැය එක හමාරක් විතර උන්නා. ඒ පැය එක හමාරෙන් විනාඩි පහක් පමණ ඇරෙන්ට ඇති. ඉතිරි මුළු කාලය ම අපි කළේ උගුරෙන් එන තරම හයියෙන් කෑ ගැම යි. මගේ උගුරෙන් මම කවද හරි වැඩක් ගත්ත නම් ඒ එද තමයි !"

සිරිමල් එද පණ බේරා දුන් ඇසළ ගසේ සේයාරුවක් ගෙන ආදරයෙන් ළඟ තබාගැනීමත්, සුබ්බු සද මිතුරකු වශයෙන් පිළිගැනීමත් පුදුම ද ?

සිරිමල් රජයට ලියා අවසරයක් ගෙන තුවක්කුවක් මිළයට ගත්තේ මේ සිද්ධියෙන් පසු ව ය. ඒ තුවක්කුවත්, සිරිමල් ගේ එඩිතර පරහිත සිතත් නිසා ඔහු ගේ පමණක් නොව තවත් බොහෝ දෙනකු ගේ ජීවිත බේරුණු වාර කීපයෙකි. ඉන් එකක් ගැන පමණක් මෙහි කියමි.

එද සිරිමල් ඔහු ගේ උසස් නිලදරියකුත්, මරක්කල කරත්ත කාරයෙක් සහ තවත් දෙදෙනෙකුත් සමග **කුමන** සිට **පානම** දක්වා එමින් සිටියේ ය. මේ **කුඹුක්කන්** ගංමෝයේ සිට **පොකුවිල්** දක්වා ඇති, මුහුදු වෙරළ අසල වුව ද ගත වනයක් මැදින් වැටුණු පාරෙකි. උසස් නිලධාරියා කරත්තයේ දිගා වී ආවේ ය. සේස්සෝ කරත්තය පිටු පස පයින් ගමන් කළහ.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

මේ මහ දෙපස ගන බැදිකුට්ටි ද, අතරතුර 'තොට්ටම්' නමින් හැඳින්වෙන පිට්ටනි ද ඇත. බැදිකුට්ටියෙන් තොට්ටමට ද, තොට්ටමෙන් බැද්දට ද මාරු වෙමින් ගමන හෙම්-හෙමින් කෙරිණි. කුමනින් රෑ කෑම කා ගමන ඇරඹුණු හෙයින් අතර මහ දැන් වේලාව රෑ මැද-යම ය. දක්කන්නා විදුලි පන්දමක් විටින් විට එළිය කරමින් යයි.

හදිසියේ ම කරත්තය නැවැතිණි. "අලියා !" යි ශ්වාසයෙක් දක්කන්නා කෙරෙන් නිකුත් විය. සිරිමල් ඉදිරියට අවුත් විදුලි පන්දම ගෙන එළිය කොට බැලී ය. ඉදිරියේ තොට්ටම මැද සිටින දැවැන්ත අලියකු ගේ රුවක් ඔහුට පෙණිනි. මිනිස් ගඳ දැනීදෝ අලියා මහ හඬකින් පිම්බේ ය. ගොන් දෙන්නා දෙපසට ඇදී බැම්මෙන් ගැළවෙනු බැරි ව නිසල වූහ.

පස්සෙන් ආ දෙන්නා ආපසු හැරී පණ එපා වූවන් මෙන් දිවූහ. දක්කන මරක්කලයා තෝන් ලනුව අත හැර දිව ගොස් මහ ගසකට නැංගේ ය. උසස් නිලදැරියා කරත්තයෙන් පැන සිරිමල් ළඟට දිව අවේ ය. අවුත්-

"ඉතින් සිරිමල් මොක ද කරන්නේ ? මොක ද කරන්නේ ?" යි වේවිළන තොල් අතරින් කී ය.

"මහත්තයා බය වෙංඩ එපා, මා මැරිල මිස මහත්තයට අනතුරක් වෙංඩ දෙන්නේ නෑ. සාක්කුවේ පතරොං පුරවලා තියනවා. ඒවා ඉවර වෙනකල් වෙඩි තියන්නම් !"

එහෙත් සිරිමල් එක වෙඩිල්ලක් වත් නො තිබ්බේ ය. වෙඩිල්ලක් තියා ඒ දැවැන්තයා කෝප කරගන්නවාට වඩා හැකි නම් ඌ මහහැරවීම හොඳ හෙයිනි.

ඔහු උසස් නිලදැරියාට රහසින් උවදෙස් දී පලා-ගිය දක්කන්නා සහ අනිත් දෙන්නා ආපසු කැන්දවීය. ඒ අතර විදුලි පන්දමේ එළිය රැළ අලියා ඉදිරියේ බිමට අල්ලමින් කෙමෙන් ඌ පාරෙන් වම් පස කැලෑවට යොමු කරවී ය. අලියා හෙමි හෙමින් කැලෑවට වැදී නිහඬ විය. සිරිමල් ඉදිරියට අවුත් අලියා පාර හරහා වනයට වැදුණු තැන එල්ලයේ සිට ගත්තේ ය. වමතින් විදුලි පන්දමත්, දකුණතින් තුවක්කුවත් ගෙන ඔහු අලියා මුරයේ සිටිමින් සෙස්සනට මාරු වී යන සේ සංඥා කෙළේ ය. අමුත්තන් දෙන්නා වේවිළන දෙ පයින් ඉස්සරහට ඇදී ඈතට ම දිව ගියහ. නිලදැරියා ද ගිනිමැලයක් මැදින් ගමන් කරන්නකු මෙන් අලියා උන් තැනින් මැරු වී ඉදිරියට දිව ගත්තේ ය. එහෙත් මරක්කල

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

දක්කන්නා යවාගැනීම දුෂ්කර විය. හේ දෙවියනට පෙනෙන්නට මෙන් දත් ඉහළට ඔසොවමින් යළි අලියා ඇති දෙස පෙන්නී ය. අලියා වනය ඇතුළත හිඳිමින් වරෙක පිඹියි. වරෙක අත්තක් බිඳියි. සිරිමල් මහා කුණුහරුපයකින් බැණ වැදී තරවටු කෙළෙන් මිනිහා කරත්තය උගුළුවා ගෙන එළවා ගියේ ය. ඉන්පසු සිරිමල් ද හෙමි-හෙමින්, පස්ස බල-බලා ඉදිරියට යා ගත්තේ ය.

එහෙත් සිරිමල් වැඩියෙන් මගේ සිත ගත්තේ මේ එකක්වත් නිසා නොවේ. කෙබඳු පරිසරයක වුව ද සතුටින් සිටින ඔහු ගේ සැහැල්ලු සිත නිසා ය.

වනය මැද අලි-වලසුන් ගේ හොස්ස අස්සේ අප දෙන්නා ගිය ගමන් අනන්ත ය. ගමනේ යෙදෙන ගමන් සාක්කුවට අත යවන ඔහු ගල් ගැසුණාක් මෙන් නතර වෙයි. ඒ අනුව නතර වන මට සාක්කුවෙන් ගත් සේයා රුවක් පාමින්,

"මේ මම බඳින්න ඉන්න එක්කෙනා !" ප්‍රේමාර්ද්‍ර විලාසයකින් කියයි.

සේයා රුවේ පෙනෙන්නි, අහිංසක සුන්දර ප්‍රේමයක ප්‍රතිමූර්තියක් බඳු ලලනා මුහුණෙකි. එහෙත් මට මතක් වන්නේ හතර වටින් අපට මරු කටින්නට බලා සිටිනා අලි-වලස්සු ය.

"ඔව්, ඔව් හරි අගෙයි" මම කියා ගමනට ඔහු පොළඹවමි.

ලොවේ කොතෙකුත් සිරිමල්ලා ඇතත් මෙබඳු සැහැල්ලු සිත් ඇති සිරිමල්ලා විරළ වෙති. මගේ සිරිමල් නම් අදත් කොතැනක නමුත් - සිනහ මුහුණින් යුතු ව ඇති.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

13

කතා බස්

වැවිගම් පත්තුවට ඉතා පැරණි ඉතිහාසයක් ඇති බව යට සඳහන් විය. ඉතිහාසය මෙන් ම එහි බස ද සිංහලයෙහි පැරණි ස්වරූපයක ලක්ෂණය ඇතියකි. පැරණි සිංහල පත-පොතෙහි ඇති අමිශ්‍ර සිංහල වචනත්, ඒවායින් නොයෙක් අතට බිඳී යාමෙන් සෑදුණ අමුතු වචනත් එහි බොහෝ ය. ඒ වචන සිත් ගන්නා සුලු, අපූරු විලාසයන්ගෙන් කතාවෙහි යෙදී සිටිනු ඇසිය හැකි ය.

වැවිගම් පත්තුවට පැමිණි අලුත මට එහි වැස්සන් කතාවෙහි අසමර්ථයන් ලෙසත්, තමන් ගේ අදහසත් පැහැදිලිව කියා පෑමට ඔවුන්ට ශක්තියක් නැති ලෙස හා ඔවුන්ගේ ගේ ශබ්ද කෝෂයෙහි ශබ්ද ඉතා අඩු ලෙසත් පෙනුණේ ය. එහෙත් එය වැරදි පෙනීමක් බව තේරුම් යාමට වැඩි කලක් ගත වුණේ නැත. සත්‍යය වූයේ අනිකකි. ඔවුහු ඕනෑ ම අදහසක් කියා පෑමට පමණක් නො ව, තමන් ළඟ නැති බොරු පුරාජේරු - පුරසාරම් කීමට ද සමර්ථයන් බවත්, කිසිවකුට නො පැරදී කතා කිරීම ඔවුන් ගේ ගැහැණු-පිරිමි බොහෝ දෙනාට හැකි බවත්, ඔවුන් ගේ ශබ්ද කෝෂයෙහි අලුත් වචන නැතත්, අදහස්වලට උවමනාවටත් වඩා වචන ඇති බවත්, වරද වූයේ ඔවුන් ගේ කියුම් තේරුම් ගැනුමට මා අසමර්ථ වීම බවත් පසු ව පෙනී ගියේ ය.

කතාකරන බාසාවක් පරීක්ෂා කිරීමෙන් ජාතියක ගේ ශිෂ්ටාචාරය පිළිබඳ බොහෝ කරුණු දක්විය හැකි බව කියනු ලැබේ. භාෂාවේ ශබ්දවල විලාසයෙන් ජාතියේ සෞඛ්‍යය හා දේහ ශක්තිය ගැන නිශ්චය කළ හැකි ය. දේහ ශක්තියෙන් උසස් මිනිසුන් කතා කරන භාෂාවක ශබ්දයෝ ගුරු වෙති. උච්චාරණයෙහි අපහසු වෙති. බොහෝ ශබ්ද හලන්ත හෙයින් වේගවත් ව උසුරුවනු යුතු වෙයි. යුරෝපීය යෝධයන්ගේ ඉංගිරිසි ශබ්දත්, උතුරු ඉන්දියානු ආර්යයන් ගේ හින්දි භාෂාව හා බ්‍රාහ්මණ යෝධයන්ගේ සංස්කෘත භාෂාවත් මීට නිදසුන් වෙති. ද්‍රවිඩය හා වර්තමාන සිංහලයේ බොහෝ වචනත් දේහ ශක්තියෙන් පිරිහුණු

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

ජාතීන්ගේ බවට ලක්ෂණ දක්වයි. හලන්ත ශබ්ද වෙනුවට හල් අකුරු වලින් පර ව එහි ම ස්වරාන්ත ශබ්ද යෙදීමෙන් පැහැදිලි වන්නේ දේහ ශක්තිය අඩු මිනිසුන් ගේ ව්‍යවහාරයෙහි ලක්ෂණයකි. වැව්ගම් පත්තුවේ කතා ව්‍යවහාරයේ යෙදෙන වචනවල මේ පිරිහුණු දේහ ශක්තියේ ලකුණු වඩාත් ප්‍රකටව පෙනෙයි.

බටහිර වෙරළ බඩ කොළඹ හා ඒ අවට පෙදෙසෙහි, ඉංගිරිසියෙන් යුරෝපීය ශිෂ්ටාචාරය පැතිරෙද්දී, නැගෙනහිර දිග මේ පෙදෙස්වල ද්‍රවිඩ භාෂාවෙන් ද්‍රවිඩ-මුස්ලිම් ශිෂ්ටාචාරය පැතුරුණු හැටි යට සඳහන් විය. මෙයින් කොළඹ රටේ භාෂාව ඉංගිරිසි උණුවු ගනිද්දී වැව්ගම් පත්තුවේ සිංහලයට ද්‍රවිඩ උණුවු වැදුණේය. එහෙයින් කතා ව්‍යවහාරයෙහි දෙමළ වචන ද දෙමළයෙන් බිඳි වෙනස් වී සැදුණ වචන ද බොහෝ ය.

පරභාෂිය ශබ්ද තමන් ගේ ව්‍යවහාරයට යෝග්‍ය සේ බිඳගෙන සකස් කරගැණීමටත්, එක ම වචනයක් ඒ ඒ තැනට වෙන වෙන තේරුම් සඳහා පාවිච්චි කිරීමටත්, මෙහි සමාජය සමත් ය. පාරිභාෂික ශබ්ද බිඳි යාමෙහි දිත්, සිංහල වචන ම හැඩගැසීමෙහි දිත් සිදු වී ඇති ලොකු වෙනසක් නම් බොහෝ වචන ව්‍යවහාරයෙහි පහසුවන පරිදි සකස් වීම ය. මේ හැර මෙහි ව්‍යවහාරයෙහි යෙදෙන අමුතු ම ශබ්ද ද රාශියක් දක්නා ලැබේ. මෙහි වෙනස කොතරම් ද යත් සමහර විට පිට ගැමියකුට සමහර කතාවකින් කිසිවක් තේරුම් ගත නො හැකි වෙයි.

පහත සඳහන් දෙබස කියවා බලනු මැනැවි. එය මේ කැලෑ රටේ ගමක අඹු සැමි යුවළකගේ දිනපතා ජීවිතයෙන් ඇසිය හැකි දෙබසක ව්‍යාජයෙන් සැපයුනෙකි. එහි අදහස මෙහි කතා ව්‍යාවහාරය ගැන හැඟීමක් දීම පමණ ය.

"බොටා!" මේ ස්වාමියා බිරින්දට කතා කළ හැටි ය.

"හොයියැ ?" යනුවෙන් ඈ පිළිතුරු කරයි.

"කොහොට්ට පනං උණේ කොලු හපුවා ?"

"කරුණාවා කැටුං දන් ඔහොකොණ ඇපල දිහා පද්දව්වෙ."

"මොක්ක කැටුං ?"

"කරුණාවා. එබ්බැහැරෙ මුත්තලෑ කරුණාව !"

"අඩෝ ! අඩෝ ! ඇ තී ඔයින් කැටුං යවව්වෙ ඒකා ? මෙහෙදීල, ඔය දන්ඩ, මං යන්ඩ උණ කැටුං එන්ඩ."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

"කළුව එද්දින් කුදහන් නැතුං වරෙල්ල. තලප මං හැඳි ගාන්නෙ."

මේ සංවාදයට ඇතුලත් අදහස රටේ වෙන පළාත්වල සාමාන්‍ය ව්‍යවහාරයට පෙරළුවොත් කියවෙන්නේ මෙසේ ය.

"බොලං !"

"මොකද ?"

"කොහාට ද ගියේ කොලුවා"

"කරුණත් එක්ක (කරුණාරත්නත්) එක්ක දැන් ඔහෙ බඩ වැටිය දිහාවට දිව්වා."

"කවුරු එක්ක ?"

"කරුණා ! එබ්බැහැරෙ ආතලා ගෙ කරුණා !"

"අනේ, අනේ, ඇයි උඹ ඔවුන් එක්ක යැව්වේ එයා ? මෙහෙ දියන් ඔය තුවක්කුව, මං යන්ඩ එයා එක්ක එන්ඩ."

"ඊ වෙනකල් බුදියන්නේ නැතුව වරෙල්ල. අද තලප උයන්නේ (හිල් වුණොත් කන්ඩ බෑ.)"

මේ සංවාදයන් දෙක සසඳ බැලීමෙන් මෙහි භාෂා ව්‍යවහාරයේ වෙනස ගැන යම්තමින් හැඟීමක් ඇති කර ගත හැකි ය. නමුත් ඒ වචන වල අදහස් සම්පූර්ණයෙන් එකිනෙක හා සමාන නො වේ.

'බොටා' යන්න 'බොල' යන ව්‍යවහාරයට වඩා බොහෝ වෙනස් කම් ඇති වචනයකි. 'බොලං' යන්න කොයි පළාතකවත් බොහෝ දෙනා අතර ව්‍යවහාර වන වචනයක් නො වේ. සමහර පවුල්වල සැමියන් සිය බිරින්දන්ට කතා කරන විට හෝ නවත් තලතුනා සමහරුන් පමණක් එය ව්‍යවහාර කරනු කලාතුරකින් ඇසිය හැකි ය. එහෙත් 'බොටා' එබඳු නො ව හැම තරාතිරමක කවුරුන් අතර නිතොරව ම භාවිත වන ඉතා සුලබ වචනයකි. අඹු සැමියනුත්, නිකම් ගැහැණු-පිරිමිත්, බාලයන් හා මහලු අයත් කිසිම විශේෂයක් නැති ව 'බොටා' යන්නෙන් එකිනෙකා ඇමතූහ. එය නිතර ම ආදරණීය හැඟුමකින් යුතු ව කැරෙන ඇමතුමකි. මිනිසුන් පමණක් නො ව සත්තු ද එබඳු හැඟුමකින් යුතු ව 'අලි බොට්ටු, වලස් බොට්ටු, ගෝන බොටා' ආදී වශයෙන් සඳහන් වූහ. එහෙයින් 'බොටා' යන්න එක් සමාන වචනයකින් දක්විය නො හැකි ය. 'බොලං, අයිසේ, යාලු, උන්නැහේ' ආදී වචන හුහක තේරුම් එහි ගැබ් ව ඇත්තේ ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

'හොයියැ ?' යනු 'ඔයියැ ?', හොයැ ?' යන ස්වරූපයන්ගෙන් ද ව්‍යවහාර වේ. 'මොක ද ? මොකෑ ? මොකෝ ?' යනුවෙන් නොයෙක් පළාත්වල කියවෙන්නේ මේ අදහස ය. මේ ද මෙහි නිතර ඇසිය හැකි වචනයකි.

'හපුවා, හපුව, හුද, හුදී' යනාදිය මෙහි භාවිත වන හුරතල් වචන යයි කිව යුතු ය. මේ වචන කොයි කෙනකු හෝ කොයි දෙයක් හෝ ගැන ඉතා හුරතල් හැඟුමකින් සඳහන් වන තැන්හි යෙදෙයි.

'ආරච්චි හපුවා පනං වෙලා වෙහෙම කා ගෙන පද්දව්වා.'

('ආරච්චිල ඇවිත් සේරම කාලා යන්ඩ ගියා.')

'ඈ මේ වතුරු හපුව ගැහැම්මේ ?'

('ඇයි මේ වතුර ටික විසිකෙළේ ?' යනුවෙනි.

කොහාට, මෙහාට, එහාට යනු කොහොට්ට, මෙහෙට්ට, එහෙට්ට ආදි විසින් කියවෙනු සිරිත ය. 'එහි, මෙහි, ඔහේ යනු 'එහෙකොණ, මෙහෙකොණ, ඔහොකොණ' යනුවෙන් කියැවෙයි.

'පනං උණා, පද්දව්වා' යනු 'ගියා' යන අර්ථයෙහි ම යෙදෙන නමුත් විශේෂ අවධාරණයක් ඇති තැන්වල කියැවෙයි. 'අරූ අර රුකුලේ (බාද මැද්දේ) පණං වේගන කුදහව්වා' 'මාත් කුදහං ඉඳලා උදෑහැන ම පද්දව්වා මෙහෙට්ට' ආදි වශයෙනි.

'කැටුං, නැතුං' යනු කැටුව, නැතුව යන වචන අප්‍රාණික වීමෙන් සෑදී ඇත්තේ ය. 'මං එනකං ඉඳින්' ආදියෙහි මෙනි. නැත්නම් යන්න මෙහි ඇත්තේ 'නැට්ටං' යි ශබ්ද කර කියති.

'මොක්කු' යන්න 'කවුරු ද', නැතහොත් 'කවිද' යන අදහස සඳහා ව්‍යවහාර ය.

'මොක්කු බොටා අර පද්දන්නේ මෙහෙට්ට ?'

'කවුද්දන් ?' (කවිද දන්නේ ?)

'මහරටේ නින්දෙ කකා ඉන්න දන්ඩෝ, මෙහෙකොන පනංවෙලා' ආදි ව්‍යවහාර මෙසේ ඇසිය හැකි ය.

කාගේත් නම් නිගරු ලෙස පාවිච්චි කිරීම මෙහි සිරිතකි. නොගරු කරන හැඟීමක් කතා කරන්නන් තුළ නැතත් ඒ බවක් වචනවලින් පෙනෙයි. බොහෝ ළපටියන්ට කරුණාරත්න, ගුණරත්න, අබේරත්න,

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ගුණසේකර ආදී කදිම නම් කිපයක් ඇතත් කවුරුත් කතා කරන්නේ කරුණාවා, ගුණෙයා, අබෙයා ආදී වශයෙනි. මේ අලුත් නම්වලින් මේ රටට පුරුදු ව ඇත්තේ ඉතා සුළු ගණනක් බැවින් එක ම ගමක ළමයින් දහ දෙනෙකු අතරේ එක නම ඇති ළමයින් දෙතුන්දෙන වෙති. එසේ වූ විට ඒ අය 'මහ ගුණයා, හින් ගුණයා' ආදී හැටියෙන් බෙදෙති.

මේ අලුත් නම් හැර පළාතට අයත් පැරැණි නම් ද ඇත්තේ ය. බණ්ඩලා - මුතු, සුදු, කිරි බණ්ඩලා හරුණු විට කිරිවන්ති, ගමන්ඩි ආදී පිරිමි නම් ද, එබඳු ම මැණිකලා සහ 'හුදුකුමා' සුදුබණ්ඩි' ආදී ගැහැණු නම් ද වෙයි. බණ්ඩා යන්නෙහි ස්ත්‍රීවාචී නම 'බණ්ඩි' වෙයි. 'හුදුකුමා' යනු පැරැණි යයි සිතෙන ගැහැණු නමෙකි. 'හුදුකුමී' යයි ද කියති. 'ගමන්ඩි' යනු පිරිමි නමෙකි. එය දෙමළ 'කමන්චි'[1] යන්නෙන් බිඳිණෑ යි සිතිය හැක. කනවදි[2] නම් පිරිමි නමක් ද වෙයි. ඒ දෙමළ 'ගණපති' යන්නෙන් සෑදුනෙකි. සම්පූර්ණයෙන් ම දෙමළ වූ 'මුරුගා, පෙරුමා' ආදී නම් සමහර ගම්වල ඇත්තන්ට ඇති බව යට සඳහන් විය.

උඩරට බණ්ඩාරලා බොහෝ දෙනෙකුන් මෙන් මෙහි ද ඇතැම්මු වෙන නම් ඇතත්, ගම්වල නම්වලින් සෑදුණු උපනාමවලින් ද හැඳින්වෙති. එහෙත් සමහරුන් තමන්ගේ නම් වශයෙන් ඇති ඒ ගම් ඇති තැනක්වත් නො දනිති. ඒවා ඔවුන්ගේ මුතුන් ගේ ගම් ය. 'එබ්බැහැරෙ මුත්තා, ඔබ්බෙගොඩ මලෙය, මියගල උදවිය' ආදී වශයෙනි. මේ නම් බොහෝවිට අනභිමුඛයෙහි 'එබ්බැහැරෙයා, ඔබ්බෙගොඩයා' ආදී හැටියෙන් කියවෙයි.

'අංඩේඃ !, 'අඩා අඩා !' 'ඒඃ, අංඩේ අංඩේ' ආදී නොයෙක් හර්ෂාදි රාවයෝ ද වෙති. 'අංඩේ, අංඩේ මේකලාට ගහල තියන විසාදියක් (කැක්කුමක්), 'ඒඃ ! මං කියන් නෑ?' (ඔහ්, මං කිව්වේ නැද්ද ආදිය ය.)

'තා, තී, තට, තිට, නොපට' ආදිය මෙහි සාමාන්‍ය හරි හරියේ ඇත්තන් ගේ ව්‍යවහාර වෙයි. නවීනයන් කියන 'ඔබ' යන්නට සම තරම් - සමහර විට ඊටත් වැඩි උසස් හැඟුමක් ඔවුහු 'උඹ' යන වචනයට දෙති. 'කෝරළේ මහත්මයා, උඹවත් යා කොයි ඔය දබරෙ විසඳන්ඩ, ඉස්කෝල මහත්තය උඹ මෙහෙන් ඉඳ ගනින් කොයි' යනු උදාහරණ ය. එහෙත් තවත් ඇතැම්මු කෝරාළට කෝරළේ හාමුදුරුවෝ යනුවෙන් ද, සමහර විට ගමේ ආරච්චිටත් හාමුදුරු පදයෙන් ද කතා කරති.

---

1. කමන්චි දෙමළෙන් ගමාරළට නම්.
2. දෙමළයෙන් ලිවූ විට කනවදි ගණපති වෙනසක් නැති තරම්.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

'කළුව එද්දිං කුදහන් නැතුං වරෙල්ල !' යනු 'කරුවල වැටෙන කල් නිදා ඉන්නේ නැතුව වරෙල්ලා' යන තේරුම ය. එද්දිං යද්දිං යනු එනතුරු, යනකල් යන තේරුම් ඇත්තේ ය.

'මං එද්දිං හිටින්' (මා එනතුරු හිටපන්), 'මං එද්දිං යා කොයි, (මම එනකල් යමුකෝ)' මෙනි.

'මං එපයි කියන්ඩත් ඌ දිව්වා' යන්නෙහි තේරුම ' මා එපා කිව් නමුත් ඌ දිව්වා' යන්න ය. කියන්ඩත්, දකින්ඩත් යනු කියද්දීත්, දකිද්දීත් යන තේරුම් ඇත්තේ ය.

'**කුදහනවා**' යනු නිදනවාට නම ය. බොහෝ දෙනාගේ නිදීම ඇදගෙන උන් සරම ලිහා ඒ තුළ වකුටු වීම බැවින් ඒ නම ඊට ගැලපේ. 'කිගනවා, ඕගනවා' යන නාම ද එවැනි ය. 'කිගනවා' (කැ ගහනවා නොහොත් අඩනවා), 'ඕගනවා' (අඩනවා නොහොත් ඕඕ ගා මහ හඬින් හඬනවා).

ක්‍රියා පද වර නැගී ව්‍යවහාරයෙහි යෙදීම පිළිබඳ ලොකු වෙනස් කම් කීපයක් ද දක්නා ලැබේ. 'කැපුවා, කෙටුවා, කැඩුවා' ආදී අතීත කාල ක්‍රියා 'කපව්වා, කොටව්වා, කඩව්වා' යන අයුරින් කියවේ. යවව්වා (යැව්වා), කියව්වා (කිව්වා) ආදී සෑම ක්‍රියාවක්ම මෙ බඳු ය. මේ ක්‍රියා මෙ සේ ම අතීත කාලයෙහි නඥර්ථයෙහි (නැතැයි යන අරුත්හි) යෙදුන කල අමුතුම වේශයක් ගනියි. කැපුවේ නෑ යනු හෝ කපව්වේ නෑ යනු හෝ නො යෙදී 'කපන්ඩ නෑ නොහොත් කපන්නේ නෑ' යනුවෙන් සිටියි. එහෙයින් 'තාත්තා ආවෙ නෑ'යි කිය යුතු තැන 'අප්පා එන්ඩ නෑ'යි ද, 'අම්මා කිව්වේ නෑ'යි කිව යුතු තැන 'අම්මන්ඩි කියන්නෑ'යි කියවෙනු ඇසෙයි.

වචන නොහොත් වාක්‍යාංශ කෙටි කොට අමුතු ම ස්වරූපයකට හැරවීම මෙහි සමාජයේ ඉතා ඉක්මනින් සිදු වන්නාක් මෙන් පෙනෙයි.

'ගැහැම්මා' යන ක්‍රියාව ගහ දැම්මා (විසිකළා) යන්න කෙටි වීමෙන් සැදුණෙකි. එය ගහමලා (විසිකරලා), ගහමප (විසිකරපිය) යනාදී වශයෙන් වර නැගෙයි. හිටප (හිටපිය), කියප (කියාපිය) යනුවෙන් ද ක්‍රියා කෙටි වෙයි.

'අහනකන්ද' යනු 'අහනකල් ඉඳලා' (ඇසුවිට) යන්න සකස් වී ඇති සැටියි. මෙසේ හැඩ ගැසුණු වචන කොතරම් පැතිරී ඇද්දයි කියතොත්, මෙසේ නියම අදහස සොයාගන්ට වත් බැරි තරම් වෙනස් ව ගිය වචන නිසා අමුත්තකුට යමක් තේරුම් ගැනීමේ දී කරදර ද පැමිණිය හැකි ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

'කවුද්දන් ? (කවුද දන්නේ ?) කවුද ආවෙ ? (කවදද ආවෙ ?), කොහා? (කොහෙ ද ?), මොනා ? (මොනව ද ?) මෙනි.

පිටතින් ලැබෙන අලුත් වචන සිංහලයට සුදුසු පරිදි සකස් කිරීම ද මෙහි හොඳින් සිදුවෙයි. 'බල්බ් එක' යයි නාගරික බොහෝ දෙනා වරද්දන වචනය මෙහි පහසුවෙන් ම 'බල්පය, බල්බෙ හෝ බල්පෙ බල්ප හතරක් ආදි වශයෙන් යෙදෙයි. 'කැප්' යන්නේ 'කැප්පය' යනු නිතැතින් සෑදී 'කැප්ප, කැප්පෙ' ආදි වශයෙන් කියවෙයි. රෝට්ටුව (රෝඩ්), ඇණ කට්ටුව (ඇනිකට්) ආදිය මනා ව සෑදී මෙහි කියවෙනු මෙන් ම ලියන්නන් වෙතින් ලියවෙනු ද නිසැක ය.

මෙසේ අමුතු වචන හා ව්‍යවහාරයෙන් වැව්ගම් පත්තුවේ සිංහලය ගන්නා ආශ්චර්‍ය්‍ය මෙහි කතා බස්වලින් දැක්වෙයි. දැන උගත් කම් හිඟ හෙයින්, පොත්-පත් නැති හෙයින් මෙහි ඇත්තන්ගේ අදහස් සීමා සහිත ය. එහෙත් ඒ බව දැන ඕනෑ තැනක අදහස් කියා නොපාන කෙනෙක් නැත. එහෙයින් කොතනක දිත් තොරක් නැති ව කැරෙන කතා ඇසිය හැකි ය.

වැව්ගම් පත්තුවේ කැලෑබද ගම්වල වසන කවුරුත් - සමහර ගමක වසන අඩුකුලවල ඇත්තන් හැර අනික් කවුරුන් නෑදෑයෝ වෙති. වසන්නන් ටික දෙනා බැවින් පළාතේ කවුරුත් එකිනෙකා - ඈත ගම්වල අයින් පවා අඳුනති. නෑකම් ඇති අය ඒ නෑකම්වලින් ම කතා කිරීම සිරිත ය. ඉතා කාරුණික ළයාන්විත ස්වරයකින් ඒ නෑ කම් කියා එකිනෙකා කතා කර ගන්නා හැටි කදිම ය. එහෙත් ඒ කතාවේ ඇති මිහිරේ තරම් ඇතුළත සම්බන්ධය ඇති කම ම එහි අදහස නොවේ. නෑ දෑ කම්වල වැඩි ම අගය ඇත්තේ කොයි රටෙත් කතාවෙහි ය.

දරුවෝ මව්-පියන්ට අම්මණ්ඩි හා අප්පච්චි හෝ අප්පා යනුවෙන් කතා කරති. මව්පියන් දරුවන්ට ගුණෙයා, අබෙයා, කරුණාවා, අඩා ආදියෙන් කතා කරන හැටි යට කියැවිණ. නමුත් මෙයින් හැම මව්පියන් හැම විට ම මෙසේ කතා කරන බව නොසිතිය යුතු ය. හුදු, හුදී යන සුරතල් නම්වලින් හා පුතා, දූ යන ආදරණීය නම්වලින් ද කතා කරති. සමහරුන් තමන්ගේ දරුවන්ටත් වඩා ආදරයක් දක්වමින් අනුන්ගේ දරුවන්ට මගෙ පුතා යයි කතා කරන හැටිත් ඇසිය හැකි ය.

මව්-පියන්දූ පුතුන් හැරුණු විට අනිත් නෑයෝ ද ඒ ඒ නෑකම් වලින් කතා කෙරෙති. මාමණ්ඩි, නැන්දම්මා, බෑනා, ලේලි, අය්යා, මලෙයා, බාප්පා, පුතා ආදි නෑකම් වයස්වලටත් වැඩියෙන් උසස් තැන් ගෙන ව්‍යවහාරයෙහි යෙදෙයි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ප්‍රශ්නවල අගට 'ද ?' යන්නක් නො යෙදීම මෙහි ව්‍යවහාරයේ ඇති විශේෂයකි. එහෙයින් වාක්‍යයක් ප්‍රශ්නයක් බවට පෙරළන්නේ අසන ශබ්දයේ විලාසයෙන් හා වචන මාරුකිරීමේ හැටියෙනි.

'ආවා තා ගිහින් ?, නැ තට කුදහන්ට ඉඩමක් ?, හෙනං නැ ?. තට බෑ මේක උහන්ඩ ?' ආදිය උදහරණ ය.

'උඹ ගිහින් ආවා ද ?, උඹට නිදන්ඩ ඉඩමක් නැද්ද ?, එහෙනම් උඹට බැරි ද මේක උස්සන්ඩ ?' යනු සාමාන්‍ය අදහස් ය.

'හෙනං නැ ?, (එහෙනම් නෑ), නම් ම ! (එහෙනම් අම්මා !), නම් බෑ (එහෙනම් බෑ !) ආදි අඟුල්පත් වචන ද ව්‍යවහාරයෙහි බොහෝ විට යෙදෙයි.

'හෙනං නැ, සුව සේ ඉන්න තට උන් දින දින කන්ඩ දෙන් ? (එහෙනම්, වැඩක් නැතුව කකා බිබී) ඉන්න කොට උඹට ඔවුන් දින පතා කන්ට දෙන් ද ?)'

'උන් ම කොටත්, වපුරත්, උන් උන් ම කපාගෙන කන් !'

'බැණා !'

'ඕයැ ?'

'වරෙං කොයි, මෙහෙට්ට් උඹෙන් වගක් අහගන්ඩ.'

'මොනා ?'

'කොහා දැන් අරකි - අර කොටි (කොටගොඩින් ආ තැනැත්තිය) ගෙ නගා ඉන්නේ ?'

'කවුද්දං ?'

මේ මෙහි කතා ව්‍යවහාරයෙහි ස්වරූපය විදහා පාන වැකි වෙයි. මීට වඩා තවත් කිවයුත්තේ එක් කාරණයකි. කණගාටුදයක පරිදි මෙ වැනි කතා බස්වලටත් වඩා මෙහි බොහෝ ගැමි ගැහැණු-පිරිමි කුණුහරුප කතාවට දස්ස වෙති. ඉතා කුඩා ළමයින් පවා යම්තමින් කියන වචනයෙන් ද කුණුහරුප කියති. වැඩි හිටි - තලතුනා යයි කිවයුතු ගැහැණු-පිරිමි පවා දරුවන් ඉදිරියේ වුව විළි බියක් නැති ව කුණුහරුප කියති. කතා බහේ ඇති නොයෙක් ශිෂ්ට වචන පවා බොහෝ දෙනාට කුණු හරුප වෙයි. මීට ද හේතුව දැන උගත් කම් හා අදහස් නැති කම ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

සේනානායක සමුද්දේ සිවවාන - 1954 දී එතුරා ගිය සැටි.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

වඩිනාගල සිව්පද

කුරක්කන් කපන කාලෙත් ආපි, ළමා!
ඉනේ කියන වත ඇඳපත් දෙකට නමා
නළල් වටින් එන දඩිය බිංදු තමා
වට පිට නො බලන්න, නුඹේ අත කැපෙයි ළමා!

ඌරල්[1] මාලු[2] දුම් මැස්සේ වනාලා
අපට කන්ට පුරු[3] කඳ හතු උයාලා!
ආවට වෙනුව මේ ඉස්සර කපාලා
යමව්, ගෑණු අර ඉස්සර කපාලා!

❊ ❊

පයේ වැලඳි ගිගිරි වළලු සොලොවා නද කරමින්
අතේ වැලඳි රුවන් වළලු ලෙළවා පැහැ විමින්
ඉනේ වැලඳි පට සේලය සුළඟට ඉගි ලවමින්
කතේ බොලඳ කොයි යනව ද, මගෙ සිත කිති කවමින්

කතා කරන කට හඬ ඇසෙනකොට කනේ
ඉතාමත් අමාරු ය, සැනසීම පනේ
වතාවක් දෙකක් නොව සැම දම අනේ
පතා නුඹ ම වගුරමි කඳුළු දෙනෙතිනේ

---

1. ඉණෙහට තුණු වූ.
2. මිස්.
3. වියලි පරණ.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

ගොලෑ කල පටන් රා මාදයෙන්
කැලෑවල වැදී තරුණුන් හා
උලා විදි උදර කිසි විළියක්
බොලෑ හැටි දනිමු, අපි විවරණ

මත්ව
එක්ව
නැතුව
ඇතුව !

දිගේකට නො ගොස් නිසි විලස
යාගේ නො කර නිසි ලෙස මදන
රාගේ රත් වෙලා දුව ඇවිද
නීගේ ඔය නැටුම බොල මොකද

කේවලේ [1]
කෝවිලේ
කාවලේ [2]
දවලේ ?

❊ ❊

පැල් පිනා කියන නෝනා නුඹ ද,
පිල් විද මොනරු හිරු දැකලා
වල් ගොනා නිතර තනි පාරේ
කල්පනා නො කර හිර ගැනුම හොඳ

කතේ
නටතේ
නොයතේ
නැතේ !

ආසා වෙලා කුමට ද, නුඹ
ආසා උනත් මේ සාලිය
හි සා නා ගොන් එක මග ද
වේසාලියන් සිටි අසලින්

ඇවිදින්නේ ?
අනුන්නේ
යන්නේ ?
නො යන්නේ

❊ ❊

වැටියට පිටින් බැහැගෙන හේනට
කොට වලිගය ගහගහ කුරහන්
කිටි කිටි හඬ දිදී මගෙ ඇහ
පිටියේ දෙවියනේ, උඟරා

එනවා
කනවා
වෙව්ලනවා
මරවනවා !

බැන්දේ වැට කඩුලු මඳකුත් නොම
නින්දේ ඉන්ට හිතිලයි, දවසක්
කන්දේ හිටන් එන මා හට වී
කන්දේ දෙවියන්ට බාරයි, හොර

තෝරා [3]
නෑරා
ගෝරා
උඟරා !

1. ස්ථිරව.
2. රැලකනේ.
3. ඉතිරි නොකොට.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

හතර පයේ අට කුරයක් බිම — සෙවුණු
නකුටු කොටේ උඩු පැත්තට — කරකැවුණු
දිගටි හොටේ දත් යුවළක් වකුටු — වුණු
නපුරු සතා මොකා ද, ලෝකෙට — මැවුණු ?

තේරුමක්[1] නැතු ව හැම බෝග කන — එකා
වාරු ඇති හොටෙන් පල්ලම්[2] බිඳින — එකා
තාරුකා මැකෙන කොට පැනල යන — එකා
ඌරු බොටා මයි, බං ඔය නපුරු — එකා !

❊ ❊

ආදි අප දෙන්න දිය පිට නෙළුම් — මෙනේ
දැන් දැන් අපි දෙන්න දිවි දුටු මුවන් — මෙනේ
දියේ පුරුදු ගොඩ නුපුරුදු මසුන් — මෙනේ
අලුත බැඳි සේනේ සුණු නැති බුලත් — මෙනේ !

ආදි අපි දෙන්න දෙන්න ම — තමුන්නේ
දැන් දැන් අපි දෙන්න දෙන්න ම — අනුන්නේ
නො දැන නො වෙයි දෙර පිල අතුර — දුන්නේ
ගෙයින් අතුර දෙමි, ගේ දෙර — අනුන්නේ !

❊ ❊

පැය පහක් තිස්සෙ මා ගෙමිදුල — උන්න
නැහැ නොවැ උණු වුනේ උඹෙ ළය ගල — මෙන්න
ආපසු යන්න මගෙ පය ඔසොවා — ගන්න
උණුසුම් කඳුළු වැටුනයි දෙපතුල — මෙන්න

පෙම්හදේ නිතර කරදර — තිබෙන්නේ
මම් ළඳේ කුමක් කරමි ද, — කියන්නේ ?
රන් කඳේ ඇයි ද මේ හැටි — සිතන්නේ ?
ඇයි ළඳේ මාව පිටමං — කරන්නේ ?

1. ඉසිරි සිරිමක්.
2. පහත් බිම්.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

රංමැණිකා මෙගමට හොඳ
ඒ වාගේ ම හරි ගිනි කෙළි
හිමිට හොරෙන් එන කවුරුත්
රම්මැණිකා නුඹ ද ? මෙගමට

කට කාරී
පුද කාරී
අතනාරී
රුවකාරී

පපා සිනා හිතවත් බව
උපා යොදන මගෙ සිත රවටා
කපා ගත්තු මාවත අව පුර
එපා ! ළඳේ නුඹ නම් මට අසු

පෙන්වන්ට
ගන්ට
යන්ට
වෙන්ට !

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

අමුතු වචන

අක්වැල්ල - වැලි දලුව - ඔයේ වැලි කඳු කොන්වල එරෙන තැන් - "හා, අඩා අක්වැල්ලේ තා එරෙයි."

අකුම - අක්මාව - කැවුත්ත - "කනව තගෙ අකුම මම."

අඩුව -කොටස - අසම්පූර්ණ දේ - "හාල් අඩුවයිනේ අඩා දුන්නේ අරකා."

අප්පච්චි - තාත්තා - "මේ මෙහෙකොණ අප්පච්චි එනවා."

අප්පු - මස්සිනා - සොහොයුරිය පතාගෙන ගෙදර වැඩ කරන තරුණයා - "අම්ම කිව්වා අප්පුට හේනට යංඩ කියලා."

අත්තම - කයිය - එකිනෙකා උපකාර වී කරගන්නා වැඩ - කුලියට නෙමේ මට අත්තමට වරෙල්ලා, මාත් එන්නම් තොපේ ගේ වහන්ඩ."

අට්ටං වෙලා - මුළු ගැන්නිලා - "තට මොනා උණා අඩා ඔතන අට්ටං වෙලා ඉන්නේ ?"

අම්මංඩි - නැන්ද - "අන්න බොටා අම්මංඩි එනවා."

අඹනවා - එලවනවා - "කොල්ලනි, අර කුඹුරේ සකලයින් අඹන්ඩ පලයව්."

අඹනවා - අඹාගන්නවා - ඉදගන්නවා - "ඔය හිදෙන් අඹාපල්ලා මං එනකල්."

අල්ලි කේනවා - එක් කරනවා - "මං උදලු ගාද්දිං තෙපි වල් අල්ලි කේ ගහමපව්"-"අල්ලි" දෙමළ වචනයකි.

අඩදම්බ - ගිනි පෙනෙල්ල - "කොල්ලා, අඩදම්බක් ගෙනල්ලා මේ මැලේට ගිනි ලාප."

අලුස්සාල් - මුලින් ලබන අස්වනුවලින් උතුමන් පුදන කොටස. සාල් පමණක් නොව පළතුරක් වැනි අනෙක් දෙයක් වෙනුවෙන් වුව ද කියැවේ. "තමුන්නැහෙට මෙද මගෙ හේනේ අලුස්සාලක් ගෙන ආවා."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

අල්ලස් - දෙවියන්ට පුදන පඩුරු - "අප්පච්චි දෙවියන්ට අල්ලසක් පුදලා කියාපංකොයි, පිහිටක් වේ ද බලංඩ."

ආතා - ආච්චි - මව ගේ මව හෝ පියා ගේ මව හෝ ඒ සමාන නෑ කම් ඇත්තී - "අන්න අම්මා ආතා ඔයේ වක්කේනවා."

අඹ - ගස් ලබු - පැපොල්.

අස්කනත්ත කොටව්වා - කුඹුර වටේ සුද්ද කළා.

ඇනකට්ටුව - ඇනිකට් - අමුණ Anicut - "තොපේ කුඹුරට දිය ලැබෙනවා ඇනකට්ටුව බැන්දලින් පස්සේ."

ඇටිකිත්තා - ගෙම්බා - "අඩා මන්න ඇටිකිත්තා ඇහට පනී."

ඇලිමෝලහ - වහලෙන් වැටෙන වතුර බස්නා කාණුව - "ඇලිමෝලහ ජඹුරු කේපල්ලා මේ වතුරු හපුව බැහැලා යංඩ."

ඇනිවිලා - බඩින් - දරු ගැබ් පිහිටලා - "ඇනිවිලා ඉන්න එළදෙං අඹන්ඩ එපා."

ඇනබානවා - ඉදගන්නවා - ඇනතියාගෙන ඉන්නවා - "මහොම ඇන බා ගනිංකොයි මං කියංඩ."

ඈ - ඇයි ? - "ඈ අඩා තා ඕගන්නෙ ?"

ඉහුරු - ඉරිහු - බඩ ඉරිහු - "මය ඉහුරු කරලක් ගං පුච්චං කංඩ." ඉහුරු භාවිතයක් නැති හෙයින් මේ යෙදුමෙන් අවුලක් නැත.

ඉඩාප්පු තියනවා - කුඹුරු ගොවිතැනේ දී ගොවිරාල වෙල් විදානේ වෙන ඒ බව ලියා පදිංචි කිරීම - මෙය මේ පළාතේ ඇති අමුතු රාජකාරියක් සේ පෙනේ. "ඉඩාප්පු" දෙමළ වචනයකි.

ඉත්තුල් - මොළ - ඉස ඇතුළත ඇති දේ - මුව ගෝන ආදින් දඩයම් කළ කල ඔලුව දින දෙක තුනක් පරණ කොට එහි ඇතුළත ඇති මස් ගෙන උයා කෑමට ඔව්හු ප්‍රිය වෙති. "ඉත්තුල්" යනු ඒ මස් ය.

ඉස වැදිය - ඉස රදය - ඉසේ විසාදිය යයි ද කියති.

ඉලිපත්ත - ඉලපත - ගේ අතුගාන උපකරණය.

ඊට ! - ඊට වඩා තවත් මොනවා ද ? යන අදහස දිය යුතු තැන්වල මේ වචනය පමණක් ම යොදති.

උඩමරාව - උඩුබැල්ල.

උන්නැහැ - ඩියාරෝ මහතා - "මං උන්නැහේ දිහා ගිහින් පැමිණිලි කේනවා බලාපව්."

උඹ - ගරු ඇත්තන්ට පමණක් කතාවේ දී යොදනු ලැබේ. "කෝරළේ මහත්තයා උඹවත් විසඳපං කොයි, මේ නඩුව."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ඌරල් වෙලා - ගණනට කුණු වෙලා - මස් කුණු රස වන පමණට පරණ වෙලා - "ඌරල් මාලු දුම්මැස්සේ වතාලා."

ඌරු වෙනවා - බාගෙට තැම්බෙනවා.

එතනා - නැනා - "අන්න එතනලාත් එනවා එබෙංඩ යමව්."

එබෙංඩ - ගිළි නාන්ඩ.

එයියන්තුන්නැහේ - ඒජන්ත තුමා - ඒජන්ත උන්නැහේ යන්න කෙටි වූ සැටියි.

ඔහොකොණ - ඔහේ - "මොනා කේනවා අඩා තෝ ඔහොකොණ ?" ඔහොකොණ, මෙහෙකොණ, අහරකොණ ආදී වශයෙන් ව්‍යවහාර වේ.

ඕගනා - අඩනවා - "ඇ අඩා තො ඔගන්නෙ ?"

කඩකැත්ත - දළිපිහිය.

කරපුස්සනවා - බඳිනවා - "මිරිස් කරලක් කරපුස්සා දියව් මට මේක කංඩ."

කකරනවා - හැඳිගනාව - "හොද්ද කකරපන්, දූ කැටිගැහෙයි."

කයිය - සමූහය - "හරක් කයියක් කුඹුරට පනං වෙලා ඕසෙට කනවා."

කාවලේ යනවා - හරක් රැලකනේ යනවා - (කාවල් දෙමළ වචනයකි. අදහස මුර කිරීම.)

කැටාකණු - මායිම් කණු - හේන් යායක් කොටන විට එකිනෙකා ගේ කොටස් වෙන් වන පිණිස සමහර පැලෑටි අග පමණක් කපා දමා තබති. හේන පිළිස්සූ පසු කොටස් වෙන් කරගන්නේ මේ කැටා කණුවල උපකාරයෙනි.

කෑටා - බලු පැටියා.

කෑටී - බලු පැටික්කි.

කිරි වේලාව - උදැසන - "මං එනවා කිරි වෙලාවට."

කිතයියා - හඳ - "අන්න හුදී කිතයියා, අර බල."

කීන්ත - තීන්ත - "මට ලියුමක් ලියා ගංඩ කීන්ත ටිකක් ගෙනෙව්."

කීයයි ? - කීය ද ? - "කීයයි අඩා ඔය සරම ?"

කීගනවා - ගැහනවා - අඩනවා - "මේකි මෙහෙකොණ කීගනවා."

කුදහනවා - නිදනවා - "මොන පැදුරු අඩා ? ඔය හම්පොත්ත උඩට වෙලා කුදහප."

කුබුද්දනවා - ඇහැරවනවා - "මං කුබුද්දන්නං රැයින්, තෝ කුදහප."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

කුංවා - බළලා.

කුඩප්පා - බාප්පා.

කුඩුමස්සන් - මාළු - කරවල.

කුඩුවෙනවා - රැස්වෙනවා - එක්වෙනවා - "ධෙහෙම කුඩු වෙලා කතා කේගන ඉටත් වෙන්නමු."

කුට්ටම - රැස් වීම - සමාගම - "හෙට කුට්ටමට වෙහෙක්කම එංඩ ඕනැයි."

කුනායිං - ක්විනින්.

කෙලා - කෙල්ල.

කේළිය - කවටකම - මාත් එක්කං කේළි කෙංඩ එපා."

කේනවා - කරනවා.

කොකිස් - කිරි අල.

කොහා - කොහෙ ද? - කොහාට ද ? "ඉස්කෝලෙ කොහා ?"

කොස් විලා - පැහිලා.

කොඳ - ලා කරල්.

කෝදරිය - වසංගතය - "මෙහෙකොණ කෝදරිය හැදිලා, හරක් වෙහෙම නට්ටං උණා." නට්ටං - නැසුණා.

කෝලෙ - හෙම්බිරිස්සාව - "කොල්ලට කෝලෙ හැදිලා, මතුරංඩ පරිෂාරි එක්ක වර."

කෝඩුවාව - පිලිකන්න.

ගහමනවා - විසිකරනවා - "මෙන්න මේකා වතුරු හපුව ගහමනවා."

ගහදනවා - විසිකරනවා.

ගල්පුදම - ගල්තලාව.

ගැහැම්මා - විසිකළා - "අම්මා, උඹ පොල් අතු ටික ගැහැම්මා ?"

ගිල්ලාමුරේ - ගෝසාව.

ගෙහෙඩියා - ගේ කුරුල්ලා.

ගොන් කපුටා - මයිනා.

ගෝහාලය - දඩුමැස්ස

ගෝටෙ - කුඩුව - "අඩා බලාප සකල ගෝටෙ පැටෝ ඇති"

(සකල - කුරුලු)

ටංගානවා - ගෝනා ගේ කෑගැසීම - "අන්න ගෝනෙක්

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ටංගානවා."

ටොම්බ - වලිගය - "ඒ කැටගෙ ටොම්බ කැඩිලා."

තඹරැනියා - සැළ ලිහිණියා

තලප - පළාතේ ප්‍රධාන ආහාරය - පිටි වර්ගයක් දියෙන් කලතා ලිප තබා හැඳිගෑමෙන් සාදා ගනු ලබන මේ ආහාරය හොදිවල බහා ගිලිනු ලැබේ.

තංඩිය - කලව.

තැරිය - දෙබල.

දංඩ - ලීය - විශාල දෙය - "මහ දංඩක්නේ අඩා ඒ බස් එක."

දඩ මිව්වා - දඩයමට ගෙන යන මීමා - මීමකු දක්කා ගෙන කැලේ යමින් ඌට මුවා වී දඩයම් කරති.

දුවා බානවා - තෙම්පරාදු කරනවා.

නපිරි - නපුරු.

නාලිය - කැළල.

නියංකඩනවා - කොනිත්තනවා - "මහත්තයා මේ කොල්ලා මගෙ නියංකඩනවා."

පරාදයි - බැරිවුණා - "ගම වෙහෙක්කම අහල පරාදයි රුපියලක් හොයාගංඩ."

පකරෙ - රාශිය - "කොල්ලනි, මේ පකරෙ ගහමපව්."

පද්දනවා - විසිකරනවා.

පදිනවා - ඉගිල්ලෙනවා - "හේනට ගිරව් පදිනව ඇති, පැයට යම්ව්."

පදිකිඩ - එළිපත - "මයෙ ගෙයි පදිකිඩ පයිංඩ එපා. තෝ අදිම්මනත."

පරන්දු වෙනවා - ඉගිල්ලෙනවා.

පරියා - වලහා - "රුකුලෙ යංඩ එපා බොටා. පරියා ඇති."

පලේ - වහළෙ - "ඉලුක් කපව්, පලේ හොයංඩ ඕනැයි."

පරිෂාරී - යකැදුරා - දෙමළයෙන් ආ වදනකි. එහෙත් නියම දෙමළ නොවේ.

පැටා - පැටියා - කොල්ලා - පොඩි එකා - "කෙල්ල අර පැටා උහාගං."

පැංචා - පැංචි - කොල්ලා - කෙල්ල.

පාන් කළුව - උදේ අඳුර - "පාන් කළුවෙන් කුද්දපව්."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පාතයා - "පහත රැටියා."

පිඹුර - සින්නක්කර ඔප්පුව.

පුරු උණ - දිරා ගියා - "පලේ පරාලත් පුරු උණා. හෙට අනිද්ද ගේත් කැඩෙද්දේ."

ප්‍රස්සනවා - පත්තු කරනවා - වෙඩි තියනවා "අද නම් මම මුවෙක් ප්‍රස්සනවා."

ප්‍රහල් - වට්ටක්කා - දෙ වගයට ම කියැවෙන්නේ ප්‍රහුල් ම ය.

පුක්ක - කිරිබත් - "කෙලා, රෑට පුක්කවත් හැදි ගාප. තලප හදන්ඩ පිටි නෑ." - දෙමළ

පක්ක වෙලා - බෙරිවෙලා.

පූවාලි - කෝලිකුට්ටු.

පුඩැල්ලා - කුඩැල්ලා.

පේරිය - පර්වතය - ගල් කන්ද.

පෙත - ඇබිත්ත - "මට සීනි පෙතක් නැතුව ඉන්නවා මේ වතුර ටික බොංඩ" - උණු වතුර යනුවෙනුත්, වතුර යනුවෙනුත් තේ වතුර හැඳින්වේ.

පොර වැටෙනවා - දබර වෙනවා - "කොල්ලො, තෙපි පොර වැවෙන්නෙ නැතුං ඔය ඉහුරු කරල් ටික බරුගහපව්." බරු ගහනවා - කඩා දමනවා.

පොද - බිංදුව - ඇබිත්ත - "දිය පොදක් නෑ උගුර තෙමාගංඩ."

පොල්ලං කේනවා - පොලු ගහනවා - කැලි කපනවා.

පෝපත් - පුවක් කොළය.

පෝඩියාරෙ - පෝසතා - වී, හරක් ඇති ගැමියා - දෙමළ ව්‍යවහාරයට අනුව පැමිණි වචනයකි. නමුත් දෙමළ වචනයකුත් නො වේ.

බණවනවා - අඩගහනවා.

බම්බු ලෑල්ල - රාක්කය.

බරුගහනවා - කඩා දමනවා - ගසා දමනවා.

බැද්ද - කැලේ.

බැදිපයිනවා - කැලේ පයිනවා - ගැහැණු ඔසප් සමය ගෙයින් පිටත කුඩුවක් මෙන් කුඩාවට තැනූ පැලක ගත කෙරෙති. එයට "බැදිපයිනවා" යයි කියති.

බිරහ - බිරිමේ

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

බුඩා - නාකියා - දෙමළ ඔස්සේ ආ වචනයකි. එහෙත් දෙමළ නොවේ.

බුත්නා - බිව්වා.

බෙත්මේ - කපු රාළ ගේ දෙවැන්නා.

බොක්ක - මුල්ල - "බොක්කට වදින්නැතුං වර අඩා පෙරට."

බොටා - මස්සිනා.

මාරිය - තද වැස්ස.

මානාවාරිය - ගහ දියෙන් වැඩ කරන කුඹුර - දෙමළ.

මිගිනි - හිටවෑන ඇට ජාති.

මිනිවා - මිමා.

මුම්මාරිය - අදහස් දියෙන් වැඩ කරන කුඹුර - දෙමළ.

මුස්නෙ බලනවා - ඉලක්කෙ බලනවා.

මුත්තෙට්ටුව - කුඹුරක ඉඩම් කාරයාට වෙන් කරන කොටස.

මැලිකි - ගැට - නො පැහැණූ ගෙඩි වර්ග.

මෙහෙකොණ - මෙහෙ - "අපේ මලයා මෙහෙකොණ ආව ද, එතනා ?"

මොක ? - මොකද් ද ? - "ඒක මොක අඩා ඒ පාරෙ දුවන්නෙ ?"

මොකා ? - කවුද ?

මොක්කු ? - කවුද ? "මොක්කු බොටා තයෙ ගෙට ආවෙ අද ?"

මොටා - ලොකු සතා.

මෝ - මව - "මෝ කිරි දිලා හැදු දරුවා වද, මේ ඈට ම අනර්ත කරන්නේ ?"

යකුන්නැහේ - යකැදුරා - පරිෂාරි යයි ද කියති - පරිෂාරි දෙමළ වචනයකි.

යකා බලනවා - යකා බැල්ම එලනවා - "කෙලා, සබන් ගාංඩ එපා. හිට යකා බලයි."

රල්ලුව - රංචුව.

රහේ ගන්නවා - විවාහ වෙනවා.

රිත්ත - තෙත - "ගේ වෙහෙම රිත්ත වෙලා. අද කුදහංඩ හේරු නෑ."

රුකුල - හිල - සිදුර - "මං රුකුලෙ තිබුණු මීය කොටං කෑවා."

රුකුල - අවුල - අමාරු මග - "කාට පුළුවෙනි යි, ඔය රුකුලෙ පනං වෙංඩ, මේ කළුවෙ ?"

රුදුව - කැක්කුම - "මහත්තයා, බඩ රුදගහනවා ගෙදර යන්නං."

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

රූගනවා - ගොරවනවා - 'වලහා මා දකලා රූගංඩ වුණා. මං පැනගත්තා ගහට.'

රොඹලෙ - හොම්බ.

රෝට්ටුව - පාර - පළාතේ ඇත්තේ කරත්ත යාමෙන් ම සෑදුණු පාර ය. එය නොව කාණු කපා පාලම් බැඳ තනන ලද පාර රෝට්ටුව නමින් හැඳින්වේ.

ලන්ද - කුඩා කැලය - 'මං ලන්දට ගුහින් තලගොයෙක් තළං එන්නම්.'

ලිහෙනවා - ලිස්සනවා - 'තියරෙ යංඩ බෑ පය ලිහෙනවා.'

ලිමා - මැ.

ලුණුකුඩු - සම්බලා - ලුණුම්රිස - 'දන් සතියක හිට ලුණුකුඩු ම නේ කෑවෙ ගෝතෙක් වත් පුස්සගංඩ යමව්.'

වක්කෙනවා - ඉසට වතුර වක්කරගෙන නෑම - 'ආං අප්පා ඔයේ වක්කෙනවා.'

වට්ටාව - බුලත් හෙප්පුව.

වට පෙට්ටිය - රෙදි දමන තළ කොළ පෙට්ටිය.

විසාදිය - කැක්කුම 'වණේ විසාදිය උහුලංඩ බැරුං අරකා ඔසෙ අදිනවා' - දෙමළ.

විසිරිපත - අවාන - පවන් සලන උපකරණ.

වෙහෙම - සේරම.

වෙහෙක්කම - හැම තැන ම - 'අලි බොට්ටුත්, වලස්සුත් මේක වෙහෙක්කම ඉදිත්.'

සකලයා - කුරුල්ලා - 'සකලයෝ අංඩ [illegible]බුරට පලයල්ලා.'

සුමග්ගාත්තරේ - වැඩ කරදර රාශිය.

සුම්බරේ - ජටාව.

සොම්මර - කම්මැලි - දෙමළ.

සෝමාරියා - කම්මැලියා - 'සෝමාරිය උණාට ඌ මෙද හේනක් තනලා අඹුවකුත් ගෙනාපි' - දෙමළ.

හඩුව - අතුල

හපුව - හුරතල් හැඟුමක් ඇති උප පදයකි. 'මයෙ කොලු හපුවට අකුරක් උගුන්නවා දෙංඩ මහත්තයා.'

හිද - එළිය - එළිමහන - 'මං ගෙට වෙන්නං. තෝ හිද කුදහප.'

හිප්පනවා - තද කරනවා - තෙරපනවා.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

හික්කා - හිකතලා.

හැන්දකළුව - ඇඳිරි වැටෙන වේලාව.

හිලහ - හිල - 'මේකෙන හිලගක් හාරලා මේ ඉන්න හිටවමු.'

හෙනම්මා - එහෙනම් බං - 'හෙනම්මා උඹ කැටුං යෙන්, ගෑණු ?'

හේරූ - ඉඩ - අවකාශ - 'සෙනඟ පිරිලා පන්සලේ ඉන්ඩත් හේරූ නැතුව ගියා.'

හෙල්ට් - කොස්.

හෙල්ලියොවෙන් - හෙලුවෙන්.

හොට්ටම්මා - මහලු අම්මා.

හොටියැන්ද - නාකි උන්ද - 'අන්න හොටියැන්ද ආවා. හොඳින් උයා කංඩ දිපල්ලා.'

Please buy books of this publisher and the author.
Make this e book to boost your reading temptation.

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

උප ග්‍රන්ථය*

මායාරංජන්
(1913 - 1968)

පියසේන කහදගමගේ

ශ්‍රී ලංකාවේ වන ගහණයේ සතා-සිපාවා ගැනත්, සකල ගහ-කොළ ගැනත්, ගිරි-කඳුරු ගැනත්, ඒවායින් ප්‍රාණ වායුව ලබන වනවාසී ගැමියා ගැනත් සිංහල පාඨකයාට කියවන්නට ලැබුණේ සුද්දන් විසින් ඉංගිරිසියෙන් ලියන ලදුව පසු ව සිංහලට පෙරළුණු පොත්වලිනි. **ලෙනාඩ් වුල්ෆ්, ජෝන් ස්ටීල්, ආර්. එල්. ස්පිට්ල්** ආදීන් දුටු වන අසිරිය පරිවර්තකයන් ගේ මැදිහත් වීමෙන් සිංහලයට පැමිණිය ද පාඨකයා ඒවා පිළිගත්තේ උණුසුම් ලෙසකිනි. එහෙත් ඊට වැඩි ආශ්චර්‍යයක් සිංහල පාඨකයාට ලබා දීමට සමත් වූයේ - වඩාත් ළෙන්ගතු පිළිගැනුමකට ලක් වූයේ සිංහලයේ ප්‍රථම වනචිත්ති සාහිත්‍ය කෘතිය වූ 'දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය' යයි කීම ඉහත ලේඛකයනට කරන මදි පුංචි කමක් නොවේ.

ඉංගිරිසින් ගේ පමණක් අවධානයට ලක් වූ වනය හ වනවාසී ගැමියා ලේඛනයට මූලාශ්‍ර කරගෙන සිංහලයේ වන චිත්ති සාහිත්‍යයේ පූරෝගාමියා වීමේ භාග්‍ය හිමිකරගත්තේ මායාරංජන් නමැත්තෙකි.

කැලෑබද ගැමියන් ගේ හෘද ස්ථන්දනයෙන් රිද්මය කැටි වී ඇත්තේ ඔවුන් ගේ සජීවී බස් වහර තුළ ය. ඔවුන් ගේ ගැමි සුවඳ වහනය වෙන්නේ පාරම්පරික සිරිත් විරිත් හා ඇවතුම් පැවතුම් තුළ ය. වනයට මෙන් ම සිංහල ගැමියනට ද ආගන්තුකයන් වූ ඉංගිරිසි ලේඛකයනට ගැමියා ගේ බස් වහරෙහි භාවමය ගුණයත්, සිරිතෙහි විරිතෙහි කැටි වූ පාරම්පරික ඥානසම්භාරයත් උකහා ගත නොහැකි විය. මායාරංජන්ට ගැමි වහරෙහි කැටි වූ ගැමියාගේ ජීවන සුවඳ මෙන් ම සිරිතෙහි

* මෙම ලිපිය සංස්කෘතික හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් 1991 මැයි 22 දින, 1991 - ජාතික වීර දිනය නිමිත්තෙන් මුද්‍රණය කෙරුණු, පූජිත ජීවිත සිවි වන වෙළුමෙහි 329-343 පිටුවල පළ විය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

විරිතෙහි මුහුන් ව තිබූ සිංහලකම හඳුනාගත හැකි වූයෙන් "දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය" සැබැවින් ම සිංහල සාහිත්‍යයට ද ආශ්චර්‍ය්‍යක් වූයේ ය.

හැබෑට ම කවරෙක් ද මේ මායාරංජන් ?

මේ ප්‍රශ්නයට පිළිතුරු සපයා ගන්නට මට දශකයකට වැඩි කාලයක් ගත කරන්නට සිදු විය.

කලාකරුවා සැහවී, කලාවට ඉස්මතු වන්නට ඉඩ දී පොත-පත ලියූ ලේඛකයන් ඇතොත් ඒ කලාතුරකිනි. "කේයස්" නමින් "සුදෝසුදු" ලියූ සාගර පළන්සූරිය හඳුනා ගැනීමට සිංහල පාඨකයාට එතරම් වෙහෙසක් ගැනීමට අවශ්‍ය වූයේ නැත. එහෙත් මායාරංජන් ගේ ලියමන් තුළ නම් ඔහු ගේ පෞද්ගලික තොරතුරු බිඳක් හෝ අල්ලා ගත හැකි අයිරුවක් නො තබන තරමට ම හේ පරෙස්සම් වූයේ ය. ලේඛකයා ගැන හෙළිදරව්වක් වීමට කිසිදු ඉඩක් නො තබා ලියූ මෑතකාලින අන් ලේඛකයකු ගැන සිහියට නො නැඟේ.

කොතෙක් සැහවෙන්නට මාන බැලුව ද, ඔහු ගේ ලියමන් තුළින් ඔහු ගැන අයිරුවක් නො ලැබුණ ද, ඔහු ගේ ලියමන්වල වූ ප්‍රභාව නිසා ම ඔහු ගේ වතගොත සෙවීමේ කුහුල මා තුළ ඉපැදිනි. මායා රංජන් සැරි සරූ දිගාමඩුල්ල දනව්වේ මට සැරි සරන්නට ලැබුණේ ඔහුට දශකයකට පමණ පසුව ය. ඔහු සැරි සැරුවේ වැව්ගම් පත්තුව සමාජ පරිණාමයකට ගොදුරු වීම ආරම්භ වූ අවධියේ ය. මා සැරි සැරූ අවධිය වන විට මායාරංජන් දුටු ආශ්චර්‍ය්‍ය මැකී ගොස් තිබිණි. නමුත් ඉඳ හිට තැනෙක අර ආශ්චර්‍ය්‍ය රැකී තිබුණා හැබෑව යි. එ සේ ම ඒ ආශ්චර්‍ය්‍යයේ සේයාවන් ද තැන තැන පැවතිණි. එහෙයින් මායාරංජන් ගේ වන සැරියේ පිය සටහන් ඔස්සේ ගොස් ඔහු ගේ මිතුරන් ගෙන් අයිරුවක් අල්ලා ගත හැකි විය. අන්න ඒ නිසයි, සැහවුණු කලාකරුවා වේදිකාවට නංවා ඔහුට උපහාරයක් දක්වීමේ පින්කමට මටත් සම්මාදම් වීමේ වාසනාව පැදුණේ.

"රාජපක්ෂ මහත්තය උන් හිටි ගමන් ඇවිල්ලා ගමරාල, ගමරාල කියල අඩගහනව. මං උන්නැහේ එක්ක කැළේ යනවා. නැත්නම් මයේ පුතා කැටුං රුකුලේ වදිනවා. රාජපක්ෂ මහත්තයා යකාටවත් බය නෑ. හිතුණොත් රාත්තිරිත් පාදගොඩ හිටන් දමනට යනවා. උන්නැහේ ලියූ පොත්වල මං ගැනත් ලියල තීනවා. අපෙ පුතා ගැනත් ලියල තීනවා. ඉස් ඉස්සෙල්ල ම අපි වගේ දුක් විඳින ඇත්තෝ ගැන ලිව්වේ උන්නැහේ තමයි. මේ ගම්වල ඇත්තො උන්නැහැට හරිම මනාප යි."[1]

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

මායාරංජන්ගේ මිතුරෙකු වූ පාදගොඩ දිසානායක මුදියන්සේලාගේ හීන්බණ්ඩා ගමරාල ගෙන් මායාරංජන් ගේ හැබෑ නමත්, ඔහු කළ රැකියාවත්, දිගාමඩුල්ලේ ඔහු සේවය කළ තැන් ගැනත් දැනගන්නට හැකි විය. ඒ තොරතුරු ඔස්සේ ගිය මට දිගාමඩුල්ලේ දී ඔහු දැන හැඳින ගත් කීප දෙනකු මුණ ගැසිණි.[2] ඔවුන් ගෙන් ලැබුණු තොරතුරු ඔස්සේ ගොස් මායාරංජන් ගේ නෑයන්[3] හඳුනා ගන්නට අවස්ථාව ලැබිණි.

"මායාරංජන් මගේ අයියා. අද ජීවත්වන කිට්ටුම ඥාතියා මමයි. දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය පොතේ මල්ලි යන්නෙන් අඳුන්වා ඇත්තෙ මායි. මහු ගේ පොත ලියන අවධියේ ඒ පෙදෙසේ විසිතුරු බලන්නට මම ද කිපවරක් ගොස් ඇත්තෙමි."[4] මායාරංජන් ගේ මලණු විශ්‍රාමලත් විදුහල්පති බී. එන්. රාජපක්ෂ මහතා පවසයි.

සැහවුණු කලාකරුවා ගේ වත ගොත අප අත පත් වූයේ ඔන්න ඔහොමයි.

❊ ❊

ස්වභාවයේ ප්‍රකෘති අලංකාරය වනයෙහි දක්ක හැකි ය. මානුෂික හස්තයෙන් විපර්යාස නො කරන ලද එහි, අක්ලිෂ්ට ස්වභාවික සෞන්දර්යය ඇත්තේ ය. එහෙත් එය වර්ණනා කළ හැක්කේ වනයෙහි ම ඉපිද, එහි ම හැදී වැඩී උගත් කවියකු පමණෙකි. එයට ආගන්තුකයකු වූ මා විසින් කළ හැක්කේ අන්ධයකු සිහිනයෙකින් දුටු දෙව් ලොවක් ගැන කරනා වැනි වැනුමෙකි ![5]

මායාරංජන් ඉතා නිහතමානී ව ස්වකීය වන වැනුම අන්ධයකු හීනයෙන් දුටු දෙව්ලොවක ගැන කීම වැනි ය යි පවසන නමුත් හැබෑව එය නො වේ. දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය තුළින් ඔහු අපූරුවට වනයේ චමත්කාරයත්, වනවාසී ගැමියා ගේ ජීවන සෞන්දර්යයත් කියා පෑවේ ය.

දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය පොත ගැන සඳහන් කරමින් කේ. ජයතිලක මෙසේ කියයි.

"වික්‍රමසිංහයන්ට තිබූ නිර්මාණ ශක්තියත්, පරිවයන් තිබුනේ නම් අපේ ගම ඉක්මවා බොහෝ ඉහළින් සිටිනු ඇත්තේ 'මා පයට නණ නිල්ල' නොව, මායාරංජන් යන ආරූඪ නමකින් රාජපක්ෂ නමැති ගුරු මහතකු ලියූ දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍යයි.[6]

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ හා *"Graass For My Feet"* ලියූ ජිනදස විජයතුංග වැනි විශ්ව කීර්තියට පත් වූ ලේඛකයන් සමඟ සසඳන මට්ටමකට මායාරංජන් ගේ ලිවිසැරිය ප්‍රබල වී ඇති සැටි ඉන් කියවෙයි.

දිගාමඩුල්ල පසුබිම් කොට දිගාමඩුල්ලේ ආශ්වයිූ, මගේ රාජ්‍ය හා පිටිසර මිනිස්සු යනුවෙන් වන විත්ති සාහිත්‍ය කෘති තුනක් ඔහු අතින් ලියැවුණු නමුත් ඉන් ඉස්මතු වී පෙනෙන්නේ දිගාමඩුල්ලේ ආශ්වයිූ යි. එම කෘතිය ගැන සෝමවීර සේනානායක මෙසේ සඳහන් කරයි.

"වනය පිළිබඳ ව විත්ත කථනයක යෙදුණු පොත් අතර අග්‍රස්ථානය හිමි වන්නේ මායාරංජන් ගේ දිගාමඩුල්ලේ ආශ්වයිූ පොතට යි."[7]

දිගාමඩුල්ලේ ආශ්වයිූ තුළින් නොමියන මිනිසකු බවට පත් වූ මායාරංජන් ගේ වතගොත සොයා බලමු.

❊ ❊

සියනෑ කෝරලේ මගලෙගොඩ පුරනේලිස් රාජපක්ෂ තරුණ වෙද මහතා හලාවත දිස්ත්‍රික්කයේ කහටවිල ගම්මානයේ පදිංචියට ගියේ එ ගම වෙල්මුලාදැනියකු ගේ දියණියක් වූ කලෝනෝනා මදුරප්පෙරුම මෙනෙවිය ආවාහ කරගත් බැවිනි. වෙද කමත්, සමාජ සේවයත් නිසා ජනාදරයට පත් වූ රාජපක්ෂ වෙද මහතා හරිහම්බ කළ ධනයක් නොවී ය. ගැමියන් ගේ ලෙඩට-දුකට වෙදකම් කළ හෙතෙම ගැමියන් ගේ නුගත්කමට ප්‍රතිකාර කිරීමට සමිති සමාගම් උපයෝගී කර ගත්තේ ය. ගමට පාසලක් ලබා ගැනීමට ද මුල් වී ක්‍රියා කෙළේ ද රාජපක්ෂ වෙද මහතා ය.

රාජපක්ෂ යුවලට දරුවෝ තිදෙනෙක් වූහ. ඉන් **1913 සැප්තැම්බර් මස 03 වැනි දින** උපන් පවුලේ මද්දුමයාට **මහානාම** යන නම තැබී ය. වැඩිමලා වූ බුද්ධරත්න එවකට පැවැති ඩෙන්හැම් ශිෂ්‍යත්වයෙන් සමත් වී කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙනීමට ගියේ ය. මහානාමට හා පවුලේ බාලයා වූ නිමල් ට ප්‍රදේශයේ පාසලකට යවා ඉගැන්වීමට වෙද මහතා කටයුතු කර තිබිණි.

අසනීප ගතියෙන් පෙළෙන්නට වූ බැවින් වෙද මහතා සිය ජන්ම භූමිය වන මගලෙගොඩ පදිංචියට පැමිණියේ ය. ඒ වන විට මහානාම

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

දස වසරක පමණ ළමයෙක් විය.

1926 දී පියා මෙලොව හැර යන විට මහානාම 13 වැනි වියේ පසු වූයේ ය. වෙද මහතා මිය යන විට රුස් කළ ධනයක් නො වූයෙන් සියලු බර කලෝනෝනාගේ හිස මත වැටිණි. බරපතල ආර්ථික අවදනමකට මුහුණ දී සිටිය ද දරුවන් ගේ අධ්‍යාපනයට එහි බලපෑම එල්ල වීම වැළැක්වීමේ ධෛර්යය කලෝනෝනා තුළ තිබිණි. පවුලේ ඥාතියකු වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක ගේ උපකාරය ලැබීම කලෝනෝනාට මහත් පිටුවහලක් විය.

ඉගෙනීමේ ශූරයකු වන මහානාම ප්‍රරම්භ විභාගයෙන් සමත් වූයේ ය. සුදුසුකම් ලැබුවනට රැකියාවක් එ ද අරුමයක් නො වූයේ දේශපාලන කුඩුකේඩුකම් සමාජය ආක්‍රමණය නො කළ නිසා විය හැකි ය. රජයේ පාසලක උප ගුරු තනතුරක් ඔහුට ලැබිණි. කුරුණෑගල ගොකරුල්ල විදුහල මහානාම රාජපක්ෂ නම් ගුරුවරයා ගේ ප්‍රථම සේවාස්ථානය විය. ගුරු සේවයට පැමිණ ටික කලෙකින් මහානාම අවසාන ගුරු විභාගයෙන් සමත් වී සහතික පත්‍ර ලත් ගුරුවරයකු බවට පත් වූයේ ය. මේ අවධිය වන විට ගුරු සේවාවේ පුහුණු ගුරුවරු ඉතා දුර්ලභ වූහ. අවසාන ගුරු විභාගයෙන් සමත් වූවන් ද වූයේ ඉතා අඩුවෙනි. එහෙයින් ආරම්භයේ දී ම මහානාම ගුරු සේවාව තුළ ඉදිරි පෙළේ පසු වූ බව වටහා ගත යුතු ය.

හෙතෙම සහජයෙන් ම කලාකාමියෙක් වූයේ ය. පොත-පත කියවීමත්, කවි, කෙටි කතා හා නාට්‍ය රචනා කිරීමත්, නාට්‍ය පුහුණු කරවා රඟ දක්වීමත් ඔහුගේ විනෝදාංශය විය. ඊළඟට ඔහු ගේ සිත ඇදී ගියේ සංගීතය වෙත ය. ගුරුවරයකු වූ මීගොඩ ආර්. විජේසිංහ මහතා ගෙන් සංගීතය හැදෑරීමේ අවස්ථාව ඔහුට ලැබිණි. ලේඛන කලාවේ කුසලතාවත්, සංගීත හා නැටුම් පිළිබඳ එක්තරා දක්ෂතාවකුත් තිබූ බැවින් ප්‍රදේශයේ ගුරුවරුන් අතර ඔහුට හිමි වූයේ විශේෂ දක්ෂතාවකි.

වාරාවසානයේ විවිධ ප්‍රසංගයක් හෝ නාට්‍ය දර්ශනයක් හෝ පැවැත්වීමෙන් ඔහු මහත් තෘප්තියක් ලැබුවේ ය. නාට්‍ය දර්ශන පවත්වන විට එහි වේදිකා සැරසිලි හා චිත්‍ර ශිල්පිය කටයුතු සඳහා සිය මලණුවන් ගේ සහාය ලබා ගත්තේ ය. පණ්ඩුකාභය, පරාක්‍රමබාහු, සිතාවක රාජසිංහ යන නාට්‍ය හා කාලගෝල, මහදැනමුත්තා යන ගීත නාටක ඔහු වේදිකාවට ගෙනා ස්වකීය නිර්මාණ අතර වේ. ඩබ්ලිව්. ඒ. සිල්වා ගේ කාසි පිස්සුව, හිහන කොල්ලා, සුනේත්‍රා හා මාර්ටින් වික්‍රමසිංහ ගේ රෝහිණි යන කෘති ද ඔහු අතින් නාට්‍ය රචනා බවට පෙරළී වේදිකා ගත විය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

"මායාරංජන් මගේ පුංචි අම්මාගේ පුතා. මං ඉගෙන ගන්න කාලේ මහානාම අයියා හලාවත ගල්මුරුවෙ ඉස්කෝලේ ඉගැන්නුවා. ඒ කාලේ අපේ තාත්තා මැදගොඩ පන්සලේ පෙරහැරකට මහානාම අයියගෙ පන්තේරු කණ්ඩායම ගෙන්නුවා. ඒ නැටුම් කණ්ඩායම හදල තිබුණේ පාසලේ ළමයින් ගෙන් ම යි. එයා හැබෑ කලාකාරයෙක්. පඩියෙන් වැඩි කොටසක් වියදම් කළේ මය වගේ වැඩවලට යි."[8]

විශ්‍රාමලත් විදුහල්පති රත්නායක මහතා මායාරංජන් ගේ ගුරු ජීවිතයේ දිස් වූ කලාකාමී ලක්ෂණ අනාවරණය කළේ ය.

මහානාම රාජපක්ෂ දිගාමඩුල්ලට අයත් වැව්ගම් පත්තුවේ ගුරු සේවයට ගියේ 1948 දී ය. එ වකට ඔහු ගේ වයස අවුරුදු 35 ක් විය. ඔහුට මුල්ගුරු පදවියක් ලැබුණේ දිගාමඩුල්ලේ දමන විදුහලේ දී ය.

"රාජපක්ෂ මහත්තයා දමනෙ උගන්වන කාලෙ මට මුණ ගැහිල තියෙනවා. එතකොට මං ගල්ඔය සංවර්ධන මණ්ඩලේ බර වාහන රියැදුරෙක් හැටියට වැඩ කළා. සෙල් ලිපි හොයල ඒව පිටපත් කරල පරණවිතාන මහත්තයට යැවීම මගේ පුරුද්දක් වෙලා තිබුණා. ඒ හින්ද මං ගල්ඔය මිටියාවත පුරා ම ඇවිද්ද. මට රාජපක්ෂ මහත්තය අඳුනගන්න ලැබුණේ ඒ කාලෙ දි තමයි. එතකොට උන්නැහේ දමන විද්‍යාලෙ මුල් ගුරුතුමා හැටියට කටයුතු කළා. අපි ඉහිනියාගල වැව (සේනානායක සමුද්‍රය) හදන කොට එයා ඉහිනියාගල ඉස්කෝලේ මුල් ගුරුවරයා හැටියට සේවය කළා."[9]

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සේවය කළ කේ. සාමෙල් මහතා මායාරංජන් පිළිබඳ තොරතුරු සපයමින් පැවසී ය.

මහ වනයට මැදි වී ජීවත් වූ දිගාමඩුලු ගැමියා ගේ සරල දිවිපෙවෙතට ඔහු මහත් සේ ඇලුම් කෙළේ ය. නාගරිකත්වයේ විපර්යාසයට භාජන වූ බටහිර පළාතේ සිට නැගෙනහිර රුහුණේ වනගහණයට ගිය ඔහුට ගැමියන් ගේ සිතුම්-පැතුම්, ඇවතුම්-පැවතුම්, කතා-බහ, විශ්වාස හා ඇදහිලි ආශ්චර්යක් ලෙස දැනුණේ ය.

වනයේ සතා-සීපාවා, තුරු ලතා, පා පඳුරු, තණ තිල්ල, ගිරි කඳුරු ආදියේ ඔහු චමත්කාරය දුටුවේ ය. කුරුලු කොබෝ, ගෝන මුව, සා මීමිනි, රිළා වඳුරු සේනාවන් ගෙන් සෞන්දර්ය දුටුවේ ය. මෙකී වනගහණයේ වෙසෙන ගැමියා තුළින් ඔවුන් ගේ ජීවන සෞන්දර්ය දුටුවේ ය.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

වනය ඔහුට තක්සලාවක් වූයේ ඒ නිසා ය. පාදගොඩ, දමන, මොරගහපල්ලම, පල්ලන් ඔය, කොක්තහර, කොස්සපොළ, කිවුලේගම, වඩිනාගල, මඩවලලන්ද, හිඟුරාන, එරගම ආදි ගම්මානයන් ද, ඔහුගේ හද බැඳගත් නෙල්ලිකැලේ ද මායාරංජන් ගේ ආශ්චර්‍යවත් ලෝකයේ නවා තැන් විය.

ඔහු දුටුවේ වනයේ සෞන්දර්ය පමණක් නො වේ.

මිනිස් සමාජයේ මෙන් ම වනාන්තරයේ ද පවතින පංති විෂමතාව ඔහු දුටුවේ ය.

"ගෝන, මුව, වඳුරු, රිළා, මීමිනි, ලෙහෙන් ආදි අනෙක් සිව්පාවෝ වන රාජ්‍යයේ පිඩිත පංතියට අයත් දුප්පත් අහිංසකයෝ වෙති. ගෝනහාමි කුළා මෙන් ම ඇත් කුලයේ උපතෙකි. එහෙත් කොටි රාළහාමි ගේ පිම්මට අසුවුණ හොත් සටනක් කළ හැකි හපනක් නො වේ. මුවහාමි කොටි රාළහාමිට කිරි හට්ටියක් වැන්න. එහෙත් එය එසේ වන්නේ ද පිම්මට හසුවුණ හොත් පමණෙකි. කොටි රාළහාමි බිම දිගා වී වලිග නවමින් මානම් ගනිද්දී, අසුරු සණකට කලින් හෝඩුවාවක් ලැබුණොත්, බේරී යන්නට තමනට ජව බලය ඇති බව ගෝන-මුවෝ දනිති."[10]

වනසතුන් ගේ ජීවන අරගලයත්, වනයේ නිහැඩියාවට යටින් ඇති කා කොටා ගැනුමත්, ගසා කෑමත් ඔහු අපූරුවට වදන් හරඹයෙන් දක්වන සැටි බැලුව මැනවි. මේ කුළින් ඔහු කියා පෑවේ වනයේ ජීවිතයේ යාථර්ථය නො වේ ද ?

අත්දැකීම්, ප්‍රත්‍යක්ෂය හා ජීවිත පරිඥනය වෙතින් පරිපාකත්වයට ගිය නිර්මාණ කරුවකු වශයෙන් මහානාම වැඩි මෝරා ගියේ දිගාමඩුල්ලේ විසූ දස වසර තුළ ය.

වනගත ජීවිතය අළලා ලියූ ලිපි කීපයක් - ඔහු කොළඹ පැමිණි විටෙක ලංකාදීප කර්තෘ ඩී. බී. ධනපාල මහතා අත තැබුවේ ය. ලිපි කියවීමෙන් ප්‍රමෝදයට පත් ධනපාල මහතා මහානාම දිරිගැන්වී ය. ඔහු ලංකාදීපයට මායාරංජන් නමින් ලියමින් ලේඛක ලෝකයට එක් විය.

වැවිගම් පත්තුවට එන විට ඔහුට ඉංගිරිසි භාෂාව පිළිබඳ එක්තරා දැනුමක් තිබුණු බව පෙනේ. ඒ බව **"පසළොස් වසරකට පමණ පෙර මට හෝමර් කළ ඉලියඩ් සහ මඩිසි කියවන්නට ලැබුණේ ය"[11]** යන සටහනින් පෙනේ.

Downloaded from sinhalaebooks.com

Scanned by CamScanner

දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය පොත ලියූ මහානාම මහත් ගැටලුවකට මුහුණ දුන්නේ ය. පොත ලියා ගෙන ප්‍රකාශකයන් පසු පස ගිය විට අසන්නට ලැබුණේ අධෛර්යයට පත් කරන වදන් ය. කතුවරුන් හෑල්ලුවට පත් කොට, නිර්මාණය බාල්දු කොට තුට්ටු දෙකට අයිතිය පවරා ගැනීම ප්‍රකාශකයන් ගේ සිරිත වී තිබිණි. පිටපතේ අයිතිය කුණු කොල්ලයට ලියවා ගෙන පොත ප්‍රකාශ කෙළේ ද ප්‍රසිද්ධ ලේඛකයකු ගේ රෙකමදරුවක් ඇතොත් පමණි. ඒ නිසා පොත පළකරන බලාපොරොත්තුව කඩකර ගත් හෙතෙම පිටපත ගෙදර තබා දිගාමඩුල්ලට ගියේ ය.

මහානාම ගේ මල්ලි වන බී. එන්. රාජපක්ෂ සේවය කෙළේ අගනුවර පාසලක ය. කලාකාමියකු වූ ඔහු ගේ සිතේ දැඩි ව බලපෑවේ අයියා ගේ පොත පළ කරන වුවමනාව ය. ඒ සඳහා ප්‍රකට ලේඛකයකු ගේ රෙකමදරුවක් ලබා ගැනීමට ඔහු උත්සහ ගත්තේ ය. පෞද්ගලික හිතවත් කමක් ඔස්සේ ගොස් ලයනල් ලොකුලියන මහතා ගෙන් රෙකමදරුවක් ලබාගත් ඔහු ඒ වග අයියාට දැන් වී ය.

රුපියල් 300 කට සියලු හිමිකම් පවරා දීමට මහානාමට සිදු විය. පොත පළවීමෙන් පසු පාඨක විචාරක ප්‍රසාදය ඔහු කරා පැමිණියේ ය. මායාරංජන් යන නම සාහිත්‍ය වංශාවලියේ ලියැවුණේ සිංහලයේ වන විත්ති සාහිත්‍යයේ ආරම්භකයා ය යන ගෞරවනීය සඳහනත් සමඟ ම ය. 1963 දී දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍යයෙහි සංශෝධිත මුද්‍රණයක් පළ වූ නමුත් සම්පූර්ණ හිමිකම් පවරා තිබුණු බැවින් ඔහුට සතයක්වත් ලැබුණේ නැත.

දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය පොතට ලැබුණු උසස් පිළිගැනුම නිසා ඊළඟ පොත් ප්‍රකාශනය ඔහුට ගැටලුවක් නො වී ය. දිගාමඩුලු ජන ජීවිතය පසුබිම් කොට "මගේ රාජ්‍ය" හා "පිටිසර මිනිස්සු" යනුවෙන් පොත් දෙකක් පසුව ලියූ නමුත් ඒවා පළමු පොත තරම් ප්‍රභාවත් නො වී ය.

පන්නිපිටියේ එම්. එම්. පෙරේරා ගුරු මහත්මාව සමඟ විවාහ වී සිටියත් මහානාමට තෘප්තිමත් විවාහ ජීවිතයකට උරුම නො ලැබුණේ කැලැ රටේ ගුරු ජීවිතය නිසා ය. බිරිඳ ගමේ ද, ඔහු දිගාමඩුල්ලේ ද ගත කළ බැවින් ඔහුට හැබෑ ගෘහ ජීවිතයක් කොයින් ද ? ඔහුට ගමට යාමට ලැබුණේ ඉඳහිට ය. දුෂ්කර සේවයට පැමිණ වසර 10ක් ගත වීත් ගමට ස්ථාන මාරුවක් නො ලැබුණෙන් දෙන්න දෙමහල්ලන්ට එක් වහලක් යට ජීවත් වීමේ වාසනාව නො ලැබිණි.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

1958 වසරේ දී ඔහුට අපූරු සිතිවිල්ලක් පහළ විය. වනගත ජීවිතයේ දස වසර සපිරෙන ද ඔහු අධ්‍යාපන ඇමැති **විජයානන්ද දහනායක** මහතාට විදුලි පුවතක් යැවී ය.

"වනගත ගුරු ජීවිතයේ දසවසර සපිරෙන අද දින ඔබට ශුභාශිංසනය කරමි."

විදුලි පුවත නිසා දෝ ඊ ළඟ මාසයේ ඔහුට මාරුවීමක් ලැබිණි. හැබැයි ඒ ගමට නො වේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කළුකැලේ පාසලට ය.

එම මාරුවීමෙන් ඔහුට වූ යහපතක් නො වී ය. දැඩි වියළි දේශගුණයට පදම් වී තිබූ ඔහු ගේ ශරීරයට කළුකැලේ දැඩි ශීතල මරොත්තු නො දුන්නේ ය. ශීතල මහහරවා ගැනීමට අධික ලෙස මත්පැන් පානය කිරීමට ඔහු හුරු විය. එහෙත් ඒ අසිරුකම් ලිවීමේ කටයුතු බාල වීමට හේතුවක් නො වී ය. දිගාමඩුල්ලේ දී වනයේ ඇවිදීමට ඔහු ගේ කාලයෙන් වැඩි කොටසක් වෙන් විය. කළුකැලේ ඇවිදීම් අඩු වූ නිසා කියවීමට හා ලිවීමට ගත කරන කාලය වැඩි විය. පරණ පොත් සාප්පු කාල් ගාමින් ඇවිද දුර්ලභ පොත් - පත් මිලට ගෙන කියවූයේ ය. ස්වොත්සාහයෙන් ඉංගිරිසි දැනුම වර්ධනය කර ගත්තේය. ඉන්පසු හෝමර්ගේ ඉලියඩ් සහ ඔඩිසි යන විරකාව්‍ය පරිවර්තනය ඇරඹුවේ ය.

කළුකැලේ පාසලෙන් පසු තවත් පාසල් කිපයක සේවය කළ ඔහු ගේ රෝගී තත්ත්වයන් සුව අතට හැරුණේ නැත. අධික උෂ්ණයෙන් යුත් ඉහිණියාගල සිට අධික සිසිල් ගුණයෙන් යුත් නුවරඑළියට යාම නිසා දෝ කුෂ්ඨ රෝගයකට ඔහු ගොදුරු විය. නො සැලෙන මිනිසකු වූ මායාරංජන් නො සන්සුන්තාවකට පත් වූයේ කුෂ්ඨ රෝගය නිසා ය. කොතෙක් වෙදකම් කළත් නිට්ටාවට සුවය නො ලැබිණි. මහ නාම ගේ හිතට වද දුන්නේ තමා අන්‍යයන් ගේ පිළිකුලට භාජනය වේ ය යන සිතිවිල්ල ය. කුෂ්ඨ රෝගයකින් පෙළෙමින් ළමයින් ඉදිරියේ පෙනී සිටීමට නො හැකි යයි තීරණය කළ හෙතෙම විශ්‍රාම ලබා ගත්තේ ය.

විශ්‍රාම ගැනීමෙන් පසු ගමට පැමිණ ලේඛන කලාවේ යෙදුණ බැවින් තවත් පොත් රාශියක් ලියැවිණි. ඉන් කීපයක් ම පරිවර්තන කෘති විය.

- දිගාමඩුල්ලේ ආශ්වර්‍ය්‍ය
- මගේ රාජ්‍යය
- නීලා
- කුමාරයා සහ රන්මැණිකා
- කලිසම සහ සුකුමාරි
- පිටිසර මිනිස්සු
- අපේ රාජ්‍ය
- විදිය බණ්ඩාර
- හීනෙන් ගෑ සුවඳ
- සහෝදරයෝ දෙන්නා

Downloaded from sinhalaebooks.com
Scanned by CamScanner

- පණ්ඩුකාභය
- අටල්ලේ උපන් කුමරිය
- වන සංග්‍රාමය (පරිවර්තනය)
- ඇලෙක්සැන්ඩර් (පරිවර්තනය)
- ප්‍රේම පූජාව
- නිර්භීත පුංචි යන්නාලියා
- ත්‍රෝජපුර සංග්‍රාමය (පරිවර්තනය)
- මහෞෂධය (පරිවර්තනය)

යනුවෙන් පොත් 18ක් සිංහල සාහිත්‍යයට එක් කළ මායාරංජන් ගේ නො පළ කෘති කිපයක් ද වූ බව මලණුවෝ පවසති.

"ත්‍රෝජපුර සංග්‍රාමයේ අවසානය සහ මිනිලෞසනට හෙලන් ලැබුණු පරිදි දක්නා කැමැති පාඨක තෙමේ මෙහි දෙවැනි කාංඩය වූ මතු පළ වන සමුද්‍ර සංහාරය කියවන්නේ ය."[12]

බී. එන්. රාජපක්ෂයන් ගේ කියමන හැබෑ යයි හැඟුමක් මායාරංජන් ගේ ඉහත කී සටහනින් මතු කෙරෙයි.

විවාහයෙන් දරුඵල නොලත් බැවින් මායාරංජන්ට යමක් ඉතිරි කිරීමේ අවශ්‍යතාව මතු නො වී ය. ඔහු ගේ විශ්‍රාම වැටුප ද සමාජ සේවයට යෙදවුණේ ඒ නිසා ය. මගලේගොඩ නිවස අසල පාරට යාබද ව කුඩා ශාලාවක් තැන වූ හෙතෙම තමා ළඟ වූ පොත් එහි තැන්පත් කොට කියවීම් ශාලාවක් ආරම්භ කෙළේ ය. පොත්-පත් ලිවීමෙන් ලැබෙන මුදල් ද පොත් ගැනීමට යෙදවිණි. "පොත් මිහිරි" නමින් හැඳින්වුණු මේ පුස්තකාලයේ සාමාජිකයන්ට ශත 25 ක් ගෙවා පොතක් කියවීමේ අවස්ථාව ලැබිණි. සෑහෙන කාලයක් මේ කාර්යය කෙරීගෙන ගිය නමුත් ආපසු පොත් ලැබීම බාල විය. ක්‍රමයෙන් පුස්තකාලය අභාවයට ගියේ ය.

දිගාමඩුල්ලේ සේවය කරද්දී කැළෑ රටේ ගැමියන් වේයන්ගොඩට කැඳවා ගෙන විත්, ඔවුන්ට කොළඹ හා අවට පෙන්වා යළි දිගාමඩුල්ලට කැඳවා ගෙන යාම ඔහු මහත් ආසාවකින් කළ දෙයකි. දිගාමඩුල්ලේ දී ගැමියන් සමඟ එක් ව දඩයමේ ගිය ඔහු, ගැමියන් සමඟ එක් වී හේන් කෙටුවේ ය. වරෙක විරිදු කියමින් හිඟා කෑ පුද්ගලයකු තමා ගේ වාඩියේ නවත්වා ගෙන කෑම බීම දී ඔහු ගොවිතැනට හුරු කරවා ගම්වැසියකු බවට පත් කෙළේ ය. දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය පොතේ එන රබන්[13] ඔහු ය. මගේ රාජ්‍ය පොතේ එන සින්දු[14] ගේ චරිතය ගොඩ නඟා ඇත්තේ ද එම අත්දැකීම් මඟිනි.

මායාරංජන් හැබෑ කලාකාරයෙකු සේ ම, හැබෑ මිනිසෙක් ද විය. ඒ ඔහු තුළ වූ මනුස්සකම නිසා ය. මට මෙහි දී සිහියට නැහෙන්නේ දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය තුළින් පමණක් මායාරංජන් අඳුනා ගත් රත්න ශ්‍රී විජේසිංහ තැබූ සටහනක් කොතරම් නිවැරදි ද යන්න ය.

"මායාරංජන් ස්වභාවයේ චමත්කාරය ආස්වාදනය කරමින්, එය ම ගායනය කරමින් ආහ්ලාදයට පත් සියුමැලි අව්‍යාජ මිනිසෙකි."[15]

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

ජනවහර කෙරේ උනන්දුවක් දැක්වීම ඒ අවදියේ දුර්ලභ දෙයක් විය. එහෙත් මායාරංජන් දිගාමඩුලු ජනවහරෙහි මිහිර දුටුවේ ය. දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය හා මගේ රාජ්‍යය යන පොත් දෙකෙහි සුවිශේෂ වැදගත්කමක් ඇති වීමට ජනවහර උපයෝගී වී ඇත. දිගාමඩුලු බස් වහරෙහි තැන්පත් වූ ඉපැරැණි ලක්ෂණ ඔහු අවබෝධ කොට ගත්තේ යයි සිතිය හැකි ය. දුටුගැමුණු කුමාරයා හා කොත්මලේ රන් මැණිකා පිළිබඳ ජනප්‍රවාදය තේමාව කොට ගෙන ඔහු ලියූ 'කුමාරයා හා රන් මැණිකා' නම් ඓතිහාසික නවකථාවේ සංවාද කථනය සඳහා දිගාමඩුලු බස් වහර ඔහු ප්‍රයෝජනයට ගත් සැටියක් මෙයින් පෙනේ.

"එසේ නම් දුරු කතර සිට එන මා පුතුට අහරක් ගනිවි කෙල්ලනි."[16]

ගුරුවරයකු වශයෙන් ඔහු කළ සේවය අගය කරන්නෝ දමන, පාදගොඩ හා ඉහිණියාගල යන ගම්මානවල වෙසෙති. කැළැ ගම්වලට ඔහු දිසාපාමොක් කෙනෙක් වූ හ.

"මගේ ප්‍රථම විදුහල්පති තමයි මායාරංජන්. ඔහු ඉතා දක්ෂ පුද්ගලයෙක්. නිලධරයන්ට ගැතිකම් කිරීම ඔහු හෙළා දුටුවා. ගුරුවරයෙක් හැටියට ගත්තම මායාරංජන් තුළ විප්ලවවාදී ගුණයක් පැවතියා. ගුරුවරයා කොන්ද කෙළින් තියාගෙන ඉන්න ඕන කියා ඔහු විශ්වාස කළා. හැම විටක ම තම උප ගුරුවරුන් නිලධාරීන් ගෙන් ආරක්ෂා කළා. ඒ වගේ ම හරි විනෝද කාරයා. උන්නු ගමත් යමව් කොල්ලනේ කියල අපට කියනවා. කවුරුනුත් දන්නවා කැළේ විනෝද ගමනක් යන බව. ඩෝලැක්කෙත් අරන් අප පිටත් වෙනවා. මායාරංජන් පන් මල්ලක් අරන් එනවා. කැළේ ඇවිදගෙන ගිහින් හොඳ තැනක් බලලා ගල් කලාවකට නහිනවා. අඩියක් ගහල සින්දු කියනවා. එතකොට ඩොලැක්කෙ ගහන්නේ මායාරංජන් ම යි."[17]

සිංහල සාහිත්‍යයේ නො මැකෙන පිය සටහනක් තැබූ මායාරංජන් නොහොත් **මහානාම රාජපක්ෂ** වසර 55ක් ආයු වළඳ **1968 නොවැම්බර් 19** වැනි දින මගලේගොඩ දී අවසන් හුස්ම හෙළී ය. ඔහු ගේ බිරිඳ ටික කලක් එහි සිට ඇගේ ගම වූ පන්නිපිටියේ විසූ සහෝදරිය ළඟට ගියා ය.

මායාරංජන් ජාතියෙන් සමුගෙන දශක දෙකක් ඉක්ම ගිය ද ඔහු අප අතර ජීවත්වන්නේ අමරණීයත්වයට පත් වූවකු බැවිනි. ඔහු ගේ ලියමන් වඩාත් ප්‍රභාවත් ව නැඟී සිටිනුයේ සමාජ පරිණාමය තුළින් ඉපැරැණි ලක්ෂණ මැකී යන තරමට ය. එදට අප දිගාමඩුලු ගැමි ජනයා ගේ සරල දිවි පෙවෙත චිත්තරූප මහින් පෙන්වනු ඇත්තේ ඔහු ලියූ පොත-පතිනි. ඔහු ගේ මහ ගිය පසුකාලීන ලේඛකයන් ගේ පොත-පතිනි.

මායාරංජන් අද අප අතර නැත. එහෙත් ඔහු ගොඩ නැගූ කියවීම් ශාලාව අදත් ගැමියන් විසින් හඳුන්වනු ලබන්නේ **'පොත් මිහිර'** යනුවෙනි.

Please buy books of this publisher and the author.
Make this e book to boost your reading temptation.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner

පාදක සටහන්

1. වනයේ වීරයෝ (පාදගොඩ වලස් මුත්තා) පියසේන කහඳගමගේ - දිවයින ඉරිදා සංග්‍රහය, 1982.04.25 හා 1982.05.02.
2. දි. මු. හීන්බණ්ඩා ගමරාළ, කේ. සාමෙල්, කටුහත්පොළ ගමරාළ, පියදස වැලිකන්නගේ මහත්වරු.
3. බී. එන්. රාජපක්ෂ, මහින්දපාල රත්නායක.
4. සාම විනිසුරු බී. එන්. රාජපක්ෂ (විශ්‍රාමලත් විදුහල්පති) මහතා, 6/1, මගලෙගොඩ, වේයන්ගොඩ. 1990.02.17 දනමින් යුතු ව මා වෙත එවන ලද ලිපියකිනි.
5. "දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය - මායාරංජන් - දෙවන සංස්කරණය 1963 - සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, මහරගම - 09 වැනි පිටුව.
6. කේ. ජයතිලක - පූජිත ජීවිත - පළමු වෙළුම - අධ්‍යාපන, සංස්කෘතික හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය - 1989, මාර්ටින් වික්‍රමසිංහ පිළිබඳ ව ලියන ලද ලිපියකිනි - 262 වැනි පිටුව.
7. සෝමවීර සේනානායක (පියසේන කහඳගමගේ - වනේ ඇදුණු පියසටහන් පොත ගැන විචාරය), නවයුගය - 1985.04.20.
8. රත්නායක මහින්දපාල (මැදගොඩ - නාත්තන්ඩිය) දැන් පදිංචිය 163/4, බෝගහවත්ත, පන්නිපිටිය.
9. කේ. සාමෙල්, වෙනුර, අම්පාර.
10. දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය (මායාරංජන්), දෙවන සංස්කරණය, 13 පිටුව.
11. ත්‍රෝජපුර සංග්‍රාමය - (මායාරංජන්), වචනයක්.
12. ත්‍රෝජපුර සංග්‍රාමය - (මායාරංජන්), 462 පිටුව.
13. දිගාමඩුල්ලේ ආශ්චර්‍ය්‍ය - (මායාරංජන්), 2 වන මුද්‍රණය - 102-107 පිටු.
14. මගේ රාජ්‍ය (මායාරංජන්), 24 පිටුවේ සිට ඉදිරියට.
15. රත්න ශ්‍රී විජේසිංහ - පියසේන කහඳගමගේ නැවුම් පොළොව පොත පිළිබඳ විචාරය දෙසතිය - 87.12.15.
16. කුමාරයා සහ රත්මැණිකා (මායාරංජන්), 11 පිටුව.
17. පියදස වැලිකන්නගේ, 258/24, හෙට්ටියාවත්ත, හුළංගමුව පාර, මාතලේ.

Please buy books of this publisher and the author.
Make this e book to boost your reading temptation.

Downloaded from sinhalaebooks.com Scanned by CamScanner